**2019.02.05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**මාසික සභා රැස්වීම් වාර්තාව**

**සහභාගීත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රීනි |
| දිනයාදුර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රීනි |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති | ගරු නගර සභා මන්ත්‍රීනි |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රීනි |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රීනි |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව ප.ව. 02.15රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී☸**

## (01)

**01.01 2019 – 02 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම**

**2019-02-05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ඒ අනුව 2019- 02- 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**සංශෝධන**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

**01.02 2019.01.08 පැවති සභාවේ සභා තීරණ අංක 12.11 යටත් ඇති 2019 වර්ෂයේ නේවාසික ස්ථාන සඳහා 7% ක් හා වාණිජ දේපළ සඳහා 11% ක් ලෙස වරිපණම් බදු ප්‍රතිශතය 1% කින් අඩු කිරීම නගර සභා අඥා පනතේ 160(3) වගන්තිය ප්‍රකාරව ගරු විෂය භාර අමාත්‍යතුමා විසින් අනුමත කිරීම යනුවෙන් සඳහන් ව තිබීම ගරු විෂය භාර අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට සංශෝධනය කළ යුතුය.**

**තීරණය**

2019 වර්ෂයේ නේවාසික ස්ථාන සඳහා 7% ක් හා වාණිජ දේපළ සඳහා 11%ක් ලෙස වරිපණම් බදු ප්‍රතිශතය 1%කින් අඩු කිරීම නගර සභා අඥා පනතේ 160(3) වගන්තිය ප්‍රකාරව ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**01.03 2019.01.08 දින පැවති සභාවේ තීරණ අංක 08.19 යටතේ ඇති අම්බලන්ගොඩ නගර සභාවේ රණසූරිය පාරේ පෙට්ටි බොක්කු ඉදිකිරීම සඳහා පෝරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතියට රු.1071994.95 ක මුදලක් යන්න දිස්ත්‍රික් ඉංජිනේරු මහතාගේ අනුමැතියෙන් පසුව ගෙවීම සුදුසු බවට සංශෝධන විය යුතුය.**

**තීරණය**

2019.01.08 දින පැවති සභාවේ තීරණ අංක 08.19 යටතේ ඇති අම්බලන්ගොඩ නගර සභාවේ රණසූරිය පාරේ පෙට්ටි බොක්කු ඉදිකිරීම සඳහා පෝරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතියට රු.1071994.95 ක මුදලක් දිස්ත්‍රික් ඉංජිනේරු මහතාගේ අනුමැතියෙන් පසුව ගෙවීම ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදි.

- ප.ව.2.20 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා , ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම් ලසන්ත අජිත් කුමාර මහතා ගරු නගර සභා මන්ත්‍රී , ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. එම් ඉන්දා අයිරාංගනී මහත්මිය , ගරු නගර සභා මන්ත්‍රිනි සහ එච් ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය සභා රැස්වීම සඳහා පැමිණියහ.

(02) සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය මධ්‍යස්ථානයේ 26 වන සංවත්සර උත්සවයට කොඩි කණු 50 ක් සභා අනුමතියට යටත්ව ලබා දීමේ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය මධ්‍යස්ථානයේ 26 සංවත්සරය 2019.01.25 දිනට යෙදී තිබූ මියගිය රණවිරුවන්ගේ ඥාතින්ගේ සහභාගිත්වයෙන් සංවිධානය කර තිබූ උත්සව මාලාව සඳහා

මුදල් අයකර ගැනීමෙන් තොරව කොඩි කණු 50ක් සහා අනුමතියට යටත්ව ලබා දිම පිළිබඳව සහා අනුමතිය ලබා ගැනිමට ඉදිරිපත් කරනවා.

**තීරණය -**

කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය මධ්‍යස්ථානයේ 26 වන සංවත්සර උත්සවයට කොඩි කණු 50 ක් සහා අනුමතියට යටත්ව ලබා දීම වෙනුවෙන් සහා අනුමතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.

**03.02 කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය මධ්‍යස්ථානයේ 26 වන සංවත්සර උත්සවයටසහායෝගය දැක්විම සම්බන්ධව ස්තුතිය පුද කිරිමේ 2019.01.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය මධ්‍යස්ථානයේ 26 වන සංවත්සර උත්සවයට සහායෝගය දැක්විම සම්බන්ධයෙන් ස්තුතිය පුද කර එවන ලද ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**තීරණය -**

කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය මධ්‍යස්ථානයේ 26 වන සංවත්සර උත්සවයට මාලාව සාර්ථකර කර ගැනීම සඳහා ලබාදුන් සහයෝගයට ස්තුතිය පුද කිරිම සම්බන්ධව ඉදිරිපත් කරන ලිපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**03.03 අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මගින් 2019 වෙසක් උත්සවය නිමිත්තෙන් සංවිධානය කරනු ලබන පුණ්‍ය කටයුතු සම්බන්ධව 2019.01.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019 වර්ෂයේ වෙසක් උත්සවය නිමිත්තෙන් නගර සිමි බල ප්‍රදේශය තුල 2018 පවත්වන ලද ව්‍යාපෘතින් සඳහා දක්වන ලද සහයෝගයට ස්තුතිය පුදකර තිබු අතර 2019 වර්ෂය සඳහා ව්‍යාපෘතින ක්‍රියාත්මක කරන බව දන්වා තිබුණිමරණයට කැපවුණු ගවයින් මරණින් මුදාගෙන ඇති දැඩි කරීමට සුදුසු අයට භාරදීම.

1. මරණයට කැපවුන ගවයින් මරණින් මුදාගෙන ඇතිදැඩි කිරිමට සුදසු අයට භාරදීම.
2. ගම මස් කැමෙන් වැළකි සිටිම සඳහා පොරොන්දු පත්‍ර අත්සන් කිරීම.
3. ප්‍රදේශයේ ජනතාව ගව මස් කැමෙන් වැලකි සිටිම පිළිබඳව දැනුවත් කිරිමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

මේ සඳහා මුදල් අවශ්‍ය බැවින් 2019 දිත් 2019 මැයි මන 01 සිට මැයි 18 දක්වා අම්බලන්ගොඩ බස්නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ ඉදිරිපස ඔරලෝසු කණුව අසල පැවැත්විමට අපේක්ෂා කරන බැවින් සභාවේ අවසරය හා ආශිර්වාදය ලබා දෙනමෙන් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , දරුණු මුස්ලිම් අක්‍රමණයක් හමුවේ අම්බලනගොඩ තරුණ බෞද්ධ සංගමය ඉදිරිපත් වී අම්බලන්ගොඩ නගරයට පමණක් නොව මුළු සමස්ත ලංකාවටම ආදර්ශයක් ගෙන එනු ලබන වැඩසටහනකි මෙය. ඔවුන්ගේ මෙම ඉල්ලීම සාධරණ යයි මා සිතනවා. මරණයට කැපවුණු ගවයින් මරණින් මුදා ගැනිම ආදි විවිධ වැඩ සටහන් 15ක් යටත් වැඩසටහන් දියත් කොට ඇත. දාන , ශිල , භාවනාදියට මුල්තැන දෙමින් අප බොදු සිත්

යොමු කරවීමට මේ කරුණු ලබන වැඩ පිළිවලට ඔවුන් ඉල්ලා සිටින අපගේ බස්නැවතුම්පොළ ලබා දෙන්න. එය ඔවුන්ට මෙම කාර්ය සඳහා වටිනාම ස්ථානයයි. මේ සඳහා අපගේ සවිය ඔවුන් වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ යනු ඉතිහාසයේ සිටම හොඳ බෞද්ධ නගරයකි. අපේ මුතුන් මිත්තන්ගේ කාලයේ සිට අපි එය රැක්කා . අම්බලන්ගොඩ නගරයේ තරුණ බෞද්ධ සංගමය මෙ ගෙන යනු ලබන වැඩ සටහනට භේදයකින් තොරව වැඩ කටයුතු සාර්ථක කර ගැනිම සඳහා අවශ්‍ය කරන සියළුම දේවල් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. යෝජනා කරනවා. අපි ගියවරත් මා යෝජනා කළා මේ අයගේ ගිණුම් වාර්තා පරික්ෂා කර බලා ඒවා අධ්‍යානය කරන ලෙසට. එම ගිණුම් වාර්තා මා අධ්‍යයනය කළා. ඒ සඳහා වියදම් කළ සියළු කටයුතු මෙහි සඳහන් වී ඇත. මෙම ගිණුම් කටයුතු නිසි පරිදි සිදු වෙනවාද කියා තහවුරු කර ගන්නා ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ සඳහා පූර්ණ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගිණුම් වැය විස්තරයක් ඉදිරිපත් කර තිබෙනවා. සඳහම් සෙවණ තරංග සේවය සඳහා රු.150000/= ක්,අලංකාර විදුලි මල් ගස් සඳහා රු.400000/=ක් , ගවයින් නිදහස් කිරිමේ පිංකමට රු.300000/=,සැදැ සංගිත ප්‍රසංගය සඳහා රු.200000/=, වෙසක් කලාපයේ ප්‍රචාරක බැනර් සඳහා රු.20000/=ක් , වෙසක් බොදු සිතුවම් දැක්මට රු.200000/=,බෞද්ධ ධජ මහින් නගරය අලංකාර කිරීමට රු.10000/=, භාවනා පිරිත් පිංකමට රු.80000/=, භාවනා වැඩ සටහනට රු.60000/=, ශ්‍රී සර්වඥධාතු ප්‍රදර්ශනයට රු.15000/=, සියක් නමගේ පිංඩපාත චාරිකාවට රු.100000/=,බෞද්ධ චිත්‍රපටි ප්‍රදර්ශනයට රු.10000/=, ඇස් දන්දිමේ පොරොන්දු පත්‍ර අත්සන් කිරිමට රු.10000/=,වෙසක් කළාපය ආරම්භක ස්ථානයේ සිට අවසාන ස්ථානය දක්වා තොරණ් සඳහා රු.150000/=, වෙනත් වියදම් රු.15000/= ක් ලෙස සම්පූර්ණ වැය ඇස්තමේන්තුව1715000/= කි. ඉදිරි ඇස්තමේන්තුව.ලක්ෂ රු.1700000/= ක් එකතු කරන විට මේ කියන කාරණය සම්බන්ධව වියදම් කරනු ලබන්නේ රු.300000/= ක් පමණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගරය සියයට සියයක්ම බෞද්ධයන් වෙසෙන නගරයකි. වෙසක් සතිය තුල වැඩසටහන් රාශියක්ම පසුගිය අවුරුදු කිහිපය තුළම කරගෙන යනු ලැබුවා. මෙම නිලධාරි මණ්ඩලයේ වැඩක් කළ හැකි ප්‍රභූ පිරිසක් සිටිනවා.මා මෙය අප කණ්ඩායම් රැස්වීමේදි අපගේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කළා.එතුමාත් මේ සඳහා යන වියදම ගැන විමසා පළාත් සභා අරමුදලින් රු.100000/= මුදලක් දීමට පොරොන්දු වුණා.සියයට සියයක් බෞද්ධයන් වෙසෙන නගරයක්. අපට නොපෙනුනාට මෙය ඉතා විශාල වැඩ කොටසකි. යම් යම් ගැටළුකාරි තත්වයන් තිබේ නම් ඔබතුමා එහි සාමාජිකත්වය දරන නිසා එම නිලධාරි මණ්ඩලය ගෙන්වා සාකච්ජා කර එම තත්වය මග හරවා ගන්න.මෙම උත්සව මාලාවන් සඳහා අපිත් සහභාගි වි තිබෙනවා. එහෙම ගැටළුකාරි තත්වයක් නම් පෙනෙන්නට නැහැ. මෙම කටයුත්ත සිදු නොකරන්නේ නම් අපගේ නගරය මුකුත්ම වෙසක් මාසය සඳහා නොමැති නගරයක් බවට පත්වේ. අපි නගර සභාවක් විදියට මේ වෙසක් වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය උදවු උපකාර කළ යුතුයි.ඒ සඳහා අපගේ පූර්ණ සහාය ලබා දෙන ලෙස අප මන්ත්‍රීවරු සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.බෞද්ධයන් වශයෙනුත් නගර සභාව මඟින් ඉටුවිය යුතු යම් අවශ්‍යතාවයක් ඇත්නම් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත් යම් වැඩසටහන් සම්බන්ධයෙන් ගැටළුකාරි තත්වයන් මග හරවා ගෙන මෙම වැඩසටහන සාර්ථක කර ගැනිමට එතුමන්ලාගේ ඉල්ලීම ඉටු කරන්න. අපිත් මේ මුදල සොයා දීම සඳහා පුළුවන්තරම් කටයුතු කරනවා.මොන වැරදි තිබුණත් යම් යම් අංග තිබෙනවා එම වැරදි මග හරවා ගෙන මේ සඳහා සාකච්ජා කර මේ කටයුත්ත සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගරයේ නම බැබළවීම සඳහා වෙසක් සතිය තුල මේ තරුණ බෞද්ධ සංගමය විසින් සිදු කරනු ලබන කටයුත්ත මා ඉතා අභය කරනු ලබනවා.මෙම වැඩසටහන සිදු කරනු ලබන්නේ ගවයින් නිදහස් කිරිම උදෙසා කියා. එහෙම නොකරත් බෑ. විදුලි අලංකාරය සඳහා ප්‍රකාශ කරාම මිනිසුන් මේ සඳහා මුදල් දෙනු නොලැබේ. භාවනා වැඩ සටහනක් කිව්වාට මුදල් දෙන්නේ නැහැ. හැබැයි ගවයින් නිදහස් කරනවා කිව්වාම සෑම කෙනෙකුම අතින් මුදල් දෙනවා. මෙම තරුණ බෞද්ධ සමිතියේ වෙසක් සතියේ වැඩ සටහන් සාර්ථක කර ගැනිමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මිට වසර 10 කට පෙරද අම්බලන්ගොඩ නගරයේ මෙසේ මුදල් එකතු කර මෙම උත්සවය සමරනු ලැබුවා.මා දන්නා ආකාරයට කුඩා කාලයේ සිට අම්බලන්ගොඩ නරගයේ වෙසක් කලාපය ඉතාමත් හොඳින් පැවැතුනා.ටිකෙන් ටික යනවිට එය ඇත්වෙලා යනවා.මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා අම්බලන්ගොඩ නගරයේ මේ බෞද්ධ කම විදහා දැක්වීම සඳහා අලංකාර ලෙස විදුලි බුබුළු දල්වා , මෙවැනි වැඩ සටහනක් කිරිම සම්බන්ධයෙන් ස්තුතිය පුද කර සිටිනවා.අපගේ ගරු සංවිධායකතුමත් , ගරු මන්ත්‍රිවරුනුත් මේ සඳහා අදහස් දැක්වුවා. මෙවැනි වැඩසටහනකට අපි අත් දෙකම ඔසවා සහායෝගය ලබා දිය යුතුයි. මේ පුරවරයේ සිංහල බෞද්ධයන් වෙසෙන කලාපයකි.අප බෞද්ධයන් ලෙස මෙය හදවතින්ම සමරනු ලබයි. මෙම වෙසක් කලාපයට අවශ්‍ය අධාර උපකාර ලබා දිය යුතු යුතුයි. මේ සඳහා අවශ්‍ය කරන සියළු සහයෝගය නගර සභාවෙන් ලබා දෙන්න. මේ බස්නැවතුම්පොළේ මුදල් එකතු කිරිමෙන් තමයි මෙම වැඩ සටහන සාර්ථක වෙන්නේ. වෙන කුමන ප්‍ර දේශයට ගොස් මුදල් එකත් කළත් වැඩක් නැහැ. මෙම ස්ථානයට පැමිණෙන බොහෝ පිරිස් යම්කිසි මුදලක් පරිත්‍යාග කරනවා. මා නගර සභාවට පැමිණිමට පෙර සිටම බස්නැවතුම්පොළට ගිය අවස්ථාවල යම්කිසි මුදලක් පරිත්‍යාග කරලාමයි යන්නේ. අපි බෞද්ධයන් විදියට මේ තරුණ බෞද්ධ සංගමය කරනු ලබන කාර්යයට හදවතින්ම සුභ පතනවා. මා සියළු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මෙයට සහායෝගය දක්වා අම්බලන්ගොඩ නගරයේ වෙසක් කළාපය හොඳ සුරපුරයක් කිරීමටත් නගර සභාව විහිදා දක්වන ලෙසත් අම්බලන්ගොඩ නගරය බෞද්ධ පුරවරයක් කරන ලෙසටත් ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් සෑම වර්ෂයක් පසාම සිදු කරනු ලබන මෙම වැඩ සටහනට අපි සැමදාම සහායෝගය දක්වා තිබෙනවා. එම සංගමය විසින් ගරු සභාපතිතුමා ඇතුළු ගරු නගර සභා මන්ත්‍රීවරුන්ට සැමදාම මේ සඳහා ආරධනා කර ඇත.අම්බලන්ගොඩ කියන්නේ බෞද්ධ නගරයකි. කිසිම වෙනත් අන්‍ය ආගමික සිද්ධාස්ථාන නැති ප්‍රදේශයකි.මෙම වැඩකටයුත්ත තරුණ බෞද්ධ සංගමය මඟින් සිදු කිරිම සම්බන්ධයෙන් එම සංගමයට අපේ ස්තුතිය පුද කර සිටිනවා. මෙම කටයුත්ත මෙවර පමණක් නොව බොහෝ කලක සිට මෙය කරගෙන යනු ලබනවා. මරණයට කැපවූ ගවයකු තනිකරම නිදහස් කිරිමට නොහැකි පුද්ගලයන් සිටිනවා. අපිටත් ආසයි ගවයකු නිදහස් කිරීමට කියා සිතනා අය සිටිනවා.ඒ පුද්ගලයන් මිට දායක වීමෙන් එම පුද්ගලයන්ටත් පිනක් අත්වෙනවා. අම්බලන්ගොඩ මේ වෙසක් කලාපය පවත්වනු ලබන්නේ මේ එකතු වන මුදල් වලිනි.එහෙම නැතිව මරණයට කැපවූ ගවයකු නිදහස් කිරිමට පමණක් නෙමෙයි මේ ලැබෙන මුදල් යොදවනු ලබන්නේ වෙසක් කලාපයේ වැඩ කටයුතු සඳහාත් මෙවා යොදවනවා.මෙම වෙසක් කලාපය පැවැත්වීම පිළිබඳ අම්බලන්ගොඩ බෞද්ධයන් විදියට අප සතුටු විය යුතුයි. මෙය නගර සභාවටත් ලොකු ගෞරවයක් කිර්තියක් හිමි වෙනවා. මේ අවස්ථාව එම තරුණ බෞද්ධ සංගමයට ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනි මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි,අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මඟින් ඉටු කරනු ලබන මෙම කාර්යය අනෙක් මන්ත්‍රීවරුන් සිතනා ආකාරයටම ඉතාවිශිෂ්ඨ කාර්ය භාර්යකි. එසේම මාගේ දහම් පාසල් මේ සඳහා සක්‍රියව දායකත්වය ලබා දි ඇත අපගේ බුදු හාමුදුරුවන්ගේ තෙමඟුල සිහි කිරිම සඳහා වෙසක් කලාපය මඟින් සිදු කරනු ලබන්නේ.මේ සඳහා සිදු කරන්නාවූ සියළුම ක්‍රියා මාර්ගයන් , ගරු රාහුල මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ ආකාරයට යම් කරුණ නිවැරදි විමට ඔබතුමාගේ අවධානය යොමු වීම වැදගත් . මෙවැනි කාර්ය භාර්යක් සිදු කර ගැනිමට අවශ්‍ය

සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර ඔවුන්ගේ එම කාර්ය භාර්ය ඉටු කර කිරිම ගැන ඔවුන්ටත් සුභ පතනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින්අවසර ඉල්ලා ඇත්තේ මේ මරණයට කැපවූ ගවයින් නිදහස් කිරිම වත් , නගරය අලංකාර කිරීමවත් මේ පවත්වන උත්සවය සඳහා අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ ප්‍රචාරක කටයුතු සඳහා පමණයි. වෙන කිසිදු උපකාරයක් අපගෙන් ඉල්ලා නැත. බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ වූ වෙසක් උත්සවය , බෞද්ධයන් ගේ නගරයක් වූ අම්බලන්ගොඩ නගරයේ පැවැත්වෙන මෙම උත්සවයට පෙර ඒ සඳහා අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ සිට යම් මුදලක් මේ සඳහා ඒ පුණ්‍ය කටයුතු වලට එකතු කරයි. මාත් එම සංගමයේ සභාපතිවරයෙක් ලෙසත් කටයුතු කර තිබෙනවා. එම සංගමයට දිර්ඝ ඉතිහාසයක් තිබෙනවා.මෙම එකතු කරනු ලැබූ මුදල් වලින් විටක තරුණ බෞද්ධ සංගමය ගොඩ නගනු ලැබුවා. තුන් මහල් බෞද්ධ මන්දිරය සහිතව සියළු පහසුකම් වලින් සමන්විතයි. මෙම ගොඩනැගිල්ල ඉදිකරනු ලැබුවේ අම්බලන්ගොඩ නගර සභාව විසින් ඉඩම පවරා දුන් පසුවයි. ඔවුන් විසින් මේ එකතු කරනු ලබන මුදල් වලින් තමයි මෙම කාර්යයන් සිදු කරනු ලබන්නේ. එවැනි උදාරතර කටයුතු සිදු කරනු ලැබු ආයතනයකි අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය. ඒ සඳහා කටයුතු කරන නිලධාරින් දැඩි කැපවීමකින් , උනන්දුවකින් , භක්තිසහගතව තමයි මේ කටයුත්ත සඳහා කැප වී සිටින්නේ.විශ්‍රම ගිය නිලධාරි ආදින් සමන්විත පිරිසකගෙන් තමයි මෙම තරුණ බෞද්ධ සංගමය සැදුම් ගෙන ඇත්තේ.ඒ අය පිළිබඳව අවිශ්වාසයෙන් කතා කළ නොහැකිය. මෙවැනි පොදු වැඩවලදි යම් යම් අඩුපාඩු සිදු වෙනවා. එම සංගමය විසින් ගනු ලබන යම් යම් තිරන පිළිබඳව නගර සභාවක් විදියට අපට යම් අපහැදිලිකම් තිබිමට පුළුවන. එවැනි බෞද්ධ කටයුතු නොවන දෙයක් සිදු වෙනවා නම් මෙම තරුණ බෞද්ධ සංගමයේ නිලධාරින් කැඳවා ඒ පිළිබඳව සාකච්ජා කර විසදාගත යුතුයි. නමුත් අපි දන්නා තරමින් මෙම සංගමය අම්බලන්ගොඩ වෙසක් කලාපය සැදැවත් කිරීමට ඉතාමත් කැපවී වැඩ කටයුතු සිදු කර ඇත. අපිට අපේ වෙළඳ ව්‍යාපාරයක ධජයක් දමා ගත නොහැකි මොහොතක ඔවුන් මේ අම්බලන්ගොඩ නගරයේ විදි පුරා බෞද්ධ ධජ යොදා විදුලි බුබුළු දමා ඉතා අලංකාර කරනු ලැබේ.ඔවුන් විසින් කරනු ලබන මේ කර්තව්‍ය අපට කළ නොහැකිය. ඉතිහාසයේ ගත් කළ අම්බලන්ගොඩ නගරයේ තොරණ් 16 ක් පමණ තිබුණු නගරයකි. නමුත් අද එය එක තොරණකට දෙකකට සිමා වී ඇත. මෙම තරුණ බෞද්ධ සංගමය නිර්මාණශිලිව කරගෙන යද්දි අම්බලන්ගොඩ නගරයට උද්යෝගයක් තත්වයක් මේනිසා ලැබෙනවා.අපි මේ තරුණ බෞද්ධ සංගමය විසින් කරනු ලබන සේවාවට ගරු කරනවා. ඉමහත් ආදරයෙන් ඔවුන්ට අත් දෙකම ඔසවා ඔවුන්ට ඒ අවස්ථාව ලබා දෙනවා. වෙළඳ ව්‍යාපාරවලට බාධාවක් නොවන පරිදි ඒ සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගරයේ මෙවැනි කාර්යයක් සිදු කිරිම සම්බන්ධයෙන් තරුණ බෞද්ධ සංගමයට ස්තුති වන්ත වෙනවා. මෙවැනි කාර්යයක් ඉටු කිරිමේදි අම්බලන්ගොඩ නගර සභාව විදියට ගරු මන්ත්‍රිවරුන් විදියට අපගේ වගකීම හා යුතුකම වෙනවා මේ සඳහා සහායෝගය ලබා දිම. මා එතුමන්ලාට ප්‍රකාශ කර සිටිනවා යම් වැඩක් කරනා විට බාධා පැමිණෙන බව. නමුත් පැමිණෙන බාධා වෙස් වලාගත් අශිර්වාදයක් ලෙස සිතා මෙම වැඩ කටයුත්ත සිදු කරන ලෙස. අපගේ සංවිධායක ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සාකච්ජා කළ පසු එතුමා ද ප්‍රකාශ කර සිටියේ මෙවැනි කර්ත්‍යයක් ඉටු කිරිම පිළිබඳ ඔවුන්ට ස්තුති වන්ත වන අතර ඒ සඳහා ඔවුන්ට යම්කිසි අධාර මුදලක් ලබා දෙන බවයි. සුනාන්දාරාමේ පෙරහැර පවත්වන වන විට , අම්බලන්ගොඩ නගරයේ බෞද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කරනා විට විට එතුමාගේ ප්‍රතිපාදන වලින් මුදල් ලබා දි ඇත. එතුමා මෙම සංගමයේ වැඩ කටයුත්ත සඳහා රු .100000/= ක මුදලක් ලබා දීමට තිරණය ඇත.මේ සඳහා යම් ගැටළුකාරි තත්වයක් ඇත්නම් එය නිරාකරණය කරගෙන මෙම කටයුත්ත සාර්ථක කරගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව එම සංගමයේ ප්‍රධාන නිල තල දරන නිලධාරින් ඊයේ රාත්‍රියේ දි මා මුණ ගැසී සාකච්ජා කරනු ලැබුවා. එහිදි මා ඔවුන්ට ප්‍රකාශ කර සිටියා පසුගිය සභා වාර කිහිපයකදි අපගේ ගරු මන්ත්‍රිවරු මේ සම්බන්ධව දක්වන ලද අදහස් පිළිබඳව . ඔබතුමන්ලා දැන් ප්‍රකාශ කරන දේ නෙමේ ඊට පසුව පැමිණ පවසන්නේ. ඒ සියළු දේවල් මා ඔවුනට පැවසුවා. මෙම කටයුත්ත සඳහා පසුගිය වසර වල අපෙන් සිදුවූ සේවාවන් කිහිපයක් පිළිබඳව ඔවුන් මට පැවසුවා.නගර සභාව මඟින් මෙම තරුණ බෞද්ධ සංගමයේ භක්ති ගී තරඟ පවත්වන වේදිකාව සපයා දි ඇත. ඒ සඳහා යන වියදම පිළිබඳව සභාව විසින් එකඟතාවය ඇති කර ගත යුතුයි. මල් ගස් 130 කට ලක්ෂ හතරක වියදමක් තිබෙනවා. මෙහි ලේකම් වශයෙන් සිටින ඉදුනිල් එදිරිවික්‍රම මහතා අපගේ නගර සභාවේ වැඩ පරිපාලක නිලධාරි තුමෙක්. මා එතුමාට පැවසුවා මෙහි කපා අයින් කරන ලද පයිප්ප නගර සභාවේ ඕනෑ තරම් තිබෙනවා. ඒවා එකතු කර මල් ගස් 13 ක් සකසා ගෙන තරුණ බෞද්ධ සංගමයට පරිත්‍යාග කරන ලෙස. ඒ අයට ඇත්තේ මෙයට කම්බි ටිකක් දමා සකස් කර ගැනීමයි. මේ සඳහා වැයවන්නේ එක් වැලකට රු.600/= ක මුදලකි.එම කපා දමා ඇති බටවලින් මල්වැල් ටික සාදා තබා ගන්නත්. මෙය ඔවුන්ට ස්ථිරවම තබා ගන්නා ලෙසත් අවශ්‍ය නම් වෙනත් තැන්වලට කුලියට දිමටත් පුළුවනි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , දැන් ඔය මල්ගස් 13 මදි නේද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නෑ ගස් 130 කි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඔබතුමා කියන කතාව හරි . බල්බ් වැලක් දෙනවිට බල්බ් වැලෙම රේට්එක අයකරනවා දිනකට. එකතමයි මෙය වැඩි වීමට හේතුව. තියෙන දින ගණනට අයකරනු ලැබේ. එක ගසක බල්බ් වැල් 10 ක් විතර වැටෙනවා නම් ඒ ගණන තමයි ඔය වැඩි වෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අනවසර බෝඩ් ලෑලි කපාගෙන නගර සභාවට ගෙන එනු ලබනවා. ඒවා ගෙනා විට සමහර ඒවා වෙන්දෙසි දමනවා. සමහර ඒවා පස්වෙලාම යනවා. ඒ කපන් එන්නේ ඇත්තටම අපේ දේපලක් නෙමේ. සභාවෙන් තීරණය කර තරුණ බෞද්ධ සංගමයට දෙමු ඒ ටික. ඒ අයට ස්ථිරවම සාදාගෙන මෙය තබා ගැනීමට. මෙම සභාවේ දැන් මන්ත්‍රිවරු 21 සිටිනවා. අවශ්‍ය නම් වැලක ගණන අරගෙන දිය හැකිය. ඒ විදියට උදවු කළ හැකිය. වෙනදා මාස දෙක තුනක් විතර මෙම මුදල් එකතු කරනු ලැබුවා.මෙවර ඔවුන් ඉල්ලා සිටින්නේ මැයි 01 සිට සති දෙකක පමණ කාලයක තමයි මුදල් එකතු කරනු ලබන්නේ දින 18 ක පමණකි.මේ සියළු මන්ත්‍රිවරුන්ට වඩා මා එහි අසල් වැසියෙකි. ඒ දිනවලට අපේ දරුවන්ට පාඩම් කිරීමට ඇත්තටම බෑ. ශබ්දය කණ් පැලෙන තරම්. එම නිසා ශබ්ද පරිපාලනය ඉතා අඩු මට්ටමකින් සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා. මෙහි අපේ එක් දිනක් ගරු මන්ත්‍රිවරුයෙකු ප්‍රකාශ කර සිටියේ සංගමය තරුණ බෞද්ධ වුවාට එහි සිටින පිරිස වයස නිසා ශබ්දය වැඩි කරන බවයි. මේ පිරිස නැති වූ විට මොවුන් මෙසේ පවසනවා. එහෙත් එවැනි කතා අද දිනයේ පැමිණියේ නැත. මීට ඉහත දි අපි මේ සඳහා භක්ති ගීත තරඟවලිය සඳහා වේදිකාවත් ශබ්ද විකාශන යන්ත්‍රත් ලබා දිමෙන් මේ සඳහා යන වියදම අඩුකර ගත හැකිය. ඔබ සියළු දෙනාම මේ සඳහා එකඟතාවය පල කර ඇති නිසා අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයට මේ කාර්ය කර ගැනීමට අනුමතිය ලබා දෙනවා.

තීරණය -

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මඟින් 2019 වෙසක් උත්සවය නිමිත්තෙන් සංවිධානය කරනු උත්සව මාලාවේ ප්‍රචාරාත්මක වැඩසටහන් සඳහා 2019 මැයි මස 01 සිට මැයි මස 18 දක්වා අම්බලන්ගොඩ බස්නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ ඉදිරිපස ඔරලෝසු කණුව අසල ලබා දීමටත්, නගර සභාව තුළ පවතින ඉවත්කරන ලද බටවලින් විදුලි මල් ගස් සැකසීමට ලබා ගන්නා ලෙසත් ශබ්ද විකාශන යන්ත්‍ර සපයා දීමත් ,සැදැහැ

ගීත ප්‍රසංගය සඳහා වේදිකාවත් ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.04 අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උස් ජල ටැංකියක් ඉදිකිරිම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගාල්ල නියෝජ්‍ය සාමාන්‍යධිකාරි විසින් 2019.01.23 දිනැති ලිපිය ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

උක්ත ලිපියේ ඕකන්ද ප්‍රදේශයේ උස්බිම්වල ක්ෂේත්‍ර පරික්ෂයක් සිදු කර බවත් එම ප්‍රදේශයේ නිවාස 15 ක් පිහිටා ඇති බවත් දැනට එම නිවාස සඳහා දිනකට පැය 05 ක කාලයක් ජලය ලබා දෙන බවත් බිම් මට්ටම සඳහා ප්‍රමාණවත් පීඩනයක් යටතේ ජලය ලැබෙන බවත් උස්බිම වල තිබෙන නිවාස සඳහා ජල සැපයුම් පීඩනය වැඩිකල නොහැකි බවත් ජලය සපයන පැය ගණන ද වැඩිකල නොහැකි බව දන්වා තිබුණි. එබැවින් එම නිවාස හිමියන් විසින් බිම් මට්ටමෙන් ජල ගබඩා ජල ගබඩා ටැංකිටයක් පවත්වාගෙන යාම සුදුසු බව හා බිම් මහල් වල සිට උස් මහල් දක්වා ජලය ලබා ගැනිමට අවශ්‍ය නම් ඒ සඳහා නිවාස හිමියන් පෞද්ගලිකව ක්‍රමවේදයක් සකස් කරගත යුතු බව, දකුණ, නියෝජ්‍ය ප්‍රාදේශිය සේවා මධ්‍යස්ථානයේ , සාමාන්‍යාධිකාරි මඟින් දැනුම් දි තිබුනි.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපි සිටින්නේ ඔය උසම ස්ථානයේ. ඇත්තටම අපට කනගාටුයි. එතුමා එය කාරණය පැවසිමට අවශ්‍ය නැහැ. සැමදෙනාම සිදු කර ඇත්තේ ඔය විදියට තමයි. දැන් ඒ විදියට ක්‍රියාත්මක කරත් උඩට ජලයඑන්නේ නැහැ.මොකද මෙසේ ජලයඑන්නේ නැත්තේ ධාරිතාව ඇති ප්‍රමාණයට වඩා ජල සැපයුම දි තිබිමයි. ඔවුන් නියම කර තිබු ප්‍රමාණයට වඩා ප්‍රබලයෙකුගේ බලපෑමක් පැමිණි විට ජල සැපයුම දෙනවා.අපි කටවත් ජලය සැපයුම දෙන්න එපා කියන්නේ නැහැ. මේ සඳහා තව ජල ටැංකියක් ඉදිකර තමයි ජල සැපයුම දිය යුත්තේ. එය තමයි සිදු විය යුත්තේ. නැතිනම් කලින් ජල සැපයුම හොඳින් පැමිණියා.මේ ළඟකදී තමයි ඔය ප්‍රශ්නය පැමිණියේ. කාමර 500 කටත් ජල සැපයුම දී ඇති නිසා. මෙවැනි ව්‍යාපාර ස්ථාන වලට කොහොමහරි ජල සැපයුම දෙනවා. අඩි 16 මට්ටමට පැමිණියොත් තමයි ඕකන්ද ප්‍රදේශයට ජල සැපයුම දෙනු ලබන්නේ. මේ සඳහා ජල සැපයුම් වේගය වැඩි කර මෙය ලබා දෙන්න.ඔය නිලධාරින් පැමිණි පසු මා තේරුම් කර දුන්නා ඔබතුමලා දෙන සැපයුම වැඩි නිසා තමයි මෙම ප්‍රශ්නය උද්ගත වි ඇත්තේ. කලින් මේ සේවාව අලුත් කරාම සැපයුම කොපමණ ප්‍රමාණයකට දිය හැකිද කියා අපි ඒ දිනවල විමසා සිටියා. ඒ අය නිසි පිළිතුරක් ලබා දුන්නේ නැහැ. ඒ දුන්නේ නැත්තේ කපටිකම නිසාය.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නෑ බලපිටියේ සැපයුම වෙනම කඩා ඇත. අපගේ ටැංකියෙන් යන්නේ නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නෑ එකම ටැංකියේ ජලය . සැපයුම් ධාරිතාව වැඩිකර තමයි යවන්නේ. එවැනි ක්‍රමයක් තමයි දැන් අපි කියන්නෙත්.එ අය කියන නිවෙස් 15 ට පමණක් නෙමෙයි අනෙක් තැන්වලටත් උස්බිම ඇති ස්ථානවලටත් මේ තත්තවය ඇතිවේ. නිවාස 40 කට විතර ජල සැපයුම ලැබෙන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිතුමා, මේ නිවාස 15 ම මේ විදියට බිම මට්ටමින් ටැංකි සකස් කර තිබෙනවාද?

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් අපගේ නිවෙස්වලට ඉහළින් නිවාස වලින් බොහෝ නිවෙස් වල මෙසේ සිදු කර ඇත. එම ටැංකිවලට ජලය පිරිම ආරම්භ වන්නෙත් රාත්‍රි 12.00 ට පමණ යි.ඒ ජලය පිරිම සිදු වන්නේ පැය 2කට ආසන්න කාලයක් තුල පමණි

. ජල ටැංකියේ ධාරිතාව අඩු වී විට අපගේ ටැංකි වලට ජලය පිරේන්නේ අඩු ප්‍රමාණයකි. මූලිකම හේතුව වී ඇත්තේ නව ජල සම්පාදන ලබා දීමේ ප්‍රශ්නයයි. ජල සම්පාදන මණ්ඩලයට කළ යුත්තේ නව ජල ටැංකියක් ඉදිකර සැපයුම් ලබා දීමයි. ඔබතුමා මෙය යෝජනා කිරිමෙන් හෝ සාකච්ඡා කර හෝ මෙය ඉටු කර දෙන්න. අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙනුත් ඉල්ලා සහායෝගයක් ලබා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.එම්.ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඕකන්ද කියන්නේ අපගේ ගම අප පදිංචි වී සිටින ස්ථාන. නිවෙස්වල සිටිම බැරි තත්වයක් තමයි උදා වී ඇත්තේ. අපි නිවෙස්වලට පැමිණියත් ඉන්නේ නැහැ. රට හෝ නැවත යනවා. අපට අවශ්‍ය දෛනික කටයුතු වලට ජලය නැහැ.මෙය ලොකු ප්‍රශ්නයකි. ඇත්තටම අපිම හිනා වෙන්න ඕන අම්බලන්ගොඩ නගරයේ ජීවත්වන අපට එවැනි ගැටලු තිබිම පිළිබඳව. ඕකන්දේ සමහර අය ටැංකි භූමි මට්ටමින් පහළ සවිකර තිබුණාට මගේ නිවසට නම් මෙය සිදු කර නැහැ. මේ සඳහා වෙනත් උප සැපයුම් ටැංකියක් ඉදිකර හෝ ජල සැපයුම ලබා දිය යුතුයි. ඔබතුමා නගරයේ ප්‍රධානම පුරවැසියා. එම නිසා ඔබතුමා මෙය කරට ගෙන කළ යුතුයි. ඔබතුමාගේ ප්‍රදේශයක සිටින ගම්වැසියන් නගර වැසියන්මේ වගේ දුක් විඳිනා කිව්වාම අපි ඇත්තටම කනගාටු විය යුතුයි. අපගේ ප්‍රධාන සංවිධායකතුමා ජල ව්‍යාපෘතියක් ආරම්භ කළා ඉදිකැටිය ප්‍රදේශයේ. එය ඉතා සාර්ථකව ඉටු කර ඇත.ඕකන්ද කියන්නේ අම්බලන්ගොඩ ඇති උසම ස්ථානයයි. මේ සඳහා උප ජල ටැංකියක් ඉදිකර හෝ මෙම ප්‍රශ්නය විසඳාගත යුතුයි. මේ ප්‍රශ්නය නිවාස 40 කට පමණ බලපා ඇත. මොවුන් නිවෙස් 15 ක් පමණ කිව්වාට. නිවෙස්වලට ජලය හම්බ වෙන්නේම නැහැ. පොඩි දරුවන් රාත්‍රියට නිදිවර්ජිතව පොල් කටුවලින් ජලය පුරවනවා සේ පොඩි පොඩි බැරල් වලට පුරවනවා. එම නිසා මෙම ප්‍රශ්නය විසඳා දෙන්න. ගම්වැසියන් , නගර වැසියන් සතුටින් සිටිම තමයි අපි බලාපොරෝත්තු වෙන්නේ. ජල සම්පාදන මණ්ඩලයෙන් මෙසේ පැවසුවාට ඔබතුමා ඔවුන්ගෙන් ඉල්ලිමක් කරන්න මේ සඳහා උප ටැංකියක් ඉදිකර ජල සැපයුම ලබා දෙන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගරය වියළි කලාපයක් බවට පත් වී ඇති බව අපට පෙනෙනවා. අපේ නගරයේ ඕකන්ද ජනතාව සා පිපාසාවෙන් පෙළෙන මේ මොහොතේ අපි මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේච්චර දියුණු තාක්ෂණය දියුණු ලෝකයේ මේ ජලය ගෙනයාමට ක්‍රමයක් නොමැතිද ? අපගේ ගරු රාහුල මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින අකාරයට මේ සඳහා නිසි පිළිතුරක් දි නොමැති අතර ඇඟ බේරා ගැනීමට කටයුතු කර ඇති බවයි. මීට වඩා සාර්ථක පිළිතුරක් බලාපොරෝත්තුවෙන් යම් දෙයක් මේ සඳහා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ සඳහා හොඳම ක්‍රමවේදය වන්නේ ඔය ප්‍රධාන නිලධාරින් කිහිපදෙනෙකු සමඟ සාකච්ඡාවක් පැවැත්විමට කටයුතු සිදු කරන්න. මේ සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ගැනීමට අවශ්‍ය සහාය අපි ලබා දෙන්නම්. මෙයට නිසි ක්‍රමවේදයක් තිබිය යුතුයි. ඔවුන් පැමිණෙන විට කිසිම දැනුම් දිමක් නොමැතිව පැමිණෙනවා. එසේ පැමිණ එක එක පුද්ගලයන්ගෙන් විමසනවා. එසේ විමසන පුද්ගලයන් දන්නෙත් නැහැ මේ පිළිබඳව. මේ සඳහා සාකච්ඡාවක් කැඳවන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.එම්.ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මීට ඉහත එවා තිබුණේ. මේ සඳහා ඇස්තමේන්තු එවනා බවයි. දැන් ඇස්තමේන්තුව පැත්තකට විසි කර දමා ජල සැපයුම දෙන්න බැහැ කියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මෙම ජල සැපයුම නොලැබිම මටත් බලපාන ගැටළුවකි. ජල සම්පාදනය ලබා දීමේ සෑම පුද්ගලයෙකුම මේ සඳහා අවශ්‍ය අයදුම්පත්‍ර පුරවා, ගිවිසුම් අත්සන් කර තමයි මෙම ජල සැපයුම ලබා දෙන්නේ. එවිට ජල සම්පාදනයට වගකිමක් තිබෙනවා මේ සෑම පුද්ගලයෙකුටම නිසියාකාරව ජල සැපයුම සැපයීම පිළිබඳව. මෙවැනි ලිපියක් එවා

ඔවුන්ට ඇඟබේරා ගැනිමට නොහැකිය.ඔවුන් නිතියෙන් වගකිමෙන් බැඳි සිටිනවා සෑම පුද්ගලයෙකුටම ජල සැපයුම ලබා දීමට.මේ සඳහා අපට ජල සම්පාදන මණ්ඩලයට බලපෑමක් කළ හැකි නම් ඒ සඳහා ජල සම්පාදන මණ්ඩලයට බලපෑමක් කරනා ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව අපි ජලසම්පාදන මණ්ඩලයට බලපෑම් කිරිමක් තමයි සිදු කර ඇත්තේ. මෙය දැන් බොහෝදුරක් ගිහින් තිබෙනවා. මේ පිළිබඳව ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මහතා නම් මේ පිළිබඳව දන්නවා. දේශපාලන තල්ලුවක් අවශ්‍ය බව මණ්ඩලය තුල තිබෙනවා. ගරු සභාවෙන් , ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්, ගරු එක්සත් ජාතික පක්ෂය මඟින් , ඔබතුමාලා මඟින් දේශපාලන තල්ලුවක් අවශ්‍ය බව. මණ්ඩලය මඟින් මේ සඳහා ඇස්තමේන්තු පවා සාදා තිබෙනවා. ඒ සඳහා තල්ලුවක් අවශ්‍ය බවයි කියන්නේ. මා සුදානම් කරන්නම් සාකච්ජාවක් අපේ ගරු මන්ත්‍රිතුමන්ලා සහ එම නිලධාරින් සමඟ සාකච්ජාවක් මේ පිළිබඳව ඇති ගැටළු සාකච්ජා කිරිමට. මිට කලින් මා ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතාටත් ප්‍රකාශ කර සිටියා . එය එච්චරම ක්‍රියාත්මක වුණේ නැහැ. සභාවක් වශයෙන් අපට කළ හැකි ක්‍රම කිහිපයක් තිබෙනවා. ඔය ජල ටැංකි ලබා දෙන්න තිබුණා. සභාව සතුව ජල බවුසරය තිබෙනවා. සභාව අවසර දෙනවා නම් එක බවුසරයක් දී ඔය ටැංකිවලට ජලය ලබා දෙන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔය අපි කලින් කලානේ. ජල සම්පාදනයෙන් ජලය ලබා ගෙන ජලය බෙදා දිමට යාමේදි මිනි මරාගන්න හදනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙම බෑ. ජනතාවට දිය හැකි සහානය එයයි.වියදම සභාව දරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඔය යනවිදියට යන්න දෙන්න. ඔය ප්‍රශ්නය විසඳන්න ගියහොත් පොලිසියක් දමන්න වෙනවා. පලමුව අපි සාකච්ජාව පවත්වා අපගේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහායෝගයත් ගෙන , පාලන තන්ත්‍රයේ සිටින ගරු එක්සත් ජාතික පක්ෂ සංවිධායකතුමාගේ සහායත් ලබාගෙන , අපේ දිස්ත්‍රික් සංවිධායකතුමිය සිටිනවා. ඒ සහායත් ලබා ගෙන මේ සඳහා කටයුතු යොදන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දෙවැනි යෝජනව තමයි පහළ ඇති ළිඳ නැවත සකස් කර උඩට පායිප්ප දමා බිමට නැතිව නෑම සඳහා පමණක් වතුර මල් ටිකක් සවි කර දෙනවා. ගරු නගර සභා මන්ත්‍රි ඉන්දා අයිරාංගනි මහත්මියට නෑමටවත් ජලය නැ කිව්වානේ. මේ සඳහා සභාවේ මුදල් වලින් මෙය ඉදිකර දෙන්නම්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඇත්තටම විශේෂම කරුණ නම් අපි කනගාටුවෙනවා මෙවැනි තත්වයක් පිළිබඳව. මේ ඕකන්දේ ජල ප්‍රශ්නය ගැන සභා වාර කිහිපයකම සකච්ජා වෙනවා . අම්බලන්ගොඩින් උප ටැංකියක් ඉදිකර බෙන්තරට යනකම් ජල සැපයුම ලබා දි ඇත. එම සැපයුමෙන් ඕකන්ද ප්‍රදේශයට ජලය ලබා දෙන්න බැරිද? ඒ සඳහා අවශ්‍ය ධාරිතාවය වැඩි යන්ත්‍ර සවිකර තිබෙනවා. එක සැපයුමකින් ලබා දෙන්න කියන්න. මිටර් 200 ක් 300 ක ප්‍රමාණයක් යන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව ගරු මන්ත්‍රිවරුන්ට මා පවසන්න ඕනැ. මේ දෙකට කඩන වැඩේ කරන්න මුලික වුයේ මම. එයට හේතු වුයේ අම්බලන්ගොඩින් මුළින්ම ටැංකිය පිරුණුවිට පහතම ස්ථානය ඇත්තේ කොස්ගොඩයි. එකපාරට

කොස්ගොඩට ජලය යනවාතප්පර පහක් යන්න කලින් අඩි හතරක් පහළට වැටෙනවා. එකපාරට අපි ටැංකිය පුරවා වැසුවොත් අම්බලන්ගොඩ ජනතාවට පැය 2කට වත් ජලය ලැබෙන්නේ නැහැ. කොස්ගොඩ ප්‍රදේශයට ජලය ගලා ගෙන යනවා. මෙය අසාධාරණයි. එම නිසා ජලය අඩුවෙමින් අඩුවෙමින් යනවා. දැන් එහෙම නෙමේ ධාරිතාව අඩු මට්ටමක තියෙන්නේ. ඒ නිසා මා ඉල්ලීමක් කළා . මෙය සුනාමියට ලැබුණු කෝටි 6000/= ක පමණ ව්‍යාපෘතියක් අපට ලැබුණ. එය පැමිණි වේලාවේ මා පවසා සිටියා බලපිටිය ප්‍රදේශයේ ජල සැපයුම දෙකට කඩන ලෙස. අර ගලෙන් එහාට වතුර යන්නේ නැහැ. ගිංගඟේන් ලබාදෙන සැපයුම කැඩුණොත් මේ වතුර ටැංකියේ වතුර නිමවනතුරු අම්බලන්ගොඩ නගරයේ ජනතාවට ජලය තිබෙනවා. නමුත් අර පැත්තට වතුර නැති වෙනවා.ඒ විදියට කඩනු ලැබුවේ ඒ නිසායි. වෙන හේතුවක් නෙමෙ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ප්‍රශ්නයක් නෙමේ. මෙය අම්බලන්ගොඩට ගෙන එනු ලැබුවේ අම්බලන්ගොඩ ජනතාවට ජලය ලබා දෙන්න. එහෙත් දැන් එම ජනතාවට ජලය නැහැ. මෑත කාලයක් යනතුරු තල්ගස්ගොඩට වතුර තිබුණෙත් නැහැ.විශාල අරගලයක් කිරිමෙන් පසු තමයි තලගස්ගොඩ ප්‍රදේශයට ජලය ලබා ගත්තේ. ජල සම්පාදන මණ්ඩලය සමඟ අරගල කරන්නේ නැතිව ජලය ලබා ගැනීමට නොහැකියි.මෙහෙන් බෙන්තරට වනකම් ජල සැපයුම දෙන්න පුළුවන්නම්. එක සැපයුමක ධාරිතාව වැඩිකර ජල සැපයුම ලබා දෙන්න කියන්න. මේ සඳහා එම අවශ්‍ය යන්ත්‍ර එහි සවි කර ඇත. ඒ අඟල් 3 ක නළ පද්ධතියක් සකසා කෙරමිණියෙන් ඕකන්දට අළුතින් එක සැපයුමක ධාරිතාව වැඩි කර ජලසැපයුම ලබා දෙන්න. එවිට ප්‍රශ්නය ඉවරයි. ඔබතුමා එම යෝජනාව ගෙනවිත් ක්‍රියාත්මක කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙවැනි කරුණු සාකච්ඡා කිරිමට තමයි අපි මන්ත්‍රිවරුන් විදියට සම්බන්ධිකරණ රැස්වීමට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහභාගි වුයේ. දැන් ගරු මන්ත්‍රිවරුන්ට ඒ අවස්ථාව මගහැරි ඇත.එතැනට ජලසම්පාදන මණ්ඩලයේ ඉංජිනේරුවරයා සහභාගි වෙනවා. අපිට කෙලින්ම ප්‍රශ්න කිරිමට තිබුණා. එයට අපිට ඊළඟ මාසයේ පිළිතුරක් ගන්න තිබුණා.අර ගරු උප සභාපතිතුමා පැවසු ආකාරයට අපි ලැජ්ජා විය යුතුයි. අම්බලන්ගොඩ නගරයේ එක කොටසකට විතරක් , එක පිරිසකට විතරක් ජලය නැහැ. අනික් සියළු දෙනාටම ජලය තිබෙනවා. එම නිසා මෙම අයට එය දැවෙන ප්‍රශ්නයකි.ජල ටැංකිය ඉදිකර ඇති ස්ථානයට යාබදම ගම. ප්‍රායෝගිකව ගැටළු ඇති. මෙය ලංකාවේ පලමු ප්‍රශ්නය නෙමෙයිනේ. ජල සැපයුම් ලබා දෙන , ජල බිල්පත් නිකුත් කරන මෙතරම් දේවල් සිදුකරන ජල සම්පාදන මණ්ඩලයට මෙය එතරම් ගැටළුවක් නෙමේ. මෙය නිදහසට කරුණක් මිසක් පිළිතුරක් නෙමේ මෙය අම්බලන්ගොඩ ජනතාවගේ එක කොටසකි.ජලය නොමැතිව පිඩා විඳින අවස්ථාවක අපගෙන් ලබා දිය හැකි උපරිම දායකත්වය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි මේ සම්බන්ධයෙන් නිලධාරින් ගෙන්වා සාකච්ජා පැවැත්විමට කටයුතු සිදු කරනවා. ගෝනපිනුවල ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් මීට වඩා ජලය අඩුවෙනවා. ගෝනපිනුවලටත් යන්නේ මෙම ඉදිකරනු ලැබු ටැංකියෙනි. දැන් එම ජල ව්‍යාපෘතිය දැනට අසාර්ථක වී ඇත. එම කාමර 500 ට දෙන්නේ කෙරමිණිය ජල ටැංකිය මගිනි. එය රජයෙන් ගනු ලබන තිරණ තින්දු.

**තීරණය -**

අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උස් ජල ටැංකියක් ඉදිකිරිම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරින් හා ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රිවරුන් සමඟ සාකච්ජාවක් පැවැත්විම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- ✓ පස්වරු 3.00 ට මිළ ගණන් විවෘත කරන ලදී.

**03.05 අම්බලන්ගොඩ සි. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් වෙසක් තොරණ පිළිබඳව දැනුවත් කිරිම සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීම් සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019 අම්ලන්ගොඩ 26 වෙනි වරටත් පවත්වන වෙසක් තොරණ සඳහා දැන්වීම් ප්‍රදර්ශනය සඳහා අවසර ඉල්ලමින් හා මෙම තොරණ පිළිබඳව දැනුවත් කිරිම සඳහා කටවුට් කිහිපයක් අම්බලන්ගොඩ බස් නැවතුම්පොල , වෙළඳ පොල , තනායම ඉදිරිපිට හා නේශන්ට්‍රස්ට් බැංකුව ඉදිරිපිට යන ස්ථානවල නොමිලේ ප්‍රදර්ශනය කරන ලෙස සි. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් අවසර ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මා පොඩි ඉල්ලිමක් කරනවා. මෙම තොරණේ සැණකෙළියක් තිබෙනවා නේද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නෑ එ ාහම දෙයක් ඉල්ලා නැත. දැනට එහෙම දෙයක් ඉල්ලා නැත.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙම සැණකෙළිය පවත්වනවානම් ගාස්තු අඩු කරන්න කියන්න. ගියවර මෙම සැණකෙළිය සඳහා අයකරනු ලබන ගාස්තු වැඩිය. ගියවර මුදල් අයකිරිමේදි රු.200/= ක පමණ මුදලක් අයකරනු ලැබුවා

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

බිල් කරනු ලබන සැණකෙළියක මුදල් අයකිරිමේ බලය ඇත්තේ අපි ළඟ නෙමේ. ඒ අය ළඟයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නෑ අපි මේ සඳහා විනෝද බදු අය කරනවානේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගියවර විනෝද බදුත් අඩුකර තමයි මෙය ලබා දුන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නෑ එක නෙමේ කියන්නේ. එය පාරිභෝගිකයාට ලබා දෙන්න. රු.100 කට වගේ නම් ගන්න තියෙනවානම් හොඳයි. මොකද එක පවුලක 4කු සිටිනම් රු 800/= ක් ගෙවීමට වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එම නිසා තමයි අපි ලෝක ළමා දිනය කරනු ලබන්නේ. ඇති තරම් විනෝද වන්නට

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එහෙම දෙයක් පැමිණියොත් ගාස්තු අඩු කරන්න.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

හොඳයි මා එවැනි දෙයක් පැමිණියොත් බලන්නම්.

**තීරණය -**

අම්බලන්ගොඩ සි. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් වෙසක් තොරණ පිළිබඳව දැනුවත් කිරිම සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු නොමිලේ ප්‍රදර්ශනය කිරිමට හා බස්නැවතුම්පළ ඇතුළත ප්‍රදර්ශනය කිරීමට අවසර නොදිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.06 අම්බලන්ගොඩ වනත් ගුණරත්න මහතා විසින් වනත් ගුණරත්න කලායතනය මගින් ඉදිරිපත් කරන රත්න වල්ලි නර්තන ප්‍රසංගයේ ප්‍රචාරක කටයුතු සඳහා බැනර් 02 ක් ප්‍රදර්ශනය කිරිම සම්බන්ධ 2019.01.24 ලිපිය සභා ගත කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

වනත් ගුණරත්න කලායතනය මගින් ඉදිරිපත් කරනු ලබන රත්න වල්ලි නර්තන ප්‍රසංගයෙහි ප්‍රචාරක කටයුතු සඳහා බැනර් 02 ක් ප්‍රදර්ශනය කිරිමට සහනදායි පදනම මත අවසර ලබා දෙන ලෙස ඉල්ලා ඇත. වනත් ගුණරත්න කියන්නේ කුලරත්න විද්‍යාලයේ නර්තන ආචාර්ය වරයා. ඔහු සැම දිනකම නගර සභාවේ තිබෙන උත්සව සඳහා මුදල් අයකිරිමකින් තොරව නර්තන කණ්ඩායම් ලබා දෙනවා.ඒ ගැන සලකා බලා මෙම ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ වනත් ගුණරත්න මහතා විසින් වනත් ගුණරත්න කලායතනය මගින් ඉදිරිපත් කරන රත්න වල්ලි නර්තන ප්‍රසංගයේ ප්‍රචාරක කටයුතු සඳහා බැනර් 02 ක් නොමිලේ ප්‍රදර්ශනය කිරිම සඳහා අවසර ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.07 අම්බලන්ගොඩ සමෘද්ධි ප්‍රජා මුල බැංකුව මඟින් සැම වර්ෂයකම පවත්වනු ලබන අවුරුදු උත්සවය 2019.04.21 ඉරු දින පියසේන ක්‍රීඩාංගනය නොමිලේ වෙන්කර ලබා ගැනිම සඳහා 2019.01.21 වන දිනැති ලිපිය සභාගත කරන ලදි.**

ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ සමෘද්ධි ප්‍රජා මුල බැංකුව මඟින් සැම වර්ෂයකම පවත්වනු ලබන අවුරුදු උත්සවය 2019.04.21 ඉරු දින පියසේන ක්‍රීඩාංගනය නොමිලේ වෙන්කර දෙන ලෙස කළමණාකරු, සමෘද්ධි ප්‍රජාමුල බැංකුව මඟින් ඉල්ලිමක් කර ඇත.මෙය පෝය දිනයක් නොවන්නේ නම් මෙය ලබා දෙන්න.

**තීරණය -**

අම්බලන්ගොඩ සමෘද්ධි ප්‍රජා මුල බැංකුව මඟින් 2019.04.21 ඉරු දින පවත්වනු ලබන අවුරුදු උත්සවය වෙනුවෙන් පියසේන ක්‍රීඩාංගනය නොමිලේ ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.08 අම්බලන්ගොඩ දළුක්කන්ද ටි.එච්.ඩබ්. නිවාස හි කේ.ජී. සමන්ති මහත්මිය විසින් කඩ කාමරයක් ලබා ගැනිම සම්බන්ධව එවන ලද ලිපිය සභාගත කිරීම.**

<u>ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඉහත නම හා ලිපිනයේ පදිංචි මාහට අම්බලන්ගොඩ දළුක්කන්ද ටි.එච්.ඩබ්. නිවාස ව්‍යාපෘතියේ හිස්ව ඇති කඩ කාමරය මා හට ලබා දෙන මෙන් ඉල්ලිමක් කරනවා. තවද එම කඩ කාමරයේ කලින් පදිංචිව සිටි අය විදුලිය හා ජල බිල්පත් වල හිඟ මුදල් ගෙවා නොමැති බැවින් එහි ඇති හිඟ මුදල් මා ගෙවිමට කැමති බැවින් එම කඩ කාමරයට අයිති ජලය හා විදුලිය ලබා ගැනිමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගිවිසුම්ගතවී මෙම කඩ කාමරය ලබා දෙන්න.

<u>ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගිවිසුම්ගතවි මෙම කඩ කාමරය ලබා දෙන්න. මෙහි විදුලිය නෑ. ජලය නෑ. දොරවල් නෑ. ජනෙල් උළුවහු නැහැ. අන්තිමට කුඩු කාරයික් විසින් මෙවා ගලවගෙන යනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ දළුක්කන්ද ටි.එච්.ඩබ්. නිවාස ව්‍යාපෘතියේ කඩ කාමර අංක 02 දරණ කඩ කාමරය කේ.ජී. සමන්ති මහත්මියට ගිවිසුම් ගත වි එය මාසික බදු කුලිය මත ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.09 ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතාගේ සංකල්පයට අනුව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය හා අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරන වැඩිහිටි බක්මහ උළෙල 2019 මාර්තු මස 27 වන දින පියසේන ළමා ක්‍රිඩාංගණය වෙන්කරදීම සහා අනුමතියට යටත්ව ලබා ගැනිම සම්බන්ධ ල2019.01.17 වන දිනැති ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතාගේ සංකල්පයට අනුව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය හා අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව පස්වෙනි වරටත් සංවිධානය කරනු ලබන වැඩිහිටි බක්මහ සුහද හමුව මෙම වසරේද පැවැත්විමට කටයුතු සංවිධානය කෙරෙමින් පවති. ඒ වෙනුවෙන් ඉකුත් වර්ෂවල ඔබතුමිය ඇතුළු කාර්ය මණ්ඩලය දැක්වු සහයෝගය ස්තුති පූර්වකව සිහිපත් කරනවා.මෙම වසරේ වැඩිහිටි බක් මහ උළෙල 2019 මාර්තු මස 28 වන දින ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විමට අපේක්ෂා කරන බැවින් 2019 මාර්තු මස 27 වන දින හා 28 බ්‍රහස්පතින්දා යන දෙදින අම්බලන්ගොඩ පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගණය වෙන්කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ක්‍රිඩාංගනය වෙන් කර දිම සඳහා යම් ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ නම් අපවෙත දැනුම් දෙන ලෙස ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් ඩබ්.එච්. දයාපාල මහතා විසින් ලිපියක් එවා ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ වැඩිහිටියන් සතුටු වෙන මෙවැනි දිනයක ඔවුන්ට තරඟ සඳහා සහභාගි වී සිත් පුරා සතුටට ලබා දී ඒ වෙනුවෙන් දෝතපුරා තෑගිත් ලබා දීම පිළිබඳවත් මෙවැනි දෙයක් ඉටු කිරිම ගැන අප සතුටු වෙනවා. මෙය නොමිලේම ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඉල්ලා සිටිනවා ගරු ප්‍රධාන අමාත්‍ය කාර්යාලයෙන් ඉල්ලා සිටින මෙම මාර්තු මස 27 සහ 28 දින 2ක එම ක්‍රිඩාංගනයත් පුටු හා ටෙන්ට් ටිකත් ලබා දෙන ලෙසත්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපට බොහෝ උපකාර කරනවා. මා හිතන්නේ අද දිනයේ ලක්ෂ එකසිය පනහක මුදලක් නගර සභා ගිණුමට වැටි ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අද දිනයේ උදේ අපට ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ජාවක් පැවතුනා. ඊයේ දිනයේ වන විට ගැටළු සම්බන්ධව දන්වන්න කියා ලිපියක් එවා තිබුණා. එහි සිටි සහාකාර ලේකම් කෙනෙකු උදේ 10.30 ට පමණ මගෙන් විමසා සිටියා ඔබතුමා විතරක් ඇයි ගැටළු දන්වා තිබුණේ නැත්තේ කියා. ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අහන්න ඕන ප්‍රශ්නයත් ඒ සඳහා එතුමා දෙන පිළිතුරත් දන්නවා . මා ඕනනම් ඒ දෙකම කියලා දන්නම් කියා. ඒ කියලා උදේ 11.30 වන විට ගිණුමට මුදල් වැටි තිබුණා. අපි ස්තුති වන්ත වෙනවා මෙවැනි මුදලක් ලබා දීම පිළිබඳව. අපි එතුමාගෙන් හිඟා කන්න ඕන නෑ. ඒ අම්බලන්ගොඩ ජනතාවගේ මුදල් . එවා ලබා දෙන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හිඟා කැමක් නෙමේ . ඔබතුමා අපිටත් කිව්වා මෙතැන මුදල් ලැබෙන්නේ නැහැ කිවා. අපිත් සාකච්ජා කළා. කලින් ලක්ෂ අසුවක මුදලක් එවා තිබෙනවා දැන් ලක්ෂ 150 ක් ලබා දි තිබෙනවා. ඔබතුමා සතුටු වෙන්න . ඔය කතාව කියන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ මා මුදල් ලබා දිම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එසේ නම් මෙම අවුරුදු උළෙල සඳහා ක්‍රිඩාංගනයත් ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි ගාස්තු අයකරනවාද කියා විමසා සිටිනා විට මා මෙය නොමිලේ ලබා දෙන්න තමයි නිර්දේශ කර ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. එතුමා ලක්ෂ 150 ක මුදලක් ලබා දීම පිළිබඳවත් අපි ස්තුතිවන්ත වෙනවා සියළු ගරු මන්ත්‍රිවරුන් වෙනුවෙන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය නොමිලේ ලබා දෙනවා. ගරු මන්ත්‍රිතුමන්ලා දැන ගත යුතුයි අම්බලන්ගොඩ නගරයේ තිබෙන තැගි ඔප්පු විකුණුම් බදුකරවලින් ලැබෙන මුදල් වල අයිතිය ඇත්තේ අප සභාවටයි. එවිට එම මුදල් බැර වනුයේ දකුණු පළාත් සභා ගිණුමටයි. ඉතිං එම වැටෙන මුදල් තබාගෙන කරදර කලාම තමයි ලැබෙන්නේ. හැමදාම ඔහොම තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් එහෙම සිදු වන්නේ රටේ නිතිය අනුවයි. පළාත් සභාවට ගිහින් තමයි ලැබෙන්නේ. ඒ රටේ නිතිය. අර අපේ වැඩ නොකළත් කමක් නැහැ. කොට්ඨාශයේ වැඩ ටික කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

ඔබතුමා සතුටු වෙන්න ඕන මෙම මුදල් එවිම පිළිබඳව . සභාපතිතුමා දැනගන්න ඕන ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සුහදව කටයුතු කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හැබැයි මා මෙම මුදල් එව්වේ නැහැ කියා කනගාටු වන්නේ නැහැ. මාස දෙකකින් පසු අපගේ ගරු ප්‍රධාන අමාත්‍ය කෙනෙක් පත් වුණාම ලබා ගන්නවා කියා හිතා ගත්තා. පොහොට්ටුවේ ප්‍රධාන අමාත්‍ය කෙනෙකු පත් වුණාම තව මාස දෙකකින්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

එය වෙනම කතාවකි. පළාත් පාලන ආයතන 29 ම සුහදතාවයෙන් එතුමා සමඟ වැඩ කරනවා. බලපිටිය , රත්ගම ආදි සභා වල සුහදතාවයෙන් වැඩ කටයුතු සිදු කරනවා. ඔබතුමාත් එහෙම සුහදතාවයෙන් වැඩ කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මෙම මුදල් එවිම පිළිබඳ ප්‍රශ්නයක් මතු වී තිබෙනවා. එම මුදල් ලබා දීම එතුමාගේ යුතුකම. එය පුන පුන කිමට අවශ්‍ය නැහැ. මොන ගරු ප්‍රධාන අමාත්‍ය කෙනෙක් සිටියත් ඒවා ලබා දෙන්න ඕන . මේවා අම්බලන්ගොඩ ජනතාවගේ මුදල්. අපි ස්තුතිවන්ත වෙනවා . එතුමා පත්කරන්න අපිත් චන්දය දි තිබෙනවා. දේශපාලනයේ වාමාංශික අදහස් දරණ අපි. එයට රණ්ඩු වෙන්න යන්න අවශ්‍ය නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැ මෙතැන පොහොට්ටු කතන්දර කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මා පොහොට්ටු කතාවක් කිව්වේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැ මා පැවසුවා පොහොට්ටු කතාව

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමාගේ යුතුකම එම මුදල් ලබා දීම පිළිබඳ ප්‍රකාශ කිරිම

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

අපි කාටත් තිබෙනවා යුතුකම් හා වගකිම්. යුතුකම් ඉෂ්ඨ කළාම අයිතිවාසිකම් ලබා ගන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට ප්‍රකාශයක් කරන්න තියෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යතුමා. අපි එතුමාට ගරු කළ යුතුයි. නගර සභා 55 කට නායකත්වය දරන පුද්ගලයා. එතුමාගේ තිරණය තමයි අවසාන තින්දුව වන්නේ. අපි මෙම මුදල් පිළිබඳව මොන අයිතිවාසිකම් දරුවත් එතුමාටත් දර්ශනයක් තිබෙනවා ඒ මුදල් තුල. අපි මෙසේ කෑ ගැසිමෙන් සිදු වන්නේ එම මුදල් තවත් අපස්සට යන එක විතරයි. එතුමාත් මනුෂයෙකි. එතුමාත් සිතන පතන ආකාරයට තමයි මෙම මුදල් ලැබෙන්නේ. අපි යන්ත්‍ර සූත්‍ර, මුදල් ඉල්ලා තිබෙනවා . ඒවා ලබා දෙනවා. මොන ගරු ප්‍රධාන අමාත්‍යතුමා හිටියත් මොන සභාවක් තිබුණත් අපි එතුමාට යටත්ව යායුතුයි. අපි

එතුමාගේ අධාර උපකාර ලබා ගන්න ඕන. මාර්ගයක් ඉදිකරන්න ලක්ෂ 38 ක් වියදම් කරලා මාසයක් නැහැ. අපි මෙසේ කතා කිරිමෙන් ඊළඟ අධාර ලැබෙන්නේ නැහැ.. මෙය අම්බලන්ගොඩ නගරයේ ජනතාවට කරන ද්‍රෝහිකමකි. ඔබතුමාලා ගිහින් පටලවන්න එපා. නිවැරදිව කියන්න. මෙම පුටුවේ කවුරු ගරු ප්‍රධාන අමාත්‍ය වුණත් අපි එතුමාගේ සේවය ලබා ගත යුතුයි. අපි විටින් විට අධාර ලබා ගෙන තිබෙනවා අධාර මුදල් ඉල්ලා තිබෙනවා. අධාර මුදල් ලබා දී තිබෙනවා. එනිසා ගරු කළ යුතුයි. ස්තුතිවන්ත විය යුතුයි. ඉදිරියටත් එම කටයුතු එසෙම ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

D4 යන්ත්‍රයක් ලබා දෙන්න නිර්දේශ කර යවා ඇති බව පැවසුවා. අපි මෙවැන් දේවල් ගත යුතුයි. එතුමාගේ උදවු ලබා ගත යුතුයි. මේ සඳහා අපි අපිට ලබා දිය හැකි සහයෝගය ලබා දෙනවා. මේ ළඟදි මහ අම්බලන්ගොඩ දෙල්දූව පාර ප්‍රතිසංස්කරණයට ලක්ෂ හැටක මුදලක් ලබා දුන්නා. දෙන එක හරි අපි ගන්න ක්‍රමවේදය සකස් කර ගත යුතුයි. ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා ප්‍රකාශ කළ අකාරයට ඔබතුමා එතුමා සමඟ සහයෝගයෙන් වැඩ කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රිතුමා , එයට වාද කරන්න දෙයක් නහැ. හුඟක් මහ ඇමතිවරු සිටිද්දි එය සිදුවි තිබෙනවා. හරියට මුදල් දෙනු ලැබුවේ ගරු හිටපු ප්‍රධාන අමාත්‍ය මහින්ද යාපා මැතිතුමාගේ කාලයේදි පමණයි. එම්.එස් .සමරසිංහ මහතා සිටින කාලයේ 1991 වර්ෂයේ ගරු හිටපු සභාපති ජී.එම්.එස්. ද . සිල්වා මහතා ට නොදුන් මුදල් මා සභාපතිව සිටි කාලයේ 1997 වර්ෂයේදි දි මට දුන්නා. එහෙම වෙනවා. අපි හිතන් හිටියේ අපේ ගමේ කෙනෙක් ගරු ප්‍රධාන අමාත්‍ය ධූරය දරන විට අපිට කරදරයක් නොමැතිව වැඩ කළ හැකි බවයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**</u>

සුහදතාවයෙන් වැඩ කරන්න. අනෙක් සභා 49 වැඩ කරන්නේ එහෙමයි.

**තීරණය -**

ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මහතාගේ සංකල්පයට අනුව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය හා අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරන වැඩිහිටි බක්මහ උළෙල සඳහා 2019 මාර්තු මස 27 බදදා දිනත් 28 බ්‍රහස්පතින්දා දිනත් පියසේන ළමා ක්‍රිඩාංගණය නොමිලේ වෙන්කරදීම සහ ඒ සඳහා අවශ්‍ය පුටු හා ටෙන්ට් නොමිලේ ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

### 03.10 වතුගෙදර සිරි අභයතිස්ස මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් කොන්ක්‍රිට් පතුරු කිහිපයක් ඉල්ලා 2019.01.09 දිනැති ලිපිය සභාගත කරන ලද ලිපිය සභාගත කරන ලදි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එම විදුහල ග්‍රාමිය ප්‍රදේශයක පිහිටි දිළිදු දෙමාපියන් දරුවන් අධ්‍යාපනය ලබන දුෂ්කර පාසලක් බවත් ඊට ප්‍රථම දරන ලද අනුග්‍රහයන්ට ස්තුතිය පුද කරන බවත් අම්බලන්ගොඩ පොදු සුසාන භූමියේ ඉවත්කර තිබෙන පෙළවට ඇල්ලිමට යොදා ගන්නා කොන්ක්‍රිට් පතුරු එම විද්‍යාලයේ භාවිතය සඳහා ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුනි. අදාහානාගාරයේ ගල් ඇල්ලිම නිසා ඉවත්කරන ලද කොන්ක්‍රිට් පතුරු තාප්පය මුල්ලේ ගොඩ ගසා තිබේනවා. සභාව තිරණය කරනවා නම් එය ලබා දිය හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගරයේ සිද්ධාස්ථානයකට හෝ පාසලකට අවශ්‍යතාවයක් තිබේ නම් ලබා දෙන්න. ගරු මන්ත්‍රීවරුන් සොයා බලන්න තමන්ගේ ප්‍ර දේශයේ සිද්ධාස්ථානයක් හෝ පාසලකට මේවා අවශද කියා. එසේ නොමැතිනම් ලබා දෙන්න. අපේ සීමාව බලන්න. අපේ සීමාවෙන් පිට යන එක ගැටළුවක් විය හැකියි. ඒසේ නොමැතිනම් ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මෙය අපි ඉවත් කරලත් වසර හතකට අටකට වැඩියි. අන්න දැන් ඕනම කෙනෙකු සුසාන භූමියට ගියාම එතැන පෙන්න තියෙනවා. ඉතිං දැන් පොළවට පස් වෙනවා. මේ අහිංසක පාසලක් බැලුවාම. මෙම පාසලට මේවා දිලා දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මෙම විදුහල්පතිවරයා බොහොම සරුසාර අදහස් ඇති නව නිර්මාණ කරන විදුහල්පතිවරයෙකි. අපි නගරයේ අයට මුල්තැන දි මොහුට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මත දෙකක් තිබෙනවා.. මෙය ලබා දෙන්නද ? එපාද? කියා කෙලින්ම කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

කමක් නැහැ මෙය පාසලක්නේ එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සියළුදෙනාම එකඟ බැවින් ලබා දෙන්න කටයුතු කරනවා.

**තීරණය -**

වතුගෙදර සිරි අභයතිස්ස මහා විද්‍යාලයට අම්බලන්ගොඩ නගර සභා පොදු සුසාන භූමියේ ඉවත්කර පසෙක ගොඩගසා ඇති කොන්ක්‍රිට් පතුරු ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.11 ගා/ප්‍රජාපති ගෝතමී බාලිකා මහා විද්‍යාලය මගින් 2019.01.30 හා 31 යන දෙදින තුල පෙ.ව. 8.00-11.30 දක්වා මානාන ක්‍රීඩා පිටිය වෙන්කර දෙන ලෙස ඉල්ලා 2019.01.29 දිනැති ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගා / ප්‍රජාපති ගෝතමී බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඉල්ලීමක් කර ඇත. නිවාසාන්තර ක්‍රිඩා උළෙලේ සරඹ සංදර්ශන පුහුණු කටයුතු සඳහා 2019.01.30-2019.01.31 යන දෙදින පෙ.ව.8.00-11.00 දක්වා මානාන ක්‍රීඩා පිටිය ගාස්තු අයකිරිමකින් තොරව වෙන්කර දෙන මෙන් ඉල්ලා ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

ගා/ප්‍රජාපති ගෝතමී බාලිකා මහා විද්‍යාලය මගින් 2019.01.30 හා 31 යන දෙදින තුල පෙ.ව.8.00-11.30 දක්වා මානාන ක්‍රීඩා පිටිය සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධයෙන් අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.12 ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් අම්බලන්ගොඩ නගර සභාව මගින් පෙර පාසල් දරු දැරියන්වෙනුවෙන් සංවිධානය කරන ලද ළමා සැණකෙළිය සඳහා ලද අදායම් සහ සංවිධාන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් වාර්තාව සභා කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ලෝක ළමාදිනය අරමුණු කර ගනිමින් අම්බලන්ගොඩ නගර සභාව මගින් පෙර පාසල් දරුවන් වෙනුවෙන් සංවිධානය කරන ලද ළමා සැනකෙළිය සඳහා අනුග්‍රහක ආයතන / පුද්ගලයන්ගෙන් සහ සංවිධාන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් ඇතුළත් වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත.

**තීරණය -**

ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් අම්බලන්ගොඩ නගර සභාව මගින් පෙර පාසල් දරු දැරියන්වෙනුවෙන් සංවිධානය කරන ලද ළමා සැණකෙළිය සඳහා ලද අදායම් සහ සංවිධාන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් වාර්තාව සඳහා සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.13 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ සභාව සතු SL3731 දරණ ට්‍රැක්ටරය සඳහා අළුතින් ටේලරයක් මිලදී ගැනිම සඳහා සභා අනුමතිය ලබා ගැනිම සම්බන්ධ ලිපියට සභා ගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඩිපෝ ඉංජිනේරු වාර්තාව පරිදි SL3731 දරණ ට්‍රැක්ටරය සඳහා අළුතින් ටේලරයක් මිලදි ගැනිම සඳහා සුදුසු බවට නිර්දේශ කර ඇත. ඩිපෝ ඉංජිනේරු විසින් වාර්තා කර තිබෙනවා .එම ටේලරය මා විසින් පරික්ෂා කිරිමේදි අළුත් වැඩියා නොහැකි තත්වයට දිරා පත් වි ඇත. අළුත් වැඩියාව සුදුසු නොවන බැවින් නව ටේලරයක් මිලදි ගෙන පාවිච්චි කිරිම සුදුසු බවට අම්බලන්ගොඩ ප්‍රාදේශිය සහකාර ඉංජිනෙරු ඩිපෝ කාර්යාලය නිර්දේශ කර ඇත.මේ සඳහා මිළ ගණන් කැඳවා ලබා ගැනිම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ සභාව සතු 3731 දරණ ට්‍රැක්ටරය සඳහා අළුතින් ටේලරයක් මිළ ගණන් කැඳවා ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.14 ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනිම සම්බන්ධ සභා අනුමතිය ලබා ගැනිම.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගනීම සඳහායි. උක්ත කරුණ සම්බන්ධව ඔබටද පිටපතක් සහිතව මා අමතන ලද අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම්ගේ 2018.11.21 දිනැති ලිපිය හා බැඳේ. ඒ අනුව පුරා විද්‍යා ස්මාරකයක් වන අම්බලන්ගොඩ ඕලන්ද ස්තාල ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය ප්‍රවේශ මාර්ගය ඇතුළු යටිතල පහසුකම් ( වැසිකිළි පහසුකම්) සලසා ගැනිම අත්‍යවශ්‍යව ඇත. මෙහි නඩත්තු කටයුතු අප දෙපාර්තමේන්තුව මගින් සිදු කරන අතර අප සේවකයින් මෙමස්ථානයේ සේවයේ යොදවා ඇත. ඉදිරියේදි මෙම ස්ථානයයට නියමු සැලසුමක් සකස් කිරීමට අපේක්ෂා කරන බැවින් . දෙපාර්තමේන්තු වාහනය ස්ථානය වෙත ළඟා විය යුතු බැවින් ප්‍ර වේශ මාර්ගය , වැසිකිළි පහසුකම් ඇතුළු යටිතල පහසුකම් සපයා ගැනීම අවශ්‍යව ඇත. මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගාල්ල මාතර පුරා විද්‍යා සහකාර අධ්‍යක්ෂ විසින් ලිපියක් එවා ඇත. මේ සම්බන්ධව 2018.11.13 වන දින පැවති මාසික සභාවේ තිරණයක් ගෙන ඇති බැවින් ප්‍රතික්ෂේප කරනු ලැබූ මෙම ඉල්ලීම නැවතත් ඉල්ලා සිටිනවා. එම ඉල්ලීම නැවතත් සභාවට ඉදිරිපත් කර සිටිනවා. අපි මෙම ඉඩම බදු දි අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ප්‍රතික්ෂේප වෙනවා කියන්නේ. එය අපිට අදාල නැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපිට අදාලයි . ගිය සභාවකදි ඉල්ලා ඇති ඉල්ලීමකි. එය එම සභාවේදි ප්‍රතික්ෂේප කරනු ලැබුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ අයට වැසිකිළියක් සෑදිමට දෙනවානම් දිය යුත්තේ එළියේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බදු දි ඇති ආයතනය මෙයට විරුද්ධ වුණොත් ? අපි මෙය දි ඇත්තේ ටෙන්ඩර් කරලා . දැන් ගැටුමකුත් තිබෙනවානේ. ඒ අයට මේ පිළිබඳව යම් ගැටළුවක් මතුවුණොතින් එය ඔවුන් හේතුවක් කර ගනියි. අපි වැසිකිළියක් සෑදිමට ඉඩ දුන් නිසා අපි මෙය කළේ නැහැ කියා ඔවුන් පවසාවි. එම නිසා මේ ගැන සොයා බලන්න . ඔවුන් අපෙන් පැන යාමට බලා සිටින්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාව මුණ ගැසෙන්න පැමිණියා පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,එම නිසා මෙය අපගේ භූමියක් වුවාට මෙය අපි ක්‍රමයට බදු දි තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ සම්පූර්ණ බදු දී නැහැ. ගොඩනැගිල්ල තිබෙන කොටස බදු දි නොමැත. ඉතිරි කොටස බදු දී ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙයට පිටින් වැසිකිළියක් ඉදිකිරිමට දුන්නොත් එය ගැටළුවකි. ගොඩනැගිල්ල විතරක් අතහැර තිබියදි මෙය ලබා දුන්නොත් එහෙම අපි විශාල ගැටළුවකට මුහුණ දෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මෙය හඳුනාගත් පසු ඔවුන් එය නඩත්තු කරනවා. අපිට මෙයට අත තියන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් අර බදුගත් අය පැමිණ තාප්පයක් ඉදිකළහොත් මොකද වෙන්නේ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, යම් ගැටළුවක් තිබෙනවා මෙම තනායම පිළිබඳව . එම නිසා අපි සාකච්ඡා කර ගරු සභාව විසින් අවසාන තින්දුවකට පැමිණ තිබේ. සියළු ගරු මන්ත්‍රීවරුන් විසින්. මෙය අම්බලන්ගොඩ නගරය පිළිබඳ තිබෙන විශාල ගැටවකි. අපේ ගරු උපසභාතිතුමා ප්‍රකාශ කර අකාරයට ගිවිසුම් කඩවෙන කිසිම දෙයකට යන්න එපා. අපි තින්දුවක් ගෙන තිබෙනවා බව දැනුම් දෙන්න. එම තින්දුව වෙනස් කිරිමට අපි කිසිම කෙනෙකු එකඟ වෙන්නේ නැහැ. කරුණාකර ඔබතුමා මේ කිසිදු දෙයකට අවසර ලබා දෙන්න එපා. අපි තීන්දුවක් ගෙන තිබෙනවා. එම තින්දුව අනුව කටයුතු කරන්න. මෙය පුරා විද්‍යා වටිනාකමක් තිබෙනවා. මෙය සංරක්ෂණය විය යුතුයි. මේ අවස්ථාවේ එයට කිසිම සහයෝගයක් නොදිය යුතුයි. අපි ගනු ලැබූ තින්දුව අපි අනිවාර්යෙන්ම අදාල දිනයට ක්‍රියාත්මක කරනවා.මොන බලපෑම් ආවත්, මොන දේශපාලන බලපෑම් ආවත්, රටේ මොන දේශපාලනඥයගෙන් බලපෑම් පැමිණියත් අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් ප්‍රතිපත්තිමය තින්දුවක් ගත්තා. එම තින්දුව අපි අට්ටාල ගසා හරි මියෙනතුරාවට එය ඉෂ්ඨ කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පසුගිය 2018.11.13 වන දින සභාවේ තින්දුව පරිදි ක්‍රියා කරන බවට දන්වා යවන්න.

**තීරණය -**

ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීය නොහැකි බවත් , 2018.11.13 වන දින සභා තීරණ අංක 12.01 පරිදි කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.15 පටබැඳිමුල්ල නව ප්‍රජා ශාලාව හා සේවා පියස ඉදිකිරිමේ ව්‍යාපෘතිය කරගෙන යාමේදි නගර සභාව විසින් ඉදිකර තිබු ප්‍රජශාලාවෙන් ඉවත්කරන ලද ලැලි ප්‍රමාණයක් නගර සභාවට නොලැබිම හේතුවෙන් එහි පාඩුවූ මුදල අයකර ගැනිමට තීරණය වුව පළාත් පාලන කොමසාරිස් 03/06/පොදු හා 2014.06.09දිනැති වාර්ථාව අනුව අලාභය ලෙස රු 21828.21 ක් ලෙස ගණන් බලා ඇත එම මුදල ප්‍රාදේශිය ලේකම් නමින් ගෙවා ඇත. එම මුදල 2016 වසරේදි ණයගැති ලෙස අවසාන ගිණුම් රු.27268.80ක මුදලක්ගිණුම් ගත කර ඇති අතර ගිණුම ගත කල මුදල මුදලත්, ලද මුදලත් අතර වෙනස අදායම් ණයගැතියන් ලෙස කපා හැරිමට සම්බන්ධව ලිපියට සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පටබැඳිමුල්ල නව ප්‍රජා ශාලාව හා සේවා පියස ඉදිකිරිමේ ව්‍යාපෘතිය කරගෙන යාමේදි නගර සභාව විසින් ඉදිකර තිබු ප්‍රජශාලාවෙන් ඉවත්කරන ලද ලැලි ප්‍රමාණයක් නගර සභාවට නොලැබිම හේතුවෙන් එහි පාඩුවූ මුදල වන රු.27268.80 ක මුදලක් අයකර ගැනිමට තීරණය තිබුණ ද පළාත් පාලන කොමසාරිස් 03/06/පොදු හා 2014.06.09 දිනැති වාර්ථාව අනුව අලාභය ලෙස රු 21828.21 ක් ලෙස ගණන් බලා ඇත එම මුදල ප්‍රාදේශිය ලේකම් නමින් ලදුපත් අංක 5833 හා 2017.7.31 දිනෙන් ගෙවා ඇත. නමුත් 2016 වසරේදි ණයගැති ලෙස අවසාන ගිණුම් රු.27268.80ක මුදලක්ගිණුම් ගත කර ඇති අතර ගිණුම ගත කල මුදලත්, ලද මුදලත් අතර වෙනස ආ ණය බවට එරෙහිව කපා හැරිමට අනුමතිය ඉල්ලා ඇත.මෙම මුදල් නගර සභාවට ලැබි තිබෙනවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඔය ප්‍රජා ශාලාව ඉදි කරනු ලැබුවේ කොයි කාලයේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ අපි සාදනු ලැබු පරණ වෙරළ උද්‍යානය

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. මේ රු.5440.65 ක මුදලක්නේ. යම්කිසි වැඩ කොටසකුත් සිදු වි තිබෙනවානේ. එම මුදල කපා ඉවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ සඳහා නිත්‍යානුකුල තත්වයකුත් තිබෙනවා නේද? ඇයි ඔය රු27268.80 ක් කියා සඳහන් ව ඇත්තේ. මොකක්හරි වැරද්දක් සිදු වි තිබෙනවානේ. එයට ඔබතුමිලා තොරතුරු යවන්න ඇත්තේ ඔය විදියට වෙන්නැති.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පළාත් පාලන කොමසාරිස්තුමාට යවා ඇත්තේ රු.27268.80 ක් ලෙස . ඒ වුණත් ඔවුන් තක්සේරු කර ඇත්තේ රු.21828.15 ලෙසයි. එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන මෙහේට එවා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එහෙනම් ප්‍රශ්නයක් නැහැ. එතුමා යම්කිසි පදනමක් මතනේ මෙහාට එහෙම එවා ඇත්තේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය  අනුමත කරනවා.

**තීරණය -**

පටබැඳිමුල්ල නව ප්‍රජා ශාලාව හා සේවා පියස ඉදිකිරිමේ ව්‍යාපෘතිය කරගෙන යාමේදි නගර සභාව මඟින් එහි වටිනාකම රු.27268.80 ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර ඇති අතර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය 2014/06/09 වාර්තාව මඟින් එම පාඩුව රු.21828.21 ක් ලෙස ගණනය කර එවා ඇති බැවින් එම මුදල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් ප්‍රතිපුරණය කර ඇත. එබැවින් එහි වෙනස රු.5440.05 ණයගැතියන් ගෙන් කපා හැරිම සුදුසු  බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව  ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින්  සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.16 පොදු වෙළඳ පොල හා නව මාළු වෙලඳ සංකිර්ණය පහත අංක දරණ කඩ කාමර ටෙන්ඩර් කිරිම සහ මාසික බදු කුලිය වැඩිකිරිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොදු වෙළඳපොළ නව මාළු වෙළඳ සංකීර්නය පහත අංක දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සහ මාසික බදු කුලිය පහත සඳහන් ආකාරයට අයකිරීම සුදුසු බවට යෝජනා කර ඇත.

| නව මාළු වෙළඳ සංකීර්ණය | මාසික බදු කුලිය | අවම ලංසුව |
|---|---|---|
| අංක 04 | රු.3000/= | රු.500000/= |
| අංක 13 | රු.5000/= | රු.700000/= |
| අංක 10 | රු.5000/= | රු.700000/= |
| පොදු වෙළඳපොළ | | |
| අංක 14 | රු.3000/= | රු.500000/= |
| අංක 04 | රු.3000/= | රු.500000/= |

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මීට ඉහත කඩ කාමරයක් ටෙන්ඩර් කරලා ටෙන්ඩරය ලබා ගෙන ඇත. ඔහු අහිංසක මිනිසෙක් රුපියල් ලක්ෂ ගණනක මුදලක් පොළියට ගෙන නගර සභාවට මුදල් ගෙවා ඇත. නමුත් ඔහුට එම කඩ කාමරය ලැබී නැත. ඔහු සිටි තැනුත් ඉවත් කරලා රුපියල් ලක්ෂ පහක මුදලක් නගර සභාවටත් බැදලා එය අළුත්වැඩියා කර නොමැත. එ සඳහා ඇස්තමේන්තුවකුත් සාදා ඇත. ඔහුට මෙය අළුත්වැඩියා කර ගන්නා ලෙස නගර සභාව මඟින් දන්වා සිටියත් ඔහුට ඒ සඳහා වත්කමක් නැත. මුදලක් නගර සභාවට ගෙවා ඇතිනිසා. ඒ ගැනත් ක්‍රියාත්මක වන්න. මෙම කඩ කාමර ටෙන්ඩර් කරනා විට අළුත්වැඩියා කටයුතු සිදු කර ටෙන්ඩර් කරන්න. නැතිනම් ජනතාව ලක්ෂ ගණන් මුදල් ඉතා අමාරුවෙන් සොයා ගෙනවිත් මුදල් ගෙවීමෙන් පසුත් මාස5ක් 6ක් යනතුරු එම කඩය ලැබෙන්නේ නැහැ. මෙය ජනතාවට කරනු ලබන අසාධාරණයකි. මෙය කුලියට ගෙන ඇත්තේ ඕකන්ද ප්‍රදේශයේ කෙනෙකි. ඔහු රට යාමට සොයනවා දැන්. මෙවැනි දේවල් ටෙන්ඩර් කරනා විට ජනතාව ගැනත් සිතා ටෙන්ඩර් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මොකක්ද ඔය කඩ කාමරයේ තත්වය. ඔහු මා මුණ ගැසිමටත් පැමිණියා. ඔහු මෙම ටෙන්ඩරය ගෙන මාස 5 ½ විතර වෙනවා. අදවනතුරු එම කඩය භාරදී නොමැත. ඔහුට ව්‍යාපාරය කර ගැනීමට නොහැකිව සිටී. මොකක්ද මෙහි තත්වය. ඇයි කර ගැනිමට නොහැකි වි ඇත්තේ. මෙහි ඇත්තේ වයරින් එකේ ප්‍රශ්නයක්ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට ටෙන්ඩර් කිරීමට ඉදිරිපත් කර ඇත්තේ කඩ කාමර 5 සඳහා ටෙන්ඩර් කරන්න එපා තාක්ෂණසේවා නිලධාරි මහතා එය ටෙන්ඩර් කිරීමට සුදුසු බවට වාර්තාවක් දෙනතුරු. ඊළඟ බදුකරු පැමිණ මෙයට වාසයට සුදුසු කියා පවසන්න ඕනෑ. මෙය දි පරක්කු වුණොත් එහෙම ඔබතුමා සභාවට එම අලාභය ගෙවිය යුතුයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කලින් සඳහන් කරනු ලැබූ පුද්ගලයාගේ කඩ කාමරය කුමක් හෝ සමිතියකින් ලබා ගෙන ඇත. මෙය කෙරෙන්නේ නැතිනම් අපේ විදුලි කාර්මික ශිල්පින් යොදවා හරි සකස් කර මෙය භාර දෙන්න. මෙය අපගේ සේවකයන් යොදවා මෙය ඉක්මනින් නිම කර ලබා දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සඳහා අපගේ නගර සභා සේවකයන් යොදවා මෙය ඉක්මනින් මේ සති දෙක තුළ නිම කර දෙන්න.එයට බාධාවල් තිබෙනවාද ? ඇලුමිනයම් වැඩ ටික පිට ආයතනයකට හරි දී කර දෙන්න. මෙතැන කඩ කාමර 5ක් තිබෙනවා. ඒ වගේත් ප්‍රශ්න තියෙනවාද ? එවා සඳහා සුදුසු තත්වයේ තිබේදැයි වාර්තාවක් ලබා දෙන්න. එම වාර්තාව නොමැතිව ටෙන්ඩර් කළ නොහැකිය.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අංක 1 කඩ කාමරයෙත් පොඩි ප්‍රශ්නයක් පැන නැගුනා. අංක 1 කඩ කාමරය කුලියට දිලා නේ තියෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අංක 1 කඩ කාමරය ගෙන ඇත්තේ අපගේ හිටපු නගර සභා මන්ත්‍රී දේව් මහතායි. එම මහතා මෙම කඩ කාමරය ගත් පසු විදුලි බිල්පතේ රු.700/= ක මුදලක් අඩු නිසා විදුලිය විසන්ධි කර ඇත.(2013 වර්ෂයේ) මෙහි කලින් ගිවිසුමේ තිබෙනවා මෙය ගනු ලබන පුද්ගලයා විසින් කරගත යුතු බවට. එයාට කර ගැනිමට ඉල්ලුම්පත්‍රය ලබා ගන්න කියා ලිපියක් දමන්න. අපගේ පරණ වෙළඳපොළ කඩා ඉවත් කර මට්ටමේ තිබෙන්නේ. මා අපේ තාක්ෂණසේවා නිලධාරි මහතා සමඟ ගියා මෙය ප්‍රතිසංස්කරණය කිරිමට බලන්න. මොකද රජයෙන් ලක්ෂ 40ක් ලබා දෙනවා කියා තිබුණා වෙළඳපොළ වල් අළුත්වැඩියා කිරිම සඳහා. එම මුදල් ලබා ගැනිමේදි පලක් නොවන බව මෙය අළුත්වැඩියා කිරිමට නොහැකි බව ඉංජිනේරු මහතා ප්‍රකාශ කර තිබුණා. අළුතින් එකක් ඉදිකළ යුතු බව තමයි ප්‍රකාශ කර ඇත්තේ. මේ ටෙන්ඩර් කරනු ලබන්නේ අළුත් වෙළඳසැලේ කඩ කාමරයි.

**තීරණය -**

පොදු වෙළඳ පොල හා නව මාළු වෙලඳ සංකිර්ණයේ පහත අංක දරණ කඩ කාමර

- නව මාළු වෙළඳ සංකිර්ණය අංක 04
- නව මාළු වෙළඳ සංකිර්ණය අංක 13
- නව මාළු වෙළඳ සංකිර්ණය අංක 10
- පොදු වෙළඳ පොල අංක14
- පොදු වෙළඳ පොල අංක19

ටෙන්ඩර් කිරිමට පෙර තාක්ෂණ සේවා නිලධාරි මහතාගේ වාර්තාවක් ලබා ගෙන එය ටෙන්ඩර් කිරීමට සුදුසු තත්වයේ පවතිද යන්න සොයා බැලීමටත් , මෙම වෙළඳ සංකිර්ණය අබලන් තත්වයේ පවතින බැවින් එය අලුතින් ඉදිකිරීම සිදු කළ යුතු බවත් , මින් පසු කඩ කාමර ටෙන්ඩර් කිරීමේදි තාක්ෂණ සේවා නිලධාරි මහතාගේ වාර්තාවක් ලබා ගෙන එය ටෙන්ඩර් කිරීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නැත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

05.01.01 අම්බලන්ගොඩ හිරේවත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බලයලත් මානක පී.එච්.ඩී. ද සිල්වා මහතාගේ පිඹුරු අංක 1536 දක්වා ඇති ලොට් 1 නැමති මාදම්පා ගඟින් ගොඩවුන කැබැල්ල නැමැති ඉඩම රජයට පවරාගෙන එය නගර සභාව වෙත ලබා දිම සුදුසු බවට යෝජනා කර සිටිමි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනා කරනු ලැබුවේ මාදම්පා ගඟ පිහුනුම් මධ්‍යස්ථානය පිහිටි සුනාමියෙන් ගොඩවුණු භූමි ප්‍රදේශයයි. මීට කලින් එහි අපගේ අඳුම්මාරු කර ගැනිම සඳහා සුළු කොටසක ගොඩනැගිල්ලක් තිබුණා. නගර සභාවට බලපත්‍රයක් මගින් මෙය ලබා ගත යුතුයි. මුදල් ගෙවීමක් අවශ්‍ය වන්නේ නැහැ. මෙම යෝජනාව ප්‍ර දේශිය ලේකම් වෙත යොමු කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙය නගර සභාවේ කර්තව්‍යයකට තමයි පාවිච්චි කරන්න වෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් නගර සභාවේ කර්තව්‍යයකට තමයි.

**<u>තීරණය</u>**

අම්බලන්ගොඩ හිරේවත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බලයලත් මානක පී.එච්.ඩී. ද සිල්වා මහතාගේ පිඹුරු අංක 1536 දක්වා ඇති ලොට් 1 නැමති මාදම්පා ගඟින් ගොඩවුන කැබැල්ල නැමැති ඉඩම රජයට පවරා ගැනිම සුදුසු බවටත් ප්‍රාදේශිය ලේකම් අම්බලන්ගොඩ වෙත යොමු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

05.01.02 අම්බලන්ගොඩ නගර සභාවේ මුද්දර යන්ත්‍රයක් නොමැති බැවින් මුද්දර සඳහා පළාත් පාලන ආයතනවලට රජයෙන් දෙනු ලබන රු.12000/= ක ආධාර මුදල ලබා ගැනිමට නොහැකි වී ඇත. එබැවින් සභාවට මුද්දර යන්ත්‍රයක් ලබා ගැනිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ මුද්දර යන්ත්‍රයක් නොමැති බැවින් මුද්දර සඳහා පළාත් පාලන ආයතනවලට රජයෙන් දෙනු ලබන රු.12000/= ක ආධාර මුදල ලබා ගැනිමට නොහැකි වී ඇත. එබැවින් සභාවට මුද්දර යන්ත්‍රයක් ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

05.01.03 අම්බලන්ගොඩ ඕකන්ද නගර සභා පෙර පාසලට හා පුස්තකාලයට අයත් වැසිකිළියක් ටයිල් අතුරා අළුත් වැඩියාකිරිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරීමට යෝජනා කර සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ඕකන්ද නගර සභා පෙර පාසලට හා පුස්තකාලයට අයත් වැසිකිළියක් ටයිල් අතුරා අළුත් වැඩියා කිරිම සම්බන්ධ යෝජනාව පිළිගත යුතු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනී මහත්මියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

05.01.04 අම්බලන්ගොඩ මුහුදු වෙරළ පාර අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මෙම අම්බලන්ගොඩ පරණ පාර කොතරම් දුරට නඩත්තු කටයුතු සිදු කරනු ලැබුවත් මධ්‍යම රාත්‍රියේදි මෙම මාර්ගයේ තනිකරම ධාවනය වන්නේ වැලි ගෙන යන වාහනයි. කවුද කරන පුද්ගලයා අපට අදාල නැහැ. අපි මෙය මේ මාසේ සංවර්ධනය කරනු ලැබුවොත් නැවතත් මෙය කැඩෙනවා. මේ වැලි අදින පුද්ගලයන් අති විශාල ලාභයක් මින් උපදවනවා. එම නිසා මෙම අය සමග නගර සභාවේ ගිවිසුමක් තිබේද ?

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නැහැ. එහෙම ගිවිසුමක් නැත.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

මේ සඳහා දායකත්වය දරනු ලබන්නේ නගර සභාවේ බදු ගෙවන මහජනතාවයි. ඉන් ලාභ ලබන්නේ මෙම පුද්ගලයන් විසිනි.ඔවුන් නිසා තමයි ගමන් කිරිමට නොහැකි තරම් විශාල වළවල් මෙම මාර්ගයේ ඇත්තේ. එසේනම් අපි යෝජනා කර සිටිනවා මෙම වැලි ගෙන යන පුද්ගලයන් කැඳවා සාකච්ජාවක් තබ මෙම මර්ග නඩත්තු කිරිම සඳහා එම අයගෙන් යම්කිසි මුදලක් ලබා ගැනිම සඳහා. අපි මෙම වළවල් වසා ප්‍රතිසංස්කරණය කළත් තව සති දෙකකින් මෙය කැඩෙනවා. මා යෝජනා කරනවා මේ අය සමඟ ගිවිසුමක් අත්සන් කර නගර සභාවට මේ අය හරහා යම්කිසි මුදලක් ලබා ගන්න. මොකද අපි මෙම මාර්ග සංවර්ධනය කළ යුත්තේ. මෙහි ඉතා විශාල වාහන ගමන් කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

මම නම් හිතන්නේ නැහැ ගරු විපක්ෂ නායකතුමා යෝජනාවක් විදියට මෙය ඉදිරිපත් කළත් එය ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියා. ඕනෑම වාහනයක් අදායම් බලපත්‍රයක් ලබා ගෙන තමයි මෙය මාර්ගයේ ධාවනය කරනු ලබන්නේ . අපිට කියා විශේෂ බලපෑමක් කිරිමට නොහැකි බවත් , එතුමා සඳහන් කරනු ලැබු කාරණය පිළිබඳ සොයා බලන්න. මා ඉල්ලිමක් කරනවා අපගේ කසළ වළ වැසිම සහා එම ආයතනයෙන් ඔබතුමා වාචිකව යම්කිසි වැලි ප්‍රමාණයක් ලබා ගන්නා ලෙස.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා එක් කාලයක නගර සභා ට්‍රැක්ටර් රථ දමා පාර හරස් කර දැමුවා. දින දෙකක් තිබෙන විට මොවුන් පැමිණ එකඟතාවයකට පැමිණ වැඩ කළා. වෙලා තියෙන්නේ මේ පුද්ගලයන් අපි දන්නා හඳුනන අය. මේ අපේ ගමේ ජීවත්වන පුද්ගලයන්ම තමයි ඊට සම්බන්ධ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මේ සඳහා බර වාහන නොමැතිව යම්කිසි ටොන් ප්‍රමාණයක් නියම කර එම ටොන් ප්‍රමාණයට වැඩි වාහන මෙම මාර්ගයේ ධාවනය කර නොහැකි බව කිව හැකිය. විශාල වාහන වලින් නෙමේ . සාමාන්‍ය වාහන වලින් වැලි ගෙන යා හැකියි මාර්ගයේ කැඩීම අඩුකරවීම සඳහා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හොඳයි ඒ ගැන බලන්නම් .

**තීරණය**

අම්බලන්ගොඩ මුහුදු වෙරළ පාර අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය සම්බන්ධ යෝජනාව පිළිගත යුතු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

05.01.05 අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ පැති බැම්ම හා වාහන නැවතුම් අංගනය ඉදි කිරීම පළමු අදියරය සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ පැති බැම්ම හා වාහන නැවතුම් අංගනය ඉදි කිරීමේ කර්මාන්තයේ පළමු අදියරය සම්බන්ධ යෝජනාව පිළිගත යුතු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

05.01.06 අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ පැති බැම්ම හා වාහන නැවතුම් අංගනය ඉදි කිරීම දෙවන අදියරය සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ පැති බැම්ම හා වාහන නැවතුම් අංගනය ඉදි කිරීමේ කර්මාන්තයේ දෙවන අදියරය සම්බන්ධ යෝජනාව පිළිගත යුතු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

05.01.07 අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ පැති බැම්ම හා වාහන නැවතුම් අංගනය ඉදි කිරීම තුන්වන අදියරය සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කර සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ පැති බැම්ම හා වාහන නැවතුම් අංගනය ඉදි කිරීමේ කර්මාන්තයේ තුන්වන  අදියරය සම්බන්ධ යෝජනාව පිළිගත යුතු බවටත්, එම කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත්  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.08** **අම්බලන්ගොඩ නගර සභාවේ දැනට භාවිතා කරන ඡායා පිටපත් යන්ත්‍රය නිතර ක්‍රියා විරහිත වන බැවින් වැඩි පහසුකම් වලින් යුත් ඡායා පිටපත් යන්ත්‍රයක් සභා අරමුදලින් මිලදී ගැනීමට සුදුසු බව යෝජනා කර සිටිනවා.**

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට භාවිතා කරන ඡායා පිටපත් යන්ත්‍රය නිතර ක්‍රියා විරහිත වන බැවින් වැඩි පහසුකම් වලින් යුත් ඡායා පිටපත් යන්ත්‍රයක් සභා අරමුදලින් මිලදී ගැනීමට සුදුසු බවට යෝජනා කර ඇත .

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , අපි කලින් මෙම යන්ත්‍රයක් මිලදි ගත්තා නේද? මොකක්ද ගත් ආයතනය. හොඳ ආයතනයකින් නේද මිලදි ගනු ලැබුවේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මෙය පවිච්චි කරන්න එක්කෙනෙකුට භාර දෙන්න . එක එක්කෙනා පාවිච්චි කරන ක්‍රම වේදය තුල තමයි ඔය ගැටළු ඇති වෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

අළුතින් යන්ත්‍රයක් ගෙන අවුරුද්දකුත් නැතිකොට අපි බලන්න ඕන මොකක්ද මේ ප්‍රශ්නය කියා. එහි වොරින්ටි සහතිකයක් නැද්ද අපි ළඟ .

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙවර  සභා වාර්තා මුද්‍රණ පිටපත් ලේකම්තුමිය විසින් ගනු ලැබුවේ ඔබතුමාලා එව්මට හික්කඩුව නගර සභාව ට යාමෙනි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

එසේනම් සභාපතිතුමනි , මේ සඳහා අපි පොඩි යන්ත්‍රයක් මිලදි ගෙන හරි යන්නේ නැහැ. මෙය මිලදි ගන්නවා නම් වගකිමක් ඇති ආයතනයකින් හොඳ ධාරිතාවක් ඇති යන්ත්‍රයක් මිලදි ගන්න මිළ ගණන් කැඳවන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

එකොහොමත් මෙම ඡායා පිටපත් යන්ත්‍රය මිලදි ගත් ආයතනය එතරම් හොඳ නැහැ. අඩුම වශයෙන් තියෙනවා පිටපත් කොපමණ ප්‍රමාණයක් ලබා ගත හැකිද කියා. ඊට කලින් මොනවා හරි වෙනවා නම් වොරිටියක් තියෙනවා ඒ අයගේ  නොමිලේ සේවා සපයනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒවා යොදාගෙන තිබෙන්නේ. මෙය පාවිච්චි කරන නලින් මහතා ප්‍රකාශ කර සිටින්නේ මාසයකට පිටපත් 50000 කට ප්‍රමාණයක් ලබා ගත හැකි වන්නේ. සාමාන්‍ය යෙන් අපගේ ලක්ෂයක් පමණ යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එසේ නම් අපි ඒ සඳහා සුදුසු එක නෙමෙයි මිලදී ගෙන තිබෙන්නේ. අපි එහිදී වැරද්දක් කර තිබෙනවා. මාසයකට නෙමේ එම යන්ත්‍රයෙන් ගත හැකි ප්‍රමාණය තමයි සාමාන්‍ය යෙන් දෙනු ලබන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ් .එම් නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා සිතනා විදියට නගර සභාවේ ඡායා පිටපත් යන්ත්‍රය වුණත් එවැනි තත්වයට පත්වෙන්න හේතු වි ඇත්තේ නගර සභා ගොඩනැගිල්ලේ තත්වයයි. මා අද දිනයේ නගර සභාවට යනවිට අපේ නිලධාරින් දිවා ආහාර ගන්නවා. නගර සභාවේ සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් රථ නවතා තිබුණා. ඔවුන් කෙසේ කෑම කනවා ද කියා මට සිතුනා. ඇත්තටම එතැන ගියාම එය ගව මඩුවක් තත්වයට පත්වෙලා තිබෙනවා. සියල්ලටම කලින් මෙම ගොඩනැගිල්ලේ ප්‍රශ්නය විසඳා ගත යුතුයි. මොකද සේවක සේවිකාවන්ගේ පැත්තෙන් බැලූ විට ඒ අය ගොඩක් අසරණ තත්වයට පත්වී තිබෙනවා. එම ට්‍රැක්ටර් නවතා තබා ඇති විට කාර්යාලය තුල ඉන්න බැරි තරමේ තත්වයක් ඇති වෙනවා. දෙන්නෙක් තුන්දෙනෙක් මා දැක්කා ආහාර ගන්නවා. ගොඩක් අය නාසය වසා ගෙන. මේවාටයි පිලියම් අවශ්‍ය වන්නේ. අපගේ ආයතනයේ ඇති පරිඝණක යන්ත්‍ර ආදි යන්ත්‍ර සුත්‍ර කැඩීමට හේතු වි ඇත්තේ ආයතනය වායු සමීකරණය කර නොමැති නිසායි. නගර සභාවේ ගොඩනැගිල්ලේ තත්වය තමයි මීට ප්‍රධාන වි ඇත්තේ. ඔබතුමා මේ සඳහා ඉක්මනින් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස සියළුම මන්ත්‍රිවරුන් වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේනම් අපි හොඳ වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපේ සභා වාර්තාවේ මාසයකට පිටපත් 3000 ක් පමණ ලබා ගන්නවා. මේ කොළ දිහා බැලුවාම . ඡායා පිටපත් යන්ත්‍රයක් ද ඩුප්ලෝ යන්ත්‍රයක්ද අවශ්‍යතාවය. සභාවේ අවශ්‍යතාවයට ඡායාපිටපත් යන්ත්‍රයක් තිබෙන නිසා සභා වාර්තා මුද්‍රණය කිරිමට ඩුප්ලෝ යන්ත්‍රයකට ගියොත් හොඳයි. ඩුප්ලෝ එකයි හරිවිදියට නියම යන්ත්‍රය වනුයේ මේ සඳහා සුදුසුම. ඡායා පිටපත් යන්ත්‍රය මෙහෙම ගියොත් කැඩෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ විදියට වාර්තා කියක් ගැනිමට අවශ්‍යද මාසයකට. එක සභා රැස්විමක් තිබෙන කොට වාර්තා 33ක් පමණ අවශ්‍ය වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මා 20කට ගණන් බැලුවේ. එසේනම් කොළ 3000 ක් පමණ වැයවෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පසුගිය සභා රැස්වීමේ පිටු 116ක් තිබෙනවා. අනිවාර්යෙන්ම මෙය ඡායා පිටපත් යන්ත්‍රයට ඔරෝත්තු දෙන්නේ නැහැ. ඩුප්ලෝ යන්ත්‍රයකුත් ගන්න. දෙකම ගන්න. කරන්න දෙයක් නැහැ. නැතිනම් අපිට වැඩ කළ නොහැකිය. දෙකටම ටෙන්ඩර් කැඳවන්න. මෙය සංශෝධනය කරනවා . ඡායා පිටපත් යන්ත්‍රයක් සහ ඩුප්ලෝ යන්ත්‍රයක් මිලදී ගැනිමට මා යෝජනා කර සිටිනවා . මෙය කවුරුහරි ස්ථිර කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට භාවිතා කරන ජායා පිටපත් යන්ත්‍රය නිතර ක්‍රියා විරහිත වන බැවින් වැඩි පහසුකම් වලින් යුත් උසස් වර්ගයේ ජායා පිටපත් යන්ත්‍රයක් හා ඩුප්ලෝ යන්ත්‍රයක් අළුතින් මිලදී ගැනිමේ යෝජනාව පිළිගැනිම සුදුසු බවත් මෙය සභා අරමුදලින් සිදු කිරිමට සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ විසිරි ජල සැපයුම සඳහා ජලය ලබා ගැනීමට ජල පොම්ප කිරිමේ කුටියක් සකස් කිරිමේ කර්මන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**තිරණය :-**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ විසිරි ජල සැපයුම සඳහා ජලය ලබා ගැනීමට ජල පොම්ප කිරිමේ කුටියක් සකස් කිරිමේ කර්මන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10 අම්බලන්ගොඩ පොල්වත්ත දිස්ත්‍රික් රෝහල අසළ ඉතිරි කොටසේ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ පොල්වත්ත දිස්ත්‍රික් රෝහල අසළ ඉතිරි කොටසේ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.11 අම්බලන්ගොඩ පොල්වත්ත දිස්ත්‍රික් රෝහල අසළ ඉතිරි කොටසේ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ පොල්වත්ත බුද්ධදත්ත මාවතේ (නගර සභා පුස්තකාලයට යන මාර්ගයේ) කාණුව ඉදිකිරිමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.12** **හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසිම සඳහා කොරිපස් සැපයිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසිම සඳහා කොරිපස් සැපයිමේ කර්මාන්තය අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.13** **හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසිමේ කර්මාන්තය අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.14** **හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසිමේ කර්මාන්තය අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.15** **අම්බලන්ගොඩ කළුවඩුමුල්ල සිරි විජයාරාම පාරේ කාණු පද්ධතිය සැකසිමේ කර්මාන්තය**

**සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල සිරි විජයාරාම පාරේ කාණු පද්ධතිය සැකසිමේ කර්මාන්තය අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.16** **අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස මාර්ගයේ රුදවුම් බැම්මසැකසිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස මාර්ගයේ රුදවුම් බැම්මසැකසිමේ කර්මාන්තය අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.17** **අම්බලන්ගොඩ හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඩබ් .ඒ. සෝහිත රංජිත් මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**05.01.18** **අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ ගලි වල සැකසිම හා පායිප්ප ඇතිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ ගලි වල සැකසිම හා පායිප්ප ඇතිරිමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.19** **අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම ඉදිකිරිමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත් එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.20** **අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම සැකසීමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම සැකසීමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනීම සුදුසු බවටත් එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.21** **අම්බලන්ගොඩ නගර සභාවට අයත් ට්‍රේලරයේ තින්ත ආලේප කිරීම සඳහා සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් ට්‍රේලරයේ තින්ත ආලේප කිරීම සඳහා අදාළ යෝජනාව පිළිගැනීම සුදුසු බවටත් එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය

**05.02** **ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

05.02.01 දැනට ඡන්ද කොට්ඨාශ 12 කට බෙදී ඇති එක් එක් ඡන්ද කොට්ඨාශයට , නගර සභා කර්මාන්ත අංශයෙන් සහ සෞඛ්‍ය අංශයෙන් ඉටුවිය යුතු සේවාවන් , එක් සතියකට එක කොට්ඨාශයට බැගින් නම් කර , සතියෙන් සතිය සෑම කොට්ඨාශයක්ම අවරණය වන පරිදි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි යෝජනා කර සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්

මා මෙම යෝජනාව ගෙන එනු ලබන්නේ අම්බලන්ගොඩ නගර සභාවට තේරී පත්වී ඇත්තේ ජනතාවට සේවය කිරීම සඳහායි. අම්බලන්ගොඩ නගර සභාවේ ඇති සීමිත සම්පත් වලින් කටයුතු කිරීමේදී මේ ගරු මන්ත්‍රීවරුන් 21කු කරන ඉල්ලීම් කුඩා නිලධාරි පිරිසකට එකවර කිරීමට හැකියාව තිබේද කියන එක බරපතලම කාරණයකි. සමහරවිට සමහර මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශ මෙන් දෙගුණයක් වෙනවා. සමහරුන්ගේ අවශ්‍යතා වැඩියි ගරු සභාපතිතුමනි. සමහර වේලාවට ඒ කොට්ඨාශවල වැඩ කිරීමට ගියාම සුමාන 3ක් මාසයක් පමණ එ ප්‍ර දේශවල කරන්නට සිද්ධවෙනවා. එවිට අර කුඩා කොට්ඨාශයක ඇති මාර්ගයක වළවල් ටික වසා ගැනීමට මාස 3 ක් 4 ක් ගතවෙනවා . එක් සුමානයක් තුල උදාහරණයක් ලෙස පටබැඳිමුල්ල කොට්ඨාශය ගතහොත් එම කොට්ඨාශයට සෞඛ්‍ය අංශයේ සහ කර්මාන්ත අංශයේ සේවකයන් සියල්ලම යොදවා එම ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරයා ගිහිල්ලා ඔහු යටතේ එම නිලධාරින් යොදවා අධීක්ෂණ කටයුතු සිදු කර පුළුවන්තරම් දුරට එම කොට්ඨාශයේ අඩුපාඩු සම්පූර්ණ කරන්න. ඊළඟ සුමානයේ අනෙක් කොට්ඨාශය. ඉන් අපි අදහස් වෙන්නේ නැහැ ඔබතුමාට තිබෙන බලය අඩුපාඩුවක් වෙනවා කියා .ඉන් මා අදහස් කළේ පටබැඳිමුල්ලේ මේ සුමානයේ වැඩ කරගෙන යනවිට ඔබතුමාට අවශ්‍යතාවයක් මත මහ අම්බලන්ගොඩට ක්ෂණිකව මෙම පිරිස යැවීමට අවශ්‍යතාවයක් ඔබතුමාට තිබෙනවා. ඔබතුමාට අවශ්‍යතාවයට එම සේවක පිරිස යවා ඊට දින දෙක තුනකට පසුව හරි නැවත එම පටබැඳිමුල්ලට දමන්න. එතකොට පටබැඳිමුල්ල කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරු ටික නිලධාරින් සමග එකතු වී එම කොට්ඨාශයේ වැඩ ටික නිම කරන්න පුළුවනි. මොකද ගරු සභාපතිතුමනි, මේ සුමානේ කාණුටික ගොඩ දැමුවහොත් කුණුටික ගෙනියන්න

කර්මාන්ත අංශයේ ට්‍රැක්ටරය පැමිණෙන්නේ ඊළඟ මාසයේ. කාණුවල වැලි පිරිලා ඉවරයි. ඊයේ පෙරේදාත් ගරු සෝභිත මන්ත්‍රීතුමා දන්නවා මේ වළවල් උඩින් තමයි වාහන ගමන් කළේ. වැඩ අංශයේ ට්‍රැක්ටරය පැමිණෙන තුරු සිටිය යුතුයි එය ඇදීම සඳහා. මා මේ පවසන්නේ දිනපතා කුණු ආදිය පවිත්‍ර දේවල් වලට අමතරවයි. කර්මාන්ත අංශය දිනපතාම යන්නේ නැහැනේ වැඩ කරන්න. මේ සියළුම කොට්ඨාශ අවරණය වන පරිදි මේ සියළු යන්ත්‍ර සූත්‍ර අවශ්‍යයි. මා කරිත්ත කන්ද ප්‍රදේශයේ පිට්ටනිය සුද්ද කරන්න කියා නිවාඩු මාසයේ පැවසුවේ. නිලධාරින් පුළුවන් විදියට යවනවා. වැටේ පරඬැල් කොළ එක දවසකට ගලවනවා. නැවත එක කාණුවක් සුද්ද කරලා එනවා. ළමුන් සෙල්ලම් කරන්න ගිහින් බෝලය නැතිවෙන නිසා පිට්ටනිය පුළුස්සා දමා ඇත. තවමත් භාගයක් සුද්ද කර ඇත. මෙවැනි දේ සිදු වන්නේ මේ නිලධාරින් ඔබතුමා හෝ උපසභාපතිතුමා හෝ තව රාජකාරියකට යොදවනවා. අපිට දැනගන්න බැහැ ඒ කොට්ඨාශයට ගියාම අපිටවත් සහභාගි වෙන්න අපි දන්නේ නැහැ. ඔබතුමා කියනවා මේ නිලධාරින්ට අපිට දන්වන්න කියා. සමහර වේලාවට ඒ අයටත් අපහසු වෙනවා. අපිටත් අපහසුතා තිබෙනවා. හැබැයි අපි දන්නවා නම් මේ සුමානයේ කරිත්ත කන්දේ කොට්ඨාශයේ කියා වැඩ කරනු ලබන්නේ අපිට ඒ කරිත්ත කන්ද කොට්ඨාශයේ මන්ත්‍රී වරුන්ට පුළුවනි අපේ වැඩ පැත්තක තබා වේලාව යොමු කර ගැනිමට ඒ සඳහා. මා මේ යෝජනාවෙන් ඉල්ලා සිටින්නේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ට මේ සෞඛ්‍ය අංශයත් , කර්මාන්ත අංශයත් එකතුකර සතියෙන් සතිය මෙය සෑම කොට්ඨාශයකටම ක්‍රියාත්මක කරන්න. ගරු මන්ත්‍රීවරුන් විදියට සෑම දිනකම නිලධාරින් 2.50 ට බැගැපත්වන්න බැහැ. ගරු මන්ත්‍රීවරු විදියට ආත්ම ගෞරුත්වයක් තිබෙනවා. එතුමන්ලා කිසිම දිනක අපිට බැහැ කියලත් නැහැ. දුරකථනය විසන්ධි කරලත් නැහැ. අපි දන්නවා ගරු මන්ත්‍රීවරු 21 කු කතා කරන බව. හැබැයි වැඩේ වෙන්නේ නැහැ. ජනතාව අපිට ඡන්දය දී තිබෙනවා. කිහිපවරක්ම කිහිප දෙනෙකුමමට කියා සිටියා තමුසෙට ඡන්දේ දිලා . බැරිනම් මෙකෙන් අස්වෙනවා කියා. සමහර පොඩි කරණා වලදි . අපි මොකක්ද කියන්නේ. අපි දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියා සේවක පිරිස ලබා ගැනිමට කටයුතු කළා. ඒ අනුමතිය අපිට ලැබුණා. තවකාලික සේවකයෝ අපිට ඉන්නවා. ඒක කියන්නත් බැහැ ජනතාවට. මාත් මාස 8 ක් තිස්සේ විමසලා බලලා තමයි මෙම යෝජනාව ගෙන එනු ලැබුවේ. ඔබතුමාලාට කාටවත් අගතියකින් නොවේ. සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ ගෞරුත්වය ආරක්ෂා වන විදියට මෙම යෝජනාව කළ යුතු නිසා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු සරත් ශ්‍රී ලාල් මහතා ගෙන එනු ලැබුවේ හොඳ කලෝචිත යෝජනාවකි. අම්බලන්ගොඩ නගර සභාවේ කොට්ඨාශ 13කි. එය ක්‍රමවත්ව කරගෙන යාම සඳහා එම යෝජනාව ඉතාමත් කලෝචිතයි . අපි එයට මුලිකත්වයක් දි කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

සුවිශාල කාලයක් නියෝජ්‍ය සභාපතිවරයෙකි. ඒ වගේම බොහෝ පරිණත ගරු මන්ත්‍රීවරයෙක් හැටියට නවමු යෝජනාව ගැන හිත යොමලා ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ගෙනා යෝජනාව අගය කරනවා මේ මොහොතේ. ඔබතුමාගේ අභිමතාර්ථයට අවැඩක් වනවා කියා මේ ගෙන එනු ලැබු යෝජනාවෙන්. මේ සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් මල්පැල ගැන්වෙන ආකාරයට තමයි මේ නවමු යෝජනාවේ තිබෙන්නේ. එමනිසා සෞඛ්‍ය කර්මාන්ත හා වෙනත් , උපදේශන සේවා ඒ සියළුම සේවාවන් එකතු කරලා අපිට මතකයි විපක්ෂ නායකතුමනි අපේ ගරු හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා ජංගම සේවාවන් සිදු කළා. අන්න ඒ වගේ ඒ සියළුම දෙනා ඒ ප්‍රදේශයට කැඳවාගෙන ගොස් ගැටළු පිළිබඳව සොයා බලා කඩිනමින් විසඳුමක් දෙන වැඩ පිළිවෙළක් තමයි මෙතුමා විසින් යෝජනා කරනු ලබන්නේ. සාවධානව මේ පිළිබඳව සිතයොදවා මෙම ක්‍රමයට අපේ අම්බලන්ගොඩ නගරයේ වැඩ කටයුතු සිදු කරමින් අනාගතයට යොමු වන ලෙස කටයුතු සිදු කළ යුතු බවට මා අදහස් දක්වනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

මේ යෝජනාව සම්බන්ධයෙන් මටත් යම්කිසි දෙයක් පැහැදිලි කිරිමට අවශ්‍යයි. ඇත්තටම මෙය සාධාරණව වැඩ කොටස් බෙදි යන සාධාරන යෝජනාවකි. මෙහිදි මා පසුගිය දිනක සෞඛ්‍ය අංශයේ වැඩ පරික්ෂක මහතාගෙන් ඉල්ලිමක් කළා.සති ගණනක් තිස්සේ කියා සිටියත් මීට දින දෙකකට උඩදි එවා තිබුණා සේවකයන් දෙදෙනෙකු. එම සේවකයන් දෙදෙනා දහවල් 1.00 පමණ වෙනතුරු පමණයි වැඩ කරනු ලැබුවේ. ඉන්පසු එම කාණු පද්ධතිය

සුද්ද කිරීම ඒ ටික විතරක් කර සම්පූර්ණම ඇණ හිට ඇත. මේ සඳහා යම් වැඩක් කර ගැනීමට අවශ්‍යා වූ විට සෞඛ්‍ය අංශයට, කර්මාන්ත අංශයට යම් යම් කරුණා කියා පාන්න සිද්ධ වෙනවා. ඉල්ලීම් කරන්න වෙනවා. සේවක ප්‍රශ්නය නිසා එතුමන්ලා පවසා සිටින්නේ එවන්නම් කියා. අපේ මූණට බැහැයි කියන්න බැරිකමට. නමුත් අපිත් ඒ වේලාවේදි අපහසුතාවයට පත්වෙනවා. මෙවැනි වැඩ පිළිවෙළක් යෙදෙනවානම් අපේ වැඩ ටිකත් ප්‍රදේශයේ තිබෙන වැඩ ටිකත් කරගන්න පුළුවන කම ලැබෙනවා. මෙම යෝජනාව මාත් දැඩි සේ විශ්වාස කරනවා ක්‍රියාත්මක කිරීම හොඳයි කියා. මා හිතන්නේ මාර්ග වල වළවල් වසා ප්‍රතිසංස්කරණ කටයුතු මුලින්ම ආරම්භ කරනු ලැබුවේ හේප්පුමුල්ල ප්‍රදේශයෙනි . දැනට මාස 9 ක් වෙනවා. එම වළවල් වසා තාර දැමූ පාරේ දෙවැනි වරත් තාර දැමීම සිදු කර නැහැ. නැවතත් එම මාර්ග කැඩී ඇත. අනෙක් මාර්ග තවම එහෙමම තියෙනවා. එම යෝජනාව ඉතා ඵලදායි යෝජනාවක් ලෙස දකිනවා. මින් ඔබතුමාටත් කිසි අවැඩක් සිදු වන්නේ නැහැ. ඔබතුමාට පුළුවනි හදිස්සි අවශ්‍යාතාවයක් සිදු වුවහොත් යම්කිසි මළගෙදරක් වුවහොත් එම වැඩය නතර කර සේවකයින් කැඳවා එම වැඩය කර ගෙන එම ස්ථානයට යැවිය හැකිය.

<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ විශේෂ යෝජනාව ගැන මාත් එක හෙලාම කැමැත්ත ප්‍රකාශ කර සිටිනවා. ගිය සභාවේදි ගරු උපසභාපතිතුමා හා මා වාද කර ගනු ලැබීම ගැන මා ඇත්තටම කනගාටු වෙනවා මේ සම්බන්ධව. අදාල කොට්ඨාශයේ වගකිව යුතු ගරු මන්ත්‍රීවරයා ගොඩක් අසරණ වෙනවා මේ තත්වය යටතේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන් එය මග හරවා ගත හැකිය. එය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා. මෙය කුමන ක්‍රම වේදයකට ද ? සතියට දින 5 කියද කියා ඔබතුමා අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාට ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා. අම්බලන්ගොඩ නගරයේ සංවර්ධන කටයුතු සිදුවන විට එක කොට්ඨාශයක නෙමේ නගරයේ ඇති කොට්ඨාශ 12 ම සිදු විය යුතුයි. එය හොඳින් බලා තමයි එතුමා මෙය යෝජනා කර තිබෙන්නේ. මා ඔබතුමාට ස්තුති වන්ත වෙන ගමන් මෙය හොඳ වැඩකි. මෙය කිරීම සඳහා ඔබතුමාගේ සම්පූර්ණ සහායෝගය ලබා දෙන්න. ගමේ මන්ත්‍රීවරයා මේ සංවර්ධන වැඩ කටයුතු වලට යොමු වන විට ගමේ අය දන්නවා ගමේ මන්ත්‍රීවරයා සොයා බලා එය කරනවා කියා. ඔබතුමන්ලාට කතා කර ඉල්ලා සිටියත් සමහර අවස්ථාවල ගන්න බැරි අවස්ථා තිබෙනවා. එම කොට්ඨාශයට ගෙන්වා ගැනීමට නොහැකි වෙනවා මෙතුමා ප්‍රකාශ කර ආකාරයට මාස 3,4 කටවත් කර්මාන්ත වැඩටික කර ගැනීමට. කාණුවල , බෝක්කුවල පස් පිරී ජනතාව කොච්චර කෑ ගැසුවත් කර ගන්න බැරි අවස්ථා තිබෙනවා. ඇත්තටම මෙවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමෙන් නගරයේ තිබෙන සියළුම මැතිවරණ කොට්ඨාශ සියල්ලම සංවර්ධනය වෙනවා.කොට්ඨාශ 12ම වැඩ කළ යුතු වෙනවා. එම නිසා තමයි ගරු මන්ත්‍රීවරුන් විදියට අපි පෙල ගැසි සිටින්නේ. එතුමාට නැවත වරක් ස්තුති වන්ත වෙනවා මෙවැනි යෝජනාවක් ගෙන එම පිළිබඳව. මෙය ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී ගංහේ සරත් ශ්‍රී ලාල් මහතා ගෙන එනු ලැබූ යෝජනාව ඉතාමත් කලෝචිත යෝජනාවක් ලෙස මා දකිනවා. ප්‍රථමයෙන් එතුමාට ස්තුති වන්ත වෙනවා. මුළු අම්බලන්ගොඩ ප්‍රදේශයේම ජනතාවගේ ඡන්දය දී ඒ අය සතු අයිතිවාසිකමක් අප වෙත ලබා දී තිබෙනවා. එම බලය ගෙන ඇවිත් ජනතාවට යම් දෙයක් කිරීමේ වගකිම අපට තිබෙනවා. සෑම පුරවැසියෙකුටම තිබෙනවා එක හා සමාන අයිතිවාසිකමක්. ඇත්තටම ගරු සභාපතිතුමනි ප්‍රකාශ කළ යුතුයි දැන් මාස 10ක පමණ කාලයක් අපි මේ ගරු සභාවේ සිටිනවා. සමහර කොට්ඨාශවලට කුඩම්මාගේ සැලකිලි ලැබිච්ච අවස්ථා තිබුණා. අපි කියා සිටියොත් යම් වැඩක් කිරීමට වැඩ පරිපාලක මහතුන් ප්‍රකාශ කර සිටින්නේ අනේ බැහැ. අරයට කියන්න . මෙයාට කියන්න. දැන් මේ ක්‍රමයට කිසිම ගැටුමක් නැහැ. මටත් එවැනි දේ සිදු වී තිබෙනවා. මහ අම්බලන්ගොඩ පාරේ තාර දමන්න කිව්වාම අරයට කියන්න මෙයාට කියන්න කියා කියපු අවස්ථා තිබුණා. මා සභාපතිතුමාට දුරකථනයෙන් කතා කර කිව්වාත එතුමාත් පැමිණ මෙය බලා කර දෙනු ලැබුවා. එතුමා පැමිණ සෑම දිනකම උදයේ අපිට වඩා අපගේ කොට්ඨාශවල අධ්‍යයනය

කරනවා. එතුමා අම්බලන්ගොඩ කොට්ඨාශය පුරාම යනවා. මා උදේට මා රාජකාරියට යනවිට එතුමා තම රාජකාරියට නොගොස් එය ඉටු කරනවා. එය මා අභය කරනවා. මෙසේ කිරිමෙන් ක්‍රමානුකුලව සිදු වෙනවා. සමානව සැම කෙනෙකුටම අයිතිවාසිකම් බෙදි යනවා. කෙනෙකුට ගැටුම් ඇති කර ගැනිමට අවශ්‍යතාවයක් නැත. ඔබතුමා මාගේ කොට්ඨාශයට වැඩ කරන්නේ නැහැ. නැතිනම් අර කොට්ඨාශයේ වැඩ නිම වනතුරු ඉන්න. ඔවැනි මත ගැටුම් තිබෙනවා. මෙය ක්‍රියාත්මක කරන්න. මෙය ක්‍රියාත්මක කලාම මේ සතියේ මේ කොට්ඨාශයේ කිච්චාම ජනතාව දැනුවත් . අපිට ජනතාවට ප්‍රකාශ කළ හැකියි ඔන්න මේ සතියේ අපේ කොට්ඨශයේ වැඩ සිදු කරන්නේ. මොනවාද කාණු සුද්ද කරන්න තියෙන්නේ. මොනවාද කළ යුතු වැඩ කියා. එවිට එම වැඩ ටික සිදු වෙනවා. මෙය කාල සටහනකට අනුව ක්‍රියාත්මක කරන ලෙස නැවතත් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ගෙන එනු ලැබු යෝජනාව ඇත්තටම ඉතා හොඳ යෝජනාවකි.මාස 5 කට පසු මොළය පැදි තිබෙනවා එතුමාට. කසළ ඉවත් කිරිම නම් ඉතා හොඳින් සිදු වෙනවා. අපිට ජනතාව කියනවානේ. කර්මාන්ත පැත්තෙනුත් යම්කිසි වැඩ කොටසක් සිදු වෙනවා. සේවකයන් සමඟත් යම් ප්‍රශ්න ගැටළු තිබෙනවා. වැඩ කරනා විට.ඔබතුමා ඒ සම්බන්ධවත් හොඳයි. කොට්ඨාශ 12ම සතියකට වඩා දෙන්න පුළුවන් නම් එය හොඳයි. වැඩි ගැටළු ඇති ස්ථාන වලට මුළුන් ලබා දී අනෙක් ඒවාට යන ක්‍රමවේදයක් සැදුවා නම් හරි. ඒ ගැන සලකා බලා එය ඉටු කර දෙන්න කියා ඉල්ලා සිටිනවා. අපේ පැත්තේ නම් බලා හොඳට වැඩ ටික කෙරෙනවා නේද ධම්මික මන්ත්‍රිතුමනි. අවුලක් නැ . එයටත් බොහොම ස්තුතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ඉදිරිපත් කර ඇති යෝජනාව අපි සියළු මන්ත්‍රිවරුන් විසින් ඒකමතිකව සම්මත කර ඔබතුමාත් , උපසභාපතිතුමාත් ඒ ප්‍රදේශයේ වැඩ කරනා විට ජනතාව සමඟ මුණ ගැසිම යම්කිසි ඉදිරියට බලාපොරොත්තු තිබෙන වා නම් එය හොඳයි. ජනතාව බලාපොරොත්තු වන්නේ විශේෂයෙන් විලේගොඩ ප්‍රදේශයේ මාර්ග වල වැඩ කෙරිම නැත. කසළ ගෙන යන මාර්ගයේවත් යාමට නොහැකි තත්වයේ තිබෙන්නේ. එමනිසා හොඳම ක්‍රමවේදයක් තමයි ගරු මන්ත්‍රිතුමා විසින් ඉදිරිපත් කර ඇත්තේ. මාස 8ක් තිස්සේ මොනවාද කෙරුණේ. මා නම් එක නිසාමයි යෝජනා ඉදිරිපත් නොකරන්නේ. ඉදිරිපත් කරනු ලබන යෝජනා වලින් මේ වසර තුල ක්‍රියාත්මක වි ඇති යෝජනා වල ප්‍රතිඵල බලනකම් තව දුරටත් යෝජනා ඉදිරිපත් කිරිමෙන් පලක් නැත. මේ හොඳ අවස්ථාවක් ගරු මන්ත්‍රිවරුන්ට ලැබි ඇත. ඒ සඳහා ගරු සභාපතිතුමාගේත් , උපසභාපතිතුමාගේත සහායෝගය ලබා දී අපව දිරිමත් කරන්න කටයුතු සිදු කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාගේ යෝජනාව ඉතාමත් කලෝචිත යෝජනාවකි. බොහෝ මන්ත්‍රිවරු ඊට එකඟව අදහස් දැක්වුවා . එමනිසා මා නැවත එම කාරණයම ප්‍රකාශ කිරිමෙන් සිදු වන්නේ කාලය ගත වීමයි. එම නිසා මාගේ හා අප පක්ෂයේ කැමැත්ත මෙම යෝජනාවට එකඟතාවය පල කර සිටිනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඇත්තටම මෙවැනි යෝජනවාක් ඉදිරිපත් විමට හේතු වූ කාරණය ඇත්තටම මා දන්නේ නැහැ. ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාට උද්ගත වුණේ කොහොමද කියා දන්නේ නැහැ. එතුමාත් හිටපු උප සභාපති කෙනෙකි. එතුමාගේ කාලයේ අපිත් විපක්ෂයේ සිටියා. ඒ කාලෙත් කර විදිය අපි දන්නවා. මේ කාලෙත් මේ යෝජනාව මේ විදියට ඉදිරිපත් කලත් ඕනැම මන්ත්‍රිවරයෙකුට ස්වාධින අයිතිවාසිකමක් ඇත. යම්කිසි ගරු මන්ත්‍රිවරයෙකුට තම කොට්ඨාශයේ වැඩක් සිදු නොවු කොට්ඨාශයක් මේ ටික කාලයට තිබේ නම් කියන්න. අද දවසේ තාර දමනු ලබන්නේ පෝරඹ කොට්ඨාඹයේ. ඊළඟට හිරේවත්ත කොට්ඨාශයේ වැඩ කර අවසන් . තව සුළු කොටසක් පමණයි ඇත්තේ. මේ කොට්ඨාශ වල ගරු සියළුම මන්ත්‍රිවරුන්ගෙන් මුලින්ම අසා තිබුණේ මුලින්ම තම කොට්ඨාශයේ සංවර්ධනය කළ යුතු මාර්ගය. මෙම ගරු මන්ත්‍රිවරු ටික දෙනා තමයි මුලින්ම කළ යුතු පාර ඉදිරිපත් කරනු ලැබුවේ. එම නිසා මෙවැනි යෝජනා දැම්ම ඉතාමත් වැරදියි. මෙවැනි යෝජනා දමා ජනතාවට කියන්න පුළුවනි මා මෙවැනි

යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව. එවැනි යෝජනා ඉදිරිපත් කර බලු වැඩ කරන්න එන්න එපා. දැම්ම කියන්නම් එවැනි ජාරා වැඩ කරන්න එපා. ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාගේ මාර්ගයක් සඳහන් කරන්න වැඩ නොකරන ලද .

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, ඔබතුමා කතා කරන විට බාධා කිරිමක් කිරිමට කැමති නැහැ. මාගේ නම සඳහන් කර කතා කරපු නිසා කියන්නම් බලු වැඩ කරන්නේ ඔබතුමා. මා නොවේ මේ සභාවේ. ඔබතුමායි . එක හොඳට මතක තියා ගන්න. මේ සභාවේ උදයට ඔබතුමාට හිතෙන පාර තමයි නම් කරනු ලබන්නේ.ඔබතුමා හිතනවා . හිමල් මහතාට කතා කරනවා. එය කරනවා. එච්චරයි. මේ ගරු සභාව මා වසර 16ක් නියෝජනය කරනවා. මෙහි සිටියා කර්මාන්ත අධිකාරි කෙනෙක්. කර්මාන්ත වැඩ පරික්ෂක මහතෙකු ඔහු. කර්මාන් අධිකාරිය හිමාල් මහතා අතරයි ලොකු වෙනසක් තිබෙනවා. තාක්ෂණ දැනුම අතින්. ඔබතුමා සියළු දේ පවරා මෙම මාර්ගයේ තාර දමන්න කියනවා. සුමාන දෙකෙන් පාරේ තාර ගැලවී යනවා. කිසිම තාක්ෂණ දැනුමක් නොමැත. ඔබතුමා උදයට පුටුවට වාඩි වී පැමිණ මේ පාර දමන්න. මේ පාර දමන්න කියනවා. එහෙම කොහොමද සභාවක් ගෙන යන්නේ.

__ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

එමෙහ තමයි කරන්නේ එහෙම නැතිව කොහොමද සභාවක් ගෙනියන්නේ. නැතිව ඔයා කළේ කොහොමද?

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

මේ ගරු සභාවේ කැමැත්ත ප්‍රකාශ කර කතා කළා. ඔබතුමාට විරුද්ධ වෙන්න බෑ. ඔබතුමා කොහොමද එහෙම කියන්නේ . ඡන්දයක් විමසන්න.

__ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

ඔයා කලේ කොහොමද ? එහෙම කොහොමද කියන්නේ. එහෙම කියන්න එපා. ඡන්දයක් අවශ්‍ය නැහැ කොහොම ගියත් මම තමයි තීරණය කරන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

එහෙම ගරු සභාපතිතුමාට කියන්න අයිතියක් නැහැ. සභාපතිතුමා වුණාට

__ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

සතියක් ගියොත් එක කොට්ඨාශයකට 12 ට ගියොත් මාස 4ක් ගතවෙනවා නැවත ලැබෙන්න . මේ විදියේ වැඩ කරලා අපේ පක්ෂය නැති කර ගන්න අපි කැමති නැහැ. අපි කරන්නම්. අපි පක්ෂය හැදුවේත් අපියි.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

පක්ෂය නැති වෙන්නේ නැහැ. ප්‍ර දේශයකට ගිහින් පාරක් සුද්ද කරන විට, තාර දමන විට , වැසිකිළි සුද්ද කරන විට පක්ෂය නැති වෙනවාද? පක්ෂය ඇති වෙනවා. මතක තියා ගන්න ඒක. අපිට පොදුජන පෙරමුණට ඡන්දය දී ඇත්තේ ජනතාව එය ඉටු කරිමටයි.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

යෝජනාවක් ඉදිරිපත් කිරිම පිළිබඳ ගැටළුවක් නැහැ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ මේ මහත්වරුත් මෙය පාලනය කර තිබෙනවා. මේ පුටුවේ වාඩි වී බලන්න .

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඔබතුමා දිලා බලන්න කරනවාද නැද්ද කියා.ඔබතුමා හිතාගෙන ඉන්නේ ඔබතුමාට විතරක් මෙය කළ හැකි කියා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ජනතාව දෙන්න කැමති නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ජනතාව නෙමේ දුන්නේ. අපේ ජනාධිපතිතුමයි ඔබතුමා පත් කළේ. ජනතාව ඔබතුමාට දුන්නේ නැහැ සභාපතිකම. අපේ ගරු පක්ෂයේ සභාපතිතුමා ඔබතුමා පත් කරන්න කිව්වා සභාපති වශයෙන්. අපි පිළිගත්තා. එච්චරයි ඔබතුමාට සභාපතිකමට ඇති සුදුසුකම . මටත් සුදුසුයි , ගරු උපසභාපතිතුමාටත් සුදුසුයි සභාපතිකමට අත් දැකීමෙන් . මාත් 4 වතාවක් මේ ගරු සභාව නියෝජනය කර තිබෙනවා. ගරු උපසභාපතිතුමාත් 4 වතාවක් ගරු සභාව නියෝජනය කර තිබෙනවා. මා නොකඩවා 4 වතාවක් නියෝජනය කර තිබෙනවා. පණත අනුව ඔබතුමා වගේම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකි මා. මට කතා කරන්න අයිතියක් තිබෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා විරුද්ධයි එයට

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

නෑ ඔබතුමා එක වතාවක් ඉදලා තමයි පත් වී ඇත්තේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

නෑ ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ කතා කරන්න එන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

පණත කියවා බලන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

පණත වැඩක් නැහැ. ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ මා ඔබතුමාට වඩා වසරකින් වැඩියි.ගරු සභාපතිතුමනි , මා ඔබතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා පණත අනුව ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම වාර්තාවක් ලබා දෙන ලෙස.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

පණත අනුව ජ්‍යෙෂ්ඨත්වය අනුව ක්‍රියාත්මක කරන්න. කවුද ජ්‍යෙෂ්ඨ කියා.

**ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

පැය 24 පුරාම අපි සැමදෙනාම මුහුණට මුහුණලා මුණ ගැසෙන අයයි. අද මුණ ගැසී යන පුද්ගලයන් නෙමේ. ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ ප්‍රශ්නයක් නෙමෙ කතා කරනු ලැබුවේ. ජ්‍යෙෂ්ඨත්වය නෙමේ කණිෂ්ඨයකු වුවත් , අපි

පක්ෂයේ තීරණයට ගරු කළා. අපි එසේ ගරු කළ යුතුයි. ජ්‍යෙෂ්ඨත්වය ද කණිෂ්ඨ කියා නෙමේ පක්ෂය ඔබතුමා පත් කරනු ලැබුවා. අපි ඔබතුමා පිළිගෙන වැඩ කටයුතු සිදු කරගෙන යනවා. ගරු සභාපතිතුමනි මේ දින 7 ප්‍රශ්නය තිබේ නම් දැන් මෙහි ගැටුමක් ඇති කර ගත යුතු නැහැ. මෙය සමසේ බෙදී යන්න මෙය දින 3ක් අවම වශයෙන් දින 60 කි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

දවස් 3 න් කාණුවක්වත් සුද්ද කරගන්න බැහැ. පාරවල්ම සාදන එක නෙමෙනේතියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

දින 4 ක් වගේ දමන්න. ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාණෙනි, මෙසේ කිරීමෙන් මාස 1 ½ ක් පමණ ගතවෙනවා නැවත තම කොට්ඨාශයට පැමිණෙන විට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

දැන් මාස 6කට වත් මෙය සිදු වන්නේ නැහැ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා ලබන සභාවට මෙම වැඩසටහන් විස්තරය ලබා දෙන්නම්. හැබැයි මැදදි එකෙක්වත් ඉල්ලන්න නම් එපා පැමිණ . එක්කෙනෙක්වත් ඉල්ලන්න එපා අතරමග පැමිණ . අර උත්සවය , අර කඨිනෙයි, මගේ පන්සලට යන්න ඕනැ කියා ඉල්ලන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , එසේ කරන්න එපා. සතියකට 6කු දෙනවා . අපි තාර දමන්නේ කොහොමද ?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

6 දෙනාගෙන් තාර දැමීමට බැරිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ට්‍රැක්ටරයට එක්කෙනෙකු අවශ්‍යයි. තාර උණුකරන එකට 2ක් අවශ්‍යයි. තාර වක්කිරීමට 1 අවශ්‍යයි. ගල් දමන්න 1 අවශ්‍යයි.10 කුට වැඩියේ අවශ්‍යයි. කොහොමද අපි වැඩ කරන්නේ . අපිටනම් එහෙම එපා . තාර දමන්න අවශ්‍ය 10 ද 15 ද අපිට ඕන ඒ ප්‍රමාණය. සමස්තය ද 6නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නැ මුළු සමස්ත කර්මාන්ත අංශයම අවශ්‍යයි .

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය සහායෝගයෙන් සිදු කර ගෙන යන්න. ගැටළු ප්‍රශ්න ඇති කර ගන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සෞඛ්‍ය අංශයේ සේවක ප්‍රශ්නයක් තිබෙනවා. සෞඛ්‍ය අංශයේ වැඩ පරිපාලක තුමා අප සමඟ පැවසුවා නියමිත නිවාඩු 45ත් ගෙන තවත් නිවාඩු 45, 50 ක් ගන්නා බව. එවිට වැටුප් නොමැතිව තමයි ඔවුන්

සිටින්නේ. ඔබතුමාගෙන් ඉල්ලීමක් කර සිටිනවා කම්කරු ගැටළුවත් මෙතැන තිබෙන නිසා මෙයට විසඳුමක් සොයන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙවැනි යෝජනාවක් ලැබීමට හේතු වී ඇත්තේ අපි භාරගනු ලැබුවේ වසර 3ක පමණ කාලයක සිට කොමසාරිස් පාලනයේ තිබූ නගර සභාවකි. සුන්බුන් වී ඇති මාර්ග සහිත නගර සභාවකි. තවම අපිට නොහැකි වී තිබෙනවා එය සම්පූර්ණ කර ගැනීමට. මුලින්ම මේ කොට්ඨාශයේම ගරු මන්ත්‍රීවරුන්ගේන් විමසා මොන මාර්ගය තම කොට්ඨාශයෙන් ඉදිරිපත් කළ යුත්තේ කියා ඔවුන්ගෙන් විමසා බලා තමයි මෙය සිදු කර ඇත්තේ. මා කවදාවත් මගේ කැමැත්තට මාර්ග දමා නැත. මගේ කැමැත්තට දමා තිබෙනවා පටබැඳිමුල්ල කොට්ඨාශයේය. නමුත් අනික් එවාට සියළුම මන්ත්‍රීවරුන්ගෙන් අසා ඇත. දින වෙන්කරනා විට අපි හිතමු සතියක් විතර වර්ෂාපතනය ඇති වුවහොත් එම සතියේ කරන්න දෙයක් නැති වෙනවා. එවැනි ගැටළු තිබෙනවා. මෙතන බෝඩ්එකේ තිබෙන නමයි මම ජොෂ්ඨයි කියා ප්‍රශ්න ඇති කරන්නේ නැතිව සහායෝගයෙන් වැඩ කරන්න. මෙම යෝජනාව ඉදිරිපත් කර ගරු මන්ත්‍රීවරයා මෙම සභාවේ උප සභාපති වශයෙන් වසර 4 ක් සිටි පුද්ගලයෙකි. දන්නවා මෙය කරන්න පුළුවන්ද කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය තාර දමන එක විතරක් නෙමේ. මේ කාණුවක් සුද්ද කරන එක . පාරවල් වල කැලැව සුද්ද කරන එක. එවැනි දේවල් සිදු වන්නේ නැහැ. මේ ජනතාව කියන දේවල්.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පාරවල් වල අයින් සුද්ද කිරිම තරම්වත් වේලාවක් නැහැ මේ දින වල අපිට. ජනතාවට ගමන් කිරිමට පුළුවන් විදියට මාර්ග සංවර්ධනය කරගත යුතුයි. ඊට පසු තමයි පාරවල් අයින් සුද්ද කිරිම කරන්න වෙන්නේ. එහෙම සේවකයෝ නැහැ. මේ සියළු වැඩ කිරිමට සිටින්නේ සේවකයෝ 25කි. ඔය සියළු දේවල් කරන ගමන් කසළ අදින එක ආදි සියළුම දේවල් ඒ අතර කළ යුතුයි. එහෙම කරනා විට ලේසියෙන් කළ නොහැකිය. මෙම 05.02.01 යෝජනාව සම්බන්ධයෙන් පක්ෂ අය සිටි නම් ඡන්දය ප්‍රකාශ කරන්න. නැ මෙම ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කරන ලද යෝජනවයි.

මේ සඳහා පක්ෂව ඡන්දය 15 ක් ප්‍රකාශ කල අතර අනෙක් පිරිස ඡන්දය දිමෙන් වැලකි සිටිනවා. මෙය සම්මත වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ඉදරිපත්කර සම්මත කිරිම ගැන.

**තීරණය**

දැනට ඡන්ද කොට්ඨාශ 12 කට බෙදී ඇති එක් එක් ඡන්ද කොට්ඨාශයකට නගර සභා කර්මාන්ත අංශයෙන් සහ සෞඛ්‍ය අංශයෙන් ඉටුවිය යුතු සේවාවන් එක් සතියකට එක් කොට්ඨාශය බැගින් නම්කර සතියෙන් සතිය සෑම කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි වැඩ සටහන් ක්‍රියාත්මක කිරිමේ යෝජනාව සභාවට ඉදිරිපත් කිරිමෙන් පසුව විරුද්ධත්වයක් පැන නැගුන බැවින් ඡන්දය විමසන ලදුව යෝජනාව පක්ෂව ඡන්ද 15ක් හා අනෙක් අය ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැලකි සිටි අතර වැඩි ඡන්ද 15කින් එම යෝජනාව සම්මත විය.

**05.02.02** **කරිත්තකන්ද වසමේ පිරිස් වෙද මාවත සහ කුලරත්න පාර යාකරන හරස් පාර , නවාරා , පුද්ගලික පංතිය අසලින් උතුරට අංක8/සී/1 කොඩිකාර මහතාගේ නිවසට යන මාර්ගය , දෙපස සියලු නිවැසියන්ගේ ඉල්ලීම පරිදි එම මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීම සුදුසු යයි යෝජනා කර සිටිනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කරිත්තකන්ද වසමේ පිරිස් වෙද මාවත සහ කුලරත්න පාර යාකරන හරස් පාර , නවාරා , පුද්ගලික පංතිය අසලින් උතුරට අංක8/සී/1 කොඩිකාර මහතාගේ නිවසට යන මාර්ගය , දෙපස සියලු නිවැසියන්ගේ ඉල්ලීම පරිදි එම මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීම සුදුසු යයි යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙය නගර සභාවේ මාර්ගයකි. මෙම මාර්ගය පවරා ගැනිමත් මෙම සභාවේදිම තමයි සිදු වි තිබෙන්නේ. මෙම මාර්ගය පවරා ගැනිමක් සිදු නොකර ඇස්තමේන්තු සාදා එවා ඇත. මෙය ඉදිරිපත් කරන්නෙත් මෙම සභාවට . ඇස්තමේන්තුත් සාදනවා මෙම සභාවට

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම ඉල්ලීම කරනු ලැබුවේ මා උපසභාපතිතුමා තමයි මගෙන් මෙම ඉල්ලීම කරනු ලැබුවේ එම අය එතුමාගේ ඥාතින් බවත් මෙම යෝජනාව සභාවට යොමු කරන්න කියා. එම නිසා තමයි ඇස්තමේන්තු සකස් කරන්න කිව්වේ. ඇත්ත කතා කරන්න ගරු උපසභාපතිතුමනි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඇත්ත තමයි ප්‍රකාශ කරනු ලැබුවේ. මා මෙය කණ්ඩායම් රැස්විමෙදිත් විමසා සිටියා. ඇත්ත කතාන්දරය මා පැවසුවා මෙම මාර්ගය සකස් කර යුතු බව . එය නෙමෙයි මා ප්‍රකාශ කරන කතාව . මෙය අනුමත වන්නේත් මෙම සභාවේ . ඇස්තමේන්තුව එන්නෙත් මේ සභාවට

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

කලින් සභාවලත් මෙසේ පැමිණියා. බලන්න ඕන තරම් පැමිණ තිබෙනවා ඇස්තමේන්තු

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා එයට පිළිතුරු දෙන්නම් 10.01 දි . මා එය ඉවත් කරනවා .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා විමසා සිටින්නේ නිත්‍යානුකුල තත්වයයි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සැම දෙයම නිත්‍යානුකුල තත්වයටයි මින් ඉදිරියට සිදු කරනු ලබන්නේ.ඔබතුමා වාඩිවෙන්න

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඇයි එය මට විමසා සිටිමට බැරි. එසේ ඇසිමට අයිතියක් නැද්ද මට? මෙහි ම තිබෙනවා මෙය ඉදිරිපත් කර . එහෙම ඉදිරිපත් කරනවානම් නැවත ඇස්තමේන්තු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඒ යෝජනාවට මොකද වෙන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම යෝජනාවත් , පවරා ගැනිමත් , ඇස්තමේන්තුවත් මෙම සභාවට තමයි ඉදිරිපත් වි ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාවට පක්ෂද නැද්ද කියා ඡන්දය විමසන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට එය විමසන්න බැහැ. මට එයට නිත්‍යානුකූලව කටයුතු කල හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මේ යෝජනාවනේ ඔබතුමා ඡන්දය විමසන්න. මෙය ජනතාවගේ ප්‍රශ්නයකි. ඔබතුමාට එහෙම ඉවත් කරන්න බැහැ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙය සභාවට යොමු කර සභා අනුමතිය ලබා ගන්න. එහෙම කුමන්ත්‍රණයක් තිබේද කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙනවානේ . එම නිසා මෙය හැල්ලුවට ලක් කරන්න එපා.ගරු මන්ත්‍රීවරයෙකු යෝජනාවක් ඉදිරිපත් කලාම එය කරනවාද නැද්ද කියා සම්මත කරනවාද නැද්ද කියා තීරණය කරන්න. නැතිනම් හරි නෑ එම නිසායි අපි ප්‍රකාශ කරන්නේ. යෝජනාව ස්ථිර කර ඉතිරි වැඩ ටික කරගෙන යන්න.නිලධාරිගේ ප්‍රශ්නයක් තිබේ නම් ඒ ගැනත් කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එතුමාගේ යෝජනා වලත් මෙය තිබෙනවා. කුමන්ත්‍රණයට මෙතුමාත් හවුල්

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිලධාරි යෝජනාවක් වශයෙන් ඇතුල් කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එතුමා ඉදරිපත් කරනා විට හොඳයි. සරත් මන්ත්‍රීතුමා කරන විට කුමන්ත්‍රණේ. එතුමා ඊට කලින් යෝජනා කරලා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය නිලධාරි යෝජනා වේ.නිලධාරින් විසින් මට එවන විට මා එවනවා යෝජනා කියලා. මා එය අනුමත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුලත් කරනා විට යම් දැනුවත් වීමක් තියෙනවානේ . මා අසන්නේ එතැනදි මෙය ඉවත් කරන්න.කාගේ හෝ ගරු මන්ත්‍රවරයෙකුගේ යෝජනාවක් නේ. එය සම්මත වන්නේ නැතිනම් ඉවත් කරන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

යෝජනාවක් වශයෙන් සම්මතයි.

**තීරණය**

කරිත්තකන්ද වසමේ පිරිස් වෙද මාවත සහ කුලරත්න පාර යාකරන හරස් පාර , නවාරා , පුද්ගලික පංතිය අසලින් උතුරට අංක8/සී/1 කොඩිකාර මහතාගේ නිවසට යන මාර්ගය , දෙපස සියලු නිවැසියන්ගේ ඉල්ලිම පරිදි නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමේ යෝජනාව පිළිගැනිම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ ජගත් කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**05.03** **<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සිමාවේ 86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියසක් ඉදිකිරිම සඳහා සභාවේ ඉඩමක් වෙන් කර දුන් බැවින් මෙම ගොඩනැගිල්ල ඕකන්ද අත්කම් නිවාස අංක 09 නිවස ඉදිරිපිට තාප්ප මායිමේ සිට සුසාන භූමියේ මායිම දක්මා උතුරු දිසාවට ඇති ඉඩම , සුසාන භූමිය පිටුපස තොරණ ගසා ඇති තැන විහාරගොඩ පාරට මුහුණලා ඇති ඉඩම් කොටස ( මෙම කොටස පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමට අයත්වේ.) මෙම නිල නිවස ඕකන්ද ග්‍රාමයේ ම ඉදිකිරිමට අවශ්‍ය බිම් කොටස ක් ලබා දෙන ලෙස යෝජනා කර සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම යෝජනාව ස්ථිර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඔබතුමා සමඟ පසුගිය සභාවේදි මෙම නිලපියස ඉදිකිරිම සම්බන්ධව කමිටුවක් පත් කර ඕකන්ද පෙර පාසල හා පුස්තකාල ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ ඉදිකිරිමට යෝජනා කර කමිටුව අනුමත කර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යවන ලදී. ප්‍රා දේශිය ලේකම්තුමියත් මෙම මුදල් රඳවා ගෙන ඉන්නවා. මෙම මුදල් රදවා ගෙන සිටිය නොහැක. ඉඩම් කොටසක් ලබා දී තමයි මෙම මුදල් ලබා ගෙන තිබෙන්නේ. ඔබතුමටත් සමහර පිරිස් පැමිණ කියා සිටියා . ගමේ නිල පියස ඉදිකිරිමට ගොස් ගමේ අයගේ විරෝධතාවයක් පැමිණෙනවාට මා කැමති නැහැ. ගමේ ජනතාවට සේවය කිරිමටයි මා සුදානම් වන්නේ. මෙම නිලපියස මඟින් ගමේ සිටින පුද්ගලයන්ට උප්පැන්න සහතිකයක් ගෙදර සිට ලබා ගැනිමට ලහම තිබෙන නිල පියස මඟින් ලබා ගැනිමට ක්‍රමයක් සාදන බවට ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කර සිටියා.මෙය අත්‍යවශ්‍ය දෙයකි. මා මේ කරන්න යන කාර්යයට ගරු සියළුම මන්ත්‍රිවරුන්ගෙන් ගෞරුත්වයෙන් ඉල්ලා සිටිනවා පක්ෂ පාට භේදයකින් තොරව සහායෝගය ලබා දෙන ලෙස. මෙම නිල පියස මට සෑදිමට අවශ්‍යයි. මාහට ගරු කොඩිකාර මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටියා අපි මේ සභාවේ දි තිරණයක් ගන්නා බව. ගමේ අය විරුද්ධ වන නිසා එය ඉදිකරන්න එපා කියා. මා

එතුමාටත් ගරු කළා. එම භූමියේ ඇති පෙර පාසලේ ඔංචිලි ආදි සියළුම දේවල් ගලවා ඇත. ඒවත් නැවත සකසා ගත යුතු වෙනවා. ඒවා ගලවා තිබියදිත් මා අත්තිවාරම දැම්මේ නැහැ.ගරු මන්ත්‍රීවරුන් දූරකථනයෙන් කතා කර පැවසු පසු මා ඊටත් සවන් දුන්නා. ගරු සභාපතිතුමනි , මෙය කොහොම හරි මේ සඳහා මට අවසරය ලබා දෙන්න . එය ඉදිකිරිමට අවශ්‍යයි. මෙයට අවශ්‍ය භූමි ප්‍රදේශය ලබා දෙන ලෙස ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි,නිල සෙවණට දැන් සියළු දෙනාම විරුද්ධයි. ගොඩක් අය විරුද්ධයි. සුසාන භූමියේ සාදනවාට මා කොහෙත්ම විරුද්ධයි. වෙන කොහේ සැදුවත් මට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමිය ඊට උනාන්දු නැහැ. උනාන්දු වන්න.සුසාන භූමියක සාදා අපට එම පාපකර්මයට හසු වෙන්න බැහැ. අර පහළ ඇති ස්ථානයේ මෙය ඉදිකරන්න.කොළඹට වි ඉද හරියන්නේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

පහළ ස්ථානයක් නැහැ. මෙහෙමයි මා එක්සත් ජාතික පක්ෂයේන් මෙය වෙන්කර ගත්තා කියා කිසිම කෙනෙකුට අභියෝගයක් වෙන්න එපා. මේ කරනු ලබන්නේ ගමේ වැඩකි.  ගම් වැසියන්ට අයිති දෙයකි. පක්ෂ පාට බලන්න එපා. වෙන ඕකන්දේ කිසිම තැනක් නැහැ. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා ප්‍රකාශ කලාට එම ස්ථානය ගිහින් මැන බැලුවා.එතැන ගන්න බැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

කොහේද මැන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

අර හංදියේ ඥානසිලි අක්කාගේ ගේ ගාව ඇති ඉඩම් කැල්ල ගන්න බැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එතැන නෙමේ අර ළිඳ ලඟ උඩ ඇති ඉඩම් කැබැල්ල

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

ළිඳ ලඟ ඇති ඉඩම් කැබැල්ල ගන්නවානම් සභාවෙන් එය ගොඩ කරන්න වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

සභාවෙන් ගොඩ කරන්න නෙමේ . මට්ටම් කර පොඩි බැමි කැල්ලක් විතරයි දමන්න තිබෙන්නේ. තමන් උනාන්දු වි වැඩය කළ යුතුයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

එසේ නම් එම බැමි කැල්ල සභාවෙන් බැද දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , සුසාන භූමියේ ඉඩම් කැබැල්ල සුද්ද කර ක්‍රිකට් ගැසිමට සෙල්ලම් කිරිමට ළමුන් සාදාගෙන ඇති තැන්. ඒවායේ ඉදිකරන්න යාම අපිටත් ගැටළු වලට මුහුණ දෙන්න සිදුවෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ සභාව ඔය සම්බන්ධව තින්දුවක් ගන්න බැරිනිසා තිරණයක් ගැනිමට පත්කළා ගරු මන්ත්‍රිවරු කණ්ඩායමක්.ගරු නගර සභා මන්ත්‍රී අයිරාංගනි මහත්මිය, නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා, නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා, නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා, නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කළා. මේ කමිටුව එකතු වි තින්දුවක් ගෙන අපට කියන්න. අපි ඊට එකඟ වෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කමිටුවල තින්දු වැඩක් නැහැ. නගර සභාවේ දේපලක තිබෙන විට ඔබතුමා ගිහින් බලා එය සාදා දෙන්න.පෙර පාසල ඇති ස්ථානයේ ගැටළුව පැන නැගුනේ දරුවන්ට සෙල්ලම් කරන්න නැහැ කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි එම ගොඩනැගිල්ලේ තිබෙනවා දිග සහ පළල ප්‍රමාණයක්. මේ සඳහා ගොඩනැගිලි සැලසුමක් ඇත. අපිට ඕනෑ ආකාරයට ගොඩනැගිල්ල ඉදිකල නොහැක. බොරුවට අතන හදන්න මෙතැන හදන්න කිව්වාට බැහැ. ඉඩකඩ මදිනම් එතැන සෑදිමට බැහැ. දෙන ලද සැලැස්මට අනුව තමයි ගොඩනැගිල්ල ඉදි කළ යුත්තේ. ඒ සඳහායි මුදල් වෙන් කර ඇත්තේ. මේ සඳහා තාක්ෂණ සේවා නිලධාරින් කිහිප තැනක්ම මැන බැලුවා. ඔබතුමලා සුසාන භූමියෙන් දෙන්න බැහැ කිව්ව නිසා මා මේ පිළිබඳව විමසා බැලුවා. සභාවේ තිරණය අනුව රජයේ ගොඩනැගිල්ලක් ඉදිකිරිමට කිසිදු ප්‍රශ්නයක් ඇති නොවන බව දැන ගනු ලැබුවා. මා ඒ පිළිබඳව ගරු සභාපතිතුමාට දුරකථනයෙන් දන්වා සිටියා. මා වැඩසටහනකට සහභාගි වූ අවස්ථාවේ මේ පිළිබඳව නිලධාරින් විසින් ප්‍රකාශ කර සිටියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නිලධාරින් කියාවි . මෙම ඉඩම් දි ඇත්තේ මුදලට නෙමේ. සෑදිමට අවශ්‍ය නම් පහළ ස්ථානයේ සාදා ගන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මා පවසන්නේ ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කියන ස්ථානයේ අපිට මෙය ඉදිකළ හැකියි. එවිට කිසි ප්‍රශ්නයක් නැහැ. ගල් බැම්මක් නගර සභාවෙන් ඉදිකර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

දැන් මේ ලැබුණු මුදලකි. මෙය වෙන්කර ගෙන සිටිය නොහැක. මා හට ප්‍රා දේශිය ලේකම්තුමිය 3 න් 4 වතාවක් කතා කළා. අර රාහුල මන්ත්‍රිතුමා කියන ස්ථානයේ අපිට ගල් බැම්ම ඉදිකර දෙන්න. මෙම මුදල නැතිනම් යනවා.අපි එය ඒ විදියට ඉදිකරන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගල් බැම්ම ඉදි කළහොත් ලක්ෂ 30 ක් විතර යනවා.ගොඩනැගිල්ලට වඩා මුදලක් වැයවෙනවා. මෙය යට පතුලටම කැපිය යුතුයි. ලක්ෂ 20 ක ගොඩනැගිල්ලක් ඉදිකරන්න ලක්ෂ 30 ක ගල් බැම්මක් ඉදිකරන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අද දිනයේ තින්දුවක් ගෙන කියන්න. නැතිනම් එම මුදල නැවත යනවා. නැතිනම් මෙම මැතිවරණ කොට්ඨාශයේ වෙනත් තැනකට මෙය යොමු කළ යුතුයි. ප්‍රා දේශිය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කරගෙන තමයි මෙතුමිය හා මා මෙම මුදල් රඳවා ගෙන තබා සිටිනුයේ .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කොහේ හරි තැනක් සොයා දෙන්න. මෙය ඉදිකරන්නේ අපේ නගරයටනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි සභාවෙන් යම් ස්ථානයක් දි තිබුණේ. එ දෙනු ලැබූ ස්ථානයට මහජන විරෝධය මත තමයි එතුමියට මෙය නතර කිරීමට සිදු වුයේ. ළමයින්ට සෙල්ලම් කිරීමට තිබූ ළමා ක්‍රිඩාංගනයත් ගලවා දැම්මා. එතැන එය ඉදිකිරීමට අපි අවසර දුන්නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතැන වැඩ කරන්න යනවිට මෙතුමිය නැහැ. සාකච්ජා කරන්න ජනතාව සමඟ මෙතුමිය පැමිණ සිටිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාණෙනි එම දෙයට මා සම්පුර්ණ විරුද්ධයි. දැන් හරි ප්‍රශ්නයක් මට වි ඇත්තේ. පෙදූජන පෙරමුණේ පාර්ශිකයන් කියනවා පුස්තකාලයේ මෙය ඉදිකරන්න එපා කියා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අය කියනවා සුසාන භූමියේ ඉදිකරන්න එපා කියා. එසේ නම් මෙය කොහොද ඉදිකරන්නේ.මේ සඳහා කැමැත්තෙන් ගරු මන්ත්‍රීවරු මේ සඳහා මට උදවු කළ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා පත්කරනු ලැබූ කණ්ඩායම මා හට දි ඇත්තේ පුස්තකාල ගොඩනැඟිල්ල පිහිටි භූමියයි. ඉතිං එම ස්ථානයේ එය ඉදිකරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එහෙනම් සභාපතිතුමනි , මා පුස්තකාල භූමියේ බලෙන් හරි හෙට අත්තිවාරම් දමන්නම්.එත් මට ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා කතා කර කියනවා එය නතර කරන්න. අපි මේ සභාවෙන් මොනවා හරි කරන්නම් කියා. එවිට මා අසරණයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාත් එහි ඉදිකරන්න කියා අත්සන් කර දි තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අදාහනාගාරයට කොච්චර විරෝධතා පැමිණියාද ? එහෙත් අපි එය සෑදුවා. මේ සුසාන භූමි ප්‍රශ්නය අපිට විතරක් බලපාන ප්‍රශ්නයක් නෙමේ. පොල්වත්ත , කෙරමිණිය , පින්නදූව , ඕකන්ද ආදි අම්බලන්ගොඩ නගරයේ අනික් තැන්වලටත් ගටළුක් වෙනවා මෙය. ඉතා අසිරුතාවයකට පත්වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එසේ නම් ප්‍රජාශාලා ගොඩනැගිල්ලත් ඉදිකර ඇත්තේ සුසාන භූමිය පිහිටි ඉඩම තුලයි. කවුද එයට විරුද්ධ වුණේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොන ගොඩනැගිල්ලද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

දැන් සාදා ඇති ගොඩනැගිල්ල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොනවා කියනවාද මන්දා. ඔබතුමිය සිමාවන් වත් දන්නේ නැහැ. එය නගර සභා දේපලකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු රාහුල මන්ත්‍රතුමා කතා කරන්න එපා. ගමේ අය අත්සන් කර ලිපියක් දි ඇත එම ස්ථානයේ සාදන්න කියා.විරෝධතාවයක් නොමැතිව ගමේ ජනතාව දි තිබෙනවා එම සුසාන භූමියේ එම අඩි ගණන ලබා ගන්නා ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා කියන්නේ සුසාන භූමියේ ඉදිකරන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

අනේ ඒ හරියේ මළ සිරුරු වළ දමන්නේ නැහැ. ඒ මාර්ගයේ යන පන්සල ළඟ ඇති වැදගත්ම තැනක් ලෙස තමයා මාගේ නම් අදහස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතැන ඉදිකිරිමෙන් වාහන හරවා ගැනිමට වෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඇයි පන්සල ලඟ ඇති පිට්ටනිය

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පිට්ටනියේ කොහෙද බෝල් ගහනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම ස්ථානය තමයි සුදුසුම තැන. මාත් පවසනවා ළමයින්ගේ ක්‍රිඩාංගනයක් ගලවා මෙය ඉදිකරන එක මට ලොකු අභියෝගයක් වුවා. දෙමාපියන් පවසන්නට ගත්තා ඔයාලත් පෙර පාසල් කරපු අය නේද , ඇයි මෙය කරන්නේ. කාන්තාවන් සියළු දෙනාම මා වටා පිරුණා. ගලවන ලද ඔංචිලි ආදිය තබා මා එහි අත්තිවාරම් දැමුවේ නැහැ. ඇත්ත සිද්ධිය එයයි. ගමේ අයගෙන් අභියෝගයක් වුණා. අතන එහෙම කිසිම අභියෝගයක් එන්නේ නැහැ. මොකද වළ දමා ඇති මිනි නැගිටලා එන්නේ නැහැනේ මෙතැන ඉදිකරන්න එපා කියා. ගමේ ජනතාව අත්සන් කර දි තිබෙනවා.ගමේ ජනතාව 76ක් 86ක් විතර අත්සන් කර දි තිබෙනවා ගරු ස්වාමින් වහන්සේ සමඟ. එම ස්ථානයේ ඉදිකරනවාට කැමති බවට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය ක්‍රිඩාංගනය ඉදිකරන්න පස් කපා අපි බොහෝ වෙහෙස මහන්සි වි තමයි එය පොදු දේපළ රැක ගැනිමට වැඩ කර ඇත්තේ. මෙතුමිය දන්නේ නැති වුණාට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ක්‍රිඩා පිටියේ කිසිම බාධාවක් වන්නේ නැහැ. දැන් මෙතුමාගේ මාමාණ්ඩියම තමයි මට ලිපිය ලියා දුන්නේ. එතුමා ඇත්තටම බුද්ධිමත් කෙනෙක්. ඇත්තටම ජයවිර මහතා කියන්නේ අපේ ගමේ ප්‍රභූවරයෙකි. මහින්ද මහතා ජයවිර මහතා කියන්නේ ගමේ ප්‍රභූවරුන්ය. ඒ අය ම තමයි අත්සන් කර ලිපිය දුන්නේ මෙතැන හදන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සුසාන භූමියක ගොඩනැගිල්ලක් ඉදිකරනවා කියන්නේ සම්පූර්ණම වැරදියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගමේ ප්‍රභූවරු කියා සිටින්නේ එතැන සුදුසුයි කියා. මොකද වයසට ගියාම ගමේ අයට යාමට පහසු තැනක තමයි මෙම නිලපියස ඉදිකළ යුත්තේ. වයසක අය තමයි යන්නේ ග්‍රාම නිලධාරි මහතා , සමෘද්ධි නියාමක මහතා මුණ ගැසෙන්න යන්නේ. මොකද කඳු නගින්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් සන්ද මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මියගෙන් මා ඉල්ලීමක් කරනවා. එතුමිය ඉතා සද්භාවයෙන් මෙම ගොඩනැගිල්ල ඉදිකරන්න හදනවා. නමුත් ප්‍ර දේශයේ අය ඊට විරුද්ධයි. ඉතිං ප්‍ර දේශයේ අය විරුද්ධනම් මොකටද ඔය ගොඩනැගිල්ල සාදන්නේ. විරුද්ධ නැතිනම් අපි එදා ලේකම්තුමිය හා පත් කරන ලද ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එම ස්ථානය පරික්ෂා කළා. එතැනට ජනතාව විරුද්ධයි.ජනතාවට අවශ්‍යතාවයක් නැහැ එම ගොඩනැගිල්ල ඕකන්දයේ එම ස්ථානයේ සාදා ගැනිමට. එම නිසා පොල්වත්තේ හරි කමක් නැහැ . ඉඩ තිබෙන තැනක මෙය ඉදිකරන්න. සුසාන භූමියේ නම් සැදිමට කියටවත් ඉඩ දෙන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ සඳහා නගර සභාවෙන් මෙම පැතිබැම්ම ඉදිකර එහි එක පැත්තක බැම්ම ගෙන මෙම ගොඩනැගිල්ල නගර සභාවෙනුත් යම්කිසි දායකත්වයක් ලබා දි අපිත් යම් මුදලක් දෙන්නම් ඔබතුමියට මෙය ඉදිකර ගැනිමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් එය යෝජනා කරන තැන මෙහි යට තිබෙනවා හිස් භූමි දෙකක් . දැන් ඊයේ වන විට එහි නිවසක් ඉදිකරලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ සඳහා මොකක්ද අපිට කළ හැක්කේ.අවසාන තින්දුව කුමක්ද ? නගරයට ලැබුණු මුදලක් අපිට ආපස්සට යවන්න බැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔය ලැබුණු පළාත් සභා අරමුදල් වලින් ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ ලක්ෂ 10 හා ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතාගේ ලක්ෂ 10 යොදා පැති බැම්ම සාදා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමියණනි, දැන් ඔබතුමියට අවශ්‍ය වන්නේ නිලධාරින් ටික එක තැනකට ගෙන්නනේ. අපි දැන් ප්‍රජා ශාලාවක් ඉදිකර තිබෙනවා. එහි ග්‍රාම නිලධාරි මහතා සිටිනවා. තව කාමර 3 ක් මදියි. ඔය සල්ලි එපා. අපි නගර සභාවෙන් මුදල් දෙන්නම්. ඉතිරි කාමර ටික ඊට යාබදවම සාදා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එතැන ඉඩ තිබෙනවාද

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් එතැන ඉඩ තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,එහි මෙම ගොඩනැගිල්ල සාදන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ගොඩනැගිල්ල සාදන්න එපා . මෙම කාමර 3 ට යන මුදල් නගර සභාවෙන් දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

නෑ සභාපතිතුමනි, මාත් ගරු මන්ත්‍රීවරියක් . මටත් තිබෙනවා ඔබතුමාලාගෙන් ඒ උදවුව ඉල්ලන්න. ඔබතුමා ඉඩමක් දෙන පොරොන්දු පිට තමයි මුදල් වෙන් කර ගනු ලැබුවේ. දැන් ඉඩමක් දෙන්න බැහැ කියන්න බැහැ. ඉඩමක් ලබා දිය යුතුමයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඔබතුමියට ඉඩමක් දුන්නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මා හෙට කවුරු මරා ගත්තාත් අත්තිවාරම් දමනවා. මට කිසි ප්‍රශ්නයක් නැහැ. මට හොඳ ශක්තියක් තිබෙන කාන්තාවක්. මට යමක් කරන්න පුළුවන්. පොලිසියෙන් නෙමේ කවුරු ආවත් මා එතැන අත්තිවාරම් දමනවා. මට කවුරු තරහා වුණත් කමක් නැහැ. හෙට දිනයේ මා අත්තිවාරම් දාන්න පටන් ගන්නවා. එහෙම හිටියොත් මා එය කරනවා. මා මේ දෙගොල්ලෝ තුන්ගොල්ලෝම කියන නිසා තමයි නිකං හිටියේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතැන ඉදිකරන්න කියා මේ කමිටුවේ සිටින සියළුම මන්ත්‍රීවරුන් විසින් අත්සන් කර ලිපියක් දී තිබෙනවා මා හට. ඒ කමිටුවේ තිරණය පරිදි මේ සභාවේ තිරණය දෙන්න බලය මට පවරා ඇත. මා අවසර දී තිබෙනවා . ඔබතුමිය වැඩය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එහෙනම් මා වැඩය කරන්නම්

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මෙය ප්‍රශ්නයකි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ඔබතුමාත් ඒ සඳහා අත්සන් කර තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මා සුසාන භූමියේ ඉදිකරනවාට විරුද්ධයි. අනික් එවාට අපි අත්සන් කර දී ඇත. ප්‍රශ්නය ජනතාවගේ ඔබතුමා මැදිහත් වී මෙම ප්‍රශ්නය විසඳන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එකට තමයි ඔය ආසන්න ගරු මන්ත්‍රීවරු මේ සඳහා කමිටුව පත් කරනු ලැබුවේ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

අපි කමිටුව දැම්මට පස්සේ තමයි විරුද්ධ වුණේ. ඊට පසු බොහෝ ජනතාව විරුද්ධ වුණා. අපි 5 ක් කැමති වුණේ. ඊට වඩා වැඩි ප්‍රමාණයක් විරුද්ධ වුණේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා දැනගන්න අහන්නේ. මෙතැන සිටිනවාද මේ සිද්ධියට සම්බන්ධව යම් අදහස් ප්‍රකාශ කිරිමට සභාවට මහජන නියෝජිතයන් පැමිණ තිබෙනවාද? අදහස් දක්වන්න සිටිනවා නම් අපි කාරක සභා තත්වයට පත් කළ යුතුයි. ගරු මන්ත්‍රීතුමන්ලා ඔබතුමාලා මේ සම්බන්ධව දෙන ලද තීන්දුව අනුව ක්‍රියා කරන්නද?

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මා කියන්නේ අර ළිඳ ලඟ පිහිටි භූමියේ මෙය ඉදිකරන්න.මෙහි පැති බැම්ම දමා මෙය ඉදිකරන්න. මේ සඳහා නගර සභාවේ මුදලුත් යොදා මෙය ඉදිකරන්න. එවිට ප්‍රශ්නයක් වන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහෙනම් පොඩ්ඩක් ඉන්න. ඔය යෝජනා කරන ස්ථානයේම ඉල්ලීම් 2ක් මා ළඟ ඇත. මේ අලුතෙන් යෝජනා කරන තැන සම්බන්ධයෙන් මා හට ලිපියක් ඇත එම ලිපිනය වන්නේ පියුමිකා සඳමාලි නො 03 . ඕකන්ද , අම්බලන්ගොඩ . මේ සඳහා ඕකන්දේ 65කු අත්සන් තබා ඇත. ඉහත ලිපිනයේ පදිංචි මා කුලී නිවසක් තුල පදිංචි ව ජීවත්වන්නේ ඉතා දුක්ඛිත ජීවිතයකි. දරු දෙදෙනා සමඟ නගර සභාවට අයත් ඉඩමේ මඩුවක් ගසා ජීවත්විමට ගම් වැසියන්ගේ ඔබතුමාගේ උපකාරය මාවෙත ලබා දෙන්නේ නම් එයට පං පිණිස වුනු ඇත. අසරණ මා හට ජීවිතය ගෙන යාමට පිහිටක් අපේක්ෂා කරනවා. මෙම ලිපියට පියුමිකා අත්සන් කර ඇති අතර එයට කැමැත්ත ප්‍රකාශ කර 65 කු අත්සන් කර ඇත.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ විදියට නගර සභාවට අයත් ඉඩම්වල එක එක්කෙනා පදිංචි විමට ගතහොත් එය විශාල ගැටළුවකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඊළඟට තව ලිපියක් අම්බලන්ගොඩ , පොල්වත්ත, ඕකන්ද , අංක 6 , කේ. එම්. සමන්ත මහතා විසින් එවා ඇත. අනවසර ඉදිකිරීමක් වැලැක්වීම සඳහා යි. අම්ලන්ගොඩ , ඕකන්ද , පොල්වත්ත , අංක 6, නිවාස යෝජනා ක්‍රමයේ නගර සභා දේපල තුල 2019.02.03 දින ඕකන්ද පදිංචි පියුමිකා මහත්මිය විසින් අනවසර නිවාසයක් ඉදිකර පදිංචිවී ඇත. මෙම ඉඩම් කොටස නගර සභාව සතු වන අතර මීට පෙරද 2012.05.09 දින වැල්ලගේ සුපුන් තාරක යන අය මෙම ස්ථානයේ අනවසර ඉදිකිරීමක් සිදු කරන ලදි. එම පදිංචියට නගර සභාව විසින් වලක්වා තහනම් නියෝගයක් ලබා දුන් අතර එම ලිපියේ පිටපත් ඇමුණුම් ලෙස මේ සමඟ අමුණා ඇත. මෙම ස්ථානයේ ප්‍රදේශවාසින් විසින් පාවිච්චි කරන පොදු ළිඳ පිහිටා ඇති අතර මෙම අනවසර ඉදිකිරීම තුලින් වහලේ ජලය ළිඳට ගලා එන ලෙස සකස් කර ඇත. මෙම ස්ථානය නිවසක් ඉදිකිරීමට තරම් ප්‍රමාණවත් නොවන අතර එහි නිවසක් ඉදිකර පදිංචි වුවහොත් අපද්‍රව්‍ය ගලා යාමට කාණු පද්ධතියක් නොමැති නිසාත් අවට පදිංචිකරුවන්ට මහත් අසීරුතා වලට ලක්වීමට සිදුවේ. තවද මෙම මාර්ගය සැකසීමේදි කාණු පද්ධතිය සකස් කිරීමේදි පදිංචි වීමට මහත් හිසරදයක් වනු ඇත.විශේෂයෙන් මෙම ස්ථානය මා පදිංචි යාබද ස්ථානයක් නිසා අනවසර ඉදිකිරීමක් නිසා අපද්‍රව්‍ය ජලය ගලා එම නිසාත් , වැසිකිළියක් ගොඩ නැගුවොත් පොදු නාන ළිඳට බලපාන බැවින් මටද මාගේ බිරිඳද දරුවන්ද අපහසුතාවයට ලක් වනු ඇත. මෙහි පිටපත් සියළුම නාගරික මන්ත්‍රිවරුන් දමා ඇත.ඔහු පොලිසියට ගොස් අනවසර ඉදිකිරීමක් කියා පැමිණිලි කර ඇත. මෙම ලිපියේ 10ක් අත්සන් තබා ඇත. මා දුටුවා මෙම ලිපි දෙකෙම එකම පුද්ගලයන් අත්සන් තබා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එකම කට්ටිය අත්සන් තබා සිටියත් මෙයට වැරදි පූර්වාදේශ දෙන්න එපා. කරුණාකර මෙය නගර සභාව සතු ඉඩමක් නම් වහාම මෙය ඉවත් කරන්න. මොකද මෙම ඉඩම දුනනොත් ඉතුරු ඉඩම් කැබලි වලත් කට්ටිය නිවාස සෑදීමට පටන් ගනිවි.මේ ගරු මන්ත්‍රිවරුනුත් කියාවි අන්න අතන ඉඩම් කැබැල්ල අල්ලා ගන්නා ලෙස . කොහේවත් එවිට ඔබතුමාට පාලනය කිරිමට හැකි වන්නේ නැහැ. මේ සඳහා දැඩි විරෝධතාවය හා අප්‍රසාදය පල කරන අතර මෙය කඩා ඉවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා අදහස් දක්වන්නේ මට මේ රජයේ ඉඩමක් නොමැති වීම පිළිබඳවයි.ඕකන්දේ මා එහාට මෙහාට යනවා. ඔය ස්ථානයේ අපි ජල ටැංකියක් ඉදිකරන්න සිටිනවා. ජල ටැංකියක් ඉදිකිරීමටත් අපිට ඉඩමක් නැහැනේ . එම ස්ථාන වල නිවාස සෑදුවාම.ජල ටැංකිය ඉදිකිරිමට පහත්ම ස්ථානය ඔතැනයි . දැන් එතැන ගන්න කියනවා නම් ජල ටැංකිය පසුව ඉදිකරන්න. එතැන ගන්න වෙනවා. එදා තක්ෂණසේවා නිලධාරින් විසින් මනින ලද අවස්ථාවේ එහි දිග ප්‍රමාණය තිබුණත් පළල ප්‍රමාණය නොමැති බව දන්වා සිටියා. එහි පළල ප්‍රමාණය සාදා ගැනිමට කණ්ඩියක් දමා පස් පුරවා සාදා ගත යුතුයි. එතකන් මෙම මුදල් තබා ගෙන සිටිමට පුළුවන්ද කියා ලොකු ගැටළුවක්වේ. මේ සඳහා ඡන්දයක් විමසා හරි කැමැත්ත ලබා දෙන්න. මෙය ඉටු කිරිම සඳහා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුස්තකාලය පිහිට ඉඩමේ මෙය ඉදිකරන්නේ නැතිනම් දෙවැනි ස්ථානය ඔය. එම ස්ථානය තමයි දෙන්න තිබෙන්නේ. එම ස්ථානය ලබා දෙනවා නම් පැති බැම්මක් ඉදිකර දෙන ලෙස ඉල්ලිමකුත් තිබෙනවා. ඒ ඔස්සේ මෙතැන බලහත්කාරි ලෙස ඇතුල් වීමක් සම්බන්ධවත් තිබෙනවා. එය ඉවත් කරන්න කියා ඉල්ලිමකුත් තිබෙනවා.මේ සභාව මොකක්ද කියන්නේ. මට කියන දේ මා කරනවා. මා මෙය විසඳා අවසන් .මා මේ සඳහා ගරු මන්ත්‍රිවරු 5කු පත් කළා. 5නා අත්සන් කර ලිපියකුත් මට දි තිබෙනවා. මෙතැන දෙන්න කියා මා එතන දි තිබෙනවා. එය ගරු මන්ත්‍රිතුමිය භාර ගන්නේ නැතිව අවසන් කර තිබෙනවා නම් එය අවසන් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

දැන් අර ළිඳ ලඟ සාදන්න කියා අපි කිව්වානේ . පැති බැම්ම දමා සෑදිමෙන් ප්‍රශ්නයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා මෙම මුදල් ඇස්තමේන්තු සාදා අනෙක් වැඩ කරනතුරු තබාගෙන සිටින්න බැහැ. ඔබතුමා තේරුම් ගන්න මේ දෙසැම්බර් 31 අවසන් වු මුදල් . ගරු සෝභිත මන්ත්‍රීතුමාට කතා කර අම්බලන්ගොඩ නිල සෙවණ 8ක් පිලිබඳව මා ලබා ගත්තා. මට 64 ක් සැදිමට තිබෙනවා. ඉන් මෙවර මා 10ක් ඉල්ලා ගත්තා.10ක් කියන්නේ ලක්ෂ 200ක මුදලකි. පක්ෂ භේදයකින් තොරව අම්බලන්ගොඩ ප්‍රදේශයේ මේ නිලපියස ටික ඉදිකර දිමට. ඒ සඳහා ඔබතුමාගේ සහායෝගය ලබා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

එතැන ජනතාව විරුද්ධ නම් 50-70ක් විරුද්ධ නම් බලෙන් ගොස් මෙය සිදු කිරිම වැඩක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

ඔතැන සැදිමට දෙන්නැතිනම් වෙනත් කොටසකට මෙම මුදල් ලබා දෙන්න. ඔබතුමිය නැවත ඔය කොට්ඨාශයට ප්‍රතිපාදන මුකුත් ඉල්ලන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

නෑ සභාපතිතුමනි, මා අසරණ කරන්න එපා මෙතනදි . දැන් ඔබතුමා සභාවේ තිරණ ගන්නවා ඒවා ක්‍රියාත්මක වෙන්න ඕන. ඔබතුමා කට්ටිය එක්කම තිරණය කර තමයි අර පහල තිබෙන ඉඩම් කොටස ලබා දුන්නේ.එම ඉඩම පෙන්වා තමයි ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට කතා කර තමයි මෙම මුදල් වෙන්කර ගනු ලැබුවේ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

එසේනම් මුලින්ම තිරණය කරන ලද තැන ඉදිකරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

සුසාන භූමියේ බැහැනේ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

එය බැරිනම් මෙතැනත් බැහැ මුලින්ම තිරණය කරන ලද තැන සාදන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

මෙය ගරු මන්ත්‍රීවරුන්ට පුළුවනි. මේ සඳහා ඡන්දයක් තබන්න.ඔය පන්සල ලඟ පිට්ටනියට කිසිම බලපැමක් වන්නේ නැහැ. මළ සිරුරු වළ දමන්නේත් නැහැ ඔය කියන ස්ථානයේ. සුසාන භූමිය ඇත්තේ පහළ කොටසේ.අනිවාර්යෙන්ම ඡන්දයක් තබා  කැමැත්ත ලබා දෙන්න. මෙය පෙර පාසල් දරුවන් සෙල්ලම් කරන පිට්ටනිය ගලවා එය කරන එක අසාධාරණ බවයි. මාත් අම්මා කෙනෙකි . එමනිසා ඒ ගැන අපිට පොඩ්ඩක් සිතිමට වෙනවා. මෙම සුසාන භූමියට කිසිසෙත්ම බලපාන්නේ නැහැ මේ මා කියන ස්ථානය . පන්සලත් අර , පිට්ටනියත් ඇර ළමයින්ට සෙල්ලම් කරන කැලේ තමයි මේ පෙන්වනු ලබන්නේ . එම පර්චස් ගණන අපගේ තාක්ෂණසේවා නිලධාරින් ගිහින් මැන්නා. ඒ සඳහා විරෝධතාවයක් තිබේ නම් ඊට විරුද්ධවත් කැමති පුද්ගලයන් සිටිනවා නම් ඒ සඳහා කැමැත්තත් ලබා දෙන්න. එතැන ප්‍රශ්නය අවසන්.

**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**

සුසානභූමියේ නොමැතිව ඕනැම තැනක සැදිමට අපි අවසර දෙනවා. සුසාන භූමියේ නම් අපි අවසර දෙන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**

සුසානභූමියේ නම් මොන විදියකට වත් මෙය ඉදිකරන්න බැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සඳහා ගරු සභාවේ මුලින්ම අනුමතිය ලබා දුන්නානේ. එයට විරුද්ධ වුණා කියා තමයි ගරු සභාපතිතුමා වෙන ස්ථානයකට ගියේ. මා කියන්නේ එහෙනම් මුලින්ම අනුමතිය දුන් ස්ථානයේ මෙය ඉදිකරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එයට විරෝධතා පැමිණියා. නියම ස්ථානය තෝරන්න කියා ගරු මන්ත්‍රීවරු 5ක් පත් කරනු ලැබුවා. මට ලියා දී තිබෙන්නේ ඔබලා එම ස්ථානයයි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

සභවේ 21ක් විරුද්ධ වුණාම කියනවා 5 කු දමා කියනවා කැමති වෙන්න කියා. එතකොට ඒ 5 ට මොකද වෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාව කැමැත්ත ලබා දුන්නා ඔබතුමන්ලාගේ කැමැත්තට ඉඩ දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

එතකොට මුල් තැනට මොකද වෙන්නේ. මුල්තැනට විරුද්ධ වුණා වගේ තමයි අපි 5නා ගත් තැනට ජනතාව විරුද්ධ වන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමනි, අපගේ වගකීමක් තිබෙනවා .සැරින් සැරේ හැරෙන්න නෙමේ තිරණ ගත යුත්තේ. ගමට අවශ්‍යනම් කවුරු තරහා වුණත් කමක් නැහැ.කෙලින් තින්දුව ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ඉතිං කලින් තින්දුව ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු නගර සභා මන්ත්‍රී පේෂලා කුමාරි මහත්මිය සිටිනවාද ? මා එහි තිබූ පොල්ගස් සියල්ලම ගලවා සුද්ද කර එය ඉදිකරන්න කිව්වේ. මා දන්නවා එහි වටිනාකම

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඡන්දයක් විමසා බලන්න. එම ප්‍රතිපාදන ටික අකමැතිනම් මා වෙනත් කොටසකට දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි  කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමියණිනි, මේ ඉඩම් කැබැල්ල තියෙනවා කියන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් ගරු මන්ත්‍රීතුමිය යෝජනා කළේ මොකක්ද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

පන්සල ළඟ පිට්ටනිය එහි ඔක්කෝම ඉවත් කරලා මේ නිවසක අංකයක් තිබෙනවා එය සැමදෙනාම බැලුවා . එතැන කැලයක් තිබෙන්නේ. එම කැලයේ කොටසේ පොඩි කැල්ලක් තිබෙන්නේ. අඩි 35ක් දිග අඩි 20 පළල . එම කොටසේ පාරට මුහුණලා. පන්සලටත් හොඳයි, ගමේ මිනිසුන්ටත් හොඳයි . සුසානභූමියත් වැසෙනවා එවිට. අඩි 45ක් නැත. අඩි 35කි. අඩි 40 තමයි උපරිම ඇත්තේ. එතනට අවස්ථාව උදාකර දෙන්නකෝ. එවිට මෙම ප්‍රශ්නය ඉවරයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මන්ත්‍රීතුමිය කරන ලද යෝජනාවට පක්ෂ අය සිටි නම් අත ඔසවන්න. මේ සඳහා ඡන්ද 8ක් පක්ෂව දි ඇත. විරුද්ධව ඡන්ද 10ක් ලබා දි ඇත. ඒ අනුව යෝජනාව ප්‍රතික්ෂේප වි ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , එහෙනම් කලබල වෙන්නේ නැහැ. අපි මෙය පුස්තකාල භූමියේ ඉදිකරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම භූමිය ලබා දි ඇත. එහි තිබූ ළමා ක්‍රිඩාංගණයත් ඉවත් කර ඇත. එය දැන් ළමයින්ට සෙල්ලම් කරන්න පුළුවන් විදයට සකසා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

නගර සභාවේ බැකෝ යන්ත්‍රය මේ සඳහා ලබා දිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉතිං බැකෝ යන්ත්‍රය දුන්නානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

නෑ. මෙය සවිකිරිමටත් බැකෝ යන්ත්‍රය අවශ්‍යායි. එය සවිකිරිමට අවශ්‍ය සිමෙන්ති එහෙම මං ලබා දෙන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එච්චර ලොකුවට කැපිමට අවශ්‍ය නැහැ.එය අලවංගුවෙන් දමා සකස් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එසේ කිරිමට බැරිය . මෙය ශක්තිමත්ව සැදිය යුතුයි. ළමුන් පදින් ඔංචිලි නිසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ ඒ පාදම කඩන්න ඕනෑ දැන්. කඩා එය අලුතින් දැමිය යුතුයි. මේ සමඟම අසනවා අර ලිපි දෙකක් ඉදිරිපත් වි තිබෙනවා ළිඳ උඩ ඇති භූමියේ . මේ සඳහා එක කට්ටියක් ඉල්ලා තිබෙනවා එම නිවස කඩා ඉවත් කරන්න කියා. අනික් අය ඉල්ලා සිටිනවා එම නිවස තබා ගන්න ඉඩ දෙන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නගර සභාව සතු ඉඩම් වල ඔය එක එක පුද්ගලයන්ට අවශ්‍ය විදියට නිවාස ඉදිකරන්න දෙන්න බැහැ. එයට සම්පූර්ණ විරුද්ධයි. එසේ නම් ලබන සතිය වන විට මාත් පටන් ගන්නවා. සෑම තැනකම නිවාස ඉදිකරන්න කියනවා. එවිට ඔබතුමාට මෙය නතර කරන්න බැරිවෙනවා. මෙම වැඩය පාලනය කරන්න බැරිවෙනවා.කරුණාකර මෙය නතර කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඊට විර්ද්ධ අදහසක් තිබෙනවාද කාගේ හරි. එසේ නම් මේය කඩා ඉවත් කිරිමට කටයුතු කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සීමාවේ 86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියසක් ඉදිකිරිම සඳහා සභාවේ ඉඩමක් වෙන් කර දුන් බැවින් මෙම ගොඩනැගිල්ල ඕකන්ද අත්කම් නිවාස අංක 09 නිවස ඉදිරිපිට තාප්ප මායිමේ සිට සුසාන භූමියේ මායිම දක්වා උතුරු දිසාවට ඇති ඉඩම , සුසාන භූමිය පිටුපස තොරණ ගසා ඇති තැන විහාරගොඩ පාරට මුහුණලා ඇති ඉඩම් කොටස ( මෙම කොටස පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමට අයත්වේ.) මෙම නිල නිවස ඕකන්ද ග්‍රාමයේ ම ඉදිකිරිමට අවශ්‍ය බිම් කොටස ක් ලබා දෙන ලෙස කර ඇති යෝජනාව පිළි නොගත් අතර මේ සඳහා සුසාන භූමියේ ඉදිකිරිමට විරුද්ධ වූ අතර මේ සඳහා ඡන්දයක් විමසිමෙන් පසු එම යෝජනාවට පක්ෂව ඡන්දය 08 ක් සහ විරුද්ධව ඡන්ද 10 ක් ප්‍රකාශ කිරිම නිසා වැඩි ඡන්ද 2කින් එම යෝජනාව ප්‍රතික්ෂේප විය.

**05.04** **<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

05.04 අම්බලන්ගොඩ ගා/පී. ද එස් කුලරත්න මහ විද්‍යාලය නගර වාසි දරු කැළගේ ඉගෙනුම් අවස්ථා වෙනුවෙන් ගොඩනැගුවකි. එනමුත් මීට වර්ෂ කිපයක් තිස්සේ පනියන්දුව, කෙරම්ණිය, පින්නදූව ඕකන්ද , පොල්වත්ත , තල්ගස්ගොඩ ගම්වල දූ දරුවන් විශාල පිරිසක් මෙම විදුහලේ පළමු ශ්‍රේණිය ප්‍රතික්ෂේප වීම කණගාටුවට කරුණකි. එම අවාසනාවන්ත තත්වය මග හැරවීම සඳහා ගා/පී ද එස් කුලරත්න මහ විදුහලේ දැනට පවතින 1 ශ්‍රේණියේ පංති 04 පෙර පැවති පංති 05 දක්වා වැඩිකර ගැටළුකාරි තත්වයට පිළියම් සලසන ලෙසට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් දැනුවත් කරන ලෙසට යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ගා/පී. ද එස් කුලරත්න මහ විද්‍යාලය නගර වාසි දරු කැළගේ ඉගෙනුම් අවස්ථා වෙනුවෙන් ගොඩනැගුවකි. එනමුත් මීට වර්ෂ කිපයක් තිස්සේ පනියන්දුව, කෙරම්ණිය, පින්නදූව ඕකන්ද , පොල්වත්ත , තල්ගස්ගොඩ ගම්වල දූ දරුවන් විශාල පිරිසක් මෙම විදුහලේ පළමු ශ්‍රේණිය ප්‍රතික්ෂේප වීම කණගාටුවට කරුණකි. එම අවාසනාවන්ත තත්වය මග හැරවීම සඳහා ගා/පී ද එස් කුලරත්න මහ විදුහලේ දැනට පවතින 1 ශ්‍රේණියේ පංති 04 පෙර පැවති පරිදි පංති 05 දක්වා නැවත ස්ථාපනය කරවා දෙන මෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් දැනුවත් කරන ලෙසට යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

අපගේ දූවා දරුවන් නිසා දෙසැම්බර් මාසය වන විට දෙමාපියන්ගේ සිත් වල ඇතිවන්නේ දැඩි කනගාටුදායක තත්වයකි. මේ අපි වෙනුවෙන්ම ගොඩනැගුණු මෙම කුලරත්න විද්‍යාලයට මේ ඉහත සඳහන් කර ඇති ගම්වල ජීවත්වන දරුවන් ප්‍රතික්ෂේප විම නිසා එම ගම්වල දරුවන් දැඩිලෙස අපහසුතාවයට පත් වෙනවා. මේ තත්වය

අවබෝධ කරගෙන අපේ පළාත් අධ්‍යාපන බලධාරීන්ට දැනුවත් කර මෙම කුලරත්න විද්‍යාලයෙන් මීට වසර 5කට ඉහතදි 1 ශ්‍රේණියේ පංති 5ක් පැවතියා. කාලයත් සමඟ පැවති ගුරු ගැටළුව නිසා මෙම පංති 5 පංති 4 ක් බවට පත්වුවා. කිසිම නිර්දේශයකින් තොරව කිසිම කොන්දෙසියකින් තොරව පංති 4ක් දක්වා සීමා වුණා. අපි මේ යෝජනාවෙන් කරනු ලබන්නේ නැවතත් එම පංති 5 සක්‍රිය කර දෙන ලෙසයි. එසේම ඉතාම කනගාටුවට කරුණක් ලෙස අපි දකිනවා මේ වන විට අපේ කෙරමිණිය , පින්නදූව දරුවන් පිළිබඳවයි මා වැඩිපුර දන්නේ මෙම1 ශ්‍රේණියේ දරුවෝ අප බලපිටිය ආසනයේ සීනිගොඩ සිරි අභයතිස්ස විදුහලට මේ වන විට යනවා. කරන්දෙණියේ සිරි අභයතිස්ස විදුහලටත් යනවා. බුද්ධිමතුන්ගේ, වියතුන් බිහි වූ පුරවරයේ දරුවෝ ආසන්නම ආසන වල පිහිට පතන්නට විම දැඩි කනගාටුවට කරුණකි. එමනිසා මෙම සෝචනිය තත්වයෙන් අප දරුවන් මුදවා ගැනීමට මෙම පංති 5 සක්‍රිය කළ යුතුයැයි මා අදහස් දක්වනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව විදුහල්පතිතුමා විසින් විද්‍යානුකුල පදනම් සහිතව ලිපියක් ඉදිරිපත් කර ඇත. එම ලිපිය ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනිම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරන ලදි. එම ලිපිය පදනම් කරගෙන සියළුදෙනාම කතා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

මේ පිළිබඳව අවසාන හෝ ඊට කලින් පැවති සංවර්ධන කමිටුවේද මේ පිළිබඳව කතා කළා. එවිට කලාප අධ්‍යක්ෂකතුමිය ප්‍රකාශ කර සිටියා මෙයට අවසර තිබෙනවා කියා. එම නිසා නැවත වරක් අවසර ගැනීමක් අවශ්‍ය නැහැ. ඔබතුමාගේ ඉල්ලීමට අනුමතිය ලබා දි ඇත්තේ මීට කලින්. එම නිසා විදුහල්පතිතුමාට තිබෙන්නේ මෙය කර ගෙන යාම පමණයි. එතුමිය එම රැස්වීමේදි පැහැදිලිව එය ප්‍රකාශ කර සිටියා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි විශේෂයෙන් ස්තුතිය පුද කර සිටිනවා කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමාට මේ සම්බන්ධව දැනුවත් කිරිම පිළිබඳව . මෙහි කතා කරලා තිබෙනවා මෙහි අමුණා තිබෙනවා මේ සම්බන්ධව කතා කරන්න අවස්ථාව සලසා දෙන්න කියා. මා ඉල්ලා සිටිනවා කෙරමිණිය , පින්නදූව , ඕකන්ද , තල්ගස්ගොඩ කියන මේ ප්‍රදේශවල ජනතාව මෙම ප්‍රශ්නයට වැඩි වශයෙන් මුහුණ දි ඇත්තේ. විශේෂයෙන් තල්ගස්ගොඩ සුනාමි නිවාස 210 කට වැඩි පිරිසක් මේ වන විට ඉදිකර ඇත. අද අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජිවත් වූ එම ළමයින් ධර්මාශෝක විද්‍යාලයට, දේවානන්ද විද්‍යාලයට ඇතුලත් විය යුතු වුවත් අද කුලරත්න විද්‍යාලයට වත් ඇතුලත් කර ගැනිමට නොහැකි තත්වයක් ඇති වි තිබෙන්නේ මෙම හේතුව නිසාය. කුලරත්න විද්‍යාලයේ පංති 4ක් පමණයි ඇත්තේ. පංති 4න් 50% ක ප්‍රමාණයක් තමයි ආසන්නතාවයට ඇතුලත් කර ගන්නේ. අද මේ වන විට කුලරත්න විද්‍යාලයට ප්‍රථමයෙන්ම අසුවෙන්නේ ගොඩහේනේ දරුවන්. ගොඩහේනේ දරුවන් 27කු මේ වසර සඳහා ඇතුලත් වි ඇත. ආසන්නතාවයෙන් 50% ක ප්‍රමාණයක් තමයි පාසලට ඇතුලත් කර ගත හැක්කේ. 27කු ගොඩහේන ප්‍රදේශයෙන් පැමිණෙන විට අනෙක් ප්‍රදේශවලින් ඇතුලත් කර ගත හැක්කේ කි දෙනාද ? එම නිසා මෙය සාධාරණ ඉල්ලීමක් . මින් අසාධාරණය සිදු වි ඇත්තේ ගරු අපගේ ශ්‍රේෂ්ඨ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට අසාධාරණය සිදු වී ඇත්තේ කෙරමිණිය , පින්නදූව, ඕකන්ද, පොල්වත්ත, පනියන්දූව , තලගස්ගොඩ ආදි ප්‍රදේශවල ජනතාවටයි. විශේෂයෙන්ම ඕකන්දට පොල්වත්තට ලකුණු කැපෙනවා. මෙම කොට්ඨාශ වලට මෙම පංතියක් අහිමි විම නිසා විශාල අසාධාරණයක් සිදු වි තිබෙනවා.විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා අප සභාවේ ගරු විපක්ෂනායකතුමා 2018මාර්තු මාසයේ පැවති සංවර්ධන කමිටු රැස්විමකදි ඉල්ලීමක් මේ සම්බන්ධව කිරිම පිළිබඳව. මාහට එම පාසලේ දෙමාපියෙක් මෙම වාර්තාව ගෙනත් දුන්නා. ඒ පිළිබඳ සාකච්චා කර මෙය සකසා දෙන්න කියා. අම්බලන්ගොඩ නගර සභාව විදියට අප කොට්ඨාශවල පදිංචිකරුවන්ට සිදුවන අසාධාරණයට සාධාරණයක් කිරිම සඳහා මෙම 1 ශ්‍රේණියේ පංති 5 බලපැම් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපි ඇත්තටම ස්තුතිවන්ත වෙනවා කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමාට. එතුමා හිටපු ගරු මන්ත්‍රීවරයෙකි. මෙම පාසලට ළමුන් ඇතුලත් කිරිමේදි අපගේ ගරු උපසභාපතිතුමාත් දන්නවා විශාල සටනක් කර තමයි ළමුන් ඇතුලත් කරනු ලැබුවේ. එක සැරයක් ළමුන් ඇතුලත් කර ගැනීමේ ලැයිස්තුවක් අවලංගු කළා. එතුමා දන්නවා මේ නගර සිමාව තුල ළමුන් නොතෙරෙන්නට හේතුව මොකද කියා. හේතුවන කාරණා කිහිපයක් මෙහි සටහන් කර තිබෙනවා. එතුමාටත් කැක්කුමක් තිබෙනවා. මොකද එතුමා විදුහල්පතිව ඉදිද්දි . තව වෙන පාසලකට යාවි. නගරයේ ජනතාවගේ ළමුන් මෙම පාසලට යාවි මොකද හේතුව කොට්ඨාශ ගණනාවක දරුවන් ධර්මාශෝක විද්‍යාලයට හා දේවානන්ද විද්‍යාලයට තෙරෙන්නේ නැහැ. කුලරත්න විද්‍යාලයට තමයි ඉල්ලුම යන්නේ. එවිට නගරයේ ජනතාව ඉල්ලා සිටින විදුහල්පතිතුමාත් අසිරුතාවයට පත්වෙනවා. ඉන්න දේශපාලන අධිකාරිය අසිරුතාවයට පත්වෙනවා . මේ නිත්‍යානුකුලව ඇතුලත් නොවිම ගැන.විදුහල්පතිතුමා පැහැදිලි කර දි තිබෙනවා කරණ ක්‍රමය . මොකද එදා පංතියක ළමුන් 45ක් ව සිටි පංතියකට අද ළමුන් 38 වෙලා එක පංතියකට ගන්න පුළුවන් ප්‍රමාණය. මෙයිනුත් ක්‍රියාන්විතයේ යෙදි සිටින දෙමාපියන්ගේ දරුවන් 5කු ත් එක පංතියකට ගන්නවාත එවිට ළමුන් 33 කට අඩු වි ඇත.ළමුන් අඩු කාලයක් එවැනි තත්වයක පැවතියද ළමුන් වැඩි කාලයක මෙවැනි තත්වයක් ඇතිවිම අපි මහජන නියෝජිතයන් විදියට අප සියළු දෙනාට බලපාන ප්‍රශ්නයකි. ඔබතුමාත් දන්නවා. මෙතුමා ඉල්ලා සිටින්නේ පංතියක් වැඩිකර දෙන ලෙස නෙමේ. තිබුණු පංතියක් වැඩිකර දෙන ලෙසයි. සක්‍රිය කර දෙන ලෙසයි. එය මා හිතන්නේ කරන්න පුළුවනි. අපේ විපක්ෂයේ සංවිධායකතුමා සඳහන් කර ආකාරයට ගැටළුවක් නැහැ . වැඩි කරන්න පුළුවනි. මේ සඳහා මහජන නියෝජිතයන් විදියට සභාවේ අනුමත කර ලිපියකින් අධ්‍යාපන ලේකම් ඇතුළු බලධාරින්ට දැනුම් දුන් පසු ගැටළුවක් නැහැ. සියළුම ගරු මන්ත්‍රීවරුන් මෙයට කැමතියි. ඔබතුමා මේ පිළිබඳව දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිනවා. වැඩිදුර විස්තර වැඩක් නැහැ. සියළු දෙනාම මේ ගැන දන්න නිසා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දරුවන්ගේ අධ්‍යාපන ප්‍රශ්නයක් නිසා මටත් මේ ගැන අදහසක් දක්වන්න තියෙනවා. දැන් මේ ප්‍රශ්නය වි ඇත්තේ 1 ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරිම සහ 6 ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරිම සම්බන්ධවයි. ඒ ගැන කතා කරන විට පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත විද්‍යාලය ආදර්ශ ප්‍රාථමිකයක් ලෙස තමයි නම් කර ඇත්තේ. මේ දිනවල එම විද්‍යාලයේ 6 ශ්‍රේණිය ආරම්භ කරන්න කියා ඉල්ලිමක් යනවා. මේ වන විට ගරු ඇමතිවරුන් , බලධාරින් මුණ ගැසි ඒ අංශයෙනුත් කටයුතු කරගෙන යනවා. 6 ශ්‍රේණිය සඳහා බුද්ධදත්ත විද්‍යාලයේන් නික්ම යන දරුවන්ට පිරිමි දරුවන් සඳහා කුලරත්න විද්‍යාලයත් ගැහැණු දරුවන් සඳහා ප්‍රජාපති විද්‍යාලයත් තමයි කලින් නම්කර තිබුණේ.දැන් ඒ දෙකම ප්‍රතික්ෂේප වි ඇත. එම දරුවන්ට ඇතුළත් විමට නිල වශයෙන් නම්කර තිබෙනවා ගාමිණි විද්‍යාලය . එම විද්‍යාලයේ කිසිම පහසුකමක් නැහැ. මොකද ශිෂ්‍යත්ව මට්ටමින් හොඳ ලකුණුගත් දරුවන් පොල්වත්ත විද්‍යාලයේ සිටිනවා.එවිට එම දෙමාපියන් කැමති නැහැ පහසුකම් අඩු පාසලකට එම දරුවන් ඇතුලත් කරන්න. ඔබතුමාට මෙය කොච්චර අදාල වෙනවාද කියන එකත් මට ප්‍රශ්නයක් තිබෙනවා. මගේ යුතුකමක් තිබෙනවා ගරු සභාවේ මෙම දරුවන් වෙනුවෙන් ඉල්ලිමක් කරන්න. මොකද ඒ දෙමාපියන් ඉල්ලා සිටින්නේ ධර්මාශෝක විද්‍යාලය නෙමේ. දේවානන්ද විද්‍යාලය නෙමේ.,ප්‍රජාපතිය, කුලරත්නය නෙමේ. තමන් සිටින පාසල ඉදිරියට ගෙනියන්න කියලා. 6,7,8 ආදි ශ්‍රේණි පොල්වත්ත විද්‍යාලයේ ඇති කරන්න කියලා. මෙය ඉතාම සාධාරණ ඉල්ලිමක් දෙමාපියන්ගේ.අනෙක් කාරණය  මතක් කරන්න ඕන මෙම ධර්මාශොකය , දේවානන්ද විද්‍යාලය , කුලරත්න විද්‍යාලය ආදි පාසල් වල ගුරුවරුන්ට වැටුප් ගෙවනු ලබන්නේ ජනතාව ගෙවනු ලබන බදු මුදල් වලිනි.රජයේ බදු මුදල් වලිනි.එවිට මෙම ලොකු විද්‍යාල වලට යන දරුවාගේ දෙමාපියනුත් පොල්වත්ත බුද්ධදත්ත පාසලට යන දරුවාගේ දෙමාපියනුත් ගෙවනු ලබන්නේ එකම බදු මුදලයි. සමානව බදු මුදල් අයකරනවා . අසමානව පහසුකම් සපයනවා. මෙය වැරදියි. මෙම දෙමාපියන්ට අයිතිවාසිකමක් තිබෙනවා මෙම දරුවන්ට සමානව අයිතිවාසිකම් ලබා දිම . පොල්වත්ත විද්‍යාලයේ හමුවේ ඇතිවි තිබෙන ගැටළුව එයයි. මා ඔබතුමාට බලපෑමක් කරන්නේ නැහැ. මෙම දරුවන් වෙනුවෙන් ලොකු පාසල් අපිට දෙන්න කියා. පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත හිමියන්ගේ නාමයෙන් පවත්වා ගෙන යන මෙම විද්‍යාලය දියුණුකර ඉදිරියට ගෙන යාමට යෝජනාවක් ගෙන කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ශ්‍රී බුද්ධදත්ත විද්‍යාලයේ තෑගි ප්‍රධාන උත්සවයකට මටත් ආරධනා තර තිබුණා. එයට මා සහභාගි වුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි එම උත්සවය පැවැත්වුණේ. ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා එදින එම උත්සවයට සහභාගි වුයේ නැහැ. ඔය ඉල්ලීම දෙමාපියන් විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටියා. එතුමා විසින් විදුහල්පතිතුමාට ප්‍රකාශ කර සිටියා ඊට අදාල ලිපි ගොණු ටික එවන්න. මා එය ඉදිරි වැඩ කටයුතු සහා යොමු කරන්නම් කියා. මෙතැන සිදුවුයේ කරන්න ඕනැ කාරණය නොකර නිකං උද්ඝෝෂණය කර වැඩක් නැහැ. මෙය ඉටු කිරිමට නිත්‍යානුකුල තත්වයක් ඇත. මේ සඳහා අවශ්‍ය ගුරුවරු ගන්න ඕන. පංති කාමර ටික වෙන්කරන්න ඕන. ඔබතුමා දන්නවා ඇති දැන් වසර ගණනාවක් වි ඇත. මෙය ප්‍රාථමික වශයෙන් කඩා. ද්විතිය පාසල් ඇති කරනු ලැබුවේ කළුවඩුමුල්ලේ දරුවන්නට ධර්මාශෝක විද්‍යාලයට ඇතුලත් විමට නොහැකි නිසායි. ගමේ දැරුවන්ට හොඳ පාසලකට යාමේ අවස්ථාවක් සමඟ තමයි එය හරිගැස්සුවේ. අධ්‍යාපනය දියුණු නගරයක් වශයෙන් මෙයට පිටින් ළමයි ඕන තරම් ඇතුලත් කරනවා. ගමේ පාසල් තිබේද්දිත්. එය වරදක් දකින්නේ නැහැ. මෙහි අර ඉල්ලිමට අවශ්‍ය ලිපි ගොණු ටික ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යවන්න. එය ලැබුණු පසු එම කාර්යය ඉටු කර දෙයි.නිකං කිරිමට බැරිය. ඊට අදාල පහසුකම් සපයා දිය යුතුය. එම නිසා ඔබතුමා උනන්දු වි එය කරන්න. ඉන් සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගත හැකිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මේ වන විට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහයෝගය ලැබේමින් පවතිනවා. ඒ පිළබඳව මා එතුමාට මේ අවස්ථාවේ ස්තුතිය පුද කර සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව ගරු දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යතුමාටත් ලේකම්තුමාටත් දන්වා යවන්න.

**තීරණය**

අම්බලන්ගොඩ ගා/පී. ද එස් කුලරත්න මහ විද්‍යාලය නගර වාසි දරු කැළගේ ඉගෙනුම් අවස්ථා වෙනුවෙන් ගොඩනැගුවකි. එනමුත් මීට වර්ෂ කිපයක් තිස්සේ පනියන්දුව, කෙරම්ණිය, පින්නදුව ඕකන්ද , පොල්වත්ත , තල්ගස්ගොඩ ගම්වල දූ දරුවන් විශාල පිරිසක් මෙම විදුහලේ පළමු ශ්‍රේණිය ප්‍රතික්ෂේප වීම කණගාටුවට කරුණකි. එම අවාසනාවන්ත තත්වය මග හැරවීම සඳහා ගා/පී ද එස් කුලරත්න මහ විදුහලේ දැනට පවතින 1 ශ්‍රේණියේ පංති 04 පෙර පැවති පංති 05 දක්වා වැඩිකර ගැටළුකාරි තත්වයට පිළියම් සලසන ලෙසට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් දැනුවත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී .

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**06.01 2019.01.24 දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව සභා ගත කරන ලදි**

**2019.01.24 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව**

**6: 1 2018-07-20 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව**

**<u>2019 ජනවාරි මස 24 වන දින පුස්තකාල කමිටු වාර්තාව</u>**

- ගරු සභාපති — ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා
- ගරු නගර සභා මන්ත්‍රී — නන්දන රාජපක්ෂ මහතා
- ගරු නගර සභා මන්ත්‍රී — ධනසේන මාදුවගේ මහතා

| | |
|---|---|
| • ගරු නගර සභා මන්ත්‍රී | දිනයාදූර ධර්මදාස මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රීනි | එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය |
| • ගරු නගර සභා මන්ත්‍රීනි | එම්. චම්පා සුමුදු කුමාරි මහත්මිය |
| • කමිටු සාමාජික | සිරිපාල මාදුවගේ මහතා |
| • කමිටු සාමාජික | එම්.ඒ. ජයවීර මහතා |
| • කමිටු සාමාජික | සුගත් හෙට්ටිආරච්චි මහතා |
| • කමිටු සාමාජික | එන්.එච්.ඩන්කන් ද සිල්වා මහතා |
| • කමිටු සාමාජික | ප්‍රේමසිරි රතුවඩු මහතා |
| • ලේකම් | බී.ඒ. ධම්මිකා මහත්මිය |
| • ප්‍රජා සංවර්ධන නිලධාරී | ඩී.වී.තරංගි මහත්මිය |
| • පුස්තකාලයාධිපති | කේ.ඩබ්ලිව්.රංජනී මානෙල් මෙනවිය |
| • පුස්තකාල සහායිකා | ජී.එච්.එල්.පියන්ති මෙනවිය |
| • පුස්තකාල සහායිකා | එස්.සුසිලා දීපානි මහත්මිය |
| • පුස්තකාල සහායිකා | බී.එච්. දයාලතා මහත්මිය |
| • පුස්තකාල සහායිකා | කේ.ඒ. විසුද්ධි රේණුකා මහත්මිය |
| • පුස්තකාල සහායිකා | මාලතී සමන්තා ආරියසිංහ මහත්මිය |
| • පුස්තකාල සහායිකා | එස්.එම්.මනෝරි චන්ද්‍රවංශ මහත්මිය |
| • පුස්තකාල සහායිකා | එම්.ඩබ්ලිව්. ජේ.සුමංගලී මහත්මිය |

<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ 2019/01/24 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව</u>

- ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව. 2.30 ට පමණ පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.
- ගරු සභාපතිතුමා විසින් පුස්තකාල කමිටුවට පැමිණි සියලුම ගරු නගර සභා මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්, පුස්තකාල කමිටු සාමාජික මහතුන්, ලේකම්තුමිය සහ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාලයාධිපතිනිය සහ පුස්තකාල සහායිකාවන් ඇතුලු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදී.
- පළමුවෙන්ම ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම සිදුකරන ලදී.
  ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද ශාඛා පුස්තකාලවල ප්‍රගතිය ඒ ඒ ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් ද විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගති වාර්තාව සහ පෝරඹ, කෙරමිණිය ශාඛා භාර පුස්තකාල සහායිකාවන් පුස්තකාල කමිටුවට සහභාගී නොවුන බැවින් එම වාර්තා ජී.එච්. එල් .පියන්ති මෙනවිය විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදී.
- ජී.ඩබ්. ගුණසිරි මහතා සහ පියසිරි ටුක්කාවඩු මහතා පුස්තකාල කමිටුවට සහභාගී වීමට නොහැකි බව දූරකථනයෙන් දැන්වූ බව පුස්තකාලයාධිපතිනිය විසින් පුස්තකාල කමිටුවට දන්වන ලදී.
- විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී ආදායම සමග වියදම ද සඳහන් කර ලබන කමිටුවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට දැනුම් දෙන ලදී.

▪ ශාඛා පුස්තකාලවල ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම.

- හිරේවත්ත සහ හෙප්පුමුල්ල ශාඛා සඳහා සාමාජික සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන ලෙස එම ශාඛව භාර සහායිකාවන්ට පුස්තකාල කමිටුවට සහභාගී වු මහත්ම මහත්මීන්ගෙන් උපදෙස් ලබාදෙන ලදී.

▪ 2019 වර්ෂය සඳහා පොත් මිලදී ගැනීම.

- 2019 වර්ෂය සඳහා අලුතින් පොත් ලබා ගැනීමට රු. 250,000/= මුදලක් ලබාදුන් බවත් එම මුදලින් වට්ටම් මුදල ඇතුළුව පොත් මිලදී ගත් බව ගරු සභාපතිතුමා දන්වන ලදී. එහිදී රු. 342,495/= ක මුදලක් යොදවා පොත් මිලදී ගත් බව පුස්තකාලයාධිපතිනිය පුස්තකාල කමිටුවට දන්වන ලදී. එම

මුදලින් අලුතින් ලබාගත් පොත් ලැයිස්තුව පාඨක අදහස් පොතට ඇතුලත් කර තබන ලෙස ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට උපදෙස් ලබාදෙන ලදි.

- පොත් බැඳීම (Binding) සම්බන්ධව සාකච්ඡා කිරීම.

- දැනට ලබාගෙන ඇති පොත් සහ පසුගිය දිනවල මිලදී ගත් පොත් බැඳීමට අවශ්‍ය වන කාලය පිළිබඳ ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියගෙන් කරුණු විමසන ලදි. එහිදී ප්‍රධාන සහ ශාඛා පුස්තකාලවල පොත් එක් අයකුට පමණක් බැඳීමට විශාල කාලයක් වැයවන බැවින් පුස්තකාල සේවා මණ්ඩලයෙන් සාකච්ඡා කොට ශාඛා භාර පුස්තකාල සහායිකාවන්ට පොත් බැඳීම පිළිබඳ පුහුණුවක් ලබාදිය යුතු බව ගරු සභාපතිතුමාගේ අදහස විය. එහිදී ගරු නගරසභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා පවසා සිටියේ ඔහුගේ ග්‍රාමයේ පුස්තකාල සේවා මණ්ඩලයේ පොත් බැඳීමට සම්බන්ධ නිලධාරියකු විශ්‍රාම ගෙන ඇති බැවින් නොමිලයේ ඔහු යොදා පොත් බැඳීම පුහුණු කිරීමට කැඳවීමට හැකි බවය. එහිදී ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉක්මණින් මේ පිළිබඳ සාකච්ඡා කොට විසඳුමක් ලබාදීමට ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට උපදෙස් ලබාදෙන ලදි.
- ගරු නගරසභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයෙන් ලබාගෙන ඇති පොත් දෙකක් සම්බන්ධයෙන් ලිපියක් පුස්තකාල කමිටුවට ඉදිරිපත් කරන ලදි. 2017 වර්ෂයේ සාමාජික කාඩ්පත් දෙකක් සඳහා ලබාගෙන ඇති පොත් 02ක් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා පවසා සිටියේ නීත්‍යානුකූල පියවරක් අනුගමනය කොට මේ පිළිබඳ කරුණු සොයා බලා එම පුස්තකාල භාර සහායිකාවට කටයුතු කරන ලෙසය.

- ප්‍රධාන පුස්තකාලයට අලුතින් පුවත්පත් මිලදී ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීම.

- ප්‍රධාන පුස්තකාලයේ පාඨක අදහස් පොතේ පාඨකයකු සඳහන් කර ඇත්තේ මව්බිම, දේශය, අරුණ යන පුවත්පත් මිලදී ගැනීම සුදුසු බවය. එහිදී විශාල මුදලක් යොදවා පුවත්පත් මිලදී ගන්නා බැවින් සතිඅග අරුණ පුවත්පත පමණක් මිලදී ගැනීම සුදුසු බව යෝජනා විය.

- ප්‍රධාන හා ශාඛා පුස්තකාල සඳහා සාමාජිකයන් බඳවා ගැනීමට ක්‍රමවේදයක් පිළිබඳ සාකච්ඡා කිරීම.

- මෙහිදී ගරු සභාපතිතුමාගේ අදහස වූයේ අඩු ආදායම් ළමුන් සඳහා නොමිලයේ පාසල් පොත් බෙදාදීමේදී සුදුසුකමක් ලෙස පුස්තකාලයේ සාමාජිකත්වය ලබා තිබීම සුදුසු බවය. තවද එම සාමාජිකයා පොත් ලබාගැනීම නොකඩවා සිදු කර තිබීමද සොයා බැලිය යුතු බවය.

- දහම් පාසල් වෙත ගොස් සාමාජිකත්වය ලබා ගැනීමට පාසල් ළමුන් උනන්දු කරවීම සුදුසු බවද යෝජනා විය.

- ඉහත සඳහන් යෝජනා වලට අමතරව පුස්තකාල කමිටු සාමාජිකයන්ගේ යෝජනා ද ඉදිරිපත් කර සභාවට යොමු කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට උපදෙස් ලබාදෙන ලදි.
- ප්‍රධාන පුස්තකාලයේ පුවත්පත් කියවීමේ අංශයේ විදුලි පංකාව ක්‍රියාවිරහිත වී ඇති බව සුගත් හෙට්ටිආරච්චි මහතා පුස්තකාල කමිටුවට දන්වන ලදි. පුස්තකාල කමිටු සාමාජික එන්.එච්. ධන්කන් මහතා ප්‍රකාශ කර සිටියේ පොත් රාක්ක සෑදීම පිළිබඳ පසුගිය කමිටුවේ දී සාකච්ඡා කළ අතර එහි ඉදිරි කටයුතු පිළිබඳ විමසා සිටීමය. එහිදී ගරු සභාපතිතුමා දැන්වූයේ එම පොත් රාක්ක සාදා නිම කර ඇති බැවින් තීන්ත ආලේප කර හෝ පොලිෂ් කර ඉක්මනින් පුස්තකාල සඳහා ලබාදෙන බවය.

- ඕකන්ද ශාඛා පුස්තකාලය සඳහා අවශ්‍ය වතුර ටැංකිය ළමා මේස පුටු, පොත් රාක්ක ලබාදීම පිළිබඳ එම්.ඒ. ජයවීර මහතා කරුණු විමසන ලදි. එම අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදි.

- **හිරේවත්ත ශාඛා පුස්තකාලයේ ඉදිකර ඇති වතුර ටැංකිය තැබීම සඳහා සාදන ලද කණු දිරාපත් වී ඇති බැවින් එමගින් ජීවිත වලට පවා හානි සිදුවීමට ඉඩ තිබෙන නිසා ඉක්මනින් එය කඩා ඉවත් කරදෙන ලෙස එම ශාඛා පුස්තකාලය භාර පුස්තකාල සහායිකාව කමිටුවට කරුණු ඉදිරිපත් කරන ලදි. ගරු සභාපතිතුමා යෝජනා කර සිටියේ දිනෙන් දින මෙම කාර්ය පසුවට යන බැවින් රු. 20,000/= ක මුදලක් මේ සඳහා වෙන් කිරීමට යෝජනා කරන අතර ඒ කාර්ය නිසි ආකාරයට කරගැනීම සඳහා පුද්ගලයන් යොදවා එය ඉටු කර ගැනීම සුදුසු බවය.**

**වෙනත් කරුණු ඉදිරිපත් නොවු බැවින් ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තූතිය ප්‍රකාශ කරමින් පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු අවසක් කරන ලදි.**

......................................

**කමිටු ලේකම්**

**නගර සභාව අම්බලන්ගොඩ**

| | |
|---|---|
| ........................................ | .................................. |
| **ලේකම්** | **අත්සන් කළේ සභාපති** |
| **නගර සභාව අම්බලන්ගොඩ** | **නගර සභාව අම්බලන්ගොඩ** |

**තීරණය**

2018.01.24 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06.02 2019.01.19 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව සභා ගත කරන ලදි

**ටෙන්ඩර් කමිටුව**

**2019/01/17 දින ප.ව. 2.30**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 01. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 02. ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 03. නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 04. රාහුල ලලිත වික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 05. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 06. බී.ඒ. ධම්මිකා මහත්මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |
| 07. එච්.පී. මිහිරි ද සිල්වා මිය | ප්‍රධාන කළමණාකරන සහකාර,අම්බලන්ගොඩ නගරසභාව |

08. පී.එම්. විජේසිංහ මෙනවිය තාක්ෂණ නිළධාරී,අම්බලන්ගොඩ නගරසභාව

09. හසලා යසින්දරා මිය කළමනාකරණ සහකාර ,අම්බලන්ගොඩ නගරසභාව

**කමිටු වාර්තාව**

1.පරණ පත්තර විකිණීම සදහා ඩී. සිරිසේන මහතාගේ උපරිම මිල ගණන් පිළිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ෆ්. ප්‍රනාන්දු ද සිල්වා මයා | ඩී. සිරිසේන මහතා | එම්.ඩී. ජයන්ත ලොරේන්ස් මයා | ජී.එච්. ද සිල්වා මයා |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | පරණ පත්තර | 01kg | ලොකු පත්තර | රු.12.00 | රු.14.00 | රු.10.00 | රු.06.00 |
| 2 | | 01kg | පොඩි පත්තර | රු.08.00 | රු.12.00 | රු.8.00 | රු.05.00 |

2. පස් , කොරි පස් සදහා අවම මිල ඉදිරිපත් කල පී.එච්.සී. ගොඩනැගිලි දව සපයන්නෝආයතනයේ මිල පිලිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | පී.එච්.සී. ගොඩනැගිලි දව සපයන්නෝ | එම්.ඩී. ප්‍රේමසිංහ අම්බලන් | පී.යූ. සුනිත් අම්බලන් ගොඩ |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | කොරි පස් කියුබ් | 300 | | 2800.00 | 3000.00 | 3000.00 |
| 02 | පස් කියුබ් | 300 | | 2800.00 | 3000.00 | 2900.00 |

3.පිරිසිදු කාරක ද්‍රව්‍ය සදහා අංක 1,2,3, සදහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නයනරංජන ආයතනයේ මිල ගණන් පිළිගැනීමටත් අංක 4 සදහා පූර්ණා වෙළද සැල ආයතනයේ මිල පිළිගැනීමටත් සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | පූර්ණා වෙළඳසැල අම්බලන් ගොඩ | නයන රංජන සේල් පොල අම්බලන් | කරු සේල් සෙන්ටර් අම්බලන් ගොඩ |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | හාපික් | | 500ml | 195.00 | 190.00 | - |
| 2 | ටොයිලට් බෂ් | | ප්ලාස්ටික් මිට | 60.00 | 30.00 | 35.00 |
| 3 | ෆිනෝල් | | | 625ml 190.00 | 01L 190.0 | - |
| 4 | බ්ලීච් | | | 200g 55.00 | 1kg 350.00 | |

.

4.කසල බඳුන් සඳහා පරීක්ෂා කිරීමෙන් අනතුරුවඅවම මිල ඉදිරිපත් කර ඇති තරුසේල් සෙන්ටර් වෙතින් ලබාගත් මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | නව සජීව ආයිෂා ආයතන | තරු සේල් සෙන්ටර් අම්බලන්ගොඩ | තයනි රංජනී සේල් පොල |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | තෙරපීමෙන් විවෘත කරන ලද 100 කසල බඳුන් | 10 | | 2845.00 | 2700.00 | 2750.00 |

**5.පාට කොඩි 100 සඳහා නගර සභා ලාංඡනය හා අම්බලන්ගොඩ නගර සභාව යන නම මුද්‍රණය සඳහා අවම මිල ඉදිරිපත් කර ඇති H.M.D. ද සොයිසා මහත්මියගේ මිල ගණන් පිළිගැනීම තීරණය කරන ලදී**

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ජී. ශාන්තා දමයන්ති මිය | එස්. එච්. හෙට්ටි ශාන්ත මිය | H.M.D. ද සොයිසා මිය |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| | **පාට කොඩි 100 සඳහා නගර සභා ලාංඡනය හා අම්බලන්ගොඩ නගර සභාව යන නම මුද්‍රණය** | | | 160.00 | 155.00 | 150.00 |

.............................................          ...................................................

සකස් කලේ

එල්.ආර්.මිගෙල්හේවා

සංවර්ධන නිළධාරී

අම්බලන්ගොඩ නගර සභාව

පරීක්ෂා කලේ

තාක්ෂණ නිළධාරී

අම්බලන්ගොඩ නගර සභාව

.................................................... ....................................................

| | |
|---|---|
| ලේකම් | සභාපති |
| බී.ඒ.ධම්මිකා | ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් |
| අම්බලන්ගොඩ නගර සභාව | අම්බලන්ගොඩ නගර සභාව |

තීරණය -

2018.01.17 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06.03 2019.01.29 දින පැවැති ක්‍රීඩා කමිටු වාර්තාව සභා ගත කරන ලදි

**ක්‍රීඩා කමිටු වාර්තාව**
**2019.01.29**

**සහභාගිත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා | -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා | -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ව්.ඉනෝකා ක්‍රිෂානති මිය | -ගරු නගර සභා මන්ත්‍රිණි,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩබ්ලිව්.එම්.නිලානි මෙ.වි | - ගරු නගර සභා මන්ත්‍රිණි,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.එච්.ඩී.එස්.කරුණාරත්න මහතා | -ක්‍රීඩා නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ. |
| කේ.ඩබ්ලිව්.සී.දර්ශනී ද සිල්වා මිය | -ගා/ප්‍රජාපතීගෝතමී බා.වි.,අම්බලන්ගොඩ. |
| එස්.ඩබ්ලිව්.මහේන්ද්‍ර ගුණරත්න මහතා | -ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ. |
| ඩබ්ලිව්.ඒ.ආර්.ගුරුසිංහ මහතා | -ගා/ධර්මාශෝක විද්‍යාලය,අම්බලන්ගොඩ. |
| ටී.සරත් ශාන්ත මහතා | -සිංහ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ. |
| එස්.කේ.ආර්.දිලංකා මෙ.වි | -ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ. |
| එගොඩගේ ජයසේන මයා | -අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය. |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා | -ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ. |
| එස්.එම්.නීල් වසන්ත මහතා | -පිහිණුම් පුහුණුකරු,අම්බලන්ගොඩ. |
| පී.එම්.විජේසිංහ මෙ.වි | -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.පී.මිහිරි ද සිල්වා මිය | -ප්‍රධාන කළමනාකරණ සහකාර,අම්බලන්ගොඩ නගර සභාව. |

| | |
|---|---|
| ජී.අශෝක කුමාර මහතා | -ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා | -දකුණු පළාත් පා පන්දු පුහුණුකරු. |
| ඩී.වි.තරංගි මිය | -ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනීම.-ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන්ලා,මන්ත්‍රීතුමියන්ලා,ගුරු මහත්ම මහත්මීන්, ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි මහත්ම,මහත්මීන් ඇතුළු සියළුම නිලධාරි මහත්ම,මහත්මීන් පිළිගනිනමින්, ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා,ධම්මික කොඩිකාර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මිය අද දින ක්‍රීඩා කමිටුවට සහභාගිවීමට නොහැකි බව දන්වා දුරකථනයෙන් දැනුම් දීම සභාවට දන්වන ලදි.

**ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම.**

අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය විසින්,නගර සභා ක්‍රීඩා කමිටු රැස්වීම සඳහා නියෝජනය වීමට කරන ලද ඉල්ලීම මැයෙන් ඉදිරිපත් කරන ලද ලිපියත්,එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතා විසින් ක්‍රීඩා කමිටුව සඳහා සමාජිකත්වය ලබා ගැනීම මැයෙන් ඉදිරිපත් කරන ලද ලිපියත් සභාගත කරන ලදි.

**සභාවේ විරෝධතාවයක් නොවූයෙන් ඉහත ඉල්ලීම් පරිදි, අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයට හා එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතාට නගර සභා ක්‍රීඩා කමිටුවේ සමාජිකත්වය ලබා දීමට තීරණය කරන ලදි.**

දකුණු පළාත් පාපන්දු පුහුණුකරු ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා විසින් නගරාධිපති කුසලාන පාපන්දු තරගාවලිය 2018 ,තරගාවලියෙන් ජෝෂ්ඨ ක්‍රීඩා නිලධාරි සරත් කුමාර ද සිල්වා මහතා, ක්‍රිඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතා, දකුණු පළාත් පාපන්දු පුහුණුකරු ඉඳුනිල් එදිරිවික්‍රම සූරිය මහතා සහ පාපන්දු පුහුණු කරු මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතාගෙන් සැදුම් ලත් තෝරා ගැනීමේ කමිටුව විසින් නගර සභා පාපන්දු සංචිතයට තෝරාගන්නා ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නාම ලේඛනය සහ පාපන්දු සංචිතයට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ ඇස්තමේන්තුව ඉදිරිපත් කරන ලදි.

**අම්බලන්ගොඩ නගර සභා පාපන්දු සංචිතය සඳහා තෝරාගත් ක්‍රීඩක නාම ලේඛනය**

1. කේ.සෙනේෂ් කාවින්ද
2. එම්.ඔෂේන් ඉඳුවර
3. තරුක සෙනෙවිරත්න
4. එස්.කවිඳු සඳරුවන්
5. එම්.විශ්ව මින්ජය
6. කේ.ඩී.ගයාන් ගීතාංජන
7. ඩී.සචින් මධුසංක
8. එන්.කවිඳු සුසාන්
9. ආර්.මලින් උදයන්ත
10. වයි.විකසිත තරුමිණ
11. කේ.එච්.මිතුන් මධුසංක
12. පී.එච්.ආකාශ් මධුවන්ත
13. එන්.එච්.චන්දිම රුක්ෂාන්

14. ආර්.අමිත්
15. එල්.එච්.සුපුන් කුමාර
16. එස්.එච්.ගගන සිත්මිණ
17. එල්.එච්.ඉමාෂ් කුමාර
18. එල්.සුරත් සංකල්ප
19. එස්.දමිඳු දිල්ශාන්
20. ඩබ්ලිව්.පමොද් සදංජන
21. ටී.හරිස් මනෝහර
22. එම්.සමින් මධුසංඛ
23. බී.සිතිජ රොෂාන්
24. ඒ.පී.හිරුෂ්ම රන්මල්
25. කේ.ඩබ්ලිව්.ආලෝක ඉමාෂ

**අම්බලන්ගොඩ නගර සභා පාපන්දු සංචිතය සඳහා තෝරාගත් ක්‍රීඩිකා නාම ලේඛනය**

1. කේ.නිෂලි මීරා
2. එච්.ඒ.සනායා සසුන්දි
3. ඩබ්ලිව්.පී.පමෝදි චතුනිකා
4. එස්.එච්.හසාරා සේමිණි
5. එම්.ෂෙහානි දිව්‍යාංජනී
6. ඩබ්ලිව්.සුමුදු සෙව්මිණි
7. ජී.කේ.කෞෂල්‍යා ඉෂාදි
8. ජී.සුරංගි මධුෂානි
9. පී.ඉරෝෂනී සෙව්මාලි
10. ජී.රංගි නිශානි
11. ඩී.හෙසැදි විමන්සා
12. ඩී.ටෂ්මී මධුමාලි
13. කේ.එම්.පවනි ලක්වින්දි
14. එස්.පාතිමා රිජ්නා
15. එම්.තක්ෂිලා දිල්රුක්ෂි

<u>අම්බලන්ගොඩ නගර සභා පාපන්දු සංචිතය -2019</u>

<u>දල ඇස්තමේන්තුව</u>

1. Pan වර්ගයේ බූට් සපත්තු 35(කාන්තා /පිරිමි) රු.3,500x35 =රු. 122,500.00
2. පාආවරණ(සිංගාඩ්) 500 x35 = 17,500.00
3. දැල් රකින්නාගේ අත් ආවරණ 5,500x3 = 16,500.00
4. ක්‍රීඩක/ක්‍රීඩිකා ඇඳුම(කලිසම හා ටීෂර්ට්) 2,000x35 = 70,000.00
5. ක්‍රීඩක ඇඳුම දැල් රකින්නා 3,000 x3 = 9,000.00
6. ස්ටොකින්ස් 400 x35 = 14,000.00
7. පුහුණුව සඳහා යොදාගනු ලබන බිප්ස් 350 x20 = 7,000.00
8. පුහුණුව සඳහා යොදාගනු ලබන මාකස් = 3,500.00
9. පුහුණුව සඳහා යොදා ගනු ලබන 9" කෝන්ස් 175 x20 = 3,500.00
10. පුහුණුව සඳහා යොදා ගනු ලබන 12" කෝන්ස් 275 x20 = 5,500.00

11. ගෝල් නෙට් ජෝඩු 01 = 12,000.00

**මුළු එකතුව = 281,000.00**

**ඉහත ඇස්තමේන්තුව කමිටුව විසින් පිළිගන්නා ලදි.**

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා,දකුණු පළාත් පාපන්දු පුහුණුකරු.**

මෙම තරගාවලිය 2018.12.03,04,06 දිනයන්හි අම්බලන්ගොඩ කලාපයට අයත් පාසල් කණ්ඩායම් 16ක සහභාගිත්වයෙන් (බාලක කණ්ඩායම් 13,බාලිකා කණ්ඩායම් 03) ප්‍රජාපතීගෝතමී බාලිකා විද්‍යාල ක්‍රීඩාංගණයේ සාර්ථකව පවත්වනු ලැබුවා. නගර සභා පාපන්දු සංචිතයට ක්‍රීඩකයන් 234කු ගෙන් පළමු වටයෙන් ක්‍රීඩකයන් 54 තෝරාගෙන දෙවන වටයේදී 25දෙනෙකු තෝරාගනු ලැබුවා. ක්‍රීඩිකාවන් 15කුත් තෝරාගනු ලැබුවා.

මෙම තරගාවලියේ බාලක ශූරතාවය ගා/බූස්ස ධීරානන්ද විද්‍යාලයත් අනුශූරතාවය කුළිගොඩ සුමන විද්‍යාලයත් බාලිකා ශූරතාවය බළපිටිය සිද්ධාර්ථ විද්‍යාලයත් අනුශූරතාවය අම්බලන්ගොඩ ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයත් හිමිකරගනු ලැබුවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනේ ශ්‍රී ලංකා පාපන්දු සංගමය මගින් සංවිධානය කරන ලද වයස අවු.16න් පහළ සමස්ථ ලංකා පාපන්දු තරගාවලියට ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන්න සුදුසුකම් ලබාගෙන තිබුනෙත් මෙම තරගාවලියේ ශූරතාවය හිමිකරගත් කණ්ඩායම් දෙක,තරගාවලිය පවත්වන්න තිබුනේ කුරුණෑගල ඒඅවස්ථාවේ දී එම පාසල් දෙකට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම වෙනුවෙන් නගර සභාවෙන් රු.10,000.00 බැගින් ලබා දුන්නා.

ඒ වගේම අපි තෝරාගත් මේ සංචිතයට සියළු පහසුකම් සලසා දෙන්න අවශ්‍යයි.

**එස්.ඩබ්ලිව්.මහේන්ද්‍ර ගුණරත්න මහතා-ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.**

මේ සංචිතයට නගර සභා බල ප්‍රදේශයේ පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නියෝජනය අඩුයි. 50%ක්වත් බල ප්‍රදේශයෙන් තෝරාගත්තනම් හොඳයි.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා,දකුණු පළාත් පාපන්දු පුහුණුකරු.**

මුළින් සාකච්ඡා වුනේ තරගාවලියට සහභාගිවන පාසල් කණ්ඩායම් වලින් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගන්න. ඒ අනුව තමයි තෝරා ගත්තේ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මේ තමයි නගරයේ පාපන්දු වල තත්වය.අපි මෙවැනි තරගාවලි සංවිධානය කිරිමෙන් බලාපොරොත්තු වෙන්නේ නගරයේ පාපන්දු දියුණු කරන්න. අපේ පාසල් වලට අවස්ථාව තියෙනවා මේ දක්ෂ ක්‍රීඩකයන් පාසලට ඇතුළත් කරගෙන හොඳ පාපන්දු කණ්ඩායමක් හදාගන්න නමුත් ඒක කරන්නේ නැහැ.මොන ප්‍රදේශයෙන් ආවත් මේ දරුවෝ අවසානයේ සෙල්ලම් කරන්නේ අම්බලන්ගොඩ නගර සභා පාපන්දු සංචිතය නමින්.

අපි මෙම තරගාවලිය ආරම්භ කළේ 2002 දී, එහිදි තෝරා ගත් ක්‍රීඩකයන්ගෙන් සැදුම් ලත් සංචිතයේ පළමු කණ්ඩායම 2004 දී ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් සංවිධානය කරන ලද වයස අවු.19න් පහළ කණිෂ්ඨ පාපන්දු තරගාවලියේ අවසන් තරගයට සුදුසුකම් ලබා ගත්තා. ශ්‍රී ලංකා යුධ හමුදාවේ කෙටේරියන්ස් පාපන්දු කණ්ඩායමේ සම්පූර්ණයෙන්ම සෙල්ලම් කරන්නේ අපේ සංචිතයේ හිටපු ක්‍රීඩකයන්. අඩුම තරමේ මේ ක්‍රිඩකයන්ට ආමි එකට හරි සම්බන්ධ වෙන්න මේක ලොකු අවස්ථාවක් වෙනවා.

අපි නගර ක්‍රීඩා කියල ක්‍රීඩා තරගාවලියක් මීට පෙර වසරවල පැවැත්වුවා කිසිම නගර සභාවක් හෝ ප්‍රාදේශිය සභාවක් මෙවැනි තරගාවලි සංවිධානය කරන්නේ නැහැ.මෙවැනි තරගාවලින් අපි බලාපොරොත්තු වුනේ පාසල් ක්‍රීඩක,ක්‍රීඩිකාවන්ට වැඩි ක්‍රිඩා අවස්ථා ලබා දීම තුළින් ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා දියුණු කරන්න. එහිදි මට මතකයි

දේවානන්ද විද්‍යාලයේ අපේ ධම්මිකා මිස් බැඩ්මින්ටන් වලට කරන්දෙණිය විද්‍යාලයෙන් දක්ෂ ක්‍රීඩිකාවන් දෙදෙනෙක් ගන්න ලොකු උත්සහයක් ගත්ත.ඒත් විදුහල්පතිතුමා කැමති වෙලා තිබුනේ නැහැ.

**එගොඩගේ ජයසේන මයා-අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය.**
නගර ක්‍රිඩා තරගාවලිය විශාල පිටුවහලක් වුනා පාපන්දු ක්‍රීඩාව නගරයේ දිදුලවන්න.ඒ වගේම දේවානන්ද විද්‍යාලයේ පාපන්දු ක්‍රීඩාව දියුණු කරන්න අපේ ඉඳුනිල් මහත්මා ලොකු වෙහෙසක් කැපකිරීමක් කරනවා.මම එතුමාට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මෙම ක්‍රීඩා තරගාවලිය පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලොකු අවස්ථාවක් මෙම වසරේදී පවත්වන්න පුළුවන්නම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මෙම තරගාවලියට ප්‍රධාන බාධකය තමයි මේ පිට්ටනිය. පිට්ටනියේ වැඩ අවසන් වුනාම අපි මේ තරගාවලිය කරමු.

<u>**පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය**</u>

- කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට හා දුර පනිනවල සෑදීම.

  **ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  ආරක්ෂිත වැට හදල අවසන්,දුර පනින වළනම් හැදුවේ නැහැ.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් දීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  ඒක ඉක්මනට කරල දෙන්න නගර සභාවට කරන්න අමාරු වැඩක් නෙවෙයි නේ.මේ Term එකේ කරල දෙන්න බැරිනම් ඊට පස්සේ කරල වැඩක් නැහැ.

- මාදම්පා ගඟ පිහිනුම් තටාකයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  අද පත්මසිරි මහත්මයා පැමිණ නැහැ,කොහොමද දැන් තත්වය.

  **ඩී.වී.තරංගි,ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
  පෝරඹ ප්‍රජා මණ්ඩලය ගිවිසුම අත්සන් කලා කියල දන්නවා.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  ගිවිසුම අත්සන් කරලනම් ඉක්මනට වැඩ පටන් ගන්න කියන්න. TO මිස් මේ ගැන බලන්න. මාදම්පා ගඟේ බෙල්ලන් ඉවත් කර ගැනීම පිළිබඳව අපි රුහුණු සංචාරක කාර්යාංශය දැනුවත් කළා. අයින් කරන්න ක්‍රමවේදයක් තියෙනවනම් මුදල් දෙන්න ඒ අය ලැහැස්තියි.

  **එස්.ඩබ්ලිව්.මහේන්ද්‍ර ගුණරත්න මහතා-ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.**
  දරුවන්ට හානියක් නොවෙන්නනම් කරන්න තියෙන්නේ රබර් ආවරණයක් දාන එක. කඩල ඉවත් කළත් සති 02ක් යන්න කළින් ආපසු හැදෙනවා.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  TO මිස් ඇස්තමේන්තුවට රබර් ආවරණය යෙදීම ඇතුළත් කලේ නැහැ නේද? නැත්නම් ඒකත් ඇතුළත් කරන්න.

- මානාන ක්‍රීඩාංගණය ශුද්ධ පවිත්‍ර කිරීම හා වතුර tap එකක් සවි කිරීම.

  **ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  වතුර Tap එක සවි කළා.ශුද්ධ කරන වැඩ තවම කරනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
දැන් ගොඩක් වැඩ අවසන් මම හිතන්නේ මීටර් 400 ට්‍රැක්එකකට දැන් යන්න පුළුවන්.මම අපේ හිටපු ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතාත් එක්ක ගියා බලන්න. ක්‍රීඩා අමාත්‍යාංශයෙන් Basket Ball Code එකක් හදන්න මුදල් අනුමත වෙලා තියෙනවා කියල එතුමා කිව්වා.එම ප්‍රතිපාදන පාසල්වලට දෙන්නේ නැහැ.දෙන්නේ පළාත් පාලන ආයතනවලට විතරයි.මම කසුන්ට කිව්වා මානාන ක්‍රීඩාංගණයේ ම හදන්න කියලා. ඉස්සරින් අපේ අලුත් ක්‍රීඩා නිලධාරිතුමත් පාසල්වල ක්‍රීඩා භාර ආචාර්යවරුන් එක්ක පිට්ටනිය බලල, මීටර් 400 ට්‍රැක් එකට ඉඩ තියල.අනෙක් ක්‍රීඩා වලට පිට්ටනිය ගන්න විදිය සැලසුම් කරගන්න. මම කොහොමත් බලාපොරොත්තු වෙනවා මානාන ක්‍රීඩාංගණයේ Sports Complex එකක් හදන්න.
පිට්ටනියට පස්දාල තුනී කරන්න.ඇස්තමේන්තුවක් දෙන්න.ඇස්තමේන්තුව ලක්ෂ 05ට වැඩිකරන්න එපා.අදියර වශයෙන් පස් දාන්න හදන්න.

- ❖ විලේගොඩ ඇළ ශුද්ධ පවිත්‍ර කිරීම.
  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  මම හිතන්නේ ඒ වැඩය අවසන්.

- ❖ පොල්වත්ත ක්‍රීඩාංගණයේ වොලි බෝල් පිටිය සකස් කිරීම.
  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  මෙකේ ඇස්තමේන්තුව ලක්ෂ 10ක් ඇස්තමේන්තුව දැක්කාම වැඩේ නොකෙරෙන පැත්තට තමයි යන්නේ.අපි මේකකත් කරමු.

  **පී.එම්.විජේසිංහ මෙ.වි,තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.**
  ඇළ පැත්තේ බැම්මක් බැදල පස් පුරවන්නත් එක්ක තමයි ඇස්තමේන්තුව හදල තියෙන්නෙ.

- ❖ පැවිලියන් එකේ කාමර wiring කිරීම.
  **ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  ඒ වැඩය කළා.

  **මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා,ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ.**
  පැවිලියන් එකේ කාමරවල දොර වල් හදන වැඩේ නම් කෙරුනේ නැහැ.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  ක්‍රීඩාංගණය හොඳට හැදෙනකොට පැවිලියන් එකේ අඩුපාඩු තියෙන්න බැහැ.TO මිස් ඒ අඩුපාඩු බලල ඇස්තමේන්තුවක් දෙන්න.

- ❖ ඇවිදින මංතීරුව සඳහා විදුලි පහන් සවිකිරීමට අදාළ ඇස්තමේන්තුව සකස් කිරීම.
  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  ඇවිදින මංතීරුව නම් හදල ඉවරයි.ඇස්තමේන්තුව ලැබුනේ නැහැ.

  **පී.එම්.විජේසිංහ මෙ.වි,තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.**
  මේ සභාවට ඉදිරිපත් කරන්නම්.

<u>අදහස් හා යෝජනා</u>

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

ක්‍රීඩාංගණයේ විසිරි ජල සැපයුම් පද්ධතියේ වැඩ දැන් ආරම්භවෙලා තියෙන්නෙ.සභා අරමුදලින් ලක්ෂ 38ක් මේ සඳහා වියදම් කරනවා.ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණයේ පළමු පියවර අපි ආරම්භ කරල තියෙනවා.

ඊළඟට නගර සභාවට චෝදනා එල්ලවෙන එකක් තමයි ස්වභාවික පිහිණුම් තටාකය,සමාජ මාධ්‍යවල බොහෝ දුරට කථාකරන්නේ නගර සභාව වැරදිකාරය කරල.මම හිතන්නේ අම්බලන්ගොඩ තියෙන දර්ශනියම ස්ථානයක් තමයි මෙම ස්ථානය. නිදහසේ නාන්න,විනෝද වෙන්න තියෙන හොඳම තැනක් අපි වෙන විනාශය වළක්වා ගෙන ආරක්ෂා කරගන්න ඕනේ.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා,ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ.**
අපි මීට කළින් යෝජනා කළා වැලි කොට්ට තියන්න. ඒක කරමු.

**ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා ,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
කොන්ක්‍රීට් බැම්මක් දාන්න පුළුවන්නම් හොඳයි.
**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මේ පිළිබඳව මුළින්ම වෙරළ සංරක්ෂණ නිලධාරි දැනුවත් කරල උපදෙස් ගන්න ඉල්ලීමක් කරන්න.
Trial එකක් විදියට මුළින් වැලි කොට්ට දාමු.

**ඩබ්ලිව්.එම්.නිලානි මෙ.වි, ගරු නගර සභා මන්ත්‍රිණි,අම්බලන්ගොඩ නගර සභාව.**
මාදම්පා ගඟේ තියෙනවා අළුත් පාලම හදද්දි ඉවත් කරපු යකඩ,ගඟේ මෝය කට හිරවුණොත් ගංවතුරක් වුනත් එන්න පුළුවන්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මේ කියන කථාව ඇත්ත.එම යකඩ කණු අපට උස්සල තියන්න පුළුවන් ඒවා නොවෙයි. දුම්රිය දෙපාරත්තමේන්තුව පාලම අළුතින් හදද්දි පරණ පාලමේ කොටස් ගඟට දාලයි තියෙන්නේ මේවා ඉවත්කරන් කියල දුම්රිය දෙපාර්තමේන්තුවට ලිපියකින් දන්වන්න.පිටපතක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට දාන්න.

**ඩී.එච්.ඩී.එස්.කරුණාරත්න මහතා,ක්‍රීඩා නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ.**
මම ක්‍රීඩා කරල තියෙන්නෙත් Table tennis මෙහේ දැන් තියෙන ගැටළුව තමයි සෙල්ලම් කරන්න Hall එකක් නැතිකම.මම මේ ගැන ක්‍රීඩා අමාත්‍යාංශය දැනුවත් කරල තියෙන්නේ ඒ අය කියනවා ඉඩමක් තියෙනවා නම් Hall එක හදන්න සල්ලි දෙන්නම් කියල.මම ප්‍රාදේශිය ලේකම්තුමියගෙනුත් ඇහැව්වා.එතුමිය නම් කියන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතුව ඉඩමක් නැහැ කියල.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මානාන ක්‍රීඩාංගණය දෙන්නම්, Table tennis වලටයි, ඉහළ මාලය Badminton වලට ගන්න පුළුවන් විදයට හදන්න පුළුවන්.

**ඩී.එච්.ඩී.එස්.කරුණාරත්න මහතා,ක්‍රීඩා නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ.**
Gym එක තියෙන ගොඩනැඟිල්ලේ උඩ කොටස දෙනවනම් අපට හදාගන්න පුළුවන්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
එතන ඉඩ ඇතිද?
**ඩී.එච්.ඩී.එස්.කරුණාරත්න මහතා,ක්‍රීඩා නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ.**
Tournament එකකට යන්න අමාරුයි. අඩි 17x14 ඉඩ ප්‍රමාණයක් ඕනේ. Practice වලට මේස දෙකක් දාගන්න ඇති.ඒකත් ප්‍රමාණවත් දැන් තියෙනතත්වයත් එක්ක.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි දෙන්නම්,හැබයි ගොඩනැඟිල්ල හදල නගර සභාවට පැවරිය යුතුයි.නැත්නම් ප්‍රශ්න ඇතිවෙනවා.පොදු තැනකින් පාලනය වෙන එක තමයි හොඳ.

**එගොඩගේ ජයසේන මයා,අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය.**
අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයෙන් තමයි රොසෙත් රෝහල අසල තිබෙන Badminton Code එක පවත්වාගෙන යන්නේ,එම භූමිය රොසෙත් රෝහලට දීල තියෙනවා වාහන Park කරන්න.මම ඊයේ දවසේ සිදුවූ සිදුවීමක් කියන්නේ ඊයේ දොර ළඟ ත්‍රීවිල් එකක් හප්පලා බැම්මත් කඩල දාලා.මම ඒ වෙලාවෙම කිව්වා හදල දෙන්න කියල මොකද වැස්සක් වැස්සොත් වතුර ඇතුළට දාන්න පුළුවන් නිසා,රොසෙත් රෝහලෙන් වාහන Park කරන එක ගැන කිසිම සේවීමක්,පාලනයක් කරන්නේ නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මේ ගැන රොසෙත් රෝහල් කළමනාකාරිත්වය දැනුවත් කරන්න.
**එස්.ඩබ්ලිව්.මහේන්ද්‍ර ගුණරත්න මහතා-ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.**
අපේ නගරයේ ක්‍රීඩා වලට තියෙන තවත් ලොකු පාඩුවක් තමයි Pool එකක් නැතිකම.ක්‍රීඩා අමාත්‍යාංශය හැම නගරයකටම Pool එකක් දුන්නා. ජාත්‍යන්තර,ජාතික මට්ටමේ පිහිණුම් ශූරයෝ බිහිකරපු අම්බලන්ගොඩට නැහැ.දැන් තියෙන තත්වය අනුව පිහිණුම් කරන්න අවස්ථාව ලැබිල තියෙන්නේ දක්ෂයාට නොවෙයි.සල්ලි තියෙන පවුල්වල ළමයින්ට.

**ඩී.එච්.ඩී.එස්.කරුණාරත්න මහතා,ක්‍රීඩා නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ.**
කසුන් මහත්මයා මේ ගැන නිතරම ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කරනවා.

**ඩබ්ලිව්.එම්.නිලානි මෙ.වි, ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව.**
මම මෙය අවස්ථාවක් කර ගන්නවා අපේ හිටපු ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මැතිතුමාට ස්තුතිකරන්න.තම රාජකාරි කාලය තුළ නගර සභාව හා එක්ව ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කරන ලද සේවාව වෙනුවෙන්.

ස්තූති කථාව

**ස්තූති කථාව- ඇම්.ඩබ්ලිව්.අරුණ ප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගී වූ සියළුම නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාටත්, විශේෂයෙන්ම පාසල් නියෝජනය කරමින් පැමිණි ආචර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ,ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි සියළුම මහත්වරුන්ටත් නිලධාරි සියළු දෙනාටත් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් දක්වන කැපවීම වෙනුවෙන් ස්තූතිය පුද කර සිටිමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදි.

සකස් කළේ,

.........................................
ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

.........................................
ලේකම්,
නගර සභාව- අම්බලන්ගොඩ.

.........................................
සභාපති,
නගර සභාව-අම්බලන්ගොඩ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මේ ක්‍රීඩා කමිටු වාර්තාව පිළිබඳව යම් දෙයක් ප්‍රකාශ කළ යුතුයි. එම වාර්තාවේ තිබෙන ඇවිදින මංතීරුව සකස් කරනු ලැබුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සාදා අපට භාර දෙනු ලැබුවේ. ඒ අපගේ මුදල් වලින් නෙමේයි මෙය ඉදිකරනු ලැබුවේ. එහි විදුලි ආලෝකය සැපයීම තමයි එම වාර්තාවේ තිබෙන්නේ. අප සභාවක් විදියට මා ඊට විරුද්ධ වන්නේ නැහැ. නමුත් ඊට කලින් අපේ ගම් ප්‍රදේශයේ මාර්ග වල විදුලිය නැති ස්ථාන ඇත . ඒවාටත් විදුලිය ලබා දිය යුතුයි. හොරිවිල වෙද මහතා නිවසට යන පාරේ හල්වතුරේ ඇළට සමාන්තරව යන මාර්ගයේ නිවෙස් කිහිපයක්ම සොරුන් එක පිට පිටම බිද දැමුවා. මත්ද්‍රව්‍ය ගන්නා පුද්ගලයින්.72සැම මාසයකම පැමිණිලි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එයට විදුලි රැහැන් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එක තමයි

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තියෙන හරියේ දැමිය හැකිය.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එතැන සිට ඇළ මාර්ගය පටන් ගන්න ස්ථානයට විදුලිය තිබෙනවා

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හල්වතුරේ විදුලිය දමා ඇති ස්ථාන වල එය ඇත්තේ විසන්ධි කිරිමේ ස්විච් මගිනි. ඒ අය වේලාවට එවා නිවා නොදමයි. එහෙමම තබනු ලබයි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

නෑ ඒ ගම් වැසියන්ට අපිට කියන්න පුළුවනි. එම ගම් වැසියන්ගේ බරපතල ඉල්ලීමයි. නිවෙස් 4ක් සොරුන් බිද දමා ඇත.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහි විදුලි රැහැන් තිබෙනවා නම් දමන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එය මගේ මුදලින් හරි දමන්නම්. අර මංතිරුවලට විදුලිය සැපයිමට කලින් ඒ ප්‍රදේශවලට විදුලිය ලබා දෙන්න නැතිව මංතිරුවලට විදුලිය ලබා දීමට විරුද්ධව නොවේ.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඇවිදින මංතිරුවේ විදුලිය සම්බන්ධයෙන් කතා කළ යුතුයි ඒ සඳහා අපි සාකච්ජා කරනා විට ගරු ප්‍රධාන අමාත්‍යතුමා සඳහන් කරනු ලැබුවා මෙම වර්ෂයේ ඒ සඳහා මුදල් වෙන් කරනා බවට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේ නම් අපි මේ සඳහා අපේ මුදල් වියදම් කිරිමට අවශ්‍ය නැහැ. මෙය අතහැර දමන්න.

**තීරණය**

2018.01.29 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රීනි එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2019.01.18 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව සභා ගත කරන ලදි.**

මූල්‍යකමිටුව

**2019-01-18 දින ප.ව.2.30**

සහභාගීත්වය

1. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා — ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
3. ඇම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා — ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. එම්.අතුල ප්‍රියන්ත මහතා — ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
5. එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා — ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
6. බී.ඒ.ධම්මිකා මිය — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මූල්‍ය කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් , නගර සභා ලේකම්, ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිලිගන්නා ලදී.

අනතුරුව එදිනට කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සඳහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදී.

| ගෙවීම් ලබන්නාගේ නම | මිලදීගෙන ඇති භාණ්ඩ පිලිබඳ විස්තර | මුදල රු. |
|---|---|---|
| 01.සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය | ඉන්ධන (2018 දෙසැම්බර් 01-15 දක්වා ඉන්ධන වියදම) | 152393.00 |
| 02. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2018 නොවැම්බර්,දෙසැම්බර් බිල්පත් | 15692.90 |
| 03.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | සැප්තැම්බර් බිල්පත් | 57124.04 |

| | | |
|---|---|---|
| 04.එන්.එච්. එල්.ආර්.ද සිල්වා | අත්තිකාරම් පියවීම | 18073.00 |
| 05. රෙජිමේන්තු මධ්‍යස්ථානය සබුබ | අපද්‍රව්‍ය ඉවත් කිරීමේ පහසුකම් සහිතව ගලි සේවය නැවත ලබා දීම සඳහා හිග මුදල් ස හිතව මුදල් ලබා ගැනීමට පෙර ලබා ගත් මුදල් නැවත ගෙවීම | 41630.00 |
| 06. පී.එච්.සී.සී.ද සිල්වා | ව්ප්ගල් මිලට ගැනීම (ඇ.අ. 1977) | 161700.00 |
| 07. ටියුලිප් කම්පියුටර්ස් | පරිගණක උපාංග මිලට ගැනීම (ප්‍රින්ටර්,මොනිටර් - ඇ.අ.1939) | 156300.00 |
| 08. දේශීය ණය හා සංවර්ධන අරමුදල | සාප්පු සංකීර්ණය 20104 පොළිය, වාරික | 97000.00 |
| 09. දේශීය ණය හා සංවර්ධන අරමුදල | ගලි රථය සඳහා ස්ථාවර නියෝග මගින් ගෙවන ලද මුදල ගිණුම් ගත කිරීම | 55350.78 |
| 10. සභා /අනස 035100126295234 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් සභාවේවෙනත් ගිණුමකට බැර කරන ලද මුදල් නිවැරදි ගිනුමට මාරු කිරීම | 65637.32 |
| 11. සභා/අනස 035100146295638 | මුදල් මාරු -එම - | 64300.00 |
| 12. ගිත්මි සපෝර්ට්ස් ගුඩ්ස් | පාපන්දු තරගාවලිය සඳහා කුසලාන ලබා ගැනීම (ඇ.අ.1992) | 10800.00 |
| 13. ශ්‍රී ලංකි ටෙලිකොම් පී.එල්. සී. | 2018 දෙසැම්බර් බිල්පත් | 24930.56 |
| 14. එම්.එස්.වීරසිංහ, | 2018 දෙසැම්බර් පුවත්පත් සඳහා | .51130.00 |
| 15. ස/අනස ගි.අ.0351001106295876 | මුදල් මාරු(ප්‍රාග්ධන ගිනුමට බැර විය යුතු මුදල පළාත් පාලන ආයතනය මගින් පොදු ගිණුමට තැන්පත් කර ඇති බැවින් , එය නිරවුල් කිරීම) | 1030306.12 |
| 16. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | මුද්දර බදු | 25911.84 |
| 17. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | එන්.බී.ටී. | 147408.30 |

18. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන

මණ්ඩලය 2018 නොවැම්බර් බිල්පත් 23830.59

19. සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය කාර්යාලයට අවශ්‍ය

සබන්,හාපික්,ෆයිනෝල් 38875.00

(ඇ.අ.1846)

20. පී.එච්.සී.සී.ද සිල්වා චිප්ගල් මිලට ගැනීම
(ඇ.අ.1977) 58800.00

21. එල්.ආර්.ඩී.සී. සර්විසර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන්

ගෙවීම (නොවැම්බර් ) 223371.21

22. පී.එච්.සී.සී.ද සිල්වා ගල් මිලට ගැනීම
(8.40 කියුබ් 1 1/2 ,ඇ.අ.1977)

50375.00

23. යූ.කේ.ජී.එන්ටර්ප්‍රයිසර්ස් කර්මාන්ත අංශය සඳහා උපකරණ
(ඩ්‍රිල් 1, බ්‍රෂ් කටර් 2) (ඇ.අ.1959) 45700.00

24. පූර්ණා වෙළඳසැල අත් වැසුම් මිලදී ගැනීම (ඇ.අංක 2008)

(රු.270/- බැගින් 97) 26190.00

පැමිණි සැමට ස්තුති කරමින් ප.ව.3.15 ට පමණ කමිටුවේ කටයුතු නිම කරන ලදී.

...................................... ............................................. ................................................

සකස් කලේ ලේකම්, ගරු සභාපති,

**තීරණය -**

2018.01.18 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මුල්‍යා කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06.05 2019.01.23 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභා ගත කරන ලදි

**පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**

**2019.01.23 ප.ව.2.30**

**සහභාගීත්වය**

1. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
3. ඒ.ඩබ්.ජගත් කුමාර මහතා — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. ධනසේන මාදුවගේ මහතා — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
5. බී.ඒ ධම්මිකා මිය — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.
6. එම්.පී.බී.ඩබ්.යූ.කුමාරි මිය — ආයුර්වේද වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව.
7. වෛද්‍ය වී.ජී.සී ජීවනී මිය — පශු වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ.
8. ඩී.එන්.ඉසෙඩ්.අබේසිරිවර්ධන මහතා — මහජන සෞඛ්‍ය පරීක්ෂක ,අම්බලන්ගොඩ උතුර.
9. ඒ.ආර්.පාලිත මහතා — මහජන සෞඛ්‍ය පරීක්ෂක,පරිපාලන,අම්බලන්ගොඩ
10. එච්.පී.බී.හංසික නදීල් මහතා — මහජන සෞඛ්‍ය පරීක්ෂක,අම්බලන්ගොඩ දකුණ.
11. පී.එම් විජේසිංහ මහතා — තාක්ෂණ සේවා නිලධාරී.අම්බලන්ගොඩ නගර සභාව
12. ආර්.එම්.ඩබ්.බන්දුල මහතා — උප පොලිස් පරීක්ෂක,(පරිසර)අම්බලන්ගොඩ
13. තිලක් හර්ෂදේව ද සිල්වා මහතා — ග්‍රාම නිලධාරී,86ඊ ඕකන්ද, අම්බලන්ගොඩ.
14. .එම්. එච්.ආශා මිය — ග්‍රාම නිලධාරී, 82,මහ අම්බලන්ගොඩ.
15. ජී.ජී.රන්දික මධුෂාන් මයා — ග්‍රාම නිලධාරී,85, පටබැඳිමුල්ල, අම්බලන්ගොඩ.
16. ටී.ඒ.සී.එන් කුමාරි මිය — ග්‍රාම නිලධාරී,83ඒ, හෙප්පුමුල්ල, අම්බලන්ගොඩ.
17. පී.එච්.කුමාර ද සිල්වා මයා — ග්‍රාම නිලධාරී,86, පොල්වත්ත.
18. වීමා ආර්.ගාල්ලගේ මිය — ග්‍රාම නිලධාරී,83/කරිත්තකන්ද,86සී.පෝරඹ
19. පී.එච්..එල්.සී.පුෂ්පරාණි ද සිල්වා මිය — සංවර්ධන සහකාර.අම්බලන්ගොඩ නගර සභාව
20. ඊ.අජන්තා සිරිමලී ද සොයිසා මිය — කළමනාකාර සහකාර.අම්බලන්ගොඩ නගර සභාව
21. එම්.ඩබ්.හිරාන් සංජීව මයා — සෞඛ්‍ය පරිපාලක,අම්බලන්ගොඩ නගර සභාව
22. ඒ.අයි සාරංග මයා — සෞඛ්‍ය පරිපාලක,අම්බලන්ගොඩ නගර සභාව

**පිළිගැනීම**

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් හා සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග | සාකච්ඡා වූ කරුණු | තීරණය |
|---|---|---|---|
| **2019.01.23 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය.** | | | |
| දිරන නොදිරන වශයෙන් කසල වෙන්කර එකතු කිරීම | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | අම්බලන්ගොඩ නගරයේ ජනනය වන කසල වලින් වැඩි ප්‍රමාණයක් නොදිරන කසල වන අතර දෛනිකව එකතු කිරීමක් සිදුනොවන බැවින් නගරය අශෝබන වී ඇති අතර ජනතාවගෙන්ද පැමිණිලි ලැබෙන බව | සභාවේ ඇති භාවිතයට නොගන්නා ටැක්ටරය සතියක් ඇතුලත අලුත්වැඩියාකර තැඹිලිපාට තීන්ත ආලේපකර නොදිරන කසල එකතුකිරීම සඳහා දිනපතා ප.ව.2.00 ට යොදවන ලෙස තා.සේ.නි.වෙත දැනුම්දීම |
| නොදිරන කසල අලවි කිරීම හා දිරණ කසල කොම්පෝස්ට් කිරීම තුලින් මුදල් උපයා ගැනීම | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | නොදිරන කසල වන යකඩ පොලිතින්,සහකඩදාසි එකතුකොට විකුණා මුදල් ලබාගැනීම සහ එමගින් ලැබෙන මුදල් එම සේවකයින් අතර බෙදා හැරීම සඳහා සභා තීරණයක් ගතයුතු බවත්, දිරන කසල වලින් කොම්පෝස්ට් පොහොර නිපදවා සභාවට අදායමක් ලබා ගත යුතුබවහා කාර්ය සාධනයේදී එය වැදගත් වන බවත් | මෙම කටයුතු කළමනාකරණය කිරීම සඳහා සුමිත් යසරත්න මහතා යෙදවීම |
| කසල අංගනයේ දුගඳහමන බව | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | කසල අංගනයේ මැස්සන් බෝවීම හා දුර්ගන්ධයක් හමන බව | මැස්සන් බෝවීම වැලැක්වීම සඳහා පෙස්ගාඩ් කෘමි නාශකය අනුමැතිය ලබාගෙන නැවත ගෙන්වා භාවිතා කිරීමට ම.සෞ.ප.මහතාට පැවරීම හා කසල අංගනය පස් යොදා වසා දැමීමට තා.සේ.නි.වෙත දැනුම්දීම |
| ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම | | | |

| | | | |
|---|---|---|---|
| තල්ගස්ගොඩ පුංචි පාලම අසළ කසල දැමීම සම්බන්ධව නාමපුවරු සකස් කිරීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් යොමු කරන ලද ලිපිය | පොල්වත්ත පුංචි පාළම අසළ සිට තල්ගස්ගොඩ ඩිපෝව දක්වා මාර්ගය දෙපස අනවසරයෙන් සිදුවන කසල බැහැර කිරීම අවම කිරීම සඳහා නාම පුවරු සකස් කිරීම සම්බන්ධව | මේ සම්බන්ධව ඇස්තමේන්තු සකස් කර නාම පුවරු සැකසීම සඳහා තා.සේ.නි. දැනුවත් කිරීම |
| කසල නිසි ලෙස බැහැර නොකරන අයට එරෙහිව නඩු පැවරීම | සහකාර පොලිස් අධිකාරී කාර්යාලය, අම්බලන්ගොඩ | නගරයේ කුණු කසළ දමන ස්ථාන වල කුණු කසළ දැමීම තහනම් යනුවෙන් පුවරු සවිකොට එම පුද්ගලයන් පිළිබඳව දැනුම්දීමට කඩ සාප්පු හිමින්ද දැනුවත් කිරීමට කටයුතු කරන බව | ඒ සම්බන්ධව සොයා බලා නඩු දැමීම සඳහා අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ පාරිසරික අංශයේ ස්ථානාධිපති පණ්ඩුල මහතා කටයුතු කරන බව |
| යෝජනා සහ අදහස් | | | |
| ආයුර්වේදය සඳහා වෛද්‍ය උපකරණ ලබා ගැනීම | ආයුර්වේද වෛද්‍ය නිලධාරී එම්.පී.බී.ඩබ්.යූ.කුමාරි මහත්මිය | වෙද නලාවක්, රුධිර පීඩනමානයක් හා සීලරයක් නොමැති බවත් එම නිසා රෝගීන්ට සේවය සැපයීමේ මහත් අපහසුතාවයට පත්වන බවත් මීට පෙරද ඉල්ලීම් කර ඇති බවත් | 2019.01.23 දින පැවති සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේදී සාකච්ඡා වූ පරිදි ආයුර්වේද වෛද්‍ය නිලධාරී වෙත රුධිර පීඩන මානයක්,සීලරයක් හා වෙද නලාවක් රාජ්‍ය ඔසුහල මගින් මිලදී ගැනීමට තීරණය කරන ලදී. |
| ධම්මිකපුර කාණුව පිළිසකර කරන ලෙස | ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | ධම්මිකපුර නිවාස යෝජනා ක්‍රමයේ ඇති කානුව අතර මගදී ඉදිකිරීම නතරවී ඇති බැවින් අප ජලයපාරට සහ අවට ඉඩම් වලට ගලා යාමෙන් ජනතාව අපහසුතාවයට පත්වී ඇති බවත්, කාණුව බෝක්කුව දක්වා සම්බන්ධ කර දෙන ලෙසත් | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වන ලෙස |
| බස් නැවතුම්පල මධ්‍යම බෙහෙත් ශාලාව අසල බිම්තීරුවේ ගේට්ටුවක් සවිකල යුතු බව | ම.සෞ.ප. - ඩී.එන්.ඉසෙඩ් අබේසිරිවර්ධන මහතා | බස් නැවතුම්පල භූමියේ මධ්‍යම බෙහෙත් ශාලාව හා කඩය අතර බිම් තීරුවේ මිනිසුන් විසින් මුත්‍රා කරන බැවින් අධික දුර්ගන්ධයක් හමන බැවින් නිසි ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස | ගේට්ටුවක් සවි කිරීම සඳහා තා.සේ.නි. වෙත පැවරීම |
| ටේලර් දිරාපත් වී ඇති බව | සෞඛ්‍ය පරිපාලක හිරාන් මයා | පොදු වෙළඳපොල හා පුංචි පොල අසළ ඇති ටේලර් දිරාපත්වී ඇති බවත් අලුත්වැඩියා කළහැකි තත්වයේ පවතින බැවින් අලුත්වැඩියා | ටේලරයන් අලුත්වැඩියා කරදෙන ලෙස තා.සේ.නි.වෙත පැවරීම |

| | | | |
|---|---|---|---|
| | | කරදෙන ලෙසත් | |
| මිළදීගත් අත් කරත්ත භාවිතයට ගන්නේ යන්න | ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | ඇණවුම් කරන ලද අත් කරත්ත 03 ම ප්‍රමිතියෙන් බාල බැවින් නැවත සෑදීම සඳහා 02 ක් ආපසු භාරදී ඇති බවත් එකක් පමණක් දැනට භාවිතා කරන බවත් | අත් කරත්ත නිපදවීම සඳහා වෙනත් ස්ථාන නොමැති බැවින් ඔවුන් වෙතම භාරදී නැවත අලුත්වැඩියා කර ගැනීම සුදුසු බව |
| පෝරුක් ඇල අපිරිසිදු වනබව | ග්‍රාම නිලධාරී එච්.එම්.ටී.එච්.ද සිල්වා මහතා | බලපිටිය ප්‍රාදේශීය සභාවට අයත් කාණුවකින් කළුපාට තෙල් වැනි ද්‍රව්‍යයක් පෝරුක් ඇලට මිශ්‍රවන බැවින් ජලජ ජීවීන්ට මෙන්ම පරිසරයටද හානි සිදුවන බව | ඒ සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා ම.සෞ.ප.මහතුන් වෙත පැවරීම |
| පෝරුක් ඇලට ගස් කපා දැමීම | ග්‍රාම නිලධාරී එච්.එම්.ටී.එච්.ද සිල්වා මහතා | ඇල දෙපස ඇති කොස් ගස්වල සහ වෙනත් ගස්වල අතු කපා ඇලට දමා ඇති අතර ඇල අයිනේ ගස් සිටුවා ගොඩකරමින් පවතින බව | මෙම ඇල මැනුම්කර දෙන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට දැනුම් දීම |
| වසා ඇති නිවස සහ ඉඩමේ වල් බිහිවී ඇති බැවින් ඩෙංගු මදුරුවන් බෝවීමේ අවධානමක් ඇති බව | ග්‍රාම නිලධාරී ගාල්ලගේ භද්‍රානි මිය | ගාල්ලගේ මියගේ නිවස ආසන්නයේ ඇති වසා ඇති නිවස සහ ඉඩමේ කැලෑව වැවී ඇති බවත් එම නිසා ඩෙංගු මදුරුවන් බෝවීමේ අවධානමක් පවතින බවත් | මේ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට ම.සෞ.ප.මහතාට පැවරීම |
| සෞඛ්‍ය සේවකයින්ගේ ඇඳුම සම්බන්ධව | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා. | ඔවුන්ට ලබාදී ඇති නිල ඇඳුම් සේවය කරන වේලාව තුල ඇඳීම තුලින් සිදුවන අනතුරු අවම කරගත හැකි බැවින් ඒවා පළදින ලෙස දැනුවත් කිරීම සුදුසු බව | සාරංග මහතා ඔවුන් දැනුවත් කරන බව |
| සේනා මදුරුවා සම්බන්ධව | ග්‍රාම නිලධාරී | බටපොල,අලුත්වල සහ ඌරගහ ප්‍රදේශ වලින් සේනා දළඹුවන් හමුවී ඇති බවත් ඒ සම්බන්ධව ක්‍රියා කල යුතු ආකාරය පිළිබඳවත් විමසීම | මේ සම්බන්ධව සොයා බලා නිසි පියවර ගැනීම සඳහා ම.සෞ.ප.මහතුන් වෙත පැවරීම |
| | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | අද දින කමිටුවට සහභාගී වූ මන්ත්‍රී වරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීනිය,ආයුර්වේද වෛද්‍යතුමිය සහ පශු වෛද්‍ය නිලධාරිනිය ඇතුළු සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන බව. | |
| **නිමාව** | | ප.ව 4.30 | |

සකස් කළේ,

කළමනාකරණ සහකාර

නිර්දේශ කරමි, අනුමත කරමි.

ලේකම්, සභාපති,

අම්බලන්ගොඩ නගර සභාව. අම්බලන්ගොඩ නගර සභාව.

**තීරණය -**

2018.01.23 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.06 2019.01.28 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභා ගත කරන ලදි**

**<u>2019.01.28 දින පැවති කළමණාකරණ කමිටුවේ වාර්තාව</u>**

**<u>සහභාගිත්වය-</u>**

- ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා - ගරු සභාපති, නගර සභාව,අම්බලන්ගොඩ
- කමල් වැල්ලගේ මහතා - ගරු උපසභාපති, නගර සභාව,අම්බලන්ගොඩ
- බී.ඒ.ධම්මිකා මිය - ලේකම්,නගර සභාව,අම්බලන්ගොඩ
- එච්.පී.මිහිරි කාන්ති ද සිල්වා මිය -ප්‍රධාන ආදායම් කළමණාකරණ සහකාර
- එස්.සී.දයාරංසි මිය - ආදායම් කළමණාකරණ සහකාර
- කේ.එම්.රංජනි මානෙල් මිය - පුස්තකාලයාධිපති
- කේ.පියරත්න මහතා - ආදායම් පරික්ෂක
- කේ.වන්න මහතා - ආදායම් පරික්ෂක
- හිමාල් ගුනවර්ණ මහතා - වැඩ පරිපාලක
- පි.එම්.විජේසිංහ මෙනවිය - තාක්ෂණ සේවා නිලධාරි
- එම්.එච්.රෝෂිණි මිය - කළමණාකරණ සහකාර
- එන්.ලකිෂා යසස්වි මිය - ආදායම් පරික්ෂක
- කේ.ටි.රසිනි නිලූෂිකා මිය - සංවර්ධන නිලධාරි
- කේ.කේ.සුගන්ධි මිය - කළමණාකරණ සහකාර
- එම්.ඩබ්.බී.ඩබ්.යු.කුමාරි මිය - ආයුර්වේද වෛද්‍ය නිලධාරි

සභාපතිතුමා විසින් ප්‍රථමයෙන්ම ලේකම් ඇතුළු නිලධාරි මණ්ඩලය පිළිගනු ලැබිය.අනතුරුව ප.ව 2.30 ට පමණ රැස්විමේ වැඩකටයුතු ආරම්භ කරන ලදි.

ප්‍රථමයෙන්ම ආදායම් අංශයේ ගැටලු සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි.වෙළඳ බලපත්‍ර බදු මුදල් ෂෙඩ්‍යුල් ලබා ගැනිම සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

පසුගිය අවුරුද්දේ නොගෙවපු අය සියලුලටම නඩු දාලා ඉවරද

**<u>ආදායම් පරීක්ෂක</u>**

වෙළඳ බලපත්‍ර වල දාලා අවසානයි. කර්මාන්ත බදු , ව්‍යාපාර බදු තව කිහිපයක් තියෙනවා.මේ සතියේ සහ ඊළඟ සතියේ දැම්මම අවසානයි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

හිඟයක් තියෙනවනම් එය ඔයාලගේ වරදක්.නඩුව පැරදුනාට කමක් නෑ.නඩුව දාලා තියෙන්න ඕන.අදාළ දඩ මුදල ලැබීමේදි දඩ මුදල් උසාවි වර්ගීකරණය අපට එන්නේ නෑ.ඒක සොයන්න ඕන.මෑත කාලයේ ආපු ෂෙඩ්‍යුල්වල අම්බලන්ගොඩ නගර සභාව උසාවි දඩ වර්ගීකරණයේ රුපියලක්වත් නෑ.අපි දාපු නඩුවල හරි සල්ලි ටික එන්න ඕන.දාපු නඩුවල දඩ මුදල් ගෙවල තියෙනවනම් ඒක සභාවට ආවෙ නැත්තේ ඇයි කියලා උසාවියෙන් විමසීමක් කරන්න ඕන.එය අපේ අයිතියක්.මේ සම්බන්ධයෙන් වෙන මොනවත් තියෙනවද? එමෙන්ම 2019 වර්ෂයට ඉක්මනින් ෂෙඩ්‍යුල් ලබා ගැනීම ඉවර කරන්න.

ඉන් අනතුරුව වෙළඳ දැන්වීම් ප්‍රදර්ශන ගාස්තු සම්බන්ධයෙන් විමසන ලදී.ප්‍රදර්ශන ගාස්තු අය වෙන්න ඕන.බස් ස්ටෑන්ඩ් එකේ යනකොට තියෙන ඒවා පේමන්ට් එක උඩ තමයි බෝඩ් තියෙන්නේ.එයාලට පැහැදිලි කරල දෙන්න.ඒව පාරට බරව තිබෙනවනම් ගාස්තුවක් අය කරන්න.

අම්බලන්ගොඩ නගරයේ තියෙන වෙළඳ වටිනාකම වැඩියි.මුලින්ම ඔයාලගේ නියමිත ක්‍රමයට තක්සේරුවක් කරන්න.ලිපි ගොනුවේ ලියන්න.මීළගට දැනට අම්බලන්ගොඩ නගරය තුළ තක්සේරු වටිනාකමට වඩා වෙළඳ පොළවල් වල ගාස්තු වැඩි වී ඇති බැවින් වැඩි වටිනාකම් සඳහන් කර ඒ අනුව ටෙන්ඩර් කරන්න.Audit එකෙන් ප්‍රශ්න කළත් ඔයාලට ප්‍රශ්නයක් නෑ.ඔයාලගේ දැනීම අනුව ඔයාලගේ කාර්ය භාරය කරල තියෙනවා.නමුත් ඊට එහාට ලබා ගන්න පුලුවන් කියල ඔබ පෙන්වන්න.එවිට ප්‍රශ්නයක් නෑ.අපි සභාවෙන් අනුමත කරනවා.ඒ ටික ටෙන්ඩර් කරන්න.ටෙන්ඩර් කරනකොට දැනවීම් 02 ක් බස් නැවතුම්පල සහ Maket එකේ දමන්න.මීට අමතරව ආදායම් අංශයේ ගැටලු තියෙනවාද.තවත් කතා කළයුතු දේවල් තියෙනවාද.

කඩ සාප්පු කීයක් තියෙනවාද.කඩ සාප්පු වලින් එන ආදායම කීයද?ඔයාලගේ තක්සේරුව අනුව සමහර ඒවා රු.1000.00 යි.රු.1500.00යි. රු.2000.00 යි. රු.3000.00 ට ලොතරැයි කුටියක්වත් නෑ.නගර සභාවේ කඩ 187 ක් තියෙනවනම් අවම මුදල රු.5000.00 කියල තක්සේරු කළත් මාසෙකට ආදායම නව ලක්ෂ තිස්පන්දහසක් වනවා.ඒක 12 වැඩි කළත් එක්කෝටි දොළොස් ලක්ෂ විසි දහසක් වනවා.එතැනටයි අපි යන්න ඕන.එවිට වරිපනම් ගෙවන අහිංසක මිනිස්සුන්ට අපිට සහනයක් ලබාදිය හැකියි.

අනතුරුව 2018 අවසාන ගිණුම් පිළියෙල කිරීම සඳහා ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**<u>සුගන්ධි මිය</u>**

සමහර නිළධාරීන්ගෙන් තොරතුරු ලැබිලා නැහැ. වරිපනම් සහ වෙළඳ බලපත්‍ර වලින් ලැබිලා නැහැ.

**<u>ප්‍රධාන ආදායම් නිලධාරී</u>**

හෙට දෙන්නම් කියලා කිව්වා.

**<u>රෝෂිනී මිය</u>**

වරිපනම් Manual කරන ක්‍රමයේදී වරිපනම් විෂය සහ අපගේ එකතුව සමානයි.නමුත් system එකේ වෙනසක් තියෙනවා කියලා කිව්වා.එම ආයතනයෙන් ඒක හදල ගන්න ඕන කිව්වා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ඒකෙ වෙනසක් වෙන්න බැහැ නේද.ඔයාට වරිපනම් විතරද ප්‍රශ්නය තියෙන්නේ.

**<u>ප්‍රධාන ආදායම් නිලධාරී</u>**

වෙළඳ බලපත්‍ර වලත් තියෙනවා.එම විෂය ලිපිකරු නිවාඩු ගොස් ඇවිල්ලා ඉන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

නිවාඩු යනකොට ඒ සඳහා කරන්න ඕන ක්‍රමය අනුගමනය කරන්න ඕන නේද.වරිපනම් සහ වෙළඳ බලපත්‍ර හෙට දෙන්න පුලුවන් නේද?

**<u>ප්‍රධාන ආදායම් නිලධාරී</u>**

හෙට ලබාදෙන බව එම නිලධාරීන් පැවසුවා.

**<u>සුගන්ධි මිය</u>**

භාණ්ඩ සමීක්ෂණය 2019.01.31 දිනට අවසන් වෙනවා.එම තොරතුරු ඉන් පසුව ලැබෙනවා.2019.02.28 දින වනවිට හදලා අවසන් කරන්න උත්සාහ කරනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

අනිවාර්යයයෙන්ම ඊට ඉස්සෙල්ලා දෙන්න.දැන් අපි මෑතක කාලයේ මොන තත්ත්වය යටතේ වුණත් මෑත අවුරුදු 05 ක විතර වෙලාවට දීලා තියෙනවා.පරක්කු කරන්න එපා.පරක්කු කිරීමෙන් නිලධාරියා දෝෂාරෝපණයට ලක් වනවා.

**<u>රෝෂිනී මිය</u>**

භාණ්ඩ සමීක්ෂනයේදී පුස්තකාලයට පොත් හොයන්න කාලය මදියි කියලා තියෙනවා.

**<u>පුස්තකාලයාධිපති</u>**

ඉරිදා තමයි පොත් සමීක්ෂණය ඉවර උනේ.සොයා ගැනීමට පොත් 65 ක ලිස්ට් එකක් තියෙනවා.දැන් පොත් 10 ක් සොයාගෙන තිබෙනවා.ඉතිරි ඒවාත් සොයාගත හැකියි.check කරනකොට මග හැරිලා තියෙනවා.එම පොත් සොයා ගැනීමට කාලය මදියි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

හැම අවුරුද්දකම මේක වෙනවනෙ.ඒක රාජකාරියක්.ඉතිරි පොත් 55 ට වැටුපෙන් කපන්න.සොයා ගන්න බැරිනම් වැටුපෙන් අඩු කරන්න.සොයාගත් පසු ඊළඟ වැටුපෙන් ගෙවන්න.අපි සමීක්ෂණයේදී නගර සභාවට වූ අලාභය අය කර ගත්තා.යම් විදියකින් සොයා දුන්නොත් ඊළඟ වැටුපෙන් ගෙවා දමන්න.එතකොට ප්‍රශ්නයක්නෑ. මේ මස 28 වනදා වනවිට නොදී ඉන්න තත්ත්වයට නොවේ දෙන මට්ටමට ගෙන යන්න.තව සතියක් දෙකක් තියෙනවානේ.උත්සාහවන්ත වෙන්න පුලුවන්නේ.සොයා දුන්නම ප්‍රශ්නේ ඉවරයිනේ.තව ප්‍රශ්න කීයක් තියෙනවාද..තව තොරතුරු නොදීපු නිලධාරීන් ඉන්නවාද

**<u>සුගන්ධි මිය</u>**

ගොඩක් අය දීල තියෙනවා. ආදායම් අංශයේ ප්‍රධානව ගන්න තියෙන්නේ බිල් කිරීම් තිබෙන නිසා.අනෙක් ඒවා ජර්නල් සටහන් මගින් හඳාගන්න පුලුවන්.

**කළමණාකරණ කමිටු තීරණ අංක 2:1**

**භාණ්ඩ සමීක්ෂණයේ පොත් සමීක්ෂණය සිදු කිරීමේදී පොත් 55 ක් සොයා ගතයුතු බවට පුස්තකාලයාධිපති විසින් කරන ලද ප්‍රකාශයට අනුව එම පොත් වෙනුවෙන් නගර සභාවට වූ අලාභය ඊට අදාළ නිළධාරීන්ගෙන් අයකර ගැනීම සුදුසු බවටත් නැවත එම පොත් ලබාදීම සිදුකළහොත් ඊළග වැටුපට එම කපන ලද මුදල එකතු කිරීමටත් සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ප්‍රමුඛ කළමණාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

දැන් අපි වයඹ පැකේජ් එක ගත්තේ දෙසැ.31 වන විට ආදායම් වියදම් ගිණුම සකස් කරන්න පුලුවන් කියන එක තමයි ඇත්ත.ඇයි ඒක කරන්න බැරි වුනේ.

**<u>රෝෂිණී මිය</u>**

වයඹ විසින් වවුචර් ඇතුළත් කිරීමේදී සිදුවී ඇති අඩුපාඩු විශේෂයෙන් ඔවුන් ආයතනය තුළ වැඩි වෙලාවක් රැඳී වවුචර් ඇතුළත් කිරීම සිදු නොකිරීම ආදිය මෙහිදී පෙන්වා දෙන ලදී.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

මේ අවුරුද්දේ අන්තිම වන විටවත් මේ පැකේජ් එකේ වාසිය ගන්නහැකියාව තියෙනවද

**<u>රෝෂිණී මිය</u>**

පරිගණක මගින් බිල්පත් කඩන්නේ ආදායම් අංශය පමණයි.අනෙක් අංශවල බොහෝදුරට බිල් පොත මගින් ලදුපත් නිකුත් කරනවා.මේ ආකාරයට පැකේජ් එක ගෙනියන්න බෑ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

එහෙම කරන්නෙ කව්ද යනුවෙන් ආදායම් අංශ ප්‍රධානි තුමියගෙන් එම අවස්ථාවේදි ප්‍රශ්න කරන ලදි.

**<u>රෝෂිණී මිය</u>**

ආදායම අංශය හැර අනෙක් අංශ සඳහා පැකේජ් එකෙන් ලදුපත් නිකුත්කරන්න සකස් කරලා නෑ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

අඩුපාඩු අපවෙත සඳහන් කරලා දෙන්න.ඒ සඳහා යන පරිගණක සහ මුද්‍රණ යන්ත්‍රටික නේද ඕන.පරිගණකයෙන් බිල්පත් ලබාදෙන්න හැකි ආකාරයට පැකේජ් එක හදාගන්න ඕන.අලුතින් පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර කියක් අවශ්‍යද.අඩුතැන පුරවන්න ඕන.එසේ නොමැතිව 100% ක් කරන්න බෑ.වයඹ සංවර්ධන අධිකාරියෙන් ලබාගත් පරිගණක පහසුකමෙන් උපරිම කාර්‍ය්‍යක්ෂම අන්දමින් සේවාව ලබාගෙන අවසාන ගිනුම සෑදිමට අවශ්‍ය පරිදි සකස් කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

බල්බ් වගයක් තියෙනවා.Audit එකේ මහත්තයා අහනවා ඇයි මේවා විනාශ නොකර තියාගෙන ඉන්නෙ කියලා.

**<u>ප්‍රධාන ආදායම් කළමණාකරණ සහකාර</u>**

ගබඩාවේ බල්බ් වගයක් තියෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u>**

මේවා විකුණන්න බැරි නම් ඇයි තියාගෙන ඉන්නේ.වෙන්දේසියේ අධික මිලක් ඉදිරිපත් කරන බැවින් වෙන්දේසි වෙන්නෙ නෑ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ඔයාලා ඒ විදියට බලලා තක්සේරුව අඩු කරලා දාන්න.ගිය අවුරුද්දේ දාලා මේ අවුරුද්දේ දාන්න තියෙනවනම් තේරුම් ගන්න ඔයාලා ගේ තක්සේරුව වැඩියි.ඒ අනුව ඔයාලා තක්සේරුව අඩු කරන්න.උපසභාපතිතුමාටත් Audit එකෙන් කියලා තියෙන්නේ විකිණෙන්නේ නැත්නම් විනාශ කරන්න කියලා.මේ සභාවට වාර්තාවක් ලබා දෙන්න.අපි විනාශ කිරිමට අවසර ලබා දෙන්නම්.

**කළමණාකරණ කමිටු තිරණ 2.2**

**විනාශ කළ යුතු යැයි සඳහන් කරන භාන්ඩ (පාවිච්චි කළ නොහැකි යකඩ ගොඩ, බල්බ්) විනාශ කිරිම සුදුසු බවත් ඒ සම්න්ධව වාර්තාවක් 2019.02.05 දින පැවැත්වෙන මාසික සභාව සඳහා ඉදිරිපත් කිරිම සුදුසු බවටත් කළමණාකරණ කමිටුව තිරනය කරන ලදි.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ගිණුම් අංශයේ වෙනත් ගැටලු මොනවාද

**<u>රෝෂිණී මිය</u>**

සරප් විසින් ලබා ගන්නා ලද මුදල් බැංකුවේ තැන්පත් කිරිම සඳහා අවශ්‍ය වෙලාවට වාහනයක් නැහැ.ඒ.හේතුවෙන් ප.ව 2.30 ට බැංකු යාම සඳහා වාහනයක් ලබා ගැනිම සුදුසු බවට ඉල්ලිමක් කරන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ප.ව 2.30 යම්කිසි වාහනයක් ස්ථිරව රෝෂිණී මියට බැංකුයාම සඳහා ලබා දෙන්න.එය ලිඛිතව රියදුරු මහතකු වෙත පවරන්න.

**කළමණාකරණ කමිටු තිරණ 2.3**

**සරප් විසින් දෛනිකව ලබා ගන්නා ලද මුදල් බැංකුවේ තැන්පත් කිරිම සඳහා ප.ව 2.30 වාහනයක් ලබා දිම සුදුසු බවත් එය ලිඛිතව රියදුරු මහතකු වෙත පැවරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ප්‍රමුඛ කළමණාකරණ කමිටුව විසින් තිරනය කරන ලදි.**

**<u>රෝෂිණී මිය</u>**

ගිය මස කළමණාකරන කමිටුවේ සරප් රාජකාරි ආවරණය ගිනුම් අංශයෙන් කළ යුතු බවට තීරණයක් ගෙන තිබෙනවා.එහි ගැටලුවක් තිබෙනවා.ගිණුම් අංශයේ මේ දිනවල සියලු අයට වැඩ තිබෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

මෙහිදි එසේ තීරණයක් ගැනිමට සිදු වූ හේතු සඳහන් කළ අතර එහිදි සරප් රාජකාරි ආවරණය සම්බන්ධයෙන් ගැටලුවක් සිදුවූ බවත් (ගැටලුව පැහැදිලි කරන ලදි).එවැනි දේවල් මට ගේන්න එපා.ඒ ඒ අංශවල ප්‍රශ්න අංශ ප්‍රධානි

මාර්ගයෙන් විසඳගන්න ඕන.ඒසේ විසදිමට නොහැකි නම් පමණක් ලේකම් මිස් ලඟට යන්න ඕන.ලේකම් මිස්ගෙන් සහනයක් නැත්නම් මා හමුවට එම ප්‍රශ්නය රැගෙන එන්න ඕන.

මිලඟට ආයතන අංශයේ ගැටලු සම්බන්ධයෙන් සාකච්ජා කරන ලදි.විශේෂයෙන් වාහන ධාවන සටහන් යාවතකාලීන නොවිම සම්බන්දයෙන් සාක්ච්ජා කරන ලදි.දැන් පඩි නවත්තලා නේද තියෙන්නේ. දැන් පඩි නවත්තලා දවස් කියද. පඩි නවත්තලා නේද තියෙන්නෙ කාගෙද කියන්න.

**<u>ලේකම් මිය</u>**

ක්‍රිෂාන්ත මයා සහ සේනාරත්න මයාගේ

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා</u>**

පඩි නවත්තලා ඒත් උනන්දුවක් නෑ නේද .යම්කිසි ගැටලුවක් තිබේද කියා සොයා බැලුවද

**<u>වැඩ පරිපාලක හිමාල් මයා</u>**

ගැටලුවක් නැහැ.කාලය තමයි ප්‍රශ්නය

**කළමණාකරණ කමිටු තිරණ 2.4**

**ධාවන සටහන් සම්පූර්ණ කර ලබා දි නොමැති රියදුරු මහතුන්ගේ වැටුප් ධාවන සටහන් නියමිත පරිදි යාවත්කාලිනව සම්පූර්ණ කර ලබා දෙන තෙක් නතර කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ප්‍රමුඛ කළමණාකරණ කමිටුව විසින් තිරනය කරන ලදි.**

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>

ආපදා ණය ඉල්ලිමක් පුස්තකාලයේ සේවය කරනු ලබන කේ.නිරෝෂා මිය විසින් මා වෙත ඉදිරිපත් කලා. මම කිව්වා වෙනම ලියුමක් දෙන්න කියලා.( හේතුව සඳහන් කරන ලදි.) මෙම ණය ලබා දිමේදි අප ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන හේතු 03 ක් තියෙනවා.තමන් විවාහ වන්නේ නම් ප්‍රමුඛතාවය ලබා දෙනවා.දරුවෙක් විවාහ වන්නේ නම් සහ දරුවකුගේ වැඩිවිය පැමිණිම යන කාරණා සඳහා ප්‍රමුකතාවය ලබා දෙනවා.වෙන ඒවට නම් දෙන්නේ නෑ.කේ.නිරෝෂා මියගේ ආපදා ණය ලබා දිම පිළිබඳ හැකියාවක් තිබේද බලන්න.

නිලධාරින් ස්ථාන මාරු ලබා ගෙන යාම සම්බන්ධයෙන් අනතුරුව සාකච්ජා කරන ලදි.දැන් ආපසු වෙනස් කරලා ඇවිල්ලා නැද්ද

<u>ලේකම් මිය</u>

මල්කාන්ති මියගේ ස්ථාන මාරුව මාස 06 කින් කල් ගිහිල්ලා තියෙනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>

මම ප්‍රධාන ලේකම්ට කතා කළා.මාරුව අවලංගු කිරිමට නොව කල් ගැනිමට පමණක් හැකි බව ප්‍රකාශ කලා.අවසානයේ කොහොමහරි යන්න වෙනවා.හැමෝම එක්ක වැඩ කරන්න වෙනවා.ප්‍රධාන නිලධාරින් 4 දෙනෙක් සම්බන්දව මම ලිව්වා අවලංගු කරන්න කියලා.ලේඛණාගාරය නඩත්තුව සම්බන්ධයෙන් සාකච්ජා කළ අතර ලේඛණාගාරය භාරව සිටින නිලධාරියා පිළිබඳ විමසන ලදි.

පොත් බැඳීම පිළිබඳ සල්ලි ගෙවා සහභාගි විය හැකි පුහුණු පාඨමාලාවකට මම දෙන්නෙක් යවන්න නම් කරන්න කිව්වා.3500.00 බැගින් දෙදෙනෙකුට රු.7000.00 ගෙවලා යවන්න.එහිදි Auto CAD පාඨමාලාව සඳහා තාක්ෂණ සේවා නිලධාරි හර්ෂණ නිලමුණි මහතා රු20000.00 ක් ගෙවා යැවීමට කටයුතු කරමින් පවතින බවත් පැවසුවා.ඒ සම්බන්ධව විස්තර අසන ලදි.ලේඛණාගාරය සම්බන්ධයෙන් පැවති පුහුණුව සඳහාද කෙනෙකු යෙදවීමේ අවශ්‍යතාවය තිබුනා.ලේඛණාගාරය පුහුණුව සඳහා පුහුණුවට යවන්න සුදුසු කෙනෙකු කියන්න.

ඉන් අනතුරුව සභා කාර්යාලය උඩුමහලට ගෙනයාම සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන ලදි.ඉංජිනේරු මහතා මේ සතියේ පැමිණෙන බවත් ඉන් පසුව එය සිදු කරන බවත් තාක්ෂණ සේවා නිලධාරිතුමිය පැවසුවා.මෙය සොයා බලා කඩිනමින් සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.

මිළඟට හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදි.පෙර පාසල් ගොඩනැගිල්ල අවදානම් බව ප්‍රජා සංවර්ධන නිලධාරිනිය ප්‍රකාශ කල බැවින් ඒ පිළිබඳ සොයා බලන ලෙස තාක්ෂණ සේවා නිලධාරිතුමියට උපදෙස් ලබා දුනි.

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා</u>**

හිරේවත්ත වතුර ටැංකිය සඳහා ලබා දී ඇති ඇස්තමේන්තු මුදල සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරිතුමියගෙන් විමසන ලදි.ඇස්තමේන්තුව රු.27000.00 කින් නම් එය කරන්න බෑ.රු27000.00 ඇස්තමේනතුව ලබා දී සභාවට රු96000.00 ක් දාලා. කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලයේ ටෙන්ඩරය රු96000.00 යි.ඔයාලා හදපු ඇස්තමේන්තුව රු.27000.00 යි.එහෙම කොහොමද වැඩ කරන්නේ.අපට සභා අනුමැතිය දෙන්න බැහැනේ.සභාපතිතුමනි ඒ සඳහා ගිල්ටියක් අවශ්‍ය වෙනවා.බද්දට ගත්තත් විශාල මුදලක් යනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ඒක මේ සභාවට සංශෝධනය කරලා දෙන්න

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා</u>**

හිල්ටිය බද්දට ගන්න යන ගාන බලලා ඒ යන ගාන දාලා සභාවට දෙන්න

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

කර්මාන්ත අංශයේ ගැටලු තිබේනම් තිබෙනවාදැයි තාක්ෂණ සේවා නිලධාරි තුමියගෙන් විමසන ලදි.

**<u>තාක්ෂණ සේවා නිලධාරි තුමිය</u>**

නිල්මිණි නිවාඩු යන දවසට ලිපි හුවමාරු කිරිම සඳහා වෙනත් අයෙකු ඒ වෙනුවට යොදවන ලෙසට ඉල්ලිමක් කරන ලදි.

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා</u>**

අපේ කාර්යාලයේ තුන්දෙනෙක් ඉන්නවා නේද.ඉන් එක් අයෙකු යොදවන්න

**කළමණාකරණ කමිටු තිරණ 2.5**

**නිල්මිණි මිය නිවාඩු ගොස් ඇති අවස්ථාවලදි වැඩ ආවරණය වෙනුවෙන් එන්.එච්.දිපිකා මිය විසින් සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ප්‍රමුඛ කළමණාකරණ කමිටුව විසින් තිරනය කරන ලදි.**

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා</u>**

සෑම නිලධාරියෙක්ම ලේකම් මිස් වෙත තමා විසින්ම ලිපිගොනු රැගෙන පැමිණෙනවා.එහෙම අරන් යන්න ඕන නෑ. ඒකට තමයි කාර්යාල කාර්ය සහායක අය ඉන්නේ.හැමදාම මම දැකලා තියෙනවා විෂය විසින් ලිපි ගොනු තමන්ම අරගෙන යනවා.එසේ නොකළ යුතු බවට දැනුවත් කරන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

අපි උඩුමහළට යන එක ඉතාම වැදගත් දෙයක්.ඉක්මනින් අවසන් වෙන්න ඕන.බිල් නිකුත් කරන ඒවා පහළ තබාගත හැකි ක්‍රමයක් සකස් කරන්න .මේ සඳහා පිළියමක් යොදන්න ඕන.පරිගණක ගත කරලා තිබෙන නිසා එම තොරතුරු ඉහළට සම්ප්‍රේෂණය වෙනවා නේද.කර්මාන්ත අංශයේ වෙනත් ගැටලු නෑ නේද

**<u>තාක්ෂණ සේවා නිලධාරි තුමිය</u>**

පරිගණක සඳහා පුහුණුවලත් අය අපගේ රාජකාරි කටයුතුවලට ඉතාම අවශ්‍යයි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

මේ සඳහා බලපිටිය කාර්මික විද්‍යාලයට දැනුම් දී දෙදෙනෙක් බඳවා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

සෞඛ්‍ය අංශයේ ගැටලු මොනවාද.කර්මාන්ත අංශයේ සුමිත් යසරත්න මහතා කසළ අංගනයේ Supavicer වශයෙන් පත් කිරිම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදි.දිරන කසල කොම්පෝස්ට් කරන වැඩපිළිවෙළකට යන්න ඕන.දිරන්නෙ නැති කසල වල යකඩ, විදුරු, කාඩ්බෝඩ් ආදිය වෙන් කරන්න ඕන.සතිපතා මෙම දේවල් විකුණා නගර සභාවට බඳින්න ඕන.සෞඛ්‍ය අංශයේ කාර්ය සාධනය බලද්දී ප්‍රතිචක්‍රීකරණය ප්‍රධාන වශයෙන් බලනවා.කුණු වර්ගකර ලබාගැනිම සඳහා පාට කිහිපයකින් බෑග් නිර්මාණය කර ඒවා පාරිභෝගිකයන්ට යම්කිසි මුදලකට (ලාභයක් තබාගෙන) විකිණිම මත සභාවට ආදායමක් ලබාගත හැකි බැවින් එය කිරිමට සෞඛ්‍ය අංශය දැනුවත් කරන ලදි.

**<u>මිහිරි මිය</u>**

මෙතැන නවත්වා ඇති ට්‍රැක්ටර්වලට කුණුදාලා යනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා</u>**

ප්‍රදේශිය ලේකම් කාර්යාලයෙන් ඉඩමක් ගන්න බැලුවා .වාහන නැවතුම එතනට ගෙන යමු.සෞඛ්‍ය තර්මාන්ත නිලධාරින් ද එම ස්ථානයට ගෙන යමු.

රාක්කවල තින්ත ගෑම ඉක්මනින් සිදු කරන ලෙස වැඩපරිපාලක මහතාට දැනුම් දුනි.එමෙන්ම ආයුර්වේද වෛද්‍යතුමියට වෙදනලාවක් හා ප්‍රෙෂර්මිටරය කඩිනමින් ලබා දෙන ලෙසට සැපයුම් නිලධාරියාට දැනුම් දෙනු ලැබිය.

වැඩකිරිමේදී ප්‍රමාද ඇතිවිමට හේතුවක් වශයෙන් භාණ්ඩ අවසන් විමට සඳහන් කර ඇති අතර එසේ අවසන්විමට ප්‍රථම ඊට පෙර ගෙන්වන ලෙසට උපදෙස් ලබාදෙන ලදි.

ඕකන්ද පෙරපාසලේ සෙල්ලම් මිදුල ගලවා ඇති බැවින් එය නැවත සවිකරන ලෙස වැඩ පරිපාලක වෙත උපදෙස් ලබාදෙන ලදි.

**කළමණාකරණ කමිටු තිරණ 2.6**

**පුසතකාල පිරිසිදුව තබා ගැනිම ට පුස්තකාල භාරකරුට උපදෙස් ලබා දිම සුදුසු බවට කළමණාකරණ කමිටුව විසින් තිරනය කරන ලදි.**

ගරු සභාපතිතුමා විසින් සිටි සියලු දෙනාට ස්තුතිය ප්‍රකාශ කළ අතර කමිටුව සඳහා නොපැමිණි නිලධාරින්ට ලිපියක් නිකුත් කරන ලෙසට උපදෙස් ලබාදෙමින් කළමණාකරණ කමිටුවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

| | | |
|---|---|---|
| සකස් කලේ | .............................. | .......................................... |
| ............................ | ලේකම් | සභාපති |
| කේ.ටී.රසිනි නිලූෂිකා | බී.ඒ.ධම්මිකා | ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් |
| නගර සභාව -අම්බලන්ගොඩ | නගර සභාව - අම්බලන්ගොඩ | නගර සභාව - අම්බලන්ගොඩ |

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**07:01 ටෙන්ඩර් :-**

**07:02 මිළ ගණන් :-**

07.02.01 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය සවල් මිලදී ගැනීම සඳහා මිළ ගණන්

| ආයතනයේ නම | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| පුරණා වෙළඳ සැල | සවල් | රු.600/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය සවල් මිලදී ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබුණේ පූර්ණා වෙළඳ සැල පමණි. එම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .

07.02.02 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාලයේ දැව රාක්ක සඳහා තින්ත ආලේප කිරීම සඳහා මිළ ගණන්

| අයිතමය | ස්ටර්ලින් හාඩ්වෙයාර් | පූර්ණා වෙළඳ සැල |
|---|---|---|
| දැව ආරක්ෂක ආලේපන | (ලිටර්4)රු.1210 | (නිපෝලැක් ලිටර් 10) රු.3250(ලිටර්4)රු.1370 |
| වුඩ් ප්‍රර්මර් ( ඇලුමිනියම් යට ) | (ලිටර්4)රු.3555 | (නිපෝලැක් ලිටර් 4) රු.33360 |
| වුඩ් ග්ලෝ පිනිෂින් | රු.4275 | (නිපෝලැක් ලිටර් 4) රු.4050 |
| වැලි කඩදාසි අඟල් 6 පළල | රු.160 | රු.70 |
| කැන්වස් | රු360 | රු.50 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා පුස්තකාලයේ දැව රාක්ක සඳහා තින්ත ආලේප කිරීමට මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණා වෙළඳ සැළ මිගින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .

07.02.03 අම්බලන්ගොඩ නගර සභා ජල බවුසරයේ හෝස් එක සඳහා සාම්පල් මිළ ගණන්

| | Mazdan Hardwere | Ayan Trading | Scan Meters |
|---|---|---|---|
| ජල බවුසරයේ හොස් එක දිග 2 ප්‍රමාණයේ දිග අඩි | රු.950 | රු.1100 | රු.1150 |
| ජල බවුසරයේ හොස් එක දිග 2 ප්‍රමාණයේ දිග අඩි | රු.1350 | රු.1500 | රු.1600 |

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ජල බවුසරයේ හෝස් එක සඳහා සාම්පල් ඉදිරිපත් කර නොමැති බැවින් මේ සඳහා ප්‍රතිසම්පාදන කමිටුවක් පත්කර යුතු වෙනවා. මේ සඳහා තාක්ෂණසේවා නිලධාරි මහතා ,ලේකම්තුමිය හා අභ්‍යාන්තර විගණන නිලධාරිතුමිය පත්කරනවා. ඒ අනුව ඔවුන්ගේ තින්දුව අනුව ලබා ගැනිමට සභාපති තුමාට බලය පවරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ජල බවුසරයේ හෝස් එක සඳහා සාම්පල් ඉදිරිපත් කර නොමැති බැවින් මේ සඳහා තාක්ෂණ සේවා නිළධාරි සඳුන් මහතා , අභ්‍යාන්තර විගණන නිලධාරි හා ලේකම්තුමියගෙන් සැදුම්ලත් ප්‍රතිසම්පාදන කමිටුවක් මඟින් මෙම හොස්එක මිලදි ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී .

07.02.04 අම්බලන්ගොඩ පොල්වත්ත , නුගේතුඩුව පාරේ ඇති අඹ ගස කපා ඉවත් කිරීම සඳහා මිළ ගණන්

| මිළ ගණන් ඉදිරිපත්කර ඇති අය | අයිතමය |
|---|---|
| කේ.ජී චතුරංග | රු8500 |
| එම්.ලෂාන් සංජය | රු.7500 |
| එම්.ඒ. තිළිණ මධුසංඛ | රු.8500 |
| පත්මන් කොඩිතුවක්කු | රු.9000 |

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්ත , නුගේතුඩුව පාරේ ඇති අඹ ගස කපා ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති පුද්ගලයන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති එම්.ලෂාන් සංජය මහතා විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .

07.02.05 අම්බලන්ගොඩ නගර සභා ගලි බවුසරයේ හෝස් එක සඳහා සාම්පල් මිළ ගණන්

| | ප්‍රමාණය | Mazdan Hardwere | Ayan Trading | Scan Meters |
|---|---|---|---|---|
| අඟල් 3 ප්‍රමාණයේ අඩි 30 හොස් බට | 02 | රු.2100 | රු.2050 | රු.1850 |
| අඟල් 3 ප්‍රමාණයේ අඩි 10 දිග හොස් බට | 04 | රු.3400 | රු.3450 | රු.3200 |
| ගොරෝසු පොට සහිත කප් | 10 | රු.5100 | රු.5200 | රු.4850 |
| Cuplink sigle | | රු.2450 | රු.2450 | රු.2250 |
| අගල් 3 AI Type | | රු.1800 | රු.1750 | රු1500 |
| අගල් 3 CI Type | | රු.2650 | රු.2650 | රු.2450 |

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගලි බවුසරයේ හෝස් එක සඳහා සාම්පල් ඉදිරිපත් කර නොමැති බැවින් මේ සඳහා ප්‍රතිසම්පාදන කමිටුවක් පත්කර යුතු වෙනවා. එ සඳහා කලින් පත් කරන ලද කමිටුව පත් කරනවා. ඒ අනුව එම කමිටුව මඟින් ලබා ගන්නා තීරණය අනුව ගරු සභාපතිතුමාට බලය පවරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ගලි බවුසරයේ හෝස් එක සඳහා සාම්පල් ඉදිරිපත් කර නොමැති බැවින් මේ සඳහා තාක්ෂණ සේවා නිළධාරි සඳුන් මහතා , අභ්‍යාන්තර විගණන නිලධාරි හා ලේකම්තුමියගෙන් සැදුම්ලත් ප්‍රතිසම්පාදන කමිටුවක් මඟින් මෙම හොස්එක මිලදි ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී .

07.02.06 අම්බලන්ගොඩ හල්වතුර ගේට්ටුව සැදිම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| අයිතමය | ප්‍රමාණය | පුර්ණා වෙළඳ සැල | STARLING HARDWERWERE |
|---|---|---|---|
| 1½ (2mm) box bar | 4 | රු.1950/= | රු.2600/= |
| Cement bags | 4 | රු.965/= | රු.985/= |
| No: 12 welding roods | 8 | - | රු.750/= |
| 4 ½ Cutting wheel | 4 | රු.680/= | රු.700/= |
| ½ (1.2mm) box bar | 15 | රු.80/= | රු.130/= |
| Sand | 4 | - | රු.13000/= |
| 12mm දඟර කම්බි | 4 | රු.870/= | රු.860/= |
| 6mm මෘදු වානේ කම්බි | 6 | රු.190/= | රු.175= |

**තීරණය**

අම්බලන්ගොඩ හල්වතුර ගේට්ටුව සෑදිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් පහත ද්‍රව්‍ය සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර පූර්ණා වෙළඳ සැල විසින් ඉදිරිපත් කර ඇති

| | |
|---|---|
| 1½ (2mm) box bar | 1950/= |
| Cement bags | 965/= |
| No: 12 welding roods | 680/= |
| 4 ½ Cutting wheel | 80/= |

පහත ද්‍රව්‍ය ස්ටර්ලින් හාඩ්වේයාර් ( Starling Hardware ) විසින් ඉදිරිපත් කර ඇති

| | |
|---|---|
| ½ (1.2mm) box bar | 750/= |
| Sand | 13000/= |
| 12mm දඟර කම්බි | 860/= |
| 6mm මෘදු වානේ කම්බි | 175 |

මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී .

**(08)** **ගෙවීම්**

08.01 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ස්ථාන සඳහා ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් 2018.12.01දින සිට 2018.12.31 දක්වා කාලය සඳහා අනුව LRDC Services (PVT)LTD ආයතනය වෙත රු.228838.04/= ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.02 තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු දිමනා වෙනුවෙන් කමිටු නිළධාරින් වෙත රු.10500/= ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.03 2018 දෙසැම්බර් මස පුස්තකාල සඳහා පුවත්පත් මිලදී ගැනීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය අනුව එම්.එස්. වීරසිංහ මහතා වෙත රු.51130/= ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රි වරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.04 නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවතින CHPB පුහුණු මධ්‍යස්ථානයේ පවත්වනු ලබන Auto cad පාඨමාලාව සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ තාක්ෂණ සේවා නිලධාරි සඳුන් දිනේෂ් ගුණවර්ධන මහතා සහ ඒච්.එල්. ද සිල්වා නිලමුණි මහතා සහභාගි කරවීමටත් ඒ සඳහා එක් අයෙකුට රු.20000/= බැගින් රු.40000/= ක මුදලක් ඉදිකිරීම් කර්මාන්ත අධිකාරිය වෙත ගෙවීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.05 සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණවලට 2018/12/16 සිට 2018/12/31 දක්වා කාලයට ඉන්ධන සැපයීම වෙනුවෙන් රු.144590/= ක මුදලක් අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.06 ආදයම් පරික්ෂක පියරත්න මහතා සහ ටී වන්න මහතා සඳහා නිල ඇඳුම් මැසීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය අනුව සිල්වා ටේලර්ස් සහ පුත්‍රයෝ වෙත රු.11200/= ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්රී ශ්රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.07 ආදායම් පරික්ෂක හා වැඩ පරිපාලක මහතුන් සඳහා නිල ඇඳුම් රෙදි කට්ටල ලබා ගැනීම සඳහා සිල්වා ටේලර්ස් සහ පුත්‍රයෝ වෙත රු.14,000/= ක ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.08 අම්බලන්ගොඩ නගර සභා පෙර පාසල් පොත් ලබා ගැනීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය අනුව රු.77,560/=ක මුදලක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ගෙවීමට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.09 අම්බලන්ගොඩ නගර සභා ගබඩාවට අවශ්‍යා ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය අනුව රු.15250/= ක මුදලක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.10 ආයුර්වෙද වෛද්‍ය තුමිය වෙත වෛද්‍ය නලාවක් ලබා දීම වෙනුවෙන් රු.15900/= ක මුදලක් රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාව වෙත වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.11 අම්බලන්ගොඩ නගර සභාවේ පරිඝණක මුද්‍රණ යන්ත්‍ර සඳහා Ribbon සැපයීම වෙනුවෙන් රු.14500/= ක මුදලක් Omak Technologies ආයතනය වෙත වෙත ගෙවීම සුදුසු බවට හා මින් පසු මෙවැනි ද්‍රව්‍ය මිලදී ගැනීමේදි නියම ප්‍රමිතියට අනුව සකසා ඇති ( Original) ද්‍රව්‍ය වලින් මිලදී ගැනීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.12 හිරේවත්ත මාදම්පා ගඟ අසබඩ නාන තටාක භූමිය මිනුම් කිරිමේ මිනින්දෝරු ගාස්තු ගෙවීම වෙනුවෙන් රු.20000/= ක මුදලක් පී.එච්.ඩී. සිල්වා මහතා වෙත ගෙවිමට සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.13 අම්බලන්ගොඩ නගර සභාවට ඩයමන් ආයතනය විසින් විනෝද බදු ලෙස රු.270750/= ක මුදලක් ගෙවා ඇති අතර ඉතිරි වූ ටිකට්පත් සඳහා ගෙවූ විනෝද බදු ලෙස රු.30750/= ක මුදලක් ඩයමන් ආයතනය වෙත ආපසු ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.14 අම්බලන්ගොඩ රේණුක මොටර්ස් අසළ පිහිටි ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.304489.26 ක මුදලක් සඳහා පෝරඹ ප්‍රජා මණ්ඩල කමිටුවට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.15 අම්බලන්ගොඩ පොකුණ පාරේ කාණු පද්ධතියේ කොටසක් සැකසීම වෙනුවෙන් රු.252195.81 ක මුදලක් පනියන්දූව ප්‍රජා මණ්ඩල කමිටුවට වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.16 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියේ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරීම වෙනුවෙන් ගිවිසුම් ගත මුදලින් (VAT සමඟ) 20% වූ රු.812705/= ක මුදල ජිනසේන පුද්ගලික සමාගම වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.17 හල්වතුර කසල අවසන් බැහැරලන භූමියට පිවිසෙන මාර්ගයේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.367816.80 ක මුදල විලේගොඩ ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.18 අම්බලන්ගොඩ රේණුක මොටර්ස් අසළ ළිඳ හා කාණුව හා භූමිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.170002.34 ක මුදලක් සඳහා පෝරඹ ප්‍රජා මණ්ඩල කමිටුවට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## (09) ගිණුම්

**09.01** 2018 දෙසැම්බර් මාසයට අදාළ **පොදු ගිණුම් - වියදම් විශ්ලේෂණය** හා 2018 දෙසැම්බර් මාස **වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය**

**(10)** **ඇස්තමේන්තු**

**10.01 කරිත්තකන්ද වසමේ පිරිස් වෙද මාවත සහ කුලරත්න පාර යාකරන හරස් පාර , නවාරා , පුද්ගලික පංතිය අසලින් උතුරට අංක8/සී/1 කොඩිකාර මහතාගේ නිවසට යන මාර්ගය තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.345000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ඇස්තමේන්තුව ලබන සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඇයි සභාපතිතුමනි , එම ඇස්තමේන්තුව ඉවත් කරනු ලැබුවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පවරා ගැනිමත් ඇස්තමේන්තුවත් දෙක එකට යන්න බැහැ.එකම සභාවේ යන්න විදියක් නැහැ.පවරා ගැනිමේ යෝජනාව මේ සභාවේ අනුමතයි. ඇස්තමේන්තුව ලබන සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නෑ . මේ පවරා ගැනිම නෙමේ මා කිව්වේ. මා එය පිලිගන්නවා. මේ සභාවේ මේ විදියට අනුමත වෙච්ච නිසායි දැම්මේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම අනුමත වි නැත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මා පෙන්වන්නම් ඒවා.

**තීරණය**

කරිත්තකන්ද වසමේ පිරිස් වෙද මාවත සහ කුලරත්න පාර යාකරන හරස් පාර , නවාරා , පුද්ගලික පංතිය අසලින් උතුරට අංක8/සී/1 කොඩිකාර මහතාගේ නිවසට යන මාර්ගය සකස් කිරීමේ රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගැනීමට නොහැකි බවත් , ඒ සඳහා මෙම පාර පවරා ගැනීමේ යෝජනාවත් ඇස්තමේන්තුවත් එකවර ඉදිරිපත් වීම නිසා මෙය ප්‍රතික්ෂේප කරන අතර මෙම ඇස්තමේන්තුව ලබන සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.02 ඕකන්ද නගර සභා පෙර පාසලට හා පුස්තකාලයට අයත් වැසිකිළියේ ටයිල් අතුරා අළුත් වැඩියා කිරීමේ කර්මාන්තය තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.13000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

ඕකන්ද නගර සභා පෙර පාසලට හා පුස්තකාලයට අයත් වැසිකිළියේ ටයිල් අතුරා අළුත් වැඩියා කිරීමේ තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.13000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.03 නගර සභා ක්‍රීඩා පිටියේ විසිරි ජල සැපයුම සඳහා ජලය ලබා ගැනිමට අවශ්‍ය ජල පොම්ප කිරිමේ කුටියක් සකස් කිරිමේ කර්මාන්තය තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.400000/= ක ලද ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මොකක්ද ඒ ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදි අපි ටෙන්ඩරයේදි එකඟ වි තිබෙනවා .(එක්ස් ගවේෂන්) එක හා විසිරි නළ පද්ධතිය අපි සාදා දෙන බවට.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම තිබෙනවානම් ප්‍රශ්නයක් නැහැ. අපි එසේ කරනවා කියන්නේ කොච්චර ලොකු වියදමක්ද ? එවිට මේ අයට තිබෙන්නේ පායිප්ප ටික දමන එක විතරයි ලක්ෂ 38 ක මුදලකට . පායිප්ප ටික හා මොටර් ටික දැම්මට විතරයි තියෙන්නේ. නමුත් මේ සඳහාත් ඇස්තමේන්තු කලානම් ලක්ෂ 100 කට වැඩි මුදලක් අයකර ගනි. මේ කාණු කපන ඒවාත් එක්ක ගත්තාම.මුලින්ම ඇස්තමේන්තු සකස් කරන විට එහෙම ඇහුවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය දිස්ත්‍රික් ඉංජිනේරුතුමාගේ උපදෙස් අනුව තමයි කටයුතු කර ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මෙය වගකිමක් ඇති ආයතනයකට ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වගකිමක් ඇති ආයතනයකට තමයි දි ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මෙම අත්තිකාරම් මුදල් දි වැඩය ආරම්භ කරන්න. අනික් වැඩ පරක්කු කර හරි මෙය ඉක්මන් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙම වැඩ කටයුත්ත ඉක්මනින් කරන්න. මෙය දී දැන් මාස ගණනාවක් වෙනවා. මා දුටුවා බස්රථවල පටවා ගෙන මෙහේ සිට පාසල් ළමුන් ගෙන යනවා. ක්‍රිඩා පිටිය නැති නිසා.

**තීරණය**

නගර සභා ක්‍රීඩා පිටියේ විසිරි ජල සැපයුම සඳහා ජලය ලබා ගැනිමට අවශ්‍ය ජල පොම්ප කිරිමේ කුටියක් සකස් කිරීමේ තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.400000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.04 අම්බලන්ගොඩ පොල්වත්ත දිස්ත්‍රික් රෝහල අසළ ඉතිරි කොටසේ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.900000/= ක ලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම කාණුව ඉදිකරනු ලැබුවේ ගරු හිටපු නගර සභා මන්ත්‍රී ජනිත් මහතාගේ නිවස අසලට වෙනකම්. ඒ කාලයේ රු.2100000/= ක මුදලක් දුන්නා. ඊතනට වෙනකම් සාදා නවත්වනු ලැබුවේ මඩ සහිත නිසාය. මෙය කොන්ක්‍රීට් කර දමනවා. එතැන ප්‍රශ්නයකි. ඔහුගේ නිවස අසළට ඕකන්ද ප්‍රදේශයෙන් පැමිණ වතුර ටික ඇවිත් නතර වෙනවා.

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්ත දිස්ත්‍රික් රෝහල අසළ ඉතිරි කොටසේ කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.900000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.05 අම්බලන්ගොඩ පොල්වත්ත බුද්ධදත්ත මාවතේ (නගර සභා පුස්තකාලයට යන මාර්ගයේ) කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ දිනවල ජල සම්පාදන මණ්ඩලයෙන් පායිප්ප ඉවත් කරනවා. සමහර විට ඔය කාණුවලට පාවිච්චි කරන්න පුළුවන් වෙයි. පායිප්ප වශයෙන් නගර සභාවෙන් ලිපියක් දමා ඉල්ලා ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා ජල සම්පාදන මණ්ඩලයට ලිපියක් දමා ඉල්ලීමක් කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්ත බුද්ධදත්ත මාවතේ කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.500000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.06 හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසීම සඳහා කොරිපස් සැපයීම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.495000/= ක ලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හල්වතුර කසළ බැහැරලන ස්ථානයේ මාර්ගය සකස් කළ යුතුයි. මේ සඳහා කොරිපස් දමා සකස් කරගත යුතුයි. මෙම පාර ඉදි නොකළහොත් අපට මෙහි අන්තිම කෙළවරට යාමට නොහැකිය.

**තීරණය**

හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසීම සඳහා කොරිපස් සැපයීම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.495000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.07 හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසීම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.110000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසීම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.110000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.08 හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසීම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.495000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එකම දෙයටනේ මේ ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම ඇස්තමේන්තුවත් එතනමයි. සාමාන්‍යයෙන් මෙහෙම දැම්මාම රු.500000/= වැඩියෙන් දැම්මාම පළාත් සභාවට යවන්න ඕන. පළාත් සභාවෙන් මුදල් ගෙවීමට පවා අනුමතිය ගන්න ඕන. රු.500000/= අඩුවෙන් දැමීමෙන්. අපට එහි තීන්දුව ගන්න පුළුවනි. එම නිසා උපදෙස් දී ඇත්තේ පුළුවන් එම ඇස්තමේන්තු කඩලා හදන්න කියා. නැතිනම් සමහර අපේ වැඩ ප්‍රමාද වෙනවා එසේ යැවීමෙන්.

**තීරණය**

හල්වතුර කසල බැහැරලන ස්ථානයේ අභ්‍යාන්තර මාර්ග පද්ධති සැකසීම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.495000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.09 අම්බලන්ගොඩ කළුවඩුමුල්ල සිරි විජයාරාම පාරේ කාණු පද්ධතිය සැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.300000/= ක ලද ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල සිරි විජයාරාම පාරේ කාණු පද්ධතිය සැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.300000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.10 අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස මාර්ගයේ රුදවුම් බැම්මසැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.75000/= ක ලද ඇස්තමේන්තුව සභා ගත කරන ලදී**

**තීරණය**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස මාර්ගයේ රුදවුම් බැම්ම සැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.75000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.11 අම්බලන්ගොඩ හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.75000/= ක ලද ඇස්තමේන්තුව සභා ගත කරන ලදි.**

ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතාණෙනි, මේ සඳහා කවුරුහරි ගිවිසුමට ඉදිරිපත් කර මෙය කඩා ඉවත් කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.75000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.12 අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ ගලි වල සැකසීම හා පයිප්ප ඇතිරිමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.155000/= ක ලද ඇස්තමේන්තුව සභා ගත කරන ලදි.**

**තීරණය**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස වල සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.155000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.13 අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම ඉදිකිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.136000/= ක ලද ඇස්තමේන්තුව සභා ගත කරන ලදී**

**තීරණය**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම ඉදිකිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.136000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.14 අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම ඉදිකිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.146000/= ක ලද ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

**තීරණය**

අම්බලන්ගොඩ ඕකන්ද අත්කම් නිවාස පාරේ පැති බැම්ම ඉදිකිරීම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.146000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.15 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ට්‍රේලරයේ තින්ත ආලේප කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.20000/= ක ලද ඇස්තමේන්තුව සභා ගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම ට්‍රැක්ටරය තින්ත ආලේප කිරිමට කටයුතු කරන ලද්දේ වෙනම ප්ලාස්ටික් එකතු කිරිම සඳහායි. අපි එදා සෞඛ්‍ය කමිටුවේදි තිරණය කළා.රෝසපාට වගේ පාටක් ආලේප කරන්න. එහි ගෙන යනු ලබන්නේ ප්ලාස්ටික් පමණයි.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් ට්‍රේලරයේ තින්ත ආලේප කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.20000/= ක ලද ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීමටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

## (11) වෙනත් කරුණු

11.01 2018 දෙසැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2018 දෙසැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව . ආයතනය පවත්වන ලද දින ගණන16 ½ , පැමිණි රෝගින් සංඛ්‍යාව 183කි . රෝගින් පැමිණි දෛනික සාමාන්‍ය ගණන 11 කි. මාසය සඳහා වැයවූ ඖෂට සඳහා ගිය වියදමරු.19287.86කි එක් රෝගියකු සඳහා ගිය මුදල රු.105.40 ක් වශයෙන් වාර්තාව ඉදිරිපත් කර ඇත.

**තීරණය**
**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 නොවැම්බර් මස සඳහා වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි**

11.02 2018.12.31 දිනට ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2018.12.31 දිනට ගබඩා භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ හා යෝජනා වන්නේ 2018.12.31 දිනට පැවති මාසික සභාවේ පැවති මාසික සභාවේ තිරණ අංක 03.11 පරිද 2018.12.31 දිනට ගබඩාවේ ශේෂය පරික්ෂා කරන අතර පහත සඳහන් කරුණු ආවරණය වූ කරුණු මාසික සභාවේ අවධානය පිණිස ඉදිරිපත් කර ඇත.

01. 2018.12.31 දිනට ගබඩා ලේඛණය තොග පොත හා නිත්‍ය ශේෂය පරික්ෂා කිරිමේදි භාණ්ඩ වල අතිරික්ත හා ඌනතා ඇති බව අනාවරණය වු අතර ලැබුණු අතර ඒ අතිරික්ත හා ඌන ලේඛණ භාණ්ඩ ලේඛණ ලෙස ඉදිරිපත් කර ඇත.

02. පොදු 47 ගබඩා භාණ්ඩ අකෘතියෙන් 1,2,3 ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලේඛණයක් සකස් කර ඇත. එම භාණ්ඩ අතරින් වෙන්දෙසි කළ හැකි භාණ්ඩ S ලෙසද විනාශ කළ හැකි භාණ්ඩ D ලෙසද සඳහන් කර ඇති අතර එම භාණ්ඩ වෙන්දෙසි කිරිමට හා විනාශ කිරිමට යෝජනා කර ඇත.

03. 2018.12.31 දිනට සමික්ෂණය කරනු ලබන්නේ 2019 ජනවාරි මාසයේ බැවින් එම කාලයේ දි මිලදි ගැනිම් හා නිකුත් කිරිම් සිදුවන බැවින් එම අවස්ථාවේ ගබඩා ලේඛණයේ අඩු වැඩිවිම් පැවතිය හැකි බවද නිරික්ෂණය විය. එම කාලය තුල ඇතුලත් විම් හා මිලදි ගැනිම් ඇතුලත් වි නොතිබු අතර ඉදිරියට එවැනි ලේඛණයක් පවත්වා ගත යුතු බවට යෝජනා කර ඇත.

04. ගබඩා කාමර අංක 3 හා ඇති ලී ප්‍රමාණය ගබඩා ලේඛණය හා සැසදීමක් සිදු නොවන බැවින් 2018.12.31 දිනට ඇති එම ලි තොගය මැන වෙනම ලේඛණයක් සකස් කර ඉදිරිපත් කර ඇති අතර එම ලී ප්‍රමාණය ගබඩා ලේඛණයව ඇතුලත් කිරිමට යෝජනා කර ඇත. නමුත් යෝජනා ක්‍රියාත්මක වී නොමැති අතර ගබඩා ලේඛණයේ පෙර සේම ලී තොගය සටහන් කර ඇත. එම ලි ප්‍රමාණය වෙනම ලේඛණයක් ලෙස දක්වා ඇත.

05. භාවිතයට නොගන්නා වෙන්දෙසි කිරිම සඳහා යෝජනා කළද වෙන්දෙසියෙන් ඉවත් කරද නැවත ගබඩාව වෙත භාරදි ඇති අතර( එකම භාණ්ඩය වසර ගණනාවක් වෙන්දේසිය සඳහා ඉදිරිපත් වු අවස්ථා ද වේ).එම භාණ්ඩ භාවිතයට ගත් බවක් නිරික්ෂණය නොවේ.

06. පසුගිය වසරේදි වෙන්දෙසි කිරිම හා පොදු 47 ලේඛණයට ඇතුලත් කර වෙන්දේසි වු ඇතැම් භාණ්ඩ ගබඩා ලේඛණයෙන් ඉවත් නොවි ශේෂයම ඉදිරියට ගෙන විත් ඇති බව අනාවරණය විය.වෙන්දෙසියෙන් හා ඉවත් කිරිමෙන් ඉවත් කරනු ලැබු භාණ්ඩ ගබඩා ලේඛණයෙන්ද ඉවත් කර ගබඩා ලේඛණය නිවැරදි විය යුතු බව පෙන්වා දි ඇත.

07. ආයුර්වේද භාණ්ඩ තොග ඌණතාවයක් ගබඩා ලේඛණයට අනුව පැවතියද ආයුර්වේදයේ පරික්ෂා කිරිමේදි ඌණතාවයක් ඇති බව අණාවරණය නොවේ. තවද සෑම මාසයක් අවසානයේම ආයුර්වේද ද්‍රව්‍ය නිකුත්කිරිම පිළිබඳ වාර්තාවක් ප්‍රජා සංවර්ධන නිලධාරි වෙත ඉදිරිපත් කරනු ලබයි.

08. ගබඩා පරිශ්‍රයේ වහලය දිරාපත් වී ඇති අතර එම නිසා වැසි දිනයන්හිදි වැසි ජලය කාන්දුවිමෙන් එහි ඇති භාණ්ඩ විනාශ විමට හැකි බැවින් වහලය පිළිසකර කිරිම සුදුසු බවට යෝජනා කර ඇත.

09. සමික්ෂණ වාර්තා මගින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු නිවැරදි කිරිමක් සිදු නොවන බව පෙන්වා දෙන අතර ඒ පිළිබඳ සැලකිලිමත් නොවන බවද පෙනි යයි.

10. ලේඛණයේ දක්වා ඇති අතිරික්ත භාණ්ඩ ගබඩා ලේඛණයට ඇතුලත් කිරිමටත් , ඌණභාණ්ඩ ගබඩා භාරකරුවන්ගේ විමසා 2018.12.31 දිනට පසු මිළදී ගැනීම හා නිකුත් කිරිම ලේඛණයක් ලබා ගෙන ඇති අතර ඊට අමතරව පවතින ඌණතා වලින් ගබඩා භාරකරු විසින් ගබඩා භාරගත් දින සිට මේ දක්වා කාලයට අදාල ඌණතාවයන්ගේ වටිනාකම අයකිරිමටත් යෝජනා කර ඇත.

11. ගබඩා භාණ්ඩ තොග පොතෙහි පමණක් සටහන් වන අතර පාරිභෝජ්‍ය ලේඛණයක් , සවිකිරිම් ලේඛණයක් හා පරිත්‍යාග ලේඛණයක් පවත්වාගෙන නොයන අතර එම ලේඛණ පවත්වාගනෙ යමටද යෝජනා කර ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා අසා සිටියා ඔබතුමා ඉදිරිපත් කරන ලද කරුණු. එම වාර්තාවේ ඇති යෝජනා හා තිරණ ක්‍රියාත්මක කරන්න. නැතිනම් අපි පවත්වන ලද සමික්ෂණයක වටිනාකමක් නැති වෙනවා. නැතිනම් නිලධාරින් අධෛර්යමත් වෙනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර 2018.12.31 ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්ථාවේ නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 11.03 2018.12.31 දිනට ප්‍රධාන පුස්තකාලයේ පොත් සමීක්ෂණ වාර්තාව

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ප්‍රධාන පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවේ පහත නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කළ යුතු බවට ඉදිරිපත් කර ඇත.

01. 2018.12.31 දිනට කරන ලද ප්‍රධාන පුස්තකාල සමීක්ෂණයේදි බැහර දෙන අංශයේත් විමර්ශන අංශයෙන් ළමා අංශයෙන් පහත සඳහන් පොත් භාවිතයට ගත නොහැකි පරිදි විනාශ වි ඇති හෙයින් එම පොත් විනාශ කොට එම පොත්වල වටිනාකම පරිග්‍රහන ලේඛණයෙන් ඉවත් කිරිම නිර්දේශ කර ඇත . ඇමුණුම් 01 වශයෙන් ඇත.

02. විමර්ශන අංශයේ හා බැහැරදෙන අංශයේ බැදීමට ඇති පොත් ඇමුණුම් 2 වශයෙන් ඇත.

03. සමීක්ෂණය කරන අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට නොහැකි වු පොත්වල වටිනාකම හා රජයේ ගාසතු 25% ක මුදලද සහිතව අදාල නිලධාරියාගෙන් සහ සේවක මහත්ම මහත්මියන්ගෙන් අයකර ගැනීම නිර්දේශ කර ඇත.

යෝජනා :-

01. සෑම වර්ෂයක් පාසාම පුස්තකාලයට පොත් විශාල ප්‍රමාණයක් එකතු වුවද ඒ හා සමානව පොත් ගබඩා කරීම සඳහා කබඩ් නොමැති බැවින් රාක්ක හෝ වසා තැබිය හැකි කබඩ් ලබා දීම සුදුසු බවට යෝජනා කරන්න.

02. ළමා අංශයට සහ විමර්ශන අංශයට පැමිණෙන ළමයින්ට ඉඩ පහසුකම් මදි බැව් පෙනි යන හෙයින් ඒ ගැනද අවධානය යොමු කරන්න.

තීරණය -

2018.12.31 ප්‍රධාන පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 11.04 2018.12.31 දිනට ශාඛා පුස්තකාලයේ පොත් සමීක්ෂණ වාර්තාව සභා ගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ප්‍රධාන පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවේ පහත නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කළ යුතු බවට ඉදිරිපත් කර ඇත.

01. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද සමීක්ෂණය අනුව භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වී තිබූ පොත් විධිමත් පරිදි විනාශ කොට එම පොත්වල වටිනාකම පරිග්‍රහණ ලේඛණයෙන් ඉවත් කිරීම සුදුසු බැව් නිර්දේශ කර ඇත. එම විස්තර ඇමුණුම් අංක 01 මගින් දක්වා ඇත.

02. සමීක්ෂණය සිදු කරන අවස්ථාවේ ශාඛා පුස්තකාලවලින් ඉදිරිපත් නොවූ පොත් සඳහා එම පොත් වල වටිනාකම හා රජයේ ගාස්තු එම ශාඛා පුස්තකාල සේවය කරන අදාල නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් අයකර ගැනීම සුදුසු බැව් නිර්දේශ කර ඇත. එකී විස්තර ඇමුණුම් අංක 02 මගින් දක්වා ඇත.

03. භෞතික පොත් ගණනය සිදු කරන අවස්ථාවේ නැවත සකස් කිරීමෙන් පසු භාවිතයට ගත හැකි ලෙස හඳුනාගත් පොත් තිබූ අතර ගිය වර්ෂයේදි සකස් කිරීමට භාර දී ඇති පොත් මේ දක්වා නොලැබුණු බව වාර්තා විය. එ අනුව එම පොත් නෙපමාව සකස් කර පරිශීලනය සඳහා ලබා දීම සුදුසු බැව් නිර්දේශය කරන්න. එකි විස්තර ඇමුණුම් අංක 03 මගින් දක්වා ඇත.

**යෝජනා:-**

01. සියළු ශාඛා පුස්තකාල සඳහා පොත් ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් කබඩ් නොමැති අතර ගිය වර්ෂයේ සමීක්ෂණයෙන්ද කබඩ් ලබා දිමට යෝජනා කර තිබූ නමුත් මේ වර්ෂය දක්වාම එය ඉටු වී නැත. ඒ අනුව හැකි ඉක්මනින් රාක්ක හෝ වසා තැබිය හැකි කබඩ් ලබා දීම සුදුසු බවට යෝජනා කර ඇත.

02. මහ අම්බලන්ගොඩ පුස්තකාලය මහල් දෙකකින් යුක්ත වන අතර සේවය සඳහා යොදවා ඇත්තේ එක් සේවිකාවක් පමණි. මහල් දෙකෙහිම සේවය කරිම ගැඩළු සහගත බැවින් තවත් එක් සේවිකාවක් ලබා දීම සුදුසු බවට යෝජනා කර ඇත.

03. හිරේවත්ත ශාඛා පුස්තකාලයේ වහල දීරාපත්වී ඇති බැවින් වර්ෂා කාලයට මහත් අසීරුතාවයකට මුහුණපාන්නට සිදුවන බැවින් ඉතා ඉක්මනින් වහල අලුත්වැඩියා කිරීමට යෝජනා කර ඇත.

**තීරණය -**

**2018.12.31 ශාඛා පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

11.05 2018.12.31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභා ගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පහත පරිදි 2018.12.31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් අනාවරණය කරගනු ලැබූ කරුණු හා යෝජනා ඉදිරිපත් කර ඇත.

01 2016 හා 2017 වර්ෂවල සිදු කරණ ලද සමීක්ෂණවලදී සමීක්ෂණ මණ්ඩල විසින් යෝජනා කරන ලද යෝජනා කිපයක් මේ වන තෙක් ක්‍රියාත්මක කර නොතිබීම.

උදා: මෙම ආයතනයේ සේවය කර විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය හා සේවයෙන් ඉවත් කරන ලද නිලධාරීන් විසින් භාර නොදුන් භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියා කර තොතිබීම.

02. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භාර දීමේ ලදුපත් මගින් භාර දුන් භාණ්ඩ එම නිලධාරීන්ගේ නමින් තව දුරටත් පවතින අතර ඒවා නිවැරදි කිරීමට ක්‍රියාකර නොතිබීම.

03. එකම භාණ්ඩය නිලධාරින් හා සේවකයින් දෙදෙනෙකු නමින් ඇතුලත් කර තිබිම . උදා. හාර්ඩ් මෙක් ට්‍රැක්ටර් සත්‍ය වශයෙන් පවතිනුයේ 01 ක් පමණක් වන අතර එය සඳුන් ගුණවර්ධන මහා නමින් හා ලසන්ත සුරේශ් මයා යන දෙදෙනාම නමින් ඇත. එය නිවැරදි කිරිම සඳහා ක්‍රියා කල යුතුව ඇත.

04. නිලධාරීන්ගේ නමින් පවතින එකම භාණ්ඩ වර්ගය ස්ථාන කිපයක සටහන් ව තිබිම හේතුවෙන් භෞතිකව පරික්ෂා කිරිමේදි ගැටළු සහිත වීම.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙම හාර්ඩ් මෙක් ට්‍රැක්ටරය එක්කෙනෙකුගේ නමින් පවත්වා ගැනිමට එය නිවැරදි කරන්න.

**සමික්ෂණ මණ්ඩල යෝජනා.**

01. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් පවත්නා බඩු වට්ටෝරු ලේඛණය නිවැරදිව යාවත්කාලින කිරිමට පියවර ගැනීම.

02. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භාරදීම හා භාර ගැනීමට අදාලව නිකුත් කරන ලද ලදුපත් බඩු වට්ටෝරු ලේඛණ භාර නිලධාරියා වෙත නොපමාව යොමු කිරිමට පියවර ගැනිම හා ඒ සම්බන්ධව අධික්ෂණය කිරිම.

03. සවි කිරිම් වලට අදාල භාණ්ඩ එක් එක් නිලධාරියා නමින් පවත්වාගෙන යාම වෙනුවට සවිකිරිම් ලේඛණයක් හරහා පැවරිමට කටයුතු කිරිම

04. ස්ථාන මාරුවිම් ලබාගිය නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොණු නව සේවා ස්ථානයට යැවිමට පෙර ඔවුන් භාරයේ පැවති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නිසි පරිදි භාරදී ඇති බවට තහවුරු කර ගැනිම, භාර දෙන මෙන් ඔවුන් දැනුවත් කිරිම. එසේ භාරදීම නිශ්චිත කාලයක් තුල සිදු කිරිමට අපොහොසත් වන්නේ නම් එම භාණ්ඩවල වටිනාකම හා රජයට අයවිය යුතු ගාස්තු වැටුවෙන් අය කිරිමට නොපමාව පියවර ගැනිම.

05 විශ්‍රාම ලබා ඇති නිලධාරින්ගේ නමින් සටහන්ව ඇති භාරදී නොමැති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වල වටිනාකම ඔවුන්ගේ විශ්‍රාම වැටුවෙන් අය කිරිමට අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත දැනුම් දිම සඳහා පියවර ගැනීම.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්.</u>

ගරු සභාපතිතුමනි, ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමික්ෂණ වාර්තාවෙත් , පුස්තකාල භාණ්ඩ සමික්ෂණ වාර්තාවෙත් වැදගත් කරුණු වැදගත් යෝජනා එම සමික්ෂණ වාර්තා කටයුතු සිදු කරනු ලැබු නිලධාරින් විසින් සිදු කරනු ලැබ ඇත. මේ වාර්තාව වල ඇති නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කර අපි ආරම්භයක් ගන්න මින් ඉදිරියට නිසි පරිදි ඒවා නඩත්තු කර ගෙන යාම සඳහා.

**තීරණය -**

**2018.12.31 ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමික්ෂණ වාර්තාවේ නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

11.06 රජරයේ ඉඩම් අත්පත් ක්‍රියාවලිය අනුම ඉඩම් අත්පත්කර පොදු කාර්යයන් සඳහා එම ඉඩම්වල භුක්තිය නගර සභාවට භාරදී ඇති අතර ඒ සඳහා අප නගර සභාව විසින් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් නමින් තැන්පත් කර ඇති මුදල් වල පාස්පොත 2017.05.23 දක්වාම නගර සභාව භාරයේතිබු අතර එය සභාවේ මුල්‍යා ප්‍රකාශනයට ගෙන ඇත. නමුත් 2017.05.23 දින වන විට එම පොත් සියල්ල ප්‍රාදේශිය ලේකම්ගේ ඉල්ලිම පරිදි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගෙන ගොස් ඇත. එය අවසන් මුල්‍ය ප්‍රකාශනයේ තව දුරටත් මේ පිළිබඳ වත්කමක් පවතින බැවින් එම අගය වූ රු.4930815.85 ක ඉවත් කර ගැනිම සම්බන්ධව ගොණුව සභා ගත කරන ලදි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රජරයේ ඉඩම් අත්පත් ක්‍රියාවලිය අනුම ඉඩම් අත්පත්කර පොදු කාර්යයන් සඳහා පහත සඳහන් ඉඩම්වල භුක්තිය නගර සභාවට භාරදී ඇත. ඒ සඳහා අප නගර සභාව විසින් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් නමින් තැන්පත් කර ඇත.පතිරාජ පාර සඳහා ඉඩම් අත්පත් කර ගැනිම ,කරෝලිස වෙද මාවත පුළුල් කිරිම, කන්දේගොඩ දෙවැට පාර පුළුල් කිරිම, නුගේතුඩුව පාර තල්ගස්ගොඩ පාර අවසන් කොටස අතුරු මාර්ගය අත්පත් කර ගැනිම, හින්ඇල දෙවැට පාර, අළුත් පාර පුළුල් කර අත්පත් කර ගැනිම ,අම්බලන්ගොඩ මහ විදිය අතුරු මාර්ග සම්බන්ධවන, තල්ගස්ගොඩ බැද්ද ඉඩම අත්පත් කර ගැනිම සම්බන්ධව අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් නමින් තැන්පත් කර ඇත. මෙම මුදල් තැන්පත් කර ඇති පාස්පොත 2017.05.23 දින දක්වා එය ආයෝජන වත්කමක් ලෙස නගර සභාවේ ආයෝජනය කර ඇත. 2017.05.23 වන විට එම පොත් සියල්ල ප්‍රාදේශිය ලේකම්ගේ ඉල්ලිම පරිදි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගෙන ගොස් ඇත. එය අවසන් මුල්‍ය ප්‍රකාශනයේ තව දුරටත් මේ පිළිබඳ වත්කමක් පවතින බැවින් එම අගය වු රු.4930815.85 ක ඉවත් කර ගැනිම සම්බන්ධව ගොණුව සභා ගත කරන ලදි.

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දැන් ඔය තල්ගස්ගොඩ බැද්ද ඉඩම අත්පත් කර ගැනිම සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇති මුදල එහි පොළියත් සමඟ නේද සඳහන් වි ඇත්තේ. එවිට වන්දි මුදල් ගෙවු පසු ඉතිරි මුදල සභාවට අයිති නේද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ . වන්දි මුදල් තව බැදිය යුතුයි.

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

නෑ. මට මතක හැටියට තක්සේරුව ආවේ ලක්ෂ 20 ක් පමණි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

උදාහරණයක් වශයෙන් අම්බලන්ගොඩට සම්බන්ධ වන අතුරු මාර්ගයට ලක්ෂ 11ක පමණ මුදලකි. එයට ලක්ෂ 50 ක මුදලක් තව ගෙවිමට ඇත.

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එක හරි . මං පවසන්නේ තල්ගස්ගොඩ බැද්දට . ඒ සඳහා ලක්ෂ 44 ක පමණක මුදලක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහි එකඟ වි ඇත. වරින් වර ලක්ෂ 10 බැගින් එවිමට .

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

තල්ගස්ගොඩ බැද්දේ රජයේ තක්සේරුව පැමිණියේ ලක්ෂ 20ක් වශයෙනි . ඉතිරි මුදල සභාවට ලැබිය යුතුයි .

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රජය විසින් දෙනු ලබන්නේ තාවකාලික තක්සේරුයි. එවිට අපි භුක්තිය භාර ගන්නා දිනයේ නියම වටිනාකම ගෙවිය යුතුයි.

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙහි නියම තක්සේරුව පැමිණියේ ලක්ෂ 8 ක් පමණි. එවිට මොවුන් ඉල්ලිමක් කළා. එම ඉල්ලිමේදි තමයි ආවේ නැවත 100% ක්ම තක්සේරුව යන්න කියා. එවිට ලක්ෂ 20 ක් විතර යන්නේ. ඉතිං ඊට වඩා යනනේ නැහැ කියා පැවසුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එවිට ඒ දින සිට නෛතික පොළිය ගෙවිය යුතුයි.

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා විමසා සිටින්නේ ? එම මුදල් නැවත සභාවට ලැබෙන්නේ නැද්ද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් මේ ගැන සොයා බලන්න.

**තීරණය -**

රජයේ ඉඩම් අත්පත් ක්‍රියාවලිය අනුව ඉඩම් අත්පත්කර පොදු කාර්යයන් සඳහ පහත සඳහන් ඉඩම්වල භුක්තිය නගර සභාවට භාරදී ඇති අතර ඒ සඳහා අප නගර සභාව විසින් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් නමින් තැන්පත් කර ඇති මුදල් වල පාස්පොත 2017.05.23 දක්වාම නගර සභාව භාරයේ තිබූ අතර එය සභාවේ මුල්‍ය ප්‍රකාශනයට ගෙන ඇත . නමුත් 2017.05.23 දින වන විට එම පොත් සියල්ල ප්‍රාදේශිය ලේකම්ගේ ඉල්ලීම පරිදි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගෙන ගොස් ඇත. එය අවසන් මුල්‍ය ප්‍රකාශනයේ තව දුරටත් වත්කමක් ලෙස පවතින බැවින් එම අගය වු රු.4930815.85 ක් ගිණුම් වලින් ඉවත් කර ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12.01 අම්බලන්ගොඩ ගාමිණි මහා විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය වෙනුවෙන් කොඩි කණු 06 ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අප විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රිඩා උත්සවය 2019.02.01 දිනට යොදා ගෙන ඇත. ඒ සඳහා කොඩි කණු 6ක් නොමිලේ ලබා දිමට අවශ කටයුතු කරන මෙන් ඉල්ලා ඇත. එය සභා අනුමතියට යටත්ව ලබා දි ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ ගාමිණි මහා විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය වෙනුවෙන් නොමිලේ කොඩි කණු 06 ක් සභා අනුමතියට යටත්ව ලබා දීම සඳහා සභාවේ අනුමතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඔය කොඩි කණු හා නගර සභාව සතු දේපල වල UC කියා ගසන්න කියා දැන් මාස 6ක් පමණ වෙනවා. තවමත් එය කර නැත. කොඩි කණු 50 ක් ගියාම එන්නේ 47 කි. තව ප්‍රා දේශිය ලේකම් කාර්යාලයේ කොඩි කණු තිබෙනවා. වෙන වෙන ආයතන වල කොඩි කණු ඇත. සැමදාම අඩු අඩු වි යනවා. මෙය අම්බලන්ගොඩ UC කියා ගහන්න පුළුවනි බ්ලොක් එකක් කපා ගැසිය හැකිය. නගර සභාවේ භාණ්ඩ වල .

**12.02 අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 45 වන ජාතික ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියර තරඟ ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙල සඳහා 2019.02.22 , 28 දින හා මාර්තු 22,23 දින වල පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනයත් , 2019 පෙබරවාරි 23 දින මානාන ක්‍රීඩාංගනයත් නොමිලේ වෙන්කර ගැනීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ක්‍රිඩාංගණය වෙන්කරවා ගැනිම සම්බන්ධවයි. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අම්බලන්ගොඩ. 45 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියර තරඟ ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රිඩා උළෙල සඳහා පහත සඳහන් දිනයන්හි දි අදාල ක්‍රිඩාංගන නොමිලේ වෙන්කර දීමට අවශ්‍ය කටයුතු සම්පාදන කරදෙන මෙන් ඉල්ලා ඇත.

පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය පෙබරවාරි 22,28 හා මාර්තු 22,23

මානාන ක්‍රීඩාංගනය පෙබරවාරි 23 යන දිනයන්හි ලබා දෙන්න තිරණය කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 45 වන ජාතික ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියර තරඟ ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙල සඳහා 2019.02.22 , 28 දින හා මාර්තු 22,23 දින වල පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනයත් , 2019 පෙබරවාරි 23 දින මානාන ක්‍රීඩාංගනයත් නොමිලේ වෙන්කර ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

12.03 අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය ( පිහිනුම් ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ දෙමාපියන් / භාරකරුවන්ගේ සංගමය ) 2019.02.03 දින පැවැත්වෙන පිහිණුම් තරඟාවලිය සඳහා නොමිලේ කොඩි කණු පහළොවක් පමණ ඉල්ලා සිටියත් 2019.02.01 දින මුදල් ගෙවා ඇති අතර කොඩි කණු ලබා දිම සම්බන්ධ ලිපියට සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය පිහිනුම් ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ දෙමාපියන් / භාරකරුවන්ගේ සංගමය. 2019.02.03 දින පැවැත්වෙන පිහිණුම් තරඟාවලිය සඳහා නොමිලේ කොඩි කණු පහළොවක් පමණ අවශ්‍ය වි ඇති බැවින් එය ලබා දෙනලෙස ඉල්ලා ඇත. මේ සභා සභාවට යොමු කරන ලෙස දන්වා ඇති බැවින් එය නිසි කාලයේදි නොලැබෙන නිසා මේ සඳහා රු.175ක මුදලක් ගෙවා ඇත. එය නැවත දෙමාපියන්ට ගෙවිමට අනුමතිය ඉල්ලා ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය (පිහිනුම් ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ දෙමාපියන් / භාරකරුවන්ගේ සංගමය) 2019.02.03 දින පැවැත්වෙන නිවාසාන්තර පිහිණුම් තරඟාවලිය සඳහා නොමිලේ කොඩි කණු 15 පමණ ඉල්ලා සිටියත් 2019.02.01 දින රු.175/= මුදලක් ගෙවා ඇති බැවින් එම මුදල නැවත එම සංගමයට ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

12.04 නිවාඩු දින වලදි ආරක්ෂක නිලධාරියකු ලබා ගැනීම සම්බන්ධයෙන් 2019.0130 දිනැති ලිපියට සභා ගත කරන ලදි .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිවාඩු දින වලදි ආරක්ෂක නිලධාරියකු ලබා ගැනීම. ඉහත කරුණ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගර සභාව ප්‍රධාන ආරක්ෂක නිලධාරි ඉල්ලීමක් කර ඇත. අම්බලන්ගොඩ නගර සභාවේ ආරක්ෂක සේවය සැපයීමේදි රාත්‍රී කාලයේදී එක් නිලධාරියෙකු පමණක් සිටින අතර මුරකරු ලෙස සේවය කරන සුමුදු කුමාර මහතාද ඒ සඳහා යොදවා ඇත. ඔහුගේ රාජකාරි සෙනසුරාදා , ඉරිදා හා රජයේ අනෙකුත් නිවාඩු දිනවලදී සිදු නොවන බැවින් එම දිනයන් සඳහා රාත්‍රී රාජකාරි සඳහා ආරක්ෂක නිලධාරියෙකු යොදවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇත.( එම ලිපිය මේ සමඟ අමුණා ඇත.) අම්බලන්ගොඩ නගර සභාවට ආරක්ෂක සේවාව සැපයීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 13 වගන්තියේ සඳහන් වී ඇත්තේ ආරක්ෂක සැලැස්ම හා ආරක්ෂක නිලධාරින් ගණන තක්කාලිනව අඩුවැඩි කිරිමට නගර සභා සභාපති වෙත අයිතිය ඇතිබව දෙපාර්ශවය පිළිගනී යනුවෙනි. සේවය ලබා ගැනිම පිළිබඳ පිලිගෙන ඇත.

**තීරණය**

මුරකරු ලෙස සේවය කරන සමුදු කුමාර මහතා නිවාඩු දිනවලදී රාත්‍රි කාලයට ආරක්ෂක නිලධාරියෙක් ලබා ගැනිම සඳහා ප්‍රධාන ආරක්ෂක නිලධාරි ( ආරක්ෂක සේවය විසින් ) කරන ලද ඉල්ලීමට අනුව සෙනසුරාදා ඉරිදා සහ සුමුදු කුමාර මහතා නිවාඩු දිනවල රාත්‍රියට LRDC ආයතනයේ තවත් සේවකයෙක් යොදවා ගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

12.05 අම්බලන්ගොඩ නගර සභාවේ අබලි භාණ්ඩ වෙන්දෙසි වාර්තාව සම්බන්ධ ලිපි ගොණුව සභා ගත කරන ලදි

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාවේ අබලි භාණ්ඩ වෙන්දෙසිය.2018.12.31 දින පැවති භාණ්ඩ සමික්ෂණ වාර්තාවේ ඇතුලත් වු වෙන්දෙසි කළ යුතු භාණ්ඩ වෙන්දෙසි කිරිම සඳහා2018.01.08 12.04 අංක යටතේ සභා අනුමතිය ලැබි ඇත. එ අනුව වෙන්දෙසිය 2018.05.31 දින පැවැත්විමට තීරණය කර තිබු අතර වෙන්දෙසිය නොපැවැත්වූ අතර 2018.12.06 දින වෙන්දෙසිය පවත්වන ලදී. එම වෙන්දෙසිය සඳහා පහත සඳහන් නිලධාරින් සහභාගි වන ලදී.ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා,ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා , ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා,ගරු ලේකම්තුමිය , විමර්ශන නිලධාරි සමන් අතපත්තු මහතා , දයා රන්සි මහත්මිය, ටී . චන්න මයා , අචිරා රංජනි ලොකුගේ මහත්මිය, මල්කි මහත්මිය, ජයලත් මයා යන අය සහභාගි වුහ. එම වාර්තාව ගරු මන්ත්‍රිවරුන්ගේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කර ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ අබලි භාණ්ඩ වෙන්දෙසි වාර්තාවේ ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

12.06 අම්බලන්ගොඩ දියා රෝහලේ කාර්ය මණ්ඩලය සහ බලපිටිය මුලික රෝහලේ කාර්ය මණ්ඩලය අතර 2019.03.24 වන දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති සුහද ක්‍රිකට් තරගය පැවැත්විමට නොමිලේ පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණය ලබා ගැනීම සම්බන්ධ ලිපියට සභා ගත කරන ලදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ දිසා රෝහලේ කාර්ය මණ්ඩලය සහ බලපිටිය මුලික රෝහලේ කාර්ය මණ්ඩලය අතර 2019.03.24 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති සුහද ක්‍රිකට් තරඟය සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලිමක් කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි කොහේද ඒ ඉල්ලා තිබෙන්නේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , කවදාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019 මාර්තු මස 24 දින . එම දිනයේ පෝය දිනයක් වුවහොත් දීමට නොහැකිය.

**තීරණය**
අම්බලන්ගොඩ දියා රෝහලේ කාර්ය මණ්ඩලය සහ බලපිටිය මූලික රෝහලේ කාර්ය මණ්ඩලය අතර 2019.03.24 වන දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති සුහද ක්‍රිකට් තරගය පැවැත්වීමට නොමිලේ පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණය ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

12.07 ඉන්දියාවේ බැංගලෝර්හි පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා නගර සභා මහජන සෞඛ්‍ය පරික්ෂක නදිල් මහතා ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා විසින් නම්කර ඇති ඒ සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉන්දියාවේ බැංගලෝර්හි පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සම්බන්ධවයි.Yaarl Reisen (Pvt ) Ltd (යාර්ල් රයිසන් පුද්.සමාගම) වන අප ආයතනය විසින් ලොවපුරා රටවල් බොහොමයක ආකර්ෂණීය මෙන්ම අධ්‍යාපනික, සමාජීය වටිනාකමක් සහිත වැඩසටහන් රාශියක් සංවිධානය කරනු ලබයි. වර්තමානයේ දිනෙන් දින පරිසරයට එක්වන නාගරික අපද්‍රව්‍ය ප්‍රමාණය විශාල වශයෙන් ඉහළයාම ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යාන්තර වශයෙන් පවත්නා විශාල ගැටළුවක් බවට පත්ව ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් නිෂ්පාදන හා සේවා සැපයීමේදි නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. Yaarl Reisen (Pvt ) Ltd (යාර්ල් රයිසන් පුද්.සමාගම) වන අප ආයතනය IIWM ( International Institute of Waste Management ) ආයතනය සමඟ සම්බන්ධ වී ඉන්දියාවේ බැංගලෝර්හි දි නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් 2019.02.28 වන දින සිට 2019.03.01 දින දක්වා පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම සම්මන්ත්‍රණයට සම්බන්ධ වන සමාජිකයන් සඳහා ජාත්‍යාන්තර වශයෙන් පිළිගත් සහතික පත්‍රයක් IIWM ( International Institute of Waste Management ) ආයතනය විසින් පරිනමනු ලබන අතර මෙමගින් ඔබ ලබා ගන්නා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ඔබ ආයතනයටද උපයෝගීකර ගනිමින් මෙරට පවත්නා දිනෙන් දින ඉහළ යන නාගරික අපද්‍රව්‍ය ගැටළුව අවම කර ගැනීමට ඔබට ද දායක විය හැකි බව ප්‍රකාශ කර ඇත. මෙම සම්මන්ත්‍රණය පිළිබඳව වැඩි විස්තර පහත ඇමුණුම් එවා ඇති අතර මෙම සම්මන්ත්‍රණයේ පවත්නා පාරසරික හා සමාජීය වටිනාකම හඳුනාගෙන මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නේ නම් මෙ සම්මන්ත්‍රණයට සහභාගී වන ලෙස ඉල්ලීමක් කර ඇත. මේ සඳහා අපගේ මහජන සෞඛ්‍ය පරික්ෂක හසින්ත නදිල් මහතා යෝජනා කරනවා. එය නගර සභා වියදමින් යැවිය යුතුයි. එහි පැකේජ 3ක් ඇත.එහි නවාතැන් පහසුකම්, ප්‍රවාහන පහසුකම් ,ආහාර හා විසා ගුවන් ටිකට්පත් වෙනුවෙන් යන කරුණු හතරටම රු.121000/= ක මුදලක් වැයවෙනවා. දින 4කි. එම නිසා මා ඉල්ලා සිටිනවා අම්බලන්ගොඩ නගර සභාවේ නව

මහජන සෞඛ්‍ය පරික්ෂකවරයා මේ සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ මුදලින් යවා පුහුණුවක් කර ඒ ලබාගත් දැනුම තුලින් යම්කිසි සේවාවක් අපේ නගරයට ලබා දිමට කටයුතු කිරිම සුදුසු යයි මා යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.ඔබතුමා ගනු ලැබූ තීරණය ඉතා නිවැරදියි. ඒ සඳහා අදාල ක්ෂේත්‍රයේ පුද්ගලයා යැවිම සුදුසුයි. එතුමා නගර සභාවට පත්වීම් ලබා පැමිණ තව මාසයක්වත් නැහැ. දීර්ඝ කාලයක් තුල අපි පාලනය කළත් කවුරු පාලනය කළත් මෙම ක්ෂේත්‍රය තුල විශාල ගැටළුවකට මුහුණ දෙන ක්ෂේත්‍රයක් තමයි කසළ . එම නිසා ඔබතුමා ගත් තීන්දුව ඉතාමත් නිවැරදියි. එතුමාට එම මුදල ලබා දී පුහුණුව සඳහා පිටත් කර යවන්න. එය නගර සභාවට පිටුවහලක් වෙයි ඉදිරියේදි .

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , එතුමා අපි මෙම පුහුණුව සඳහා යැවිමෙන් පසු ස්ථාන මාරුවක් ගනු ලැබුවහොත් එහෙම. එම නිසා එතුමට ස්ථාන මාරු ලබාගෙන නොයන ලෙස දන්වන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

වසර 5ක් යනතුරු ස්ථාන මාරු නොයන ලෙස දන්වා සිටින්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේ සඳහා රු.121000/= ක මුදලක් ගෙවන නිසා වසර 5ක් යනතුරු ස්ථාන මාරු ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. මොකද මේ සඳහා වැය කරනු ලබන්නේ මහජන මුදල් නිසා නගර සභාවට ප්‍රතිඵලයක් ලැබෙන විදියට වැඩය කළ යුතුයි. නැතිනම් ස්ථාන මාරු ලබාගෙන ගියහොත් එම සේවය අපට ලබා ගැනිමට නොහැකි වේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

වසර 5ක් යනතුරු ස්ථාන මාරු ලබා නොයන ලෙස දන්වා සිටින්න. ඒ සඳහා යම්කිසි ගිවිසුමක් අත්සන් කර එතුමා යවන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ අනුව අවම කාලයක් සේවා කිරිමට යටත්ව එම මුදල ලබා දීමට මෙය ස්ථිර කරනවා.

**තීරණය**

ඉන්දියාවේ බැංගලෝර්හි පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා නගර සභා මහජන සෞඛ්‍ය පරික්ෂක හංසිත නදිල් මහතා ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා විසින් නම්කර ඇති අතර ඒ පුහුණුව සඳහා වැයවන නවාතැන් පහසුකම් , ප්‍රවාහන පහසුකම් , ආහාර , වීසා සහ ගුවන් ටිකට් පත් යනාදිය සඳහා රු.120000 ක මුදලක්, ලියාපදිංචි ගාස්තු වශයෙන් රු.1000ක මුදලක් සහ ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ පරිදි අනුව ලබා දිය හැකි වෙනත් දීමනා සභා අරමුදලින් ගෙවීමටත් , පාඨමාලාව ආරම්භක දිනයේ සිට වසර 05 ක කාලයක් ස්ථාන මාරු ලබා නොගෙන අම්බලන්ගොඩ නගර සභාවට සේවය කරන බවට ගිවිසුමක් අත්සන් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

12.08 අම්බලන්ගොඩ ගාලු පාර නො.519 හි පදිංචි මුකදන්ගේ තිලකා පද්මිණි යන අයගේ පුතු වන හේන්ද හේවා සුපුන් ලශින්තතකට තම මෑණියන් විසින් තම පුත්‍රයාට තෑග්ගක් වශයෙන් මෙම දේපල ලබා දී ඇති නිසාත් විකිණිමක් සිදු වී නොමැති බැවින් 1% ක ගාස්තු මුදල වූ රු.431200/= ක මුදලක් නිදහස් කිරීමට නිර්දේශ කරන ලෙස ඉල්ලා ඇති ලිපිය සභා කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඩබ්.ඒ.යු. ධර්මසූරිය නොතාරිස් මහතා විසින් 2018.11.13 වන දින සහතික කර ඉදිරිපත් කර ඇති Atd/12/139/2018 දරණ ඔප්පු සාරාංශ පෝරමය හා පෙලපත්සටහනද අංක 1289 දරණ ඔප්පුව මගින් සනාථ වන මුකන්දගේ තිලකා පද්මිණි යන අය ජීවිත භුක්තිය තබාගෙන තම පුත්‍රයා වන හෙන්දහේවා සුපුන් ලශින්තක සිල්වා යන අයට ලියා ඇති ඔප්පුවද , සාම විනිසුරු ඩබ්.වික්‍රමපාල සොයිසා මහත්මා ඉදිරියේ අත්සන් තබා දිවුරුම් ප්‍රකාශය අනුවද , උප්පැන්න සහතිකය මගින් මුකන්දගේ තිලකා පද්මිණි යන අයගේ පුත්‍රයා හේන්දහේවා සුපුන් ලශින්තක බව සනාථ වන බවද , ඉහත කරුණු අනුව තම මෑණියන් විසින් තම පුත්‍රයාට තෑග්ගක් වශයෙන් මෙම දේපල ලබා දී ඇති බව සනාථ වන අතර විකිණිමක් සිදු වී නොමැති බැවින් සහා අනුමැතිය මත 1% ක මුදල නිදහස් කිරිම සුදුසු බවට යෝජනා කර ඇත. ඒ සඳහා අප විසින් අයකර යුතු මුදල රු.431200/= කි. සිය මවගෙන් පුතාට ලියා දී තිබෙන්නේ. එම 1% ක ගාස්තු නිදහස් කර දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි . ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඔහු නැවත විකිණිමක් කළහොත් එහෙම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔහු වෙන කෙනෙකුට විකිණිමක් සිදු කළහොත් එම මුදල අයකරනු ලබයි. මෙම වරප්‍රසාදය හිමිවන්නේ මොහුට පමණි. ඔහු යම්කිසි කෙනෙකුට මෙය විකිණිමක් සිදු කළහොත් එම මුදල අයකිරිමට යටත්ව ගාස්තු නිදහස් කරනු ලබයි.

**තීරණය**

අම්බලන්ගොඩ ගාලු පාර නො.519 හි පදිංචි මුකදන්ගේ තිලකා පද්මිණි යන අයගේ පුතු වන හේන්ද හේවා සුපුන් ලශින්තතක ද සිල්වා මහතාට තම මෑණියන් විසින් තෑග්ගක් වශයෙන් මෙම දේපල ලබා දී ඇති නිසාත් විකිණිමක් සිදු වී නොමැති බැවින් 1% ක ගාස්තු මුදල වූ රු.431200/= ක මුදලක් නිදහස් කිරීමට සුදුසු බවටත් , මෙය විකිණිමක් සිදු වුවහොත් එම ගාස්තු නිදහස් නොකිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**12.09 අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයට 2019.02.02 දින පැවැත්වෙන නිවාසන්තර නෙට්බෝල් තරඟාවලිය සඳහා අවශ්‍ය වන කොඩි කණු 50ක් හා පතාක කොඩි 25 ප්‍රමාණයක් නොමිලේ සභා අනුමතියට යටත්ව ලබා දීම සම්බන්ධ ලිපිය සභා කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පතාක කොඩි සහ කණු ලබා ගැනිම සම්බන්ධවයි. සෑම වසරකම අප විද්‍යාලයට ලබා දෙන සහයෝගය ස්තුති පූර්වකව සිහිපත් කර සිටිනවා. ධර්මාශොක විද්‍යාලීය 2019.02.02 දින පැවැත්වෙන නිවාසාන්තර නෙට්බොල් තරගාවලිය සඳහා අවශ්‍ය වන කොඩි කණු 50 ක් හා පතාක කොඩි 25 ක ප්‍රමාණය 2019.02.01 දින ඔබ ආයතනය මගින් අප පාසලට මෙවරත් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත . එය සභා අනුමතියට යටත්ව ලබා දී ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මෙම විද්‍යාලය අපේ මේ නගරයේ මුල් පුරවරයා පවා අව තක්සෙරු කරන තත්වයක අප ආසනය මෙහෙය වන සම්බන්ධීකරණ කටයුතු කරන සභාපතිවරයාට ඒ විදියට අවනම්බුවක් සිදු කරනු ලැබූ වේලාවේ ඇයි මෙවැනි ඉල්ලීම් වලට අපි ඇහුම්කන් දෙන්නේ. මීන් ඉදිරියට ධර්මාශෝක විද්‍යාලයෙන් එවන ඉල්ලීම් වලට ඉඩකඩ සලසා නොදෙන්න. ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා හැල්ලුවට ලක් කළා. ගරු සභාපතිතුමා හැල්ලුවට ලක් කළා. ඒ විතරක් නෙමේ ඔවුන් මේ වන විට මේ පිවිතුරු හදවත් මනින්නේ දැඩි මංකොල්ලකරුවන්ගේ, පෝඩාකරුවන්ගේ ගණයට දමා ගෙනයි. ඔබතුමාන්ලා පිළිබඳව කිසිදු කළු පැල්ලමක් නැහැ.ඔබතුමන්ලා මනිනු ලබන්නේ විදුහල්පතිවරයා සහ ඒ අදාල ආදි ශිෂ්‍ය සංගමයේ නිලධාරීන්. එම නිසා මෙම ඉල්ලීම සම්බන්ධයෙන් මා විරුද්ධයි. අපගේ ගරු මන්ත්‍රීවරු මේ පිළිබඳව මා සමඟ එකඟ වෙයි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මට නිවැරදි කිරීමක් කළ යුතුයි. මෙම කරුණ පිළිබඳව නොමග ගොස් ඇති බව මට පෙනී යයි. යම්කිස අනාවබෝධයක් ඇත. මෙතැනදි මා විදුහල්පතිතුමා සමඟ පුද්ගලිකව දෙවරක් නොව තුන්වරක් කතා කළා. ඇයි මේ දේ සිද්ධ වුණේ කියා . මෙහිදි සිදුවී ඇත්තේ මෙම උත්සවය මෙහෙය වීම සඳහා නාවික හමුදාවට භාර දී තිබීමයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ එතුමා අපට පැහැදිලි කිරීමක් සිදු කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

තවදුරටත් පාසල විවේජනය කිරීම සිදු විය යුතු නැහැ. මාත් කාරක සභාවේ ඉන්නවා . එහෙම දෙයක් සිදු වුයේ නැහැ. පසුගිය කාරක සභා රැස්වීමෙදීත් විදුහල්පතිතුමා මෙය අවධාරණය කළා. මෙහිදි අපට සිදු වී ඇත්තේ නගර සභාවෙත් ගරු මන්ත්‍රීවරයෙකු ලෙස සිටිනවා. පාසලේ කාරක සභවෙත් සිටිනවා. නමුත් පාසලෙන් අපිට කියනවා නගර සභාව මේ විදියට අපිට පහර දෙනවා කියා. අපහසුතාවයකට පත් වෙලා තිබෙන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔබතුමා එය නිවැරදි කරන්න යන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මෙය ධර්මාශෝක විද්‍යාලයෙන් කළ වැඩක් නොවේ. චෝදනා කරන්න එන්න එපා එය පාසලෙන් කළ වැඩක් නොවේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා මෙම යෝජනාව ගෙන ආ වේලාවේ දෙන්න එපා කියා මා අත ඔසවා කැමැත්ත ප්‍රකාශ කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මා එය පිළිගන්නවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපි එහි ඉන්න ඕනෑ නැහැ. හැබැයි ඔබතුමා මතක තබා ගන්න. මොන උත්සවය පැමිණියත් නගරයේ මොන පාසලේ මොන උත්සවය පැමිණියත් ගරු නගරාධිපතිතුමාට ආරධනා කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙය නාවික හමුදාවෙන් කළ වැඩක්. මෙය ධර්මාශෝක විද්‍යාලයෙන් ගත් තීරණයක් නොවේ. මා පැහැදිලිව දන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

මෙය නාවික හමුදාවෙන් ගත් උත්සවයක් නම් අම්බලන්ගොඩ නගර සභාවේ බඩු භාණ්ඩ මේ සඳහා යවන්න බැහැ. ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා හමුදාවේ සිටි රණවිරුවෙකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ධර්මශෝකය කියන්නේ නාවික හමුදාව නෙමේ. නාවික හමුදාවට ඕන විදියට කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙහිදි මා පවසන්නේ මෙතැන මා සිටි නිසායි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ගැන පැහැදිලි කිරිමක් අවශ්‍ය නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මට කතා කර ඉවර කරන්න දුන්නේ නැහැනේ. මා කාරක සභාවේ සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කඩේ යන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

නෑ කඩේ යැමක් නෙමේ. කාරක සභාවේ සිටින නිසා මා කතා කරන්නේ. මට කතා කිරිමට අයිතියක් තිබෙනවා. මෙතනදි මා පිලිගන්නවා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාට යම්කිසි අපහසුතාවයක් සිදු වුණා කියා මා පිළිගන්නවා. එතුමා විශ්‍රාමික හමුදා නිලධාරියෙක්. විශ්‍රාමික හමුදා නිලධාරින් ගෙන්වනු ලැබුවා. මා මෙය පැහැදිලිව විදුහල්පතිතුමාටත් පවසා සිටියා. එතැනදි සිදු වූයේ නාවික හමුදාපති පියල් මහතාට වඩා උසස් නිලතල වල අය ගෙන්නන්න එපා කිව්වා. දේශපාලන අධිකාරිය ගෙන්වා ගැනිම ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජය ලාල් මහතා හෝ ගරු නගරාධිපතිතුමා හෝ ගෙන්විමෙන් පුටු වෙන්කරන්න සිදු වන නිසා නාවික හමුදාවෙන් තමයි එපා කියා තිබුණේ. හැබැයි එතනදි මෙතුමාට දේශපාලන වශයෙන් නෙමේ විශ්‍රාමික මේජර්වරයෙක් ලෙස එතුමාට ආරාධනා කරන්න තිබුණා. නමුත් විදුහල්පතිතුමාගෙන් මා විමසා සිටියාම එතුමා පවසා සිටියා ඔබතුමාට ආරාධනා කළ බව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා අපගේ ගරු මන්ත්‍රිතුමා සමඟ එකඟ වන්නේ නැහැ. අපි මේ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා මෙම යෝජනාව ගෙන එනු ලැබුවේ. එතුමාත් ධර්මාශෝක විද්‍යාලයේ අදි සිසුවෙක්. මෙම යෝජනාව ගෙන ආ

මොහොතේ මා අත ඔසවා කැමැත්ත ප්‍රකාශ කළා. මෙහි මෙම යෝජනාවට බෙදිමක් ඇති වුණා.එත් අප ඉදිරිපත් වී මෙය පාසලට ලබා දිය යුතු නිසා එය ලබා දුන්නා. ධර්මාශෝකය මේ නගරයේ තිබෙන පාසලකි . පාසලේ කුණුටික අදිනවානම් , පාසලට ඉල්ලා සිටින ඕනෑ එපාකම් ටික සියල්ල ලබා දෙනවා නම් ගරු නගරාධිපතිතුමාට ආරාධනා කරන්න අවශ්‍ය නැද්ද? ගරු මන්ත්‍රිවරු පැත්තකට දමන්න.ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විපක්ෂ නායකතුමා මෙන්ම අම්බලන්ගොඩ ආසනයේ සංවිධායකතුමා. ඒවා පැත්තකට දමන්න. ඔබතුමා දැන් මෙහිදි ප්‍රකාශ කර සිටියා හමුදාවේ විශ්‍රාම ගිය නිලධාරින් සියල්ල ගෙන්වා සිටි බව. මෙතුමා ගෙන්නුවේ නැහැ කියා. ඔය ඔබතුමා ගෙන එනු ලබන තර්කය නිවැරදි කිරිමටවත් සාධාරණිකරණය කරන්න එන්න එපා. ඕක වැරදි වැඩකි. දැන් ඔබතුමා ප්‍රකාශ කරනවානේ ධර්මාශෝක විද්‍යාලයට දේශපාලනඥයෝ පැමිණියේ නැහැ කියා. මේ රටේ ගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සිටි කාලයේදිත් එතුමා ගෙන්වනු ලැබුවා මෙම පාසලට. ඒ මොහොතේවත් ආරාධනා කළේ නැහැ. අපි ගරු මන්ත්‍රිවරු බලෙන් ගියේ. මෙතුමා තමයි අපිව දැමුවේ එම උත්සවයට. අපේම පාලන කාලයේ අපේම ජනාධිපති සිටි කාලයේ ජනාධිපතිතුමා පැමිණියා පාසලට එතකොටවත් අපිට ආරාධනා කළේ නැහැ. අපේ රටේ නායක එන විට නොගිහින් බැරිනිසා බලෙන් ගියා . එහෙම පාසලක් ධර්මාශෝක විද්‍යාලය.අපි මේ ගැන පවසන්නේ කනගාටුවෙනි. ඒ නිසා අපගේ දැඩි විරෝධය මේ සම්බන්ධව ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

පාසල පිළිබඳ ඔබතුමාටත් මටත් කිසිම අවුලක් නැහැ.අතිගරු ජනාධිපතිතුමා පාසලට පැමිණියා. උත්සවය සංවිධානය කරනු ලැබුවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ මාත් සංවර්ධන කමිටුවේ සභාපතිවරු විදියට. නමුත් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කතා කර ප්‍රධාන විධායකයෙක් ප්‍රකාශ කර සිටියා මෙම උත්සවය පුටු දෙකක් ඔබතුමාට හා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට දමන්න කියා ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කල බව. එම උත්සවයේදි මට පාසල ආරාධනා කළේ නැත. මා පසුව ගෝනපිනුවල සාරාලංකාරයේ තිබු උත්සවයේ සියළු සංවිධාන කටයුතු සිදු කළා. සංවිධානය කර ගරු ජනාධිපතිතුමා පිළිගනු ලැබුවේත් මම. පිළි අරගෙන මා ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කර සිටියා . සර්, මගේ පාසල ධර්මාශෝක විද්‍යාලය . නමුත් මාගේ පාසල වු ධර්මාශෝක විද්‍යාලය මට ආරාධනා නොකළ නිසා මම ඒ සඳහා සහභාගි වුයේ නැහැ. ඒ පිළිබඳව මා ඔබතුමාගෙන් සමාව ඉල්ලා සිටිනවා. එම සිද්ධිය පලවෙනි එක. මේ උත්සවයේදි මට ආරාංචිය ලැබුණේ ඔබතුමාටත් ආරාධනා කළේ නැත. මටත් නැත . මා කල්පනා කළා මොකක්ද මේ අය කරන්නේ. සුද්ද කරන්න එන්න එපා . මාත් හොඳ ආදි ශිෂ්‍යයෙකි. මා විදුහල්පතිතුමා ගෙන එනු ලැබුවේ පැය 24 කින්. එම නිසා එතුමා යවන්නෙත් මා විසින්මයි. එය හොඳට මතක තියා ගන්න. ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නේ . එතුමා වැඩිකල් යන්න පෙර යවන්නෙත් මමයි. මා මාගේ විරෝධතාවය ප්‍රකාශ කළා ගරු සභාපතිතුමාට දැනුම් නොදිම පිළිබඳව. මෙතුමා කිව්වා හරි මොන කවුරු පාලනය කළත් නගර සභාව ප්‍රධාන පුරවැසියා. අපි එය සුළුවෙන් තකන්න එපා. මෙතුමාට ආරාධනා කළ යුතුයි. දේශපාලන වශයෙන් මේ කොට්ඨාශය තුල සංවර්ධන කමිටුවේ සභාපතිවරුන් වන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් මාත්. ජොෂ්ඨ ජුනිය කතන්දර නැත.ආරාධනා කළ යුතුයි. එතකොට පියල් මහතා නාවික හමුදාවට බැඳෙන විට මා ගියේ හමුදාවට. මා අද යුධ හමුදාවේ හිටියා නම් අද මාත් ජනරල්වරයෙකි. එතුමා නාවික හමුදාවේ අඩු සංඛ්‍යාවක් සිටින නිසා නාවික හමුදාපති. මාගේ සුභ පැතුම් . එකට දුවපු එකට පිහිනුම් කරපු එකට කැඩෙට් කරපු අය. මා ගිහින් පියල්ට සුභ පැතුවා. උත්සවය අවසන් වි සවස මා නිවසට යනවිට මෙන්න තිබෙනවා ලිපිය . දිනෙත් වේලාවට තිබුණා පැහැදිලිව වැදිලා. එහෙමයි උත්සව කටයුතු සංවිධානය කරනු ලැබුවේ.මා මේ පාසල ඇදි ආ නිසා කියන්නේ. මේවා සටහන් කර විරෝධතාවය ප්‍රකාශ කරන්න ධර්මාශෝක විද්‍යාලයට. අපේ අප්‍රසාදය. මොකද ඔබතුමාත් මාත් ආදි සිසුන් වේ. මෙහි සිටින බහුතරයක් ආදි සිසුන්. අපි පාසලට ආදරේයි. පාසලේ විදුහල්පතිතුමා විතරක් නෙමේ සියළු කමිටු මතක තබා ගත යුතුයි. දේශපාලන වශයෙන් මෙතුමා උවමනායි. ප්‍රධාන පුරවැසියා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා උවමනායි.එතුමා පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යවරයා.මා උවමනායි පවතින රජය නියෝජනය කරන සංවිධායක වරයා.මේ ප්‍රතිපාදන ලැබුණේ මට.පාසල ඔහොමද වැඩ කරන්නේ.පාසලට හැන්ද බෙදන්න පුළුවන් අපිටත්. අපි බෙදනවා හැන්ද . හැබැයි ඉගෙන ගත්ත පාසල . නමුත් දේවානන්ද විද්‍යාලයට මුදල් දුන්නා.කුලරත්න විද්‍යාලයට මුදල් දුන්නා.ප්‍රජාපතියට මුදල් අවශ්‍යද ඇහුවා.එහෙම බෙදන්න පුළුවන් මුදල් . පාසලට එවැනි කැත වැඩ කරන්න එපා කියන්න.හැල්ලුවට ලක් කරන්න එපා තනතුරු. අරුණ ප්‍රදිප් වත්, ඩෙනට්වත් , ලක්ෂ්මිවත් මේ තනතුරු හැල්ලුවට ලක් කරන්න එපා.ගරු සභාපතිතුමනි ,විරෝධතාවය යවන්න . මෙය ඔබතුමාට පමණක් නෙමේ. ඊළඟට ඔය පුටුවේ වාඩිවෙන

කෙනාටත් එය සිදු කරනවා. අපි තදින් විරුද්ධයි. පොඩ්ඩක් අහාගන්න ඔබතුමා.කලබල වෙන්න එපා. ඔබතුමා සමඟ මාගේ පුද්ගලික ගැටළුවක් නැහැ. මොකද මා විරුද්ධ දෙයට විරුද්ධයි. මා මාගේ පක්ෂයේ ජොෂ්ඨ පුද්ගලයින්ට ඇඟිල්ල දික් කර කියා තිබෙනවා. කැබිනට් අමාත්‍යවරුන්ට පුටුවේ ඇඟිල්ල දික් කර පැමිණ තිබෙනවා.වැරදි වැරදි කියා විවේචනය කරනවා දකුණේ ඉපදුනු කෙනෙක් නිසා.මේ පිළිබඳව මා පිටු 1 ½ ලිපියක් ලිව්වා. ලිපිය ටයිප් කර යනවන්න ඕන අයට පිය යැව්වා. පියල් මහතාට යැව්වා. ආදි ශිෂ්‍ය සංගම්වලට යැව්වා. විදුහල්පතිතුමාට යැව්වා.මගේ බලවත් විරෝධය ලි ප්‍රකාශ කර හොඳ සිංහල වචන වලින් ලියා යැව්වා.අපි ඔබතුමාට විරුද්ධව නෙමෙ කියන්නේ. සුදු හුණු ගාන්න එන්න එපා.වැරදුනු තැන හදන්න ඕනෑ.අපේ ගරු උපසභාපතිතුමා කිවූ ආකාරයට අපගේ දැඩි විරෝධතාවය ප්‍රකාශ කර සිටින්න. මොන් උත්සවය මෙම ප්‍රදේශයේ තිබ්බත් ඔබතුමාට ආරධානා කළ යුතුයි.ඒ වගේම මෙම මැතිවරණ බලප්‍රදේශය නියෝජනය කරන ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් මටත් ආරාධනා කළ යුතුයි. මොකද අපි තමයි මුදල් ප්‍රතිපාදන දෙනු ලබන්නේ.හැල්ලුවට ලක් කරන්න බැහැ. අපට දේශපාලන මතභේද නැහැ.ඒවා තියෙන්න පුළුවන් වෙන පැත්තකට. හැබැයි දේශපාලන තනතුරු පුටු, තනතුරු හැල්ලුවට ලක් කරන්න දෙන්නේ නැහැ. එය වැරදියි.ධර්මශෝක විද්‍යාලය කරනු ලැබූ බලු වැඩයට අපි පිලියම් යොදා ඉවරයි.මා බොහොම ඉක්මනට බොහොම කලින් වැඩ කළහැකි ස්වාධින විදුහල්පතිවරයෙක් ඕතනට ගෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මට විනාඩි දෙකක් දෙන්න . ඒ කතා කළේ විදුහල්පතිතුමයි , ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතායි අතර පුද්ගලික ප්‍රශ්නයක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

කිසිම පුද්ගලික ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මමත් විරුද්ධව කතා කළා. ඇයි මේ සඳහා ආරධනා නොකළේ කියා. සුදු හුණු ගාන්න ගියේ නැහැ. මගේ නගර සභාවේ සභාපතිතුමා වෙනුවෙන් කතා කළා.ඔබතුමා වැරදි මතයක සිටින්නේ. මා කිව්වේ වෙච්ච සංසිද්ධිය.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා උත්තර දෙන්න අවශ්‍ය නැහැ වාඩිවෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එහෙම බැහැනේ . අරම සුදු හුණු ගානවා කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ එහෙම දෙන්න අයිතියක් නැහැ. සභාවේ කතා කරන්න අයිතිය දෙනු ලබන්නේ එකපාරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නාවික හමුදාපති ලෙස පියල් හරිස්චන්ද්‍ර මැතිතුමා පත්වුණාම අපි අපගේ සුභාෂිංශන එක් කළා. එම ගෞරුත්වය සභාවෙන් එතුමාට දෙනු ලැබුවා. අපි පුදන්න ඕන කෙනාව පිදුවා. නමුත් අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන පුරවැසියා A හෝ B හෝ C හෝ වේවා කවුරු වුණත් ඒ ප්‍රධාන පුරවැසියා. ඒ ප්‍රධාන පුරවැසියාට දිය යුතුයි.එතැන ඔබතුමා නෙමේ වෙන කවුරු හිටයත් එය දිය යුතුයි. ඒ කියන්නේ ප්‍රධාන පුරවැසියා හෙලා දැක්කා කියන්නේ නගර සභාවේ සිටින අපිත් හෙලා දැක්කා කියන එකයි මගේ මතය. අපේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා ප්‍රකාශ කර සිටියා මෙය කරනු ලැබුවේ නාවික හමුදා විසින් කියා.එය නාවික හමුදාවෙන් කරනු ලැබුවේ නම් එය ගිහින් නාවික හමුදා කඳවුරේ තැබිය යුතුයි. ධර්මාශෝකය කියන්නේ අපගේ පාසල. එය

අම්බලන්ගොඩ අයිතිවාසිකමකි. නාවික හමුදාවට ඕන විදියට කරන්න බැහැ ධර්මාශොකය එවා.ධර්මාශෝකයේ ඒවා කෙරෙන්න ඕන අම්බලන්ගොඩ ජනතාවට අවශ්‍ය විදියට. අනිවාර්යෙන්ම ඔබතුමාට මේ සඳහා සහභාගී වීමට ආරධනයක් තිබිය යුතුව තිබෙනවා.ඒ හැර අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා. එතුමා ආදිශිෂ්‍යයෙකි. පියල් මහතාට වඩා ජ්‍යේෂ්ඨ ආදිශිෂ්‍යයෙකි එතුමා. එතුමාත් උත්සවයේ ඒ පුටුවල වාඩි විය යුතුයි.ඒ වගේම අපගේ ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ඒ මහතාට වඩා එක පංතියකින් කණිෂ්ඨ පංතියක සිටියේ. අපි එකට සිටිය අය එතුමා සංවිධායකතුමා.එතුමා තමයි ප්‍රදිපාදන දෙනු ලබන්නේ. එතුමා තමයි පිලිගත් නියෝජිතයා.ඉතිං ඒ තුන්දෙනාටවත් ආරාධනයක් දෙන්න බැරි ධර්මාශෝකය ගැන කුමන කතාද ?මේ සම්බන්ධව මාගේ විරෝධතාවයත් මෙය තරයේ හෙලා දකින බවත් මා ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ අපි ඔය සම්බන්ධව වාද කරන්න එපා. ඒ පිළිබඳව කතා නොකර ඉන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී පී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

කතා නොකර බැහැ. මාත් එකෙන්. ගරු සභාපතිතුමනි, මේ සියළු ගරු මන්ත්‍රීවරුනේ කතා බහා අසාගෙන සිටියා.මා කතාකරන දෙයටත් ඇහුම්කන් දෙන්න. මෙතැන වැඩි හරියක් ඉන්නේ ධර්මාශෝක විද්‍යාලයේ ආදිශිෂ්‍ය ශිෂ්‍යාවන්.කාගේවත් නෙමේ මේ හැමදෙනාගේම පාසල . පාසල පැත්තක තියන්න. පාසල කියන්නේ අපි හැමදෙනාගේම පාසල. මේ කාර්ය කරන ලද අධිකාරියටයි මේ චෝදනාව යා යුත්තේ. අඩුවැඩි නැතිව අපිටත් පිළිගත යුතු වෙනවා. මෙහි ප්‍රධාන පුරවැසියාට මෙහි ආරාධනයක් යා යුතුයි.එය විවාදයක් නෙමේ.හැබැයි මේ උත්සවය සංවිධානය කරනු ලැබූ පාසලෙනි. මිට ප්‍රථම පාසලෙන් සංවිධානය කරනු ලැබූ පොලිස්පතිතුමා, හමුදාපතිතුමා ආදී සියළුදෙනාගේම උත්සව සංවිධානය වුවා මෙම පාසලෙන්. ඒ කමිටු විසින් ගන්නා ලද තින්දු ඒ පාසල විසින් ගන්නා ලද තින්දු.එහිදි ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික මහතා , මා යම් යම් කාරක සභාවලට සහභාගී වෙනවා. සමහර කමිටුවලට සහභාගී වෙනවා. එතකොට අපේ භූමිකාව වි තිබෙන්නේ අපට පුළුවන් දේ අපේ ශක්තියෙන් කරන්න. මට පැවරි තිබුණේ ස්තුති කතාව . මා මගේ ස්තුති කතාවේදි අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිතුමා ඇතුළු සියළුම නාගරික මන්ත්‍රීවරුන්ට ස්තුතිය පුද කර සිටියා. අවශ්‍යනම් මේ සඳහා පටිගත කර ඇති නිසා එය ඉදිරිපත් කළ හැකිය. ඒ කියන රැස්වීමේදි ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා සිටියේ නැහැ.අවංකවම බැනුම් ඇසුවාට. මා එහි සිටියා.නාවික හමුදාවට ධර්මාශෝකය පාලනය කරන්න දෙන්නේ නැහැ. හැබැයි නාවික හමුදාවේ ප්‍රධානියා එන විට නාවික හමුදාව එතැනට එනවා.ඔබතුමා හමුදාව නියෝජනය කළ ජ්‍යේෂ්ඨ නිලධාරියෙක්. ඔබතුමා දන්නවා ඒක. ප්‍රිල් මාෂර් එනවිට බිත්තියේ තිබෙන හිලත් වැහුවා ධර්මාශෝක විද්‍යාලයේ. මාර්ග මේ සියල්ලම වැහුවා. ඒ අයගේ නායකයා පැමිණෙන විට ඒ අය ආරක්ෂාව සම්බන්ධයෙන් කරනු ලබන දෙවල්. අපි සිවිල් පුද්ගලයෝ. ධර්මාශෝක විද්‍යාලයෙන් මෙය සංවිධානය කළාට රටේ ආරක්ෂක අංශයේ ප්‍රධාන කොටසක් මේ පැමිණෙන්නේ. ප්‍රධාන නායකයෙකි නායක හමුදාපතිතුමා. එය පියල් හරිස්චන්ද්‍ර වීම නෙවෙයි. එම අය කියන ආරක්ෂක කටයුතු වලට අපි හිස නැමිය යුතුයි.එ අය පවසන දෙය අපි පාසලේ කළ යුතුයි.ඒ නිසා එතුමාගේ ආරක්ෂාව සහ ගෞරුත්වය සම්බන්ධයෙන් නාවික හමුදාව දරනු ලැබූ මතය.අවංකවම කියනවානම් නාවික හමුදාව තමයි දේශපාලන අධිකාරිය මිට සහභාගී කරවන්න එපා කියා ඉල්ලිම කරනු ලැබුවේ.එවිට විදුහල්පතිතුමාට එතැනින් එහාට යන්න බැහැ.නැ මා ආරාධනා කරනාවා කියා මුළු ලංකාවේම සිටින දේශපාලන අධිකාරියට ආරාධනා කරන්න බැහැ.ධර්මාශෝකයේ ආදි ශිෂ්‍යයෝ සිටිනවා.ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු සභාපතිතුමා , සුනිල් හඳුන්නෙත්ති මෙන්ම හිටපු හමුදාපතිවරු 4 දෙනාටවත් ආරාධනා කළේ නැහැ.ජෙනරල් එන්.ඩි ප්‍රනාන්දු,සරත් ෆොන්සේකා මහතා, එයා වයිෂ් මාෂල් ආදි හිටපු හමුදාපතිවරු 4 දෙනටත් ආරධනා කළේ නැහැ. ඒ අයත් ආදි ශිෂ්‍යයෝ විදියට මෙයට සහභාගී වෙන බව තමයි කිව්වේ.නාවික හමුදාපති එන රැස්වීමේ පුටු 12ක් 16ක් වෙන්කරන්නේ නැහැ. පුටු 6කි. ඒ එගොල්ලන්ගේ ක්‍රම වේදය එම පුටු 6ට ධර්මාශෝක විද්‍යාලයෙන් සහභාගී කරවිමට පුළුවන් ඉහළම 6 දෙනා ඒ සඳහා සහභාගී කරවනු ලැබුවේ.දේශපාලන අධිකාරිය සහභාගී කරනවා නම් පුටු 12ක් 13 ක් දැමිය යුතුයි. මේ මතය නෙමේ මා ප්‍රකාශ කරන්නේ . ඒ සිදුවූ දෙයයි මා පවසන්නේ. අපි ගරු මන්ත්‍රීවරුන් වශයෙන් අපිට භූමිකාවක් තිබුණා.මා එතුමාට කිව්වා මෙහි ගරු සභාපතිතුමාට මෙහි අවසරයක් තිබිය යුතුයි කියා.ඇත්ත කතාව .මා පුද්ගලිකව ගරු සභාපතිතුමාටයි ලේකම්තුමියටයි ධර්මාශෝක

විද්‍යාලයේ සංගීත ප්‍රසංග වලදි ආරාධනා කර තිබෙනවා. එහෙම කතා කරන්න එපා.එම ගෞරුත්වය අපි දී තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔයා ගැන නෙමේ කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නැහැ මා කියන්නේ මා ගැන නෙමේ. ධර්මාශෝකය ගැන මේ කියන්නේ. වැරදි වැටහිමට යන්න එපා. එහෙම දෙයක් නෙමේ. මා විදුහල්පතිතුමාවත් , මෙතුමා විදුහල්පතිතුමාවත් නෙමේ මේ තීරණ ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

කමිටුවේ ඉන්නෙත් ඔබතුමාලා නේද? ඉතිං ඔබතුමාලා කමිටුවේ සිටිද්දිත් ඇයි නගර සභාවට මේ සඳහා ආරාධනා නොකළේ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නගර සභාවේ තීරණ තින්දු ගනු ලබන්නේ ගරු සභාපතිතුමානේ . ඒ වගේ ඒ කමිටුවේ සභාපතිකෙනෙක් සිටිනවා. අපිට කැගසා මෙය කරන්න ඕනම කියන්න බැහැ. එවැනි කමිටු වලිදි අපි අසාගෙන සිටින එක තමයි කරන්නේ.එහිදි අපගේ භූමිකාව ඉතාම කුඩායි.මා කරනු ලැබුවේ මට ලැබුණු අවස්ථාවේදි එම සභාවට ගෞරුත්වය ලබා දෙන එකයි. මට තිබුණේ ස්තුතිය. මා එහිදි අම්බලන්ගොඩ නගර සභාවේ සියළුම දෙනාටම එහිදි ස්තුතිය පුද කර සිටියා. මගේ යුතුකම මා කරනු ලැබුවා. මෙහිදි සියළු දෙනාටම අඩුවක් අපහාසයක් සිදු වුණානම් ඒ අයිතිය තිබෙනවා විවේචනය කරන්න. ඒ සඳහා විදුහල්පතිතුමා , නාවික හමුදාපතිතුමා ඉන්නවා. විරුද්ධත්වය ලිඛිතව ඉදිරිපත් කරන්න . එය කිසිම ගැටළුවක් නැහැ.හැබැයි ධර්මශෝකය කියන්නේ අප සැමදෙනාගේම පාසල.ඊළගට කතා කළා ධර්මාශෝකයට ළමයෙක් දාන්න බැහැ කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ධර්මාශෝකය කියන්නේ අපි සැමදෙනාගේම පාසල. එම පාසලේ වැරදි සිදු වෙනවා නම් කතා කිරිමේ අයිතියත් ගරු මන්ත්‍රිවරුන් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඒ ගැනයි අපි කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔය කමිටුවේ ඉන්න අයගේ නම් ටික බලා කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

විදුහල්පතිතුමා ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක තමයි විදුහල්පතිතුමා දන්නේ නැහැ. මෙතුමා කොපමණ ගෞරුත්වයක් ලබා දි තිබෙනවාද කියා.ඒක තමයි අපිට කියන්න තියෙන්නේ

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

විදුහල්පතිතුමා ඔයාට වඩා හොඳින් දන්නවා. බයවෙන්න එපා. මෙයාගේ ඉතිහාසයම කියායි.මෙතුමා එයා ගෙනා පුද්ගලයා.ඔබතුමා කියනවා එයා දන්නේ නැහැ කියා.එහෙම කතා කරන්න එපා. ඒ ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිවරයා. මට ඔහුගේ භූමිකාව කරන්න බැහැ. මට ඔහු වෙනුවෙන් කඩේ යන්න උවමනාවකුත් නැහැ.මා මේ ගරු සභාව ආරක්ෂා කරනවා. මා මේ ගරු කරනවා සියළු දෙනාගේ අදහස් වලට.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සභාව කෙටි කරන්න . මෙය ඉවර වෙන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

හැබැයි අපිට ප්‍රකාශ කරන්න තිබුණ දේ මාත් ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතාත් මෙයට සහභාගි වුවා. ඔබතුමාලා අපිටත් මෙම භූමිකාව පිළිබඳව අපිටත් ඇඟිල්ල දික් කර තිබුණා. අපිට ගිහින් අඩෝ ගරු සභාපතිතුමා දමන්න ඕන කියා ක්‍රමවේදයක් තිබුණේ නැහැ.මේ සඳහා පුළුවන් සෑම අවස්ථාවකම අපි එම අවස්ථාව ගනු ලැබුවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා මෙය කියෙව්වාට . මේ වන විට මෙය ලබා දී ඇත. සභා අනුමතියට යටත්ව ලබා දී තිබෙනවා.මා මෙය ගෙන එනු ලැබූ පුද්ගලයාට කිව්වා ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා මගේ බොස් නෙමේ කියා ප්‍රකාශ කරන්න.මෙය නොමිලේ දෙන්න. මේ සඳහා රුපියල් දහයක් පමණයි අය කරන්නේ. කොඩි කණු 50 ට රු.500/= කි. මෙය නොමිලේ දෙන්න පුරුද්දක් වශයෙන් එම මුදල කපා දැමීමට මට පුළුවනි.මා මෙම මුදල් කැපීමේදී ඔබතුමාලාගෙන් අනුමතිය ඉල්ලා සිටිනවා. මුදල් කපා හැරීමේදී රුපියලක් හරි කපා දමන විට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා. මීට පසු එවනවා නම් ඔය ආදී ශිෂ්‍ය මහත්වරු දෙදෙනාම ගොස් පවසන්න සභාව පැවැත්වීමට කලින් ඉල්ලා සිටින්න කියා. එවිට සභාවට දමා දෙන්නම් කියා. එවිට විදුහල්පතිතුමාට තෙරේවි අනෙක් ගරු මන්ත්‍රීවරුන්ගේ වටිනාකම තේරුම් ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා අපගේ අප්‍රසාදය පල කර ලිපියක් යවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

වටිනාකම තේරුම්ගෙන ඔය උත්සවය නෙමේ උත්සව සියල්ලට ආරාධනා කර තිබෙනවා. එහෙම කතා කරන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

දැන් ඊයේ පෙරේදා දේවානන්ද විද්‍යාලයේ උත්සවයකට ඔබතුමාට ආරධනා කළා නේද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මාට ආරාධනා කල සිටියා.

**තීරණය**

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයට 2019.02.02 දින පැවැත්වෙන නිවාසන්තර නෙට්බෝල් තරගාවලිය සඳහා අවශ්‍ය වන කොඩි කණු 50ක් හා පතාක කොඩි 25 ප්‍රමාණයක් නොමිලේ සභා අනුමතියට යටත්වලබා දී ඇති බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලද අතර මේ සඳහා ධර්මාශෝක විද්‍යාලයට විරෝධතාවය පල කර ලිපියක් යැවිය යුතු බවව ගරු සභාවේ තීරණය විය.

## 12.10 පුද්ගලික ලිපි ගොනු විෂයභාර නිලධාරි මහත්මියට එම විෂයට අදාලව නිතර ලිපි යැවීමට සිදු වන බැවින් පරිගණකයක් හා මුද්‍රණ යන්ත්‍රයක් ඉල්ලා ඇති ලිපියට සභා අනුමතිය ලබා ගැනීම.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

01/02 විෂයට අදාලව විශාල වැඩ කොටසක් කිරීමට තිබුනද පරිඝණයක් හා ප්‍රින්ටරයක් නොමැති වීම මත එම වැඩ කිරීමට නොහැකි වී ඇත. එබැවින් ඉතා ඉක්මනින් පරිඝණකයක් හා ප්‍රින්ටරයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.පෞද්ගලික ලිපි ගොනු කරන නිලධාරි මහත්මිය විසින් මෙම ඉල්ලිම කර ඇත.මෙය ලබා දෙන්න.

**තීරණය**

පුද්ගලික ලිපි ගොනු විෂයභාර නිලධාරි මහත්මියට එම විෂයට අදාලව නිතර ලිපි යැවීමට සිදු වන බැවින් පරිගණකයක් හා මුද්‍රණ යන්ත්‍රයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## 12.11 අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ 2019.02.08 දින පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා නොමිලේ කොඩි කණු 25ක් ඉල්ලා ඇති ලිපියට සභා ගත කරන ලදි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය , විසින් 2019.02.08 දින පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා නොමිලේ කොඩි කණු 25ක් ලබා ගැසිම සහ දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවල ලද ලිපිය සභාගත කරන ලදි.

**තීරණය**

අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ 2019.02.08 දින පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා නොමිලේ කොඩි කණු 25ක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## 12.12 බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය වෙත බදු දීමේ බදු ගිවිසුම 2019/01/31 දිනෙන් අවසන් වන බැවින් ගිවිසුම අළුත් කිරීම සම්බන්ධ ලිපිගොණුව සභා ගත කරන ලදි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය වෙත බදු දීමේ බදු ගිවිසුම 2019/01/31 දිනෙන් අවසන් වන බැවින් ගිවිසුම අලුත් කිරිමට සභා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මෙම බැඩ්මින්ටන් සංගමයේ ඔවුන්ගේ අයවැය වාර්තාව ඉදිරිපත් කරන්න කියා ගරු සභාවෙන් එදා ඉල්ලිමක් කළා. ඒ අනුව අයවැය වාර්තාව ඉදිරිපත් කර ඇත.. මෙය වැඩක් නැහැ. මෙය මේ විදියට බදු දිමට කටයුතු කරන්න.

තීරණය -

අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණයේ ගිවිසුම් කාලය 2019/01/31 දිනෙන් අවසන් වුවත් එම ගිවිසුම නැවත අලුත් කර 2019.04.30 දක්වා මාස 3 ක කාලයක අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩා සංගමයට බදු දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.13 පියුමිකා සඳමාලි මිය විසින් පොල්වත්තඕකන්ද හෙරලියගහගොඩැල්ල නැමති ඉඩමේ අංක 10 දරණ බිම් කොටසේ නිවසක් ඉදිකිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ , පොල්වත්ත, ඕකන්ද හෙරලියගහවත්ත අංක 10 දරණ ඉඩම නගර සභාව සතු දේපලක් බැවින් එම ඉඩමේ ඊ. පියුමිකා සඳමාලි මහත්මිය විසින් ඉදිකර ඇති අනවසර ඉදිකිරිම කඩා ඉවත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**12.14 අම්බලන්ගොඩ, පොල්වත්ත, ඕකන්ද , නො .06, හි පදිංචි කේ.එම්. සමන්ත මහතා විසින් අනවසර ඉදිකිරිමක් දැනුම්දිම හා එය වැලැක්විම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ , පොල්වත්ත, ඕකන්ද හෙරලියගහවත්ත අංක 10 දරණ ඉඩම නගර සභාව සතු දේපලක් බැවින් එම ඉඩමේ ඊ. පියුමිකා සඳමාලි මහත්මිය විසින් ඉදිකර ඇති අනවසර ඉදිකිරිම කඩා ඉවත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**12.15 අම්බලන්ගොඩ නගර සභාව සතු පහත අංක දරණ ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදි ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරීම සඳහා සභාවේ අනුමතිය ලබා ගැනිම සම්බන්ධ ලිපි ගොණුව සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාව සතු පහත අංක දරණ ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදි ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරීම සඳහා සභාවේ සභාපති , ලේකම් හා ගණකාධිකාරිට ( ගණකාධිකාරි පුරප්පාඩු පවතින අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානි ) බලය පවරන්න කියා ඉල්ලිමක් කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මා පොඩි යෝජනාවක් කර සිටිනවා. අපිට ලැබෙන ප්‍රේෂණ පත් අපිට පුළුවනි මනි මාර්කට් ගිණුමක තැන්පත් කිරිමට. එම ගිණුමක තැන්පත් කළ විට වසරක් බැලුවොත් එම වසරේ 10% තැන්පතු ගාස්තු ගියත් නගර සභාවක් විදියට ලක්ෂ 300 ක් පමණ අපි තැන්පත් කරනවා.මෙම ලක්ෂ 300 ක් කියන්නේ අපිට ලක්ෂ 100 ක් නිකම්ම ලැබෙනවා. මා යෝජනා කර සිටිනවා මෙම ගිණුමක් ආරම්භ කරන්න කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙම යෝජනාව කවුරුහරි ස්ථිර කරන්නකෝ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කර සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි කලින් ආයෝජනය කරනු ලැබුවේ භාණ්ඩාගාර බිල්පත් වලයි. ඒ ආයෝජනය කර විට රජයේ මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරන්න එපා කිව්වා. මොකද මේ රජයේ මුදල්ම තමයි රජයට දමා ලබා ගන්නේ .එසේ කරන්න එපා කිව්වා. මීට වඩා ලාභදායි වෙනවා මනි මාර්කට් ගිණුමක තැන්පත් කිරීමෙන්. සමහර අවස්ථාවලදි පෞද්ගලික ආයතන වලින් මුදල් ඉල්ලා සිටිනවා . අපි ශ්‍රී ලංකා මහ බැංකුවෙන් විමසීමක් කරනු ලැබුවා අපගේ මුදල් මේ විදියට ආයෝජනය කිරීම හොඳද කියා.ඔවුන් උපදෙස් දෙනු ලැබුවේ එවැනි පෞද්ගලික ආයතන සමඟ ගණුදෙණු කරන්න යන්න එපා කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ඔබතුමාට මා කිව්ව දෙය තේරුනේ නැහැ.මා කිව්වේ අපේ නගර සභාවේ චෙක්පත් ප්‍රේෂණ පත් ලියන ලද මුදල් යම් කාල වකවානුවකට අපගේ ජංගම ගිණුමේ තිබෙනවා.එම මුදල් ජංගම ගිණුමේ තිබ්මෙන් අපට කිසිදු ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැ. මා ව්‍යාපාරිකයෙක් විදියට මා මනි මාර්කට් ගිණුමක වසරකට ලොකු ආදායමක් ලබනවා. මට ලැබෙන සියළුම ප්‍රේෂණ පත් මා මනි මාර්කට් ගිණුමට තැන්පත් කරනවා. ජංගම ගිණුමේ බද්ධ කරනවා.එවිට ජංගම ගිණුමේ බද්ධ කරනවා. මනි මාර්කට් ගිණුමේ 25000 ක් තිබියදි මා ලියන හැම ප්‍රේෂණ පතකටම මුදල් යනවා මනි මාර්කට් ගිණුමට. එවිට වර්ෂයක් බැලුවාම මනි මාර්කට් ගිණුමේ මුදලට පොළියක් ලැබෙනවා. අපි සිතන්නේ නැති ලොකු පොළියක් අපට ලැබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එයට පොළියක් ලැබුණට එය නිත්‍යානුකුලද ?

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

නැ. නිත්‍යානුකුලව ඇයි බැරි . කොහේවත් බැංකුවල මෙය සිදු කරන්නේ නැහැ. අපිට ලැබෙන් ප්‍රේෂණ පත අපි දමනවා මනි මාර්කට් ගිණුමට. එම ගිණුමට දැම්මාම අපි බද්ධ කර තිබෙන ජංගම ගිණුම හරහා ප්‍රේෂණ පත් නිකුත් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

අපිට ලැබෙන මුදල් වලින් හරි මොනවා හරි වලින් ලැබෙන ප්‍රේෂණ පත් වලින් මසකට ලක්ෂ 200ක් . එම ලක්ෂ 200 න් ඔබතුමා අත්සන් කරනවා ලක්ෂ 80 ක් ගෙවීම්. ලක්ෂ 120 ක් අර ගිණුමේ තිබෙනවා. හැබැයි ජංගම ගිණුමෙන් සතපහක අපිට පොළියක් නැහැ. වසරකට ලක්ෂ 120කට මනි මාර්කට් ගිණුමෙන් ජංගම ගිණුමට කොපමණ පොළියක් ලැබී තිබෙනවාද කියා. අපේ තැන්පත් කරන මුදලට ජංගම ගිණුමට පොළියක් ලැබෙනවා. මෙය ලොකු මුදලකි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඊළඟ දේ තමයි ස්ථාවර තැන්පත්වලින් ලැබෙන පොළිය මා දැනට යොදා ගෙන තිබෙන්නේ සේවක ණය ගෙවීම සඳහායි.සේවකයෙකුට අයිතිය තිබෙනවා අදාල ආයතනයෙන් ලක්ෂ 2 ½ දක්වා ණය මුදල් ලබා ගැනීමට.රජයේ සිටින සියළුම සේවකයන්ට රජයෙන් මුදල් ගෙවනවා.පළාත් පාලන ආයතන වල සේවකයන්ට රජයෙන් ගෙවන්නේ නැහැ. එය ගෙවිය යුතතේ අපගේ ගිණුමෙනි. මෙහි පොළි දමා සේවක ණය ගිණුම කියා වෙනම ගිණුමක් තිබෙනවා. මේ අප්‍රේල් මාසයේ සෑම සේවකයෙකුටම රු.10000/= ක මුදලක් ගෙවිය යුතුයි.අප්‍රෙල් මාසයේ උත්සව අත්තිකාරම් ගෙවීමට ලක්ෂ 18 ක් අවශ්‍ය වෙනවා. අපි ලොකු හිර විමක සිටින්නේ. එම නිසා වැඩි වේලාවේදි මෙම මුදල් දමා සේවකයෝ ආරක්ෂා කර ගත යුතු වෙනවා . සේවකයෙකුට ණය දෙනු ලබන්නේ මසයකට එකකි. එයත් අපි 8 වෙනි මසේ 9 මසයේ විතර නවත්වනවා මෙම ලක්ෂ 18ක මුදල ගෙවන්න සිදු වන නිසා. එම නිසා අපි ඒ විදියට කර තිබෙනවා. දැනටත් අපි එක දිගට ගෙව්වා. එසේ ගෙවීමට පුළුවන් වුයේ අපට

කලින් ලැබුණු ලක්ෂ 80ත් සමග ලක්ෂ 20කුත් තව දමා ලක්ෂ 100 ක ස්ථාවර තැන්පතු දමා ඇත. ඉන් ලක්ෂ 3ක පමණ ප්‍රමාණයක මුදල් ලැබෙනවා. අපි එය මේ පැත්තට බැර කර ඔවුන්ගේ මුදල් ගෙවනවා. නැතිනම් අපිට හරි අමාරුයි මෙම කාර්ය කිරිමට.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එය හොඳ විදියකට කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඒ සඳහා ස්ථාවර තැන්පත් කිරිමට එකඟතාවය පල කර සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාව සතු පහත අංක දරණ ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදි ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරීම සඳහා සභාවේ සභාපති , ලේකම් හා ගණකාධිකාරිට ( ගණකාධිකාරි පුරප්පාඩු පවතින අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානි ) බලය පැවරිම සුදුසු බවට ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

1) 035-1-001-2 , 6295234 දරණ පොදු ගිණුම

2) 035100180002102 ප්‍රජා

3) 0351001-0-6295876 ප්‍රාග්ධන

**12.16 අම්බලන්ගොඩ , තල්ගස්ගොඩ , සුදුවැල්ල පාරේ , දෙවන පටුමගේ අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සුදුවැල්ල පාරේ දෙවන පටුමගේ අතුරු පාර අළුත්වැඩියා කටයුතු කිරිමට නගර සභාවට පවරා ගැනිම සම්බන්ධවයි. සුදුවැල්ල පාරේ දෙවන පටුමගේ අතුරු මාර්ගය වැඩි දියුණු කර සංවර්ධන කටයුතු සිදු කිරිමට නගර සභාවට නොමිලේ පරිත්‍යාග කර කැමැත්ත ප්‍රකාශ කිරිමේ ලිපියක් සමඟ ඉදිරිපත් කර ඇත. එය පවරා ගැනිමට අනුමතිය ලබා දෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඔය සුදුවැල්ල පාරේ අතුරු මාර්ගයේ නිවාස 6 ක් පමණ තිබෙනවා. එය පවරා ගන්නා හැටියට ඉල්ලා සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ , තල්ගස්ගොඩ , සුදුවැල්ල පාරේ , දෙවන පටුමගේ අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.17 කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලයේ 2019 වර්ෂයේ ආගමික හාසුහද චාරිකාව සඳහා ප්‍රජා මණ්ඩල ගිණුමෙන් මුදල් නිදහස් කර ගැනීම.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා ඔවුන්ගේ වාර්ෂික ආගමික හා සුහද චාරිකාව පිළිබඳව. ඔවුන් දළදා වහන්සේ වැඳ පුදා ගැනිමටත් කටයුතු සූදානම් කර තිබෙනවා. එ අයගේ ගිණුමෙන් සෑම වර්ෂයකම අපි මුදල් ලබා දෙනවා. ඔවුන් පවසා සිටිනවා රු.30400/=කට ආසන්න මුදලක් එම ගිණුමේ පවතින බව. ඒ සඳහා 62කු සහභාගි වන අතර රු.210000/= ක ඇස්තමේන්තුවක් මේ සඳහා ඉදිරිපත් කර ඇත. ඔබතුමාට එම ලිපිය එවා තිබෙනවා. ඒ සඳහා මා සභා අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය ප්‍රජා සංවර්ධන නිලධාරිගේ වාර්තාවක් සමඟ ගරු සභාවට ඉදිරිපත් කරන්න.

**තීරණය -**

කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය 2019 වර්ෂයේ ආගමික හා සුහද සමුහික චාරිකාව සඳහා ප්‍රජා මණ්ඩලයේ ගිණුමේ ඇති මුදල් නිදහස් කිරිමට ප්‍රජා සංවර්ධන නිලධාරිගේ වාර්තාවක් ලබාගෙන ඊළඟ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.18 ගරු විලේගොඩ අරියදේව ස්වාමින් වහන්සේ විසින් විනෝද බදු නිදහස් කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

විලේගොඩ ආරියධම්ම ස්වාමින් වහන්සේ ඉල්ලිමක් කර සිටිනවා ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලිමක කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ පිළිබඳ ඔබතුමාත් දන්නවා ඇති. නිතර නිතර විහාරස්ථානයට නිතර නිතර යන නිසා . මගේ ප්‍රතිපාදන වලිනුත් මා විහාරස්ථානයට ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවා. බෞද්ධ කටයුතු අමාත්‍යාංශයෙන් ඉල්ලිමක් කර මා තව මුදලකුත් ඉල්ලා ඇත. අපේ ගරු ආරියධම්ම ස්වාමින් වහන්සේ ආගමික කටයුතු සහ අම්බලන්ගොඩ කැටයම් ශිල්පය ආරක්ෂා කර ගැනිම සඳහා විශාල දායකත්වයක් සපයන ස්වාමින් වහන්සේ නමකි. මා සිතනවා මේ සඳහා කිසිම මන්ත්‍රිවරයෙකු විරුද්ධවන එකක් නැහැ. මේසඳහා නගර සභාවක් විදියට අපට දියහැකි උපරිම සහායෝගය සහ එම නිදහස් කිරිම් කර දෙන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ විහාරස්ථානයට ගියාම විශාල වැඩ කොටසක් අපි දකිනවා . එම ස්වාමින් වහන්සේ ඉල්ලා සිටින ඉල්ලිම ඉෂ්ඨ කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ගරු ස්වාමින් වහන්සේ විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා එම විහාරස්ථානයට අධාර පිණිස පවත්වනු ලබන මෙම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරිමට සලකා බලා ඒ පිළිබඳව සහායෝගය ලබා දෙන ලෙසත් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

මාත් ප්‍රකාශ කර සිටිනවා. අපේ ගමේ විහාරස්ථානය සැමදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා මා හට මේ අවස්ථාවට උදවු කරන්න කියා. ගමේ විහාරස්ථානය උදවු කිරිම සඳහා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි අයවැය ලේඛණයේ ප්‍රතිපත්ති තීන්දුවක් ගෙන තිබෙනවා 25% වෙනුවට 10% පමණක් අයකර ගැනීමට. නමුත්

ගරු අරියදේව ස්වාමින් වහන්සේ මෙම ප්‍රදේශයට කරන සේවය සලකා බලා මේ සඳහා අනුමතිය ලබා දෙනවා. එය විනෝද බදු නිදහස් කිරීමෙන් නිදහස් කරන නිර්දේශ කරනවා.

**තීරණය:-**

අමුගොඩහේවා රමිෂා ශාමේන් කුරුකුලවන්ද්‍ර රණවික්‍රම මහත්මිය සංවිධානය කරන 2019.03.09 දින ධර්මාශෝක විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ පැවැත්වෙන සංගීත ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කරන ලෙසට කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම පුරාණ විහාරයේ විලේගොඩ ආරියදේව ස්වාමින් වහන්සේගේ කරන ලද ඉල්ලීමට අනුව විනෝද බදු අයකර එම ප්‍රසංගයේ ශුද්ධ ලාභය හෝ මුළු ආදායමෙන් 40% ක් ශ්‍රී විජයාරාම පුරාණ විහාරයට ලබාදුන් බවට සහතිකයක් ලබා ගෙන විනෝද බදු තැන්පත් මුදල නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා  විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගම්පෙරළිය යෝජනා ක්‍රමයට යටතේ මාර්ග 17 ක් සඳහා ලක්ෂ 97 ක මුදලක් වෙන් කර ඇත. සියළුම කොට්ඨාශ වලට පාරක් එන පරිදි . නගර සභා බල ප්‍රදේශය තුල පාසල් 2 ක් සඳහා වැසිකිළි ඉදිකිරීමට ලක්ෂ 20 ක මුදලක් වෙන් කර ඇත.නගර සභා ප්‍රදේශයේ කාණු පද්ධති ඉදිකිරීම සඳහා ලක්ෂ 33 ක මුදලක් වෙන් කර ඇත.ඊළඟට ළමා උද්‍යාන 2 ක් සඳහා මේ පිළිබඳව මා ඔබතුමාට දැනුම් දුන්නා.හල්වතුර ක්‍රීඩා පිටියේ ළමා උද්‍යානය සඳහා ලක්ෂ 25 කුත් මහ අම්බලන්ගොඩ ලලිත් මහතාගේ නිවස ඉදිරිපිට ඇති බිම කොටසේ ළමා උද්‍යානය සඳහා ලක්ෂ 25 කුත් ලක්ෂ 50 ක මුදලක් වෙන් කර තිබෙනවා. නගර  සභා බල ප්‍රදේශය තුල තිබෙන විහාර අලුත් වැඩියා කිරීම 3089000 ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ  සංවර්ධන කටයුතු සඳහා සම්පූර්ණ මුදල වන 23890000/= ක මුදලක් වෙන් කර ඇත. මේ පිළබඳ වෙන්කරන ලද කොටස් ඒ සියළු දේවල් සඳහන් කර ඔබතුමාට එවන්නම්. ඔබතුමා එවිට නගර සභාවෙන් මුදල් වෙන් කරන විට ඒවාට වෙන්කරන්න එපා. මෙම මුදල් වෙන් වී අවසන්. මෙම මුදල් තව සතියක් ලැබීමට පෙර ලැබෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. මා එය ලිඛිතව දැනුම් දෙන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලිඛිතව දැනුම් දෙන්න. මීට අමතරව අපට ලැයිස්තුවක්  ප්‍රාදේශීය ලේකම් විසින් එවා තිබුණා . මා එය තාක්ෂණ සේවා වාර්තාවක් සමඟ සභාවට ඉදිරිපත් කරන්න කිව්වා. එය ඉදිරිපත් වුණේ නැහැ මෙතැනට

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් කුලරත්න පාර කාපට් කිරීම  ඉදිරිපත් කළාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මේ පිළිබඳව එකින් එකට කීමට නොහැකිය. මෙම පොතේ පිටු ගණනාවක් තිබෙනවා වෙන් කර . එකින් එක කියන්න වෙනවා. මා පසුව ගරු සභාපතිතුමාට ලිඛිතව එවන්නම්. මාර්ග මොනවාද ? කාණු මොනවාද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ ඒ ලැයිස්තුවක් ප්‍රාදේශීය ලේකම් විසින් ඒවා තිබුණා. සමහර විට ඒ ලැයිස්තුවේ සමහර දේවල් දැනටත් අපි කරලා ඉවරයි. අපි එවා බලා දැනුම් දිය යුතුයි ඒ වෙනුවට වෙනත් දේවල් ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

සංශෝධන කිරිමට නොහැකිය. ඊළගට පොදු කරුණු යටතේ මා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. සභාවාර කිහිපයක කතා කළා පුස්තකාලයේ වැසිකිළිය සැදිම සම්බන්ධව. කරුණාකර පුස්තකාලයේ වැසිකිළිය අළුත්වැඩියා කටයුතු සිදු කරන්න. කුමන හෝ මුදලක් වෙන්කර . මෙය ඉතාම අත්‍යවශ්‍ය දෙයකි. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ලංකාවේ සියළුම නගර සභාවල ප්‍රාදේශිය සභාවලසියළුම වාහන වල ස්ටිකර් එකක් ඇත. මේ අම්බලන්ගොඩ නගර සභාව ලෙස සඳහන් කරන්න. මා ඉල්ලිමක් කර සිටිනවා නගර සභාව සතු සියළුම වාහන වල අම්බලන්ගොඩ නගර සභාව කියන වචනය ස්ටිකර් කර අලවන්න. මාගේ පොඩි විරෝධතාවයක් ඔබතුමාට ප්‍රකාශ කර සිටිනවා මේ ක්‍රිඩා පිටියේ තිබුණා ගරු ජී.එම්.එස් මැතිතුමාගේ කාලයේ තබන ලද මුල් ගලක්. අලුතින් මුල් ගල තබනා විට එම මුල්ගල ඉවත් කර ඇත. මෙය වැරදි පූර්වාදේශයකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි කිසිම ඉවත් කිරිමක් කර නැත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

නැහැ එහි මුල්ගල තිබුණා. එය ගලවා ඉවත් කර ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි පැමිණෙන විටත් මෙම තාප්පය ඉදිකර තිබුණා.නිලධාරි පාලන කාලයේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මා දකිනා විටත් එහි මුල්ගල තිබුණා. එවැනි දේවල් කරන්න එපා. එය වැරදි දෙයකි. ඔබතුමාගේ වකවානුවේ ඔබතුම සාදන දෙයක ගලක් ඉවත් කර අලුතින් එන අය එම ගල ඉවත් කර අළුතින් සැදිම සම්පූර්ණයෙන්ම නිතිවිරෝධි සාධාචාර විරෝධි දෙයකි. මා ඉල්ලා සිටිනවා මෙම ඉවත් කරනු ලැබු ගල නැවත සවි කරන ලෙස. මා කලින් සභාවෙන් ඉල්ලා සිටියා තවකාලිකව බඳවා ගත් සේවකයන් පිළිබඳව ලේඛණයක් සභාවට ඉදිරිපත් කරන්න.එ අය යොදවා ගනු ලබන්නේ මොන මොන රාජකාරිවලට ද කියා විස්තර සපයන්න. එම සේවකයෝ රාජකාරියට යාමට ප්‍රථම අභිලි සලකුණු හෝ ආරක්ෂක අංශයේ පොතක අත්සන් තැබිය යුතුයි කුමන රාජකාරි සඳහා යනවාද කියා. ඊළඟ කරුණ නම් අර ආරක්ෂක අංශයේ ඩිසල් සොරකමක් වුණා. සාමාන්‍යයෙන් සොරකමක් සිදු වුණාම එයට ගත යුතු ක්‍රියා මාර්ග නොගත්තාම මෙම කාර්ය කර ගැනිමට නොහැකි වෙනවා. අපි අවංකව සේවය කරන පුද්ගලයා අවංකව සේවය කරන්නේ නැති වෙනවා එයට අදාලව කටයුතු නොකළහොත් . කරුණාවෙන් ඉල්ලා සිටිනවා.ආරක්ෂක අංශයේ ස්ථාන භාර නිලධාරියා ඔහුගේ රාජකාරිය හරියට ඉටුකර ඇත. ඔහුගේ රාජකාරිය ඉටු කර තිබියදිත් ඔහු අපහසුතාවයට පත්වෙන විදියට වැඩ කරන්න එපා. මොකද සමහර නගර සභා සේවකයෝ බිමතින් පැමිණ ස්ථාන භාර නිලධාරියාට තර්ජනය කරනවා. එවැනි තත්වයකට පත් කරන්න එපා. එසේ සිදුවුණොත් ගරු මන්ත්‍රිවරුන් විදියට මේ සභාවේ යම්කිසි තිරණ තින්දුවලට යාමට සිදු වෙනවා. අදාහානාගාරයේ දොර බිඳ දමා ඇත. මම නම් කරන්න කැමති නැහැ. ප්‍රධාන දොරේ මත්පැන් පානය කර තමයි මෙය බිද දමා ඇත්තේ . ඔබතුමා මේ පිළිබඳ සොයා බලන්න. සභාවේ කියන්නේ නිතර ගැවසෙන කෙනෙකු තමයි බිමතින් මෙය සිදු කර ඇත්තේ. එවැනි දේවල් සිදු වුණාම සොයා බලා කටයුතු කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය පිපිරිමකින් සිදු වුණේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

නෑ අතින් ගසා මෙය බිඳ ඇත්තේ බිමතින්. ඔබතුමා සොයා බලන්න. මා කියනනේ නැහැ කරුණු. මා කලින් අවස්ථාවේත් සඳහන් කළා . අපි ක්‍රීඩා පිටිය සැදීමට කටයුතු සිදුකරනවා සේම අපගේ නිලධාරින්ට පහසුවෙන් වැඩ කටයුතු සිදු කිරිමට මෙම නගර සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ගත යුතුයි. මා ලක්ෂ 238 ක් මට ලැබුණු පලමු පියවරෙන්. මට ලැබුණු ලක්ෂ 2000න් .  අපගේ නගර සභා බල ප්‍රදේශයට මුදල් වෙන් කර ඇත. තව මාස 3 කින් තව මුදලක් මා හට ලැබෙනවා. එයිනුත් මා නගර සභා කොටසට මා යම්කිසි සාධාරණ කොටසක් වෙන් කරනවා. මා සහායෝගය දෙනවා නගර සභා බල ප්‍රදේශය තුල වැඩ කටයුතු සිදු කිරිමට. ඔබතුමා බලන්න අපේ නගර සභාවේ නිලධාරින්ට වැඩ කිරිමට සුදුසු පරිදි මේ නගර සභා ගොඩනැගිල්ල අළුත්වැඩියා කර දෙන්න. අපි සහායෝගයෙන් වැඩ කිරිමට කටයුතු කරන්න. අපගේ නිලධාරින් ඒ පහසුකම් තුල වැඩ කටයුතු සිදු කළ යුතුයි. අපිටත් කනගාටුයි නිලධාරින්  ටික එකට ගුලි වි වැඩ කටයුතු සිදු කරනවා. ඒ අයට මේ නිසා වැඩ කිරිමේ තිබෙන අවශ්‍යතාවය අඩු වෙනවා. එම නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්න. ඔබතුමාට කතා කළ පරිදි මා මානාන ක්‍රීඩා පිටියට අපේ ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ක්‍රීඩා මණ්ඩපය සහ ඉදිරි කටයුතු සිදු කරගෙන යාම සඳහා මුදලක් ලබා දිමට අනුමතිය ලබා දුන්නා. තව කොපමණ මුදලක් වෙන් කළාද කියා මා තවම දැනුවත් වුයේ නැහැ. තව සති 2-3 කින් ඒ වෙන්කරන ලද මුදල හා කරන්නට ඇති වැඩපිළිබඳව ගරු අමාත්‍යතුමාගෙන් දැනගන්නට ලැබුණු පසු දැනුම් දෙන්නම්. අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා ගරු මන්ත්‍රිවරයෙක් මේ සභාවේ යම්කිසි යෝජනාවක් ඉදිරිපත් කළාම ඒ යෝජනාවේ ගරු මන්ත්‍රිවරු ඒ පිළිබඳ අදහස් දක්වා සමහර අවස්ථාවල ඡන්දයකට ගොස් එය විසඳන්න වෙයි. ඒ අවශ්‍ය වුණාම සියළු ගරු මන්ත්‍රිවරුන්ගේ ආත්ම ගෞරුත්වය තබා ගෙන ඒ ඉදිරිපත් කරන ගරු මන්ත්‍රිවරයාගේ යෝජනාව යම් අඩුපාඩු තිබෙනවා නම් එම අඩුපාඩු පෙන්වා දි ඉදිරිපත් කරන ගරු මන්ත්‍රිවරයාට මේ සභාවේදි අපවාද, අපකිර්තියට පත්වෙන විදියට අදහස් හා වචන පිට කරන්න එපා කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද අපි සියළුම ගරු මන්ත්‍රිවරුන්ගේ ආත්ම ගෞරුත්වය අපි ආරක්ෂා කර ගත  යුතුයි. අපි මහජන නියෝජිතයෝ. මා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරමින් අපි පක්ෂ පාට භේදයකින් තොරව සයළුම ගරු මන්ත්‍රිවරුන් මේ නගරය ගොඩ නැගිම සඳහා ඇපකැප වෙනවා. මට ලැබෙන ප්‍රතිපාදන ආසනයේ සංවිධායක වරයා විදියටත් සංවර්ධන කමිටුවේ  සභාපතිවරයා විදියටත් මා උපරිමයෙන් සහායෝගය දක්වනවා. අපි සහායෝගයෙන් වැඩකටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ  මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , පෙත්සම් කාරක සභාව සම්බන්ධව මේ කියන සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් සවස 2.00 සිටම මෙහි සිටිනවා. පින්නදුව තොටුපොළ පර සම්බන්ධයෙන් ඔබතුමා පසුගිය දා පෙත්සම් කාරක සභාවට මුහුණ දුන්නා. එහිදි තින්දුව දි තිබෙනවා සියළුම පාර්ශවයන් කැඳවා ඔවුන්ගේ එකඟතාවය ලබා ගෙන පාරේ කටයුතු කරන්න කියා. අපි ඉල්ලා සිටිනවා කාරක සභා තත්වයට හරි ගරු සභාව පත්කර ඔබතුමා ඇහුම්කන් දෙන ලෙස.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප්  මහතා කතා කරමින්**

මෙයට විස්තර ලබා ගෙන මේ සඳහා දිනයක් ලබා දිමට මා තාක්ෂණසේවා නිලධාරි මහතාට යොමු කර ඇත. ආරධනා කළ යුතු අය කවුද කියා ලැයිස්තුවක් ලබා දෙන්න ගරු මන්ත්‍රිතුමනි. අපි එය ලබා දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , දෙපැත්තම මේ සඳහා කැඳවන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප්  මහතා කතා කරමින්**

දැන් මේ විදියට කරන එක වැරදියි. පෙත්සම් කාරක සභාවි නියෝගයක් තිබෙන්නේ මට. ඒ අයට මා විධිමත්ව ආරාධනා කළ යුතුයි. ඒ අයගේ ලිපි ලේඛණ තිබිය යුතුයි. එම ලිපි ලැබුණු බව මා සඳහන් කළ යුතුයි. එහිදි ගනු ලැබු තින්දුව අපි අත්සන් කළ යුතු වෙනවා.ගරු මන්ත්‍රිතුමා මුලින් පාරේ ලේඛණය ඉදිරිපත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

දෙවන කෙටි කරුණ . පසුගිය දා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදි ශ්‍රී ලංකා සාම සංගමය විසින් කිර්ති ශ්‍රී දේශබන්දු විද්‍යා විශාරද කියා සමස්ත ලංකාවෙන්ම 50 කු අභිමානයට පත් කළා. ඒ 50නා අතුරින් මේ සභාවේ සිටිනවා අපේ ගරු නගර සභා මන්ත්‍රිනි නිතිඥ ඒ.පි. ලක්ෂ්මි ද සිල්වා මැතිණිය.එතුමියට සුභ පැතුම් එක් කරන්න මේ ගරු සභාවේ අවස්ථාවක් උදා කර ගන්නවා. අපගේ රිගල් සිනමා ශාලාව ඉදිරිපිට පාළුවුණ කඩ කාමර 4ක් තිබෙනවා. අප පින්නදූව ප්‍රදේශයේ පදිංචි පි.එච්.ඩි මාලිනි මහත්මිය විසින් ඉල්ලිමක් කර තිබෙනවා. බොහොම අයුතු විදියට රු.75000/= ක මුදලකට මේ සඳහා තක්සේරු කර ඇති බව. එහි එක කඩ කාමරයක ඇඹරුම් කම්හලක් පවත්වා ගෙන යනවා. ඇය මේය ගෙවන්න සුදානම්. සහන පදනමක් යටතේ මෙය ලබා දෙන ලෙස.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඒ කියන්නේ ඔය වරිපණම්ද ? ගරු මන්ත්‍රිතුමා වරිපණම් අඩු කිරිමේ බලයක් සභාවට නැහැ.එය සිදු කරන්නේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙනි. ඒ සඳහා අභියාචනයක් ඉදිරිපත් කරන්න. අපි එය තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන්නම්.දැන් ඒ සඳහාත් ප්‍රමාදයි.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

දැන් මෙය ගෙවන්න වෙනවාද

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

කොහොමත් ගෙවන්න වෙනවා. අපිට මෙය ඉවත් කරන්න බැහැ. එය රජයේ අරමුදලක්. එම අරමුදල් නගර සභාවට ලබා දි තිබෙනවා. ඒම මුදල් පාවිච්චි කර නගරය දියුණු කිරිමට.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

මගේ කොට්ඨාශයේ එස්.එම්. ස්වර්ණලතා මහත්මිය විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ATD/09/02/2009 ඔප්පු සාරාංශ පොර්මය සම්බන්ධව කියා. මෙම ඉඩම එක්කොටි ගණනක මුදලකට තක්සේරු කර තිබෙනවා.අම්බලන්ගොඩ නගර සභාවේ තක්සේරුව. මෙම ඉඩම මිලදි ගෙන ඇත්තේ ලක්ෂ 34 ක මුදලකට.මෙම ඉඩම වගුරු බිම සහිත ඉඩමකි. පොරුක් ඇළත් සමඟ සම්බන්ධ වි ඇත. ගංවතුරට යට වෙනවා.එසේම අපගේ හල්වතුර යෝජනා ක්‍රමයේ කුණු දමා තිබෙනවා දිගටම.තුනිකරනි විට ගඳේ ඉන්න බැහැ. මෙම ඉඩම විකිණිමට බැහැ. මෙම තක්සේරු වටිනාකම ඇත්තටම වැඩියි. මේ ළඟදි හිටපු නගර සභා මන්ත්‍රී බර්ට්‍රි රණසූරිය මහතාගේ ඉඩම විකුණනු ලැබුවා.එම තක්සේරුව අනුව තමයි පසුව දමා තිබෙන්නේ. ලක්ෂ 2 ½ තියා ලක්ෂ 1 ½ ටවත් විකිණිමට නොහැකිය මෙම ඉඩම.තනිකර ගඳයි. එම නිසා එන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

තක්සේරු පැනවිමේ ඉන්න අපේ බලය ආදායම් පරික්ෂක .ඒ මහතා මා මුණ ගැසුනාම මා කතා කර මා කිව්වා ඔයාගේ තක්සේරුව වැඩියි. මෙය පොඩ්ඩක් අඩු කරන්න. ඒ මහතා අඩු කර තිබුණා ලක්ෂ 2ක පමණ මුදලකට.එයටත් විරෝධතාවය දෙනවා නම් අපිට රජයේ තක්සෙරු දෙපාර්තමේන්තුවට යවන්න පුළුවනි එවිට ඔයිට වැඩියේ වැඩි වෙන්න පුළුවනි.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ ඉඩම සම්බන්ධව

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි ගරු මන්ත්‍රීවරයෙකුට තක්සේරු කිරීමේ බලයක් නැහැ.එක්කෝ ආදායම් පරිපාලක මහතා තක්සේරු කළ යුතුයි. නැතිනම් තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කළ යුතුයි.එයට විරුද්ධ නම් අපි තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කරන්නම්. හැබැයි මතක තියා ගන්න එම මුදල ඔය මුදලට වඩා තවත් වැඩි විය හැකියි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

පසුගිය දිනවල තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පැමිණ කරන ලද තක්සෙරු මුදලේ ගණන වැඩියි තමයි.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**

මීට වසර 4 කට 5කට ඉහදි මෙම ඉඩම කොඩස් කිරිමේදි 1% ක බදු මුදලද නිදහස් කර ඇත.ඇත්තටම එයා විකුණලා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙම සිද්ධිය මා දන්නවා. අපිම තමයි ඒ වේලාවේ 1% ගාස්තු නිදහස් කරනු ලැබුවා.ඒ කියන්නේ දරුවන් අතර බෙදිමකදි එම ගාස්තු නිදහස් කළා.එහි යටින් ගසා තිබෙනවා එම කොටස් අයිති කාටද කියා. නමුත් ඔවුන්ගෙන් හැර විකිණිමක් සිදු වෙනවා නම් එම ගාස්තු නිදහස් කිරිමක් සිදු නොකර එම මුදල අයකරගන්නවා. ඒ අවස්ථාවේ සලකුණු ලබන්නේ ඒ අවස්ථාවේ තිබෙන වෙළඳ වටිනාකමයි.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි අන්න එයයි මට තිබෙන ප්‍රශ්නය . එහෙත් එදාට තිබෙන වටිනාකම කියා කොහේවත් නැහැ. මා දකින්නේ මේ වරද සිදුවුණු දවස තමයි දවස . අපේ නගර සභාවට අයවිය යුතු වන්නේ එදිනටයි. එදිනටයි මේ තක්සේරුව

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ ඊට පසුව තමයි මෙය විකුණා ඇත්තේ.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**

එක හරි අපි හිතමු මෙය වසර 2 කලින් කියා ගනු ලැබුවේ . ඒ ගත්ත වේලාවේ තක්සේරුව තමයි ලක්ෂ 2

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙයට හොඳම දේ මා තක්සේරු දෙපාර්තමේන්තුවට යවන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**

මා නගර සභාව පැත්තේ මෙහිදි සිටින්නේ . හැබැයි පොදු මහජන තාවට සාධාරණත්වයක් ඉටු වෙන්නත් ඕනැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය තක්සේරු දෙපාර්තමේන්තුවට යැව්වොත් ඔබතුමා තේරුම් ගන්න මෙය. ඔය තක්සේරු මුදල ඊටවඩා වැඩිනම් මිසක අඩු වෙන්නේ නැහැ.ඔය ඉල්ලීම නිසා මා අඩු කළා. එම නිලධාරියාට කියා මා අඩු කළා.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි මෙම ඉඩම පිහිටීම සම්බන්ධයෙන් බැවුමක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි ඒ සියල්ල ලියා ඔහු අඩුකර තිබෙනවා. නැවත තුන්වෙනි වරටත් මට මෙය අඩුකරන්න කියන්න බැහැ නිලධාරියෙකුට.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා මහතා කතා කරමින්**

සාධාරණ නැහැ එම තක්සේරු වටිනාකම.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා මහතා කතා කරමින්**

පොදු කරුණකට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. සමහර නගර සභාවේ සිටින සේවකයෝ ඒ අයට රියදුරු බලපත්‍රයක් නොමැත. ඒ අය රියදුරන් නෙමේ . නමුත් රාත්‍රී කාලයේදී පැමිණ නගර සභාවේ තිබෙන වාහන ගෙන යනු ලබනවා.මෙය කාගේ දැනුවත් කිරිමක් මත ගෙන යනු ලබනවාද ?ඒ පිළිබඳව IB සටහනුත් ඇත. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. මොකද එසේ සිදු වීමෙන් බරපතල ප්‍රශ්නයකි. උදාහරණයකට JCB යන්ත්‍රය බිලා ඇවිත්2018.11.23 දින තව කෙනෙකුට පුරුදු කරනවා.මෙම වාහනයේ අදාල පුද්ගලයා . එම කරුණු ඇත. 2018.12.17 වෙනිදා රාත්‍රියේදී කැබ් රථය රැගෙන යනවා. කිසිම අවසරයක් නැහැ.ඔබතුමා ක්‍රමවේදයක් දමන්න නගර සභාව සතු වාහන කාර්යාල වේලාවෙන් පසු රැගෙන යනවා නම් ඔබතුමා හරි උපසභාපතිතුමා හරි එ අදාල නිලධාරියාගෙන් හරි අවසරය ලබා ගැනිමට කටයුතු කරන්න ගේට්ටු අවසර පත්‍රයක් ලබා දීමෙන් . නැතිනම් ඔය කැබ්රථයක් රැගෙන ගිහින් යටවෙලා මනුෂ්‍යයකු මියගියහොත් ඒ ගෙනියම පුද්ගලයා ගැලවෙයි. එයට ඔබතුමාත් ලේකම්තුමියත් ඔය වගකිව යුතු නිලධාරියාත් එයට වගකිව යුතු වෙයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා සොයා බලන්නම් මොකක්ද කියා

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

අනිවාර්යෙන්ම සොයා බලන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය කැබ් රථය ගැනිම සම්බන්ධයෙන් මා කියා ගෙන්නුවාද දන්නේ නැහැ.රියදුරු බලපත්‍ර නැති අය නෙමේ . අපි එවන්නේ අදාල අයයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

2018.11.23 දින වැඩ නිම වු පසු බිලා ඇවිත් තමයි JCB යන්ත්‍රය පුහුණු කරන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණසේවා මහත්මයාණෙනි මේ පිළිබඳව සොයා බලන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

රථ පදවන කෙනෙක් නෙමේ . මනෝජ් ප්‍රභාත් කියන්නේ රියදුරෙක් නෙමේ . මොහු ඇවිත් සුසාන භූමි භාරකරුවෙකි. අදාහානාගාර භාරකරු මොහු මෙම කැබ්රථය රැගෙන ගොස් ඇත්තේ.මොහු මෙය ගෙන යාම

සම්පූර්ණ වැරදියි. මා නැවත වතාවක් ප්‍රකාශ කර සිටිනවා අම්බලන්ගොඩ නගර සභාව සතු සියළුම වාහන වල අම්බලන්ගොඩ නගර සභාව කියන ස්ටිකර් එක අලවන්න. එතකොට ගරු මන්ත්‍රීවරුන්ටත් එම වාහන දුටු විටි මේ ගැන විමසා දැන ගත හැකියි. මේ සඳහා ගරු සභාපතිතුමා අවසර ලබා දුන්නාද ? කොහේද යන්නේ ? මේවා නගරයේ දේපල . මෙවැනි දේ සිදුවීම් අන්තිමේදි නගරයේ ජනතාවගෙන් ඔබතුමා ඇතුළු ගරු සියළු මන්ත්‍රීවරුන් දොස් අහනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පසුගිය ජනවාරි 10 දා නගර සභා ට්‍රිපර් රථයෙන් පස් ගෙනහින් දමා එය එරි ලොකු කරදරයක් වූ බව මාගේ හිතවත් කිහිපදෙනෙක් පැමිණ පැමිණිලි කළා. එය ගැනීමට අනවසරෙන් නගර සභාවේ JCB යන්ත්‍රය ගෙනහින් තියෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොහේද ඔය සිද්ධිය සිදු වි තිබෙන්නේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පොල්වත්තේ

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්තේ කොහේටද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

දෙදුවස්සට .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දෙදුවස්සට යන්න හේතුවක් නැහැනේ. දිනය කවදාද ? ජනවාරි 03 දා ගරු නගර සභා මන්ත්‍රී අයිරාංගනි මන්ත්‍රීතුමියට අර නිල පියස ඉදිකිරිමට භූමිය සකසා දුන්නේ. රෑ එළිවෙනකම් වැඩ කර තිබෙනවා. එම පස් වෙන්නැති.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පස් දාලා . වාහනය එරිලා JCB යන්ත්‍රය ගෙනහින් තමයි වාහනය අරගෙන තිබෙන්නේ. මේ පිළිබඳ වාර්තා වුණාද

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය මේ පිළිබඳව සොයා බලන්න. පරික්ෂණයක් පවත්වා අදාල නිලධාරින්ට පරික්ෂණයක් පවත්වන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

තව කාරණයක් තිබෙනවා . ත්‍රිරෝද රථ සඳහා අපි ස්ටිකර් එක දුන්නාට . එම රථ ධාවනය කරන්න දෙන්නේ නැහැ. වණ්ඩි පාට් දමනවා. එම මිනිසුන් අසරණයි. ඔවුන්ට හැපෙන්න බැහැ . අපට වගකීමක් තිබෙනවා එම මිනිසුන්ට ස්ථානයක් ලබා දෙන්න. නගර සභාව නිහඬ වෙලා හරියන්නේ නැහැ. ඒ සම්බන්ධව යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මා කියන්න ගත්තේ කෙරමිණිය පෙර පාසලේ පෙර පාසල් දරුවන් ඇතුලත් කිරීම සම්බන්ධයෙනි. මට මෙය මගසි මුණ ගැසි කියා සිටියේ. පොඩි මානසික අබාදායක් තිබෙන දරුවෙකි.එම දරුවා ඇතුලත් කිරිමට දැම්මා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා දන්නවා ඒ සිද්ධිය සම්බන්ධව. එම දරුවා ඕකන්දට ඇතුලත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමා තින්දු කළා නම් හරි. ලේකම්තුමියත් ලිපියක් යවා ඇත. මේ සඳහා 28 ක් සිටිනවා. සභාකාර කෙනෙකු නැති නිසා මෙය ඉටු කර නොහැකි බවට. ඕකන්දට ගැනිම නෙමේ වැඩය තිබෙන්නේ. එය කෙරමිණියට ගත යුතුයි. පෙර පාසල් ගුරුතුමියගේ එකමතික තින්දුවට වැඩ කරන්න බැහැ. ගමේ කෙනෙක් වුනාම. කවුරුවත් නෙමේ මෙම නගර සභවේ වැඩ කරන කෙනෙක්ගේ. මා හිතන්නේ ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමා ඉන්නවාද දන්නේ නැහැ එය පිටුපස . එසේ කිරිමට දෙන්න එපා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ පිළිබඳව මා හට පැමිණ පවසා සිටියා . 28 ට වඩා එහි වාඩිවෙන්න බැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ 28 කලින් තමයි අයදුම්පත ඉදිරිපත් කර ඇත්තේ. ඊට පසු තමයි ඔය තත්වය ඇති වුණේ

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එයා කෙරමිණියේ කෙනෙක් නෙමේ. බටපොල පැත්තේ එක්කෙනෙක් . එයා අපගේ සේවකයෙක්. ඔය ඉල්ලීම ප්‍රාදේශිය ලේකම් මගින් අපට පැමිණියා . එවිට අපි ප්‍රකාශ කළා ළඟම තිබෙන්නේ ඕකන්ද එහි 28 දෙනෙක් නැති නිසා එයට දරුවා ඇතුලත් කරන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔය පෙර පාසල් ගුරුතුමිය තමයි මුලින්ම අයදුම්පත දැන්මාම ප්‍රතික්ෂේප කර තිබෙන්නේ. සොයා බලන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්ම**

ඔබතුමාගේ ගමේනේ . අල්ලපු ගෙදරට එහානේ. විසඳාගන්න තිබුණා

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නිලධාරින්ට කියන විට හරියට දෙයක් අහගන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ අපේ ගරු කෙරමිණියේ මන්ත්‍රීතුමා මේ ගැන මුකුත් කිව්වේ නැහැ. මා කෙරමිණියට වෙනින් වැඩකට ගියාම ඔය සිද්ධිය මට කිව්වා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , අපගේ ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා කිවූ සිද්ධිය නම් මට ආරංචි වූ විදියට නම් ජනවාරි 3 වෙනිදා. ගරු සභාපතිතුමා ප්‍රකාශ කර තිබෙනවා කොහේටද පස් ගෙනහින් දාන්න කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා ඒ ටික දාන්න කිව්වා මානාන ක්‍රීඩා පිටියට

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්ම**

මානාන ක්‍රීඩා පිටියට දාන්නේ නැතිව පස්ටික වෙන අහකට දැම්මා. වේලාවට ලොරිය එරුනා. නගර සභාවේ JCB එක ගිහින් මෙය ගත්තා. අපිට ජනතාවට මුහුණ දිය යුතුයි. ඔවුන් අපි පොල්වත්ත හංදියේ නකර වුණාම ඔවුන් ඇවිත් අපට පවසන විට ඒ සඳහා අපි පිළිතුරු සැපයිය යුතුයි. එම නිසා මෙය ඉතා ඉක්මනින් සොයා බලන්න. මට මතක විදියට ජනවාරි 10 දා නෙමේ ජනවාරි 03

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්ම**

ලේකම්තුමියණනි, මේ ගැන පරීක්ෂණයක් පවත්වා අපට වාර්තාව ලබා දෙන්න. ඒ අනවශ්‍ය වැඩක් කර තිබෙනවා නම් ඒ අයට ගන්න ඕන දඩුවම් ද මොනවාද කියා පවසන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගැරු සභාපතිතුමනි, අපි මේ සභාව මුලින්ම ආරම්භ කළ අප්‍රේල් මාසයට වඩා අපගේ ගරු මන්ත්‍රීවරුන් ටිකක් ආවේගශීලි වැඩියි. ඔබතුමාත් ඉන්නවාද මන්දා. ආවිනිත ස්භාවයකුත් පැමිණියා. අද දිනයේත් පැමිණියා. ඊටත් වඩා ගිය සභාවේදි මතු වුණා. ඉන් අපිටත් ටිකක් මදිකමකි. සභාවේ පුද්ගලයෝ ගහගන්න යනවා. අපි සුදානම් නැහැ මේ තත්වයට. අපේ තත්වයටත් මදිකමකි. ගරු මන්ත්‍රීවරියන් , ගරු මන්ත්‍රීවරුන් සිටිනවා. මෙම තත්වය ගැලපෙන්නේ නැහැ. බුද්ධිමතුන්ගේ නගරයක් පරාදිසයක් කියනවා. නමුත් මා දන්නේ නැහැ එහෙම එකත් කියා මේ. අපි මතවාදිව ගැටෙනවා. නමුත් අපිට පුද්ගලික ප්‍රශ්න නැහැ. ඔබතුමා සමඟ හරි මතවාදිව තදින් ගැටෙනවා.නමුත් අම්බලන්ගොඩ අපි ඊට වඩා හොද සහජිවනයක් සහියත්වයක් ඇති ජනතාවක් වෙසෙනවා. මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමා , සහෝදර ගරු මන්ත්‍රීතුමාන්ලාගෙන් සහ තුමියන්ලාගෙනුත් , සේවකයන්ගෙනුත් .මොකද මා දුටුවා පසුගිය සභා වාරයේ නොගැලපෙන ස්වරූපයක්. මා මෙය නොකියන්න සිටියා. මා බලාපොරොත්තු වුවා කවුරු හරි ගරු මන්ත්‍රීවරයෙක් මේ පිළිබඳව කතා කරයි කියා. කිසිම ගරු මන්ත්‍රී කෙනෙක් මේ පිළිබඳව කතා කලේ නැහැ. එ සඳහා මාගේ අප්‍රසාදයත් සහෝදර ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා මීට වඩා විනයකින් කටයුතු කරන ලෙසට.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි එතුමා ප්‍රකාශ කරනු ලැබුවේ මා සම්බන්ධව. විශේෂයෙන් එය මට කතා කරන්න බැහැ ගරු මන්ත්‍රීතුමා මෙය මා සම්බන්ධ දෙයක් නිසා. ඔබතුමා මෙය කතා කර නිසා මා ගරු සභාපතිතුමාට මේ පිළිබඳව මා කණ්ඩායම් රැස්විමේදි ප්‍රකාශ කළා. මට ඇහුනේ නැහැ ඔය ප්‍රකාශ කිරිම සම්බන්ධව. විශේෂයෙන්ම නගර සභාවේ සේවකයෙක් පසුගිය සභාවේ මාත් ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතාත් පොඩි ප්‍රශ්නයක් ඇති වූ වේලාවේ ඒ පුද්ගලයා ප්‍රකාශ කර තිබෙනවා උඹ මං බල්ලෙක් වගේ මරා දමනවා කියා. එවට නම් බයේ මා මේ සභාවට එන්නෙත් නැහැ .මට නම් ඇහුනේ නැහැ. එම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා මෙන්න මේ වගේ දෙයක් සිද්ධ වුණා කියා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මේ ඇතුලේ කතා වුණේ නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එතුමාට ඇහුණ දේ තමයි කිව්වේ. මට ඇහුණේ නැහැ. මා ගරු සභාපතිතුමාට කිව්වා එතුමා මෙම යෝජනාව ගෙනාවොත් මා කතා කරනවා කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

සභාව ඇතුලේ කතා වුණේ නැහැ

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා මට කිව්වේ . එහෙම සිද්ධියක් වෙන්න දෙන්න බැහැනේ ගරු සභාපතිතුමනි. එහෙම සිද්ධියක් සිදු වුණානම් ඔබතුමා යම් ක්‍රියා මාර්ගයක් ගත යුතුයි. ඔබතුමා මේ සභාවේ ගරු සභාපතිවරයා.මට කණට ඇහුණා නම් ක්‍රියා මාර්ගයක් ගන්න තිබුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ඔය ප්‍රශ්නය ප්‍රකාශ කරන විට ගරු මන්ත්‍රීතුමා නමත් සමඟම කියන්න. සේවකයෝ කිව්වාම මෙතැන සේවකයෝ හුඟාක් ඉන්නවා. එහෙම ඇහුණා නම් ඇත්ත කියන්න බය වෙන්න එපා. දැන් මෙතුමා කිව්වා එය ප්‍රකාශ කළේ ඉඳුනිල් මහතා කියා.ප්‍රශ්නයක් ඇති කරලා කියන්න එපා. මෙන්න මේ අය මෙය කිව්වේ කියා ප්‍රකාශ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සිද්ධිය හැමෝම දැක්කා.මේ සභාවේ ඇතුලේ වුණේ.මට නම් ඉදිරිපත් කරන්න උවමනාවක් නැහැ. සිද්ධිය හැමෝම දැක්කා. හැමදෙනාම ඇස් කන් වහගෙන සිටියේ.මට ඒවා ඇහැට ඇඟිල්ලෙන් ඇණලා පෙන්වන්න අවශ්‍ය නැහැ. සැම දෙනාම සිද්ධිය දැක්කා. පුළුවන් කට්ටිය ගියා යන්න. නමුත් අපි අභිමානයක් ඇතිව මෙතැන සිටිය යුතුයි. අපිට හැල්ලුවෙන්න බැහැ මෙතැන ඇවිත් කට්ටිය රණ්ඩු වෙන විට.මුල්ලකට වී සිටින්න. ඒවාට නම් අපි ලැහැස්ති නැහැ.එවැනි තත්වයක් ඇති වී තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

අපිටත් ආත්ම ගෞරුත්වයක් තිබෙනවා.කිසිම සේවකයෙකුට අපිට කතා කරන්න බැහැ ඒ විදියට. අපිට නම් ඇහුනේ නැහැ. ඇහුනානම් ප්‍රකාශ කරන්න බය නැතිව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පොලිසියේ මහත්වරු දෙදෙනෙක් සිටියා. මා ඒ දෙන්නාට කිව්වා ඔන්න පෙනවා නේද මේ අයගේ හැසිරීම කියා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

බයනැතිව නම කියන්න. මා නම් බය නැතිව නම කියනවා දන්නවා නම්. එය අපි කාටත් හොඳ නැහැ. සේවකයන්ගෙන් වචන අහන්න අවශ්‍ය නැහැ.බය නැතිව නම කියන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.</u>**

පසුව අපි මේ පිළිබඳව සොයා බලන්නම්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්.</u>**

ඔබතුමාගේ වගකීම මේ පිළිබඳව සොයා බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්.</u>**

එහෙනම් රැස්විමේ වැඩ කටයුතු මින් අවසන් කරනවා.

- **පස්වරු 1.45 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

බී. ඒ. ධම්මිකා,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2019 -01–08** වන දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.